ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Pages 52 MAY 2017 Issue : 91 මාසික සංග්‍රහය. 2017 මැයි 91 කලාපය 50 ¢

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative

RE/MAX Diamond
Tel: 416 822 2789
www.gaminiabeysinghe.com

## සම්බුදු තෙමඟුල බැතියෙන් සමරමු !



**ටොරොන්ටෝ මහා විහාරයේ ඉදිකෙරෙන විදුලි බුබුළු 7500 කින් යුත් මහා තොරණ් රාජයා ඉදිකිරීමට දායක වන විහාරස්ථ ස්වාමීන්වහන්සේලා....**

**මෙම තොරණ මැයි මස 13 සිට 18 වනදා දක්වා ප්‍රදර්ශනය කෙරේ.**

## ශ්‍රී ලංකාවේ නව ත්‍රස්ත මර්දන පනත

ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති ත්‍රස්ත මර්දන පනත වෙනුවට නව ත්‍රස්ත මර්දන පනතක් අනුමත කොට ප්‍රකාශයට පත් කිරීමට කැබිනට් මණ්ඩලය පියවර ගෙන ඇත.

මෙතෙක් පැවති ත්‍රස්ත මර්දන පනත අහෝසි කරන ලෙස යුරෝපා සංගමය විසින් රජයට කර තිබූ දැනුම් දීමකට අනුව එය අහෝසි කර මෙසේ නව පනතක් ගෙන ඒමට කටයුතු කරන ලද බව ඒ පිළිබඳව පළ වූ පුවත් වාර්තාවල දැක්වේ.

ශ්‍රී ලංකාව වෙත ලබාදීමට නියමිත ජී. එස්. පී ප්ලස් බදු සහන ලබාදීමේදී සොයා බැලූ කරුණු යටතේ ත්‍රස්ත මර්දන පනත ඉවත් කිරීම කෙරෙහි යුරෝපා සංගමයේ අවධානය යොමු වී තිබුණි. එහිදී, පෙර තිබුණු ත්‍රස්ත මර්දන පනත ඉවත් කර ගැනීමටත් ශ්‍රී ලංකා රජය මානව හිමිකම් ආරක්ෂා කරන බවට දුන් පොරොන්දු ඉටුකිරීමටත් පියවර ගත යුතු බව යුරෝපා සංගමය පවසා ඇත. යුරෝපා සංගමය විසින් ජී. එස්. පී ප්ලස් සහනය ලබාදීමේ තීරණය මැයි 16 වෙනිදා ප්‍රකාශයට පත් කිරීමට නියමිත වේ.

ප්‍රකාශයට පත් නව ත්‍රස්ත මර්දන පනත යටතේ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා වැරදිකරුවන් වන්නන්ට වසර 20 කට නොවැඩි සිරදඬුවමක් හා දඩයක් මෙන්ම ඔවුන් සතු සියලු දේපළ රාජසන්තක කිරීමේ බලයද හිමි වේ. පෙර

8 වන පිටුව බලන්න

## 25 ට අඩු නම් FREE PRESCRIPTION DRUGS

වයස අවුරුදු 25 ට අඩු සියලුම ඔන්ටේරියානුවන් සඳහා Pharmacare Program යටතේ නොමිලේ ඖෂධ ලබා දෙන බව ඔන්ටාරියෝ රජය පවසයි. මෙම වැඩසටහන 2018 ජනවාරි 01 දා සිට ක්‍රියාත්මක වීමට නියමිතව ඇත.

මෙහිදී සම්පූර්ණ බෙහෙත් වට්ටෝරුවම (full prescription) කිසිදු අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු යොදා ඇති අතර පවුලේ ආදායම් තත්ත්වය හෝ වෙනත් පෞද්ගලික රක්ෂණ ආවරණ ඇත්ද යන්න පිළිබඳව සොයා නොබැලේ. නිසි වයස් සීමාවේ පසුවන සියලුම දෙනාට මෙම සහනය සඳහා හිමිකම ලැබෙයි.

පසුගියදා ඔන්ටාරියෝ රජයේ වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීමේදී මේ පිළිබඳව වූ නිවේදනය නිකුත් කර තිබුණු අතර මේ ආකාරයට බෙහෙත් නොමිලේ ලබා දීම සඳහා වාර්ෂිකව ඔන්ටාරියෝ රජයට වැය වන මුදල ඩොලර් මිලයන 465 ක් වෙතැයිද පැවසේ.

මේ වන විට ඔන්ටේරියානුවන් සඳහා නිදහස් ඖෂධ ලබාදීමේ ක්‍රමයක් වන

8 වන පිටුව බලන්න

TAX, BOOKKEEPING, PAYROLL
GS Accounting Co.
416-571-4270 / 647-352-1560
Residence : 416-331-8349
For more info - See Page 29

තිසල් මුදල් හුවමාරුව
CASH
THISAL BUSINESS SERVICES INC
විශ්වාසවන්ත හා සුහදශීලී සේවයක් සමගින් ශ්‍රී ලංකාවට මුදල් යැවීමට පහසු මගක්
Registered office: 1315 Lawrence Ave. E, Suit # 509 Toronto, ON, M3A 3R3 Tel: 416 546 4488

CALL FOR DETAILS ON
COURSE DETAILS, EXAM, STUDY HELP, MENTORSHIP, PRODUCT TRAINING, COMMISION AND BENEFITS
JOIN My TEAM
Become a Financial Security Advisor
• LIFE INSURANCE • CRITICAL ILLNESS COVERAGE • LONG TERM CARE INSURANCE
• INCOME PROTECTION • SUPER VISA/TRAVEL INSURANCE • HEALTH & DENTAL BENEFITS
• INVESTMENTS RESP/RRSP
647.528.4111
English हिंदी සිංහල தமிழ் اردو
Life100 INSURANCE & INVESTMENTS INC.
TERRANCE RAJAH
FINANCIAL SECURITY ADVISOR

7343 Markham Road, Suite 91, Markham ON L3S 0B5 terrance.rajah@life100.ca
Head Office 10 Milner Business Court, Suite 208, Toronto, ON M1B 3C6 www.terrancerajah.ca


VESAK 2017
BUDDHA'S BIRTHDAY CELEBRATION
SUNDAY, MAY 28th
Mississauga Celebration Square
300 City Centre Drive, Mississauga, Ontario L5B 3C1
Parade: 2 pm - Program: 3 pm
150
CANADA
UNITED NATIONS DAY OF VESAK
CANADA
"Blessings on the City, the Nation, and the World."
www.vesakcelebration.com
Co-organized by:
正覺寺
Ching Kwok Buddhist Temple of Toronto
Halton Peel Buddhist Cultural Society
West End Buddhist Temple
And Meditation Centre
F.G.S.
Fo Guang Shan
Temple of Toronto
加拿大佛教湛山精舍

## ආගමන ලොතරැයියට ඉහළ ඉල්ලුමක් !

අනුග්‍රාහක (sponsors) ක්‍රමය යටතේ දෙමාපියන් හෝ ආච්චිලා සීයලා (parents or grandparents) කැනඩාවට ගෙන ඒම සඳහා හඳුන්වා දුන් අලුත්ම ආගමන ලොතරැයි ක්‍රමයෙහි මුල් අදියර එසේත් නොමැති නම් ඉල්ලුම් කිරීමේ අවස්ථාව මේ වන විට අවසන් වී ඇත. ආරම්භක අවස්ථාවේදීම මෙම ලොතරැයිය සඳහා 95,000 ක පමණ පිරිසක් ඉල්ලුම් කර ඇති අතර මේ පිරිස අතරින් 10,000 ක පිරිසක් කැනඩාවේ පදිංචිය සඳහා ලබාදීමට තෝරාගනු ලැබේ.

කැනඩාවේ ආගමන විගමන හා සරණාගත කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් මේ වසරේදී මෙම නව ලොතරැයි ක්‍රමය හඳුන්වාදෙනු ලැබූ අතර 'පළමුව පැමිණෙන්නාට පළමුව සේවය' (first-come, first-served) යන පදනමෙහි පිහිටා මෙහිදී අවස්ථාව ලබා දී ඇත.

අනුග්‍රාහක ක්‍රමය තුළින් තම වැඩිහිටියන් කැනඩාවට ගෙන්වා ගැනීමේදී කලින් අනුගමනය කළ ක්‍රමවේදයේදී භූගෝලීය සාධක හා අයදුම්කරුගේ හැකියාව (රැකියාව, මූල්‍යමය තත්ත්වය, පවුලේ සාමාජික සංඛ්‍යාව, මවු රටේ මවුපියවරුන්ගේ බාරකරුවන්ගේ වතගොත) පෙන්වා දීමට සිදුවූ අතර බොහෝ දෙනෙකුට ආගමන කටයුතු සම්බන්ධ නීතිඥයන්ට හෝ නියෝජිතයන්ට ගෙවීම් කිරීමටත් සිදුවිය. එම ක්‍රමය සඳහා විශාල කාල සීමාවක් ගැනීමද මෙහි පැවති බරපතලම තත්ත්වය විය. කැනඩා ආගමන දෙපාර්තමේන්තුව වෙත මේ සම්බන්ධයෙන් නිරන්තරව පැමිණිලි ලැබුණු අතර ඒ සියල්ල සලකා බලා මෙම නව ක්‍රමය හඳුන්වා දීමට එම දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබුණි. මෙම නව ලොතරැයි වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින් මෙරටට පදිංචියට පැමිණීමට අදහස් කරන වැඩිහිටියන් පිළිබඳව වඩාත් සාධාරණ හා විනිවිද පෙනෙන ආකාරයට තීන්දු ගත හැකි වෙතැයි දෙපාර්තමේන්තුව විශ්වාසය පළ කර සිටී.

මෙම අලුත්ම ලොතරැයි වීසා ක්‍රමය මෙම වසරේ ජනවාරි 03 වනදා සිට පෙබරවාරි 02 වෙනිදා දක්වා බලාත්මක කර තිබුණු අතර එම කාලසීමාවේදී කැනඩා ආගමන සේවා වෙබ් අඩවියේ පළවූ ආකෘති අයදුම් පත්‍රය පුරවා එවීමෙන් මේ සඳහා ඇතුළත් වීමට සුදුසුකම් ලබාගත හැකි විය. පළමු වතාවට සිදුකළ මෙම ක්‍රමය තවදුරටත් අධීක්ෂණය කිරීම මගින් මෙහි යම් අඩුලුහුඬුකම් ඇතොත් ඒවා මගහරවාගෙන ලබන වසරේදී තවත් සාර්ථක ලෙස මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට රජය බලාපොරොත්තු වෙයි. ලබන වසර සඳහා අයදුම් කළ හැකි කාල සීමාවන් හා විස්තර ඉදිරියේදී මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කරන බව කැනඩා ආගමන හා පුරවැසිභාව පිළිබඳ අමාත්‍යාංශය ප්‍රකාශ කර සිටී.

## මැනිටෝබාවට එන අනවසර සංක්‍රමණිකයෝ

ඇමරිකාවේ සිට පැමිණෙන අනවසර සංක්‍රමණිකයන් කෙරෙහි ට්‍රෘඩෝ රජය දක්වන මෘදු ප්‍රතිපත්තිය අනාගතයේදී රටෙහි ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව මැනිටෝබා ප්‍රාදේශීය මන්ත්‍රීවරයකු සහ ආගමන කටයුතු පිළිබඳ විචාරකයකු අවධාරණය කර සිටී. මේ වන විට එක්සත් ජනපදයේ සිට කැනඩාවට පැමිණෙන අනවසර සංක්‍රමණිකයන් අතරින් වැඩිම පිරිසක් මැනිටෝබා පළාත හරහා ඇති අනාරක්ෂිත මායිම් තුළින් පැමිණේ. මෙම අනවසර පැමිණීම් පිළිබඳව එම ප්‍රදේශයේ ජනතාව දැඩි වික්ෂිප්තභාවයෙන් පසුවන අතර මෙහි වර්තමාන තත්ත්වය සොයා බැලීම සඳහා මැනිටෝබාහි එමර්සන් (Emerson) ප්‍රදේශයට පැමිණෙන ලෙස ඔවුන් අගමැති ට්‍රෘඩෝ ට ආරාධනා කර සිටී.

ප්‍රදේශයේ බහුතරයක් මෙම අනවසර සංක්‍රමණිකයන් කෙරෙහි දැඩි විරෝධතාවක් දක්වන අතර ඔවුන් පවසන්නේ අගමැති ට්‍රෘඩෝ විසින් පැවසූ 'රටේ දොරවල් විවෘතයි. පැමිණෙන්න' යන කතාවෙන් පසු එන සියලුම අය කිසිදු විමසිල්ලකින් තොරව පිළිගැනීමට සිදුවී ඇති බවයි. නීත්‍යනුකූල සංක්‍රමණිකයන් කැනඩාවට පැමිණීම කෙරෙහි කිසිදු විරෝධතාවක් නැතත් අනවසරයෙන් මෙසේ ඇතුළු වන සංක්‍රමණිකයන් පිළිබඳව පවතින්නේ දැඩි බියක් බව එම ප්‍රදේශයේ ජනතාව පවසයි.

කැනඩාව සහ ඇමරිකාව අතර පවතින මායිමෙහි අනාරක්ෂිත ස්ථාන රැසක් පවතින අතර එමර්සන් එවැනි ප්‍රදේශයකි. පසුගිය ජනවාරි 01 දා සිට එම අනාරක්ෂිත ප්‍රදේශය හරහා මෙරටට පැමිණ ඇති සංක්‍රමණිකයන් සංඛ්‍යාව සිය ගණනක් බව පැවසේ.

අනාරක්ෂිත කලාප හරහා ඇමරිකානු සංක්‍රමණිකයන් කැනඩාවට පැමිණීම අද ඊයේ ඇති වූ තත්ත්වයක් නොවූවත් පසුගිය කාලයේදී මෙම තත්ත්වය නොසිතූ විරූ ලෙස වැඩි වීමට පටන් ගැනුණි. මෙහිදී කැනඩාවේ පවතින සරණාගත ප්‍රතිපත්තිවලට අනුව මෙසේ පැමිණෙන අය හරවා යැවීමද කළ නොහැක්කකි. විශේෂයෙන්ම Canada-U.S. Safe Third Country Agreement ප්‍රඥප්තියට අත්සන් කර ඇති කැනඩාවට ඇමරිකානු සරණාගතයින් හරවා යැවීම කළ නොහැක්කකි. අනවසරයෙන් හෝ යම් සංක්‍රමණිකයකු මෙරට භූමියට පය තැබූ මොහොතේ සිට ඔවුන් සරණාගතභාවය ඉල්ලන්නේ නම් දඬුවම් පැමිණවීමකින් තොරව ඔවුන් පිළිගැනීමට බැඳී සිටින බව කැනඩා ආගමන හා සරණාගත ආරක්ෂණ පනතේ වගන්තිවල සටහන්ව පවතී.

අනවසරයෙන් රටට ඇතුළු වන ජනතාවට නීත්‍යනුකූල සරණාගත හිමිකම ලබාදීම සඳහා වන මෙම ගිවිසුම කැනඩාව ඇතුළු රටවල් කිහිපයක් විසින් 1951 එක්සත් ජාතීන්ගේ සරණාගත සම්මුතිය මත පදනම්ව අත්සන් කර තිබෙන්නකි.

## ටොරොන්ටෝ රෝහල් සේවා ඉහළට

කැනඩාවේ රෝහල් වෙත ප්‍රතිකාර ගැනීමට යන බොහෝ දෙනෙකු හට මුහුණ පෑමට සිදුවන ප්‍රධාන ගැටලුව වන්නේ ඒ සඳහා ගත කිරීමට සිදුවන කාලයයි. හදිසි ප්‍රතිකාර මධ්‍යස්ථාන කරා යන බොහෝ දෙනෙකු හට නිසි ප්‍රතිකාර ලැබෙන්නේ පැය ගණනාවක් කල් මැරීමෙන් පසුය. මේ තත්ත්වය සැලකිල්ලට ගනිමින් ටොරොන්ටෝවේ ප්‍රධාන රෝහල් 9 ක ප්‍රතිකාර කටයුතු ලිහිල් නැවතුම් කාලයක් තුළ ඉටුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඩොලර් මිලියන 68ක් වෙන් කිරීමට ප්‍රාදේශීය රජය කටයුතු යොදා ඇත. මීට අමතරව මෙවර අයවැයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීමටද ඔන්ටේරියෝ රජය පියවර ගෙන ඇත.

## ටොරොන්ටෝවේ ප්ලාස්ටික් යුද්ධය

2008 වසරේදී ටොරොන්ටෝවට හඳුන්වා දුන් පරිසර හිතකාමී සැලසුම්වලට අනුව නගරය තුළ ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම ප්‍රධාන ඉලක්කයක් විය. එහිදී නගරය තුළ විශාල වශයෙන් භාවිත කෙරෙන ප්ලාස්ටික් ජල බෝතල් ප්‍රමාණය අවම කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු වූ අතර එය ඉලක්ක කර ගනිමින් නාගරික දේපළ තුළ (ප්‍රසිද්ධ උද්‍යාන ආදියෙහි) ප්ලාස්ටික් බෝතල් ජලය විකිණීම හා බෙදාහැරීම ක්‍රමයෙන් අඩුකිරීම සඳහා පියවර ගැනුණි.

මේ සඳහා මූලෝපාය මාර්ගයක් ලෙස නගරයට පැමිණෙන ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා අවශ්‍ය ජල පහසුකම් සැපයීම කළ යුතු වූ අතර ඒ වෙනුවෙන් ප්‍රසිද්ධ ස්ථානවල නළ ජලය හා ජල ධාරා යන්ත්‍ර (water fountains) සවිකිරීම කළ යුතු බව යෝජනා විය. ඉන්පසුව ඇතැම් ස්ථානවල මේ යෝජනාව ක්‍රියාත්මක වී එවැනි පහසුකම් ඇති කිරීමට පියවර ගෙන තිබුණු නමුත් 2012 වසර වන විටත් නගරයේ උද්‍යාන සහ වෙනත් නාගරික දේපළ ඇතුළු ප්‍රසිද්ධ ස්ථාන 140 කට ආසන්න සංඛ්‍යාවක පානීය ජල පහසුකම් දක්නට නොලැබුණි. මෙම තත්ත්වය තුළ නගර සභාව විසින් ගෙන ආ ජල බෝතල් තහනම් කිරීමේ ප්‍රතිපත්තිය ලිහිල් කෙරුණු අතර අවසන එය ඉවත් කිරීමට සිදුවිය.

ජල බෝතල් සඳහා පැනවූ පනත එසේ නොසලකා හැරෙද්දී නගරය පුරා අසීමිත ලෙස ප්ලාස්ටික් ජල බෝතල් පරිභරණය වීමටත් අපද්‍රව්‍ය ලෙස එක්වීමටත් පටන් ගැනුණි.

ප්ලාස්ටික් ජල බෝතල් ගැටලුව පිළිබඳව පසුගියදා නගරසභාව තුළ උණුසුම් කතාබහක් ඇතිවූ අතර කවුන්සිලර් ජැනට් ඩේවිස් විසින් ජල බෝතල් පනත පිළිබඳව නගරසභාව ගෙන යන ප්‍රතිපත්තිය කුමක්ද යන්න පිළිබඳව දැඩිව ප්‍රශ්න කර සිටි ආකාරය දක්නට ලැබුණි. මෙසේ ජල බෝතල් ප්‍රශ්නය නගරසභාව උණුසුම් කිරීමට හේතු වූයේ නගරසභාව විසින්ම ලබාදුන් අවසරයකි. ඒ කැනඩාවට වසර 150 ක් පිරීම නිමිත්තෙන් Nathan Phillips Square හිදී පැවැත්වීමට සූදානම් කර ඇති සංවත්සර උත්සවය අවස්ථාවේදී එම පරිශ්‍රය තුළ ප්ලාස්ටික් ජල බෝතල් අලෙවිය සඳහා අවසර ලබාදෙමින් නගර සභාව දුන් තීන්දුවය. මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ කවුන්සිලර් ජැනට් පවසා ඇත්තේ නගරය තුළ ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය තහනම් කිරීම සඳහා නගර සභාව මූලිකත්වය ගෙන කටයුතු කළ යුතු බවයි. මහජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ජල නළ හා ජල ධාරා යන්ත්‍ර සවි කිරීම වෙනුවට බෝතල් ජලය නිදහසේ විකිණීමට බලය ලබාදීම කළ යුත්තක් නොවන බව ඇය තරයේ පවසා තිබුණි.

## රටෙන් සියයට 40 ක් මානසික රෝගීන් !

විවිධ වූ මානසික ආතති තත්ත්වයන් හා ඒ හා අනුබද්ධ වූ හේතූන් මුල් කොටගෙන පසුගිය වසර තුළදී පමණක් සිය රැකියාවන්, අධ්‍යාපන කටයුතු කඩාකප්පල් කරගත් කැනේඩියානුවන්ගේ ප්‍රතිශතය සියයට 40 ක් පමණ වන බව ග්ලෝබල් නිවුස් විසින් සිදුකළ සමීක්ෂණයක් හෙළි කොට සිටී.

මෙම සමීක්ෂණයට එක්වූ පිරිස අතරින් සියයට 17 ක්ම රැකියා සහ පාසල් කටයුතුවලින් ඉවත් වී ඇත්තේ පෞද්ගලික හේතු මත ඇති වූ මානසික සෞඛ්‍ය ගැටලු හේතුවෙනි. තවත් සියයට 8 ක ප්‍රතිශතයක් සිය රැකියා හා අධ්‍යාපන කටයුතු කැප කොට ඇත්තේ මානසික රෝගී තත්ත්වයන් හේතුවෙන් පොර බදන තම පවුලේ හෝ ළඟම හිතවතකුට උපකාර වීම සඳහාය.

මේ කුමන ආකාරයක හෝ මානසික රෝග හෝ ආතති හා බැඳුණු තත්ත්වයන් යටතේ වාර්ෂිකව කැනේඩියානුවන් ලක්ෂ 5 කට අධික සංඛ්‍යාවකට සිය රැකියා හා අධ්‍යාපන කටයුතුවලට සමුදීමට සිදුවන බව එම සමීක්ෂණය හෙළි කොට සිටී. මානසික ආතතිය, බලාපොරොත්තු රහිත බව, මානසික පීඩන හැඟීම් ආදිය මත පදනම් වූ මානසික රෝගී තත්ත්වයන් තුළ කැනේඩියානුවන් 'ඉහළ අවදානමක' පසුවන බව මෙම සමීක්ෂකයෝ හෙළි කොට සිටී.

මෙම ප්‍රතිශතය පසුගිය වසරේදී සියයට 35 ක් ලෙස පැවතුණි. ඒ අනුව සලකා බැලීමේදී මෙය වසරින් වසර වර්ධනය වන බව පෙනී යාම ඉතාමත් භයානක තත්ත්වයක් බව නිරීක්ෂකයන්ගේ අදහසයි.

මානසික ආතතියකින් හෝ මානසික රෝගයකින් පෙළෙන පුද්ගලයකු එම තත්ත්වයෙන් ගොඩ ගැනීමේ ක්‍රියාවලිය වෛද්‍යවරුන්ට පමණක් කළ හැකි කාර්යයක් නොවන බවත් එයට මුහුණ පා සිටින තැනැත්තා මෙන්ම ඔවුන්ගේ පවුල්වල අයත් ඊට සෘජුව සහයෝගය දැක්විය යුතු බව වෛද්‍යවරුන් පෙන්වා දේ. එහිදී ඔවුන් රැකියාවල හෝ අධ්‍යාපන කටයුතුවල නියැළුණු ආයතනවලින්ද මීට අවශ්‍ය සහයෝගය ලැබීම එම පුද්ගලයාගේ මානසික තත්ත්වය නගා සිටුවීමට විශාල පහසුවක් බව වෛද්‍යවරු පවසති.

මානසික රෝග යනු නොසලකා හැරිය හැකි රෝගී තත්ත්වයක් නොවේ. මෙම අසනීප තත්ත්වයෙන් පෙළෙන්නන් නිසා සාමාජීය ගැටලු රැසක් උදාවිය හැකි අතර එය රෝගියාට මෙන්ම රෝගියා වටා සිටින අයටද දැඩි හිරිහැර ඇති කරවන්නකි. ඇතැම් විට මෙම රෝගයට ගොදුරු වූවන් සියදිවි නසාගැනීම වැනි දරුණු පියවරවල් දක්වා වුවත් යා හැක.

මේ තත්ත්වය අවම කර ගැනීම සඳහා මෙවැනි පුද්ගලයින් සඳහා අවශ්‍ය ප්‍රතිකාර කටයුතු සිදුකිරීමට රජයේ මැදිහත් වීමෙන් මෙන්ම පෞද්ගලික වෛද්‍ය සායන මගින්ද ප්‍රතිකාර මධ්‍යස්ථාන රට පුරා ආරම්භ කර ඇත. මෙහිදී ඔබේ හෝ ඔබ පවුලේ හිතවතකු එවැනි රෝගී තත්ත්වයකින් පෙළෙන බව දැනගතහොත් ඔවුන්ව නිසි ප්‍රතිකාර සඳහා යොමු කරවීම ඔබගේද සමාජ වගකීමකි.

ඒ සඳහා උපකාර හා උපදෙස් ලබාගත හැකි ස්ථාන කිහිපයක තතු විස්තර පහත සඳහන් වෙබ් අඩවිවලට පිවිසීමෙන් ඔබට ලබාගත හැක.

- http://suicideprevention.ca/need-help/
- http://depressionhurts.ca/en/manage/accepting-help.aspx
- https://www.kidshelpphone.ca/Teens/InfoBooth/Emotional-Health/Depression.aspx#treat

# ජන කවියා දුටු




■ ආචාර්ය ස්වර්ණා චන්ද්‍රසේකර

අභිනික්කමන, අභිනිෂ්ක්‍රමණ නොහොත් 'අබිනික්මන' යනු උදාර පරමාර්ථයකින් යුතුව 'නික්මයාම' යි. සිදුහත් කුමරු ගිහිගෙය හැර යාමේ පුවත නොඇසූ බෞද්ධයෙකු නොමැති තරම් ය. මෙය බුද්ධ චරිතයේ එන අධිෂ්ඨාන පූර්වක තීරණාත්මක අවස්ථාවකි. අගනා සන්ධිස්ථානයකි. ඇස්, ඉස්, මස්, ලේ දන් දෙමින් බුදු බව පතා නිමක් නැති සසර සයුරේ සැරිසරමින් පැමිණි ගමනේ අවසාන අදියරයි. මෙම නික්ම යාමෙන් පසු 'සිදුහත් කුමරු' අප හමුවට පැමිණෙන්නේ 'සම්මාසම්බුද්ධ' ලෙසටය.

ජන කවියාගේ කවි ඇසින් මෙම 'අබිනික්මන' දුටු ආකාරය විමංශනයට භාජන කිරීම මෙම ලිපියෙහි මුඛ්‍ය පරමාර්ථයයි. ඒ සඳහා උපයෝගී කොටගෙන ඇත්තේ 'යසෝදරාවත' නමැති කාව්‍ය ග්‍රන්ථයයි. අඹුසැමියන් ලෙස යසෝදරාව සහ සිදුහත් කුමරු අතර වූ අන්‍යොන්‍ය ප්‍රේමය, අධ්‍යාත්මික බැඳීම හා අන්‍යොන්‍ය අවබෝධය නිරූපණය වීම යසෝදරාවතෙහි කැපී පෙනෙන ලක්ෂණයකි. එදා සිට අද දක්වාම සිදුහත් කුමරු සහ යසෝදරාව බෞද්ධ ජනතාවගේ ඉමහත් ආදර ගෞරවයට පාත්‍ර වී ඇත. යසෝදරාවගේ චරිතය එදා කාන්තාවන් ආදර්ශ කොටගත් බවට ද සැකයක් නැත. සිංහල බෞද්ධ සංස්කෘතියට බෙහෙවින් සමීප වූ 'යසෝදරාවතින්' මෙහිලා මහඟු සේවයක් ඉටුවූ බව ද කිව යුතුමය. ජීවිතය පිළිබඳව ජන කවියා හෙලූ සානුකම්පිත දෘෂ්ටිය, උපේක්ෂාව හා ජීවිත පරිඥාව මෙම කෘතියෙන් මනාව විද්‍යමාන වෙයි.

සංසාරේ ඈතම සිට පෙරුම් පි      රූ
දැන් කාලේ ආවා පෙරටුව කුම      රූ
පින්වත් මහන වෙන්නෙමි දැක මගෙ කුම      රූ
පින්වත් උතුම් ඉපදුන රාහුල කුම      රූ

ඒ තීරණාත්මක රාත්‍රියෙහි සුමිතුරු චන්න ඇමතිට කන්ථක අසු රැගෙන එන ලෙස පැවසූ සිදුහත් කුමරු සිය බිරිඳ වන යසෝදරාවගේ යහන්ගැබට පිය නැඟුවේ එදින උපන් රාහුල පුතුන් සහ සිය බිරිඳ අවසන් වතාවට දැක ගැනීමේ සහ සමුගැනීමේ ද අභිලාශයෙනි.

බිරිඳ සහ දරුවා සමග මෙසේ පවුලක් ලෙස බැඳීමක් ඇතිවූයේ 'පෙරුම්දම්' බලයෙනි. 'සංසාරේ ඈතම සිට' මෙසේ පැමිණියේ ජීවිතයේ සියලුම අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙමින් මහත් බැඳීමකින් යුතුවය. 'පින්වත් උතුම් රාහුල කුමරු' පැමිණියේ ද ප්‍රාර්ථනා බලයෙනි. එහෙයින්ම මෙය ශක්තිමත් බන්ධනයකි. අඹුසැමියන් වශයෙන් සිදුහත් කුමරු හා යසෝදරාව අතර වූ අධ්‍යාත්මික බැඳීම ආත්මයක් ආත්මයක් පාසා වර්ධනය වූවකි. ඒ කෙසේ වුව ද නිමක් නැති සංසාර සාගරයේ සැරිසැරීම නවතාලීමට කාලය එළඹ ඇත. සිතිවිලි සයුරේ නිමග්න වූ සිදුහත් කුමරු නතර වූයේ යහන් ගබඩාවේ උළුවස්ස අසලය.

සිරි හස්තෙන් රන්බාපත අල්ලා      ලා
සිරි පද රන් පඩිකඳ පිට තබා      ලා
පිරි සිදු යහනෙ සැතපෙන පුන්සඳ ලී      ලා
සිරි පද ගත්තෙ කිසිවක් ආපසු නොබ      ලා

සිදුහත් කුමරු උළුවස්සට දෑත් තබා යහන් ගැබට පිවිසෙන්නට පය පඩිකඳ පිට තැබූ ආකාරයත්, ක්ෂණිකව පය ආපසු ගත් ආකාරයත් නාට්‍යමය ස්වරූපයෙන් චිත්‍රණය වෙයි. මුලින්ම කුමරුගේ නෙතට ගොදුරු වූයේ 'පුන්සඳක්' ලෙස 'පිරිසිදු යහනෙහි' සැතපෙන යසෝදරාවයි. යසෝදරාවගේ රූපශ්‍රීය පමණක් නොව සොමි ගුණය ද මෙයින් ධ්වනිත වෙයි. මෙසේ බෝසතුන්ගේ සිත් දිනාගෙන ඔහුගේ බිරිඳ වී භවයෙන් භවයට සැරිසැරීම ඉතා ගුණ යහපත් කාන්තාවකට විනා අන් අයෙකුට කළ නොහැක්කකි. යසෝදරා දේවිය සැබවින්ම ගුණ ගරුක, පති භක්තික කාන්තාවකි.

අමුණක් පමණ මල් අතුරපු යහන පු      රා
පමණක් එරුණි කුමරුට රන්කිරි තිස      රා
කවදත් වරද නැති පින්කඳ යසෝද      රා
වරදක් බුදු බවට පැමිණෝය අන්ත      රා

සත් බඹයක් නිල් වරලස මිදී      ලා
අක් බඹරෙක් ලෙසට වරලස කැරකී      ලා
සිත් ලෙස කුමරු යහනෙහි කිරි බොන ලී      ලා
අත්හැර ඉන්ට බැරිවෙයි රන්කුඹ දැක      ලා

යසෝදරාව දෙස නෙත් හෙලාගෙන සිටින කුමරුන්ට ඇය පැහැදිලිව පෙනෙයි. යසෝදරාව නිදාගෙන සිටින්නේ මල් යහනාවකය. 'අමුණක් පමණ' යන්නෙන් කෙතරම් මල් ප්‍රමාණයක් යහනෙහි අතුරා තිබුණේ ද යන්න චිත්ත රූප නැංවෙයි. මල් සමූහයෙන් නැගෙන සුගන්ධය නැහැයට දැනෙයි. ඒ සුවඳැති මල් යහනාවෙහි සැතපෙන්නේ 'කවදත් වරද නැති පින්කඳ' යසෝදරාවයි. කුමරු තුළ යසෝදරාව පිළිබඳ වූ අචල ප්‍රේමය පමණක් නොව ගෞරවාදරය ද මෙයින් ගම්‍යමාන වෙයි.

'සත් බඹයක් නිල් වරලස කැරකීලා' යන්නෙන් යසෝදරාවගේ සුන්දර, නිල්වන් දිගු කේශකලාපය චිත්‍රණය වෙයි. බිළිඳු රාහුල කුමරු සිටියේ මවගෙන් කිරි උරමිනි. මෙය අතිශයින්ම සංවේදනීය අවස්ථාවකි. බිරිඳ සහ දරුවා හැරයාම කෙසේනම් කළ හැකි ද? මෙම අවස්ථාව වනවිට සිදුහත් කුමරු සිටියේ කෙලෙසුන් දුරු කරගෙන නොවේ. එහෙයින් මෙවැනි මානසික ගැටුමක් ඇතිවීම අරුමයක් ද නොවේ.

පෙරුම් පුරාගෙන එන්නේ ඈත සි      ට
පතා පුතුන් දන් දුන්නේ බුදු බව      ට
කතුන් සැමට නායක පුන්සඳ ලෙස      ට
ඉතින් කතා කෙරුවොත් මගෙ බිසවුන්      ට

යසෝදරාව යනු 'කතුන් සැමට නායක පුන්සඳකි'. ලොවට සෞම්‍යාලෝකය ගෙනෙන අඳුර දුරලන 'පුන්සඳකි'. අනෙක් කාන්තාවන් තාරකා වැනිය. ඇය සියලුම කාන්තාවන් අබිබවා අග්‍ර ස්ථානයෙහි සිටින්නීය. එවන් ළඳක් හැරදමා යාමට සිදුහත් කුමරුන් තීරණය කළේ අනාදරයෙන් නොවේ. කප් සුවහස් කල් පෙරුම් පුරාගෙන පැමිණි සම්බුද්ධත්වය ලබාගෙන ලෝ සතුන් භව කතරින් එතෙර කරවීමටය.

සාගර ජලය මදි ඇඬුවා මා සින්      දා
කීකරු ලඳ ලියෙක් මේ ලෙවු තුළ ඇද්      දා
වෙන්කර අදම යන්නේ බුදුබව සින්      දා
සුන්කර කෙළෙස් දුරුකර එකසිත් පැහැ      දා

එක අඹුදරු නිසා මම කල් බැඳීම      ය
නිම නැති සතුන් සසරින් ගොඩ නැගීම      ය
මම අද මහණ වෙමි ආලය හැරීම      ය
පුදුම කුමරු රුව ඇති මගෙ රාහුල      ය

බුදුබව පතා පාරමීදම් පුරමින් සංසාර සාගරයේ සැරිසරන අවධියෙහි අනේක වාරයක් සිය සැමියාගෙන් වෙන්වීමට යසෝදරාවට සිදුවී ඇති බව මුල් පද්‍යයෙන් හෙළි වෙයි. එහෙත් ඇය නිහඬව එම දුක දරාගත්තාය. ඇය සැබවින්ම සැමියාගේ යහපතම පැතූ, කිසි දිනක සැමියා හැරදමා යාමට නොසිතූ උතුම් කාන්තාවකි. එවන් කාන්තාවක් හැරදමා මේ ගමන යන්නේ ලෞකික සැප සම්පත් පතාගෙන නොවේ. රාහුල පුතු හැරදමා යන්නේ දරු සෙනෙහස නොමැතිව නොවේ. මෙය පහසු කාර්යයක් ද නොවේ. ඒ ගමන යන්නේ 'බුදුබව සින්දා'මය.

පැතුම් බලෙන් දෙන්නා ආවේ පේ      වී
කතුන් සැමට නායක බිම්බා දේ      වී
ඉතින් සසර ඇවිදින්නේ නැත දේ      වී
ගොසින් බුදුව එනකන් සිටපන් දේ      වී

සඳුන් සුවඳ මල් අතුරපු යහන පු      රා
යොදුන් ගණන් පැතිරෙයි සුවඳ මනහ      රා
රුවින් උතුම් රුව ඇති මගෙ යසෝද      රා
ගොසින් බුදුව එන්නෙමි මම එලොවිතු      රා

සිදුහත් කුමරු යසෝදරාව අමතන්නේ 'බිම්බා' දේවි ලෙසය. ඒ ඇගේ නමයි. අටුවා ග්‍රන්ථයන්හි යසෝදරාව හැඳින්වෙන්නේ 'බිම්බා', 'කත්‍යානා' යන නම්වලිනි. යසෝදරා යනුවෙන් භාවිත වන්නට වූයේ පසු අවධියක දී විය යුතුය.

සිදුහත් කුමරු ස්ථිර අධිෂ්ඨානයකට පැමිණි ආකාරය 'ඉතින් සසර ඇවිදින්නේ නැත දේවී' යන පොරොන්දුවෙන් පැහැදිලි වෙයි. යසෝදරාව සැතපෙන යහනෙන් නැඟෙන්නේ සාමාන්‍ය මල් සුවඳක් නොවේ. සඳුන් සුවඳකි. සඳුන් යනු මහා ඖෂධයකි. ගතට සිතට සිසිලස ගෙනෙන ආලේපයකි. සඳුන් කපන කොටනවිට වඩ වඩාත් සුවඳ විහිදුවයි. මෙයින් ධ්වනිත වන්නේ යසෝදරාවගේ ගුණ සුවඳයි. එය යොදුන් ගණන් දුරට පැතිරෙයි. 'ගොසින් බුදුව එනකන් සිටපන් දේවී' යන්න ඇයට දුන් සැනසිලි වදනකි. ඇගේ ගුණ සුවඳ සඳුන් සුවඳට සමාන කිරීම ගුණවත් සැමියෙකුගෙන් ගුණවත් බිරිඳකට ලැබිය හැකි උසස්ම ඇගයීමයි. ජනකවියා සිදුහත් කුමරුගේ සිත විවරණය කරන්නේ සිත විනිවිද දුටු මනෝවිද්‍යාඥයෙකු ලෙසය. සිදුහත් කුමරු මසින් ලෙයින් පිරි සජීවී චරිතයකි.

ජනකවියා යසෝදරාවගේ මනස නිරූපණය කරන්නේ ද සජීවී ලෙසය. සැමියා තමා සහ පුතු හැරගිය පුවත යසෝදරාවට දැනගැනීමට ලැබෙන්නේ පසු දින විය යුතුය. පෙරළා පැමිණි චන්න ඇමතිගේ විස්තර කථනයෙන් විය යුතුය. එය කාන්තාවකට විඳින්නට සිදුවූ ඉතා ශෝකජනක සිදුවීමකි.

කෙසේ වුව ද සිදුහත් කුමරු ගිහිගෙය හැර යන බවට අනාවැකි පළවූයේ ඔහු බිළිඳු වියෙහි සිටියදීමය. 'සිද්ධාර්ථ' යන නම ලැබුණේ ද එනිසාය. සුදොවුන් රජු රම්‍ය, සුරම්‍ය, සුබ යන මාලිගා කරවා රෝ බිය, මරණ නැති 'සුරපුරයක්' නිර්මාණය කළේ ද තම පුත්‍රයා ගිහිගෙයි රඳවා ගැනීමටය. එහෙත් එය ව්‍යර්ථ විය. ඔහු මෙලොව ඉපදුණේ පරාර්ථය උදෙසාය. මේ සියල්ල පිළිබඳ මනා අවබෝධයක් විවාහයට පෙර සිටම යසෝදරාව තුළ තිබෙන්නට ඇත.

කාරණාව බුදුවෙනවා ලකුණු දැ      නේ
නෑර කැටුව ආවා මම හිමිසඳ      නේ

ජ්‍යොතිෂ ශාස්ත්‍රය ඉහළින් විශ්වාස කළ එදා දඹදිව සමාජයෙහි හැදුණු වැඩුණු යසෝදරාව සිදුහත් කුමරු සමග විවාහ වූයේ ආදරයට මුල් තැන දෙමින් බවට මෙය කදිම සාධකයකි. සමහරවිට තමා හැරදමා යාහැකිය යන සැක සාංකාවක් ඇගේ යටි සිතෙහි තිබෙන්නට ඇත. ජනකවියා යසෝදරාවගේ සිතැඟි පාඨකයා හමුවට ගෙනෙන්නේ මේ පදනමෙහි පිහිටාගෙනය.

තෙමා වැටේ මගෙ සළුපිළි නෙත් පුර      වා
අමා රසක් වන් හිමිසඳ සිහිවෙන      වා
දමා කුමරු වැඩියා මට සිහිවෙන      වා
මෙමා ඇර ලියෝ ලෙව් තුළ ඇද්ද ත      වා

සැමියා තමා හැරගිය පුවත කණ වැකුන ද ඇය ඉකිබිඳ හැඬුවේ නැත. කෝපයෙන් වියරු වූයේ ද නැත. 'තෙමා වැටේ මගෙ සළු පිළි නෙත් පුරවා' යන්නෙන් කඳුළු සලමින් තම දුක වාවාගත් ආකාරය ධ්වනිත වෙයි. සැමියා ඇයට 'අමා රසයකි' අමෘතය යනු දෙවියන්ට පමණක් පානය කළ හැකි අතිමධුර පානයකි. මෙය යසෝදරාව තුළ වූ බලවත් ප්‍රේමයට කදිම නිදසුනකි. සැමියා පිළිබඳ ප්‍රේමයෙන් පිරුණු ඇගේ හද තුළ කෝපයට හෝ වෛරයට මඳකුදු ඉඩක් නැත. ඇගේ හදවත පුරාගෙන සිටින්නේ ළබැඳි ප්‍රේමයයි. පති භක්තියයි.

රුව ඇති පුතුන් වැදුවා මම වැරදී      ද
රුව ගුණ තේජසක් මගෙ අඩු වුනා ව      ද
ගරුසරු නැති කමක් මාතින් යෙදුනා      ද
මරුබිඳ බුදු වෙන්ට සීනෙන් පෙනුනා      ද

සැමියා තමා හැරදමා යාමට තමාගෙන් යම්කිසි වරදක් හෝ සම්මාදමක් සිදුවී තිබේදැයි ඇය ප්‍රශ්න කරයි. රුව ඇති පුතෙකු බිහිකිරීම වරදක්ද? ගරුසරු නැති වචනයක්වත් කියැවී තිබේද? නොඑසේනම් මාර පරාජය කොට බුදුවීමට හීනෙන් පෙනුණේද? ඇගේ මානසික ඝට්ටනය ජනකවියා නිරූපණය කොට ඇත්තේ සජීවී ලෙසය. සිතන පතන, දුක හඳුනන සැබෑ කාන්තාවකට විනා මෙසේ සිතිය නොහැකිය. කාන්තාවක් බිහිවීම අවසනාවක් කොට සැලකූ, වැන්දඹුවක් වීම සහ සැමියා හැර යාම සමාජයෙන් කොන් කිරීමට තරම් හේතු වූ එදා දඹදිව සමාජය මෙහි ලා සැලකිල්ලට භාජන විය යුතුය. මෙකී කුමන හේතුවක් නිසා වුව ද සැමියා පිට වරදක් පැටවීමට ඇය මොහොතකටවත් සිතුවේ නැත.

10 වන පිටුව බලන්න

# ජාත්‍යන්තර වෙසක් උළෙල




එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වයෙන් වාර්ෂිකව සංවිධානය කරන ජගත් වෙසක් දින උළෙල මෙවර ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විට සූදානම් වෙමින් පවතී. මෙවර ජගත් වෙසක් උළෙල 14 වෙනි වරට පැවැත්වෙන අතර මින් පෙර මෙම උළෙල වසර 11 ක් තායිලන්තයේද වසර 2 ක් වියට්නාමයේද පවත්වා ඇත.

ජාත්‍යන්තර වෙසක් උළෙල මැයි මස 12, 13 හා 14 යන දිනවල කොළඹ සහ මහනුවරදී පැවැත්වීමට නියමිතව ඇත.

මෙහි සමාරම්භක උළෙල සහ ලෝක බෞද්ධ සමුළුව කොළඹ ජාත්‍යන්තර බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතාගේ ප්‍රධානත්වයෙන් මැයි මස 12 වෙනි දින පැවැත්වේ.

ජාත්‍යන්තර වෙසක් උත්සවයේ සමාප්ති උළෙල මැයි 14 වෙනිදා නේපාල ජනාධිපතිනියගේ ප්‍රධානත්වයෙන් මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාළිගාවේදී පැවැත්වෙනු ඇත. මෙම උළෙල සඳහා රටවල් 17 ක රාජ්‍ය නායකයන් සහභාගි වීමට නියමිතව ඇති අතර ලොව බෞද්ධ රටවල් රැසක නියෝජිතයන්ද සහභාගි වනු ඇත.

ජාත්‍යන්තර වෙසක් උළෙල නිමිත්තෙන් විශේෂ දළදා ප්‍රදර්ශනයක්ද සංස්කෘතික සංදර්ශනයක්ද පැවැත්වෙන අතර ප්‍රධාන අංගවලින් සමන්විත පෙරහරක්ද වීදි සංචාරය කිරීමට නියමිත වේ.

# ඉන්දීය - ශ්‍රී ලංකා ගිවිසුම

ශ්‍රී ලංකා අගමැති රනිල් වික්‍රමසිංහ සහ ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි අතර පසුගියදා ඉන්දියාවේ නවදිල්ලි නුවර හයිද්‍රාබාද් මන්දිරයේදී පැවති සාකච්ඡාවලින් පසුව දෙරටටම සම ප්‍රතිලාභ හිමිවන ඉන්දීය-ශ්‍රී ලංකා ගිවිසුමකට අත්සන් තැබූ බව අගමැති කාර්යාලය නිවේදනය කර සිටී.

මෙම ගිවිසුමෙහි ද්‍රව ස්වභාවික වායු නිෂ්පාදන, සූර්ය බලාගාර ස්ථාපිත කිරීම, ත්‍රිකුණාමලය නගරය, වරාය හා ආර්ථික කලාප සංවර්ධනය කිරීම, මාර්ග සංවර්ධනය, දුම්රිය සේවා නවීකරණය, බහාලුම් පර්යන්ත කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන, ජල කළමනාකරණ ආදි ක්ෂේත්‍ර ගණනාවක් අන්තර්ගතව ඇත.

මෙම ගිවිසුම සඳහා ඉන්දියානු පාර්ශ්වයෙන් එරට විදේශ ඇමතිනී ශුෂ්මා ස්වරාජ් අත්සන් තබා ඇති අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම අත්සන් තබා ඇත.

මේ වන විට ඉන්දියා-ශ්‍රී ලංකා ගිවිසුම සම්බන්ධයෙන් රට තුළ විවිධ වූ මතවාද ඇතිවෙමින් පවතින අතර විශේෂයෙන්ම ත්‍රිකුණාමලය තෙල් ටැංකි හා වරාය සම්බන්ධව එම ගිවිසුමෙහි සඳහන්ව තිබීම පිළිබඳව ආන්දෝලනාත්මක තත්ත්වයක් හට ගනිමින් ඇත.

මෙම ගිවිසුම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කරනවාදැයි පාර්ලිමේන්තුවේදී නැගුණු ප්‍රශ්නයකට පිළිතුරු දුන් අගමැති රනිල් වික්‍රමසිංහ පැවසුවේ එය එසේ කරන බවයි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අගමැතිවරයා පවසා ඇත්තේ දෙරට අතර හවුල් ව්‍යාපාරයක් ලෙසින් ත්‍රිකුණාමලය වරාය හා තෙල් ටැංකි ඇතුළත් ස්ථාන පාලනය කිරීමට සැලසුම් කර ඇති බවත් මෙයින් ජාතික ආරක්ෂාවට තර්ජනයක් එල්ල වීමට ඉඩ නොදෙන බවත්ය.

කෙරවලපිටියේ මෙගාවොට් 500 ක එල්.එන්.ජී බලාගාරයක් ඉදිකිරීමත්, හවුල්කාර සමාගමක් යටතේ තෙල් ටැංකි සංවර්ධනය කිරීමත්, යාපනය සිට දඹුල්ල දක්වා මාර්ග සංවර්ධනය කිරීමත් සඳහා මෙවැනි ගිවිසුමක් අත්සන් කළ බව අගමැතිවරයා පවසා තිබුණි.

# ප්‍රමුඛතා මං තීරු සහ ඉලෙක්ට්‍රික් බස්



කොළඹ නගරය තුළ ඇති වාහන තදබදය අවම කිරීම සඳහා අත්හදා බැලීමේ වැඩපිළිවෙළක් ලෙස ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් හඳුන්වා දීමට රජය කටයුතු සූදානම් කොට ඇත.

බස්නාහිර පළාතේ පදිංචිකරුවන් විසින් දිනකට මහාමාර්ග භාවිත කරමින් සිදුකරන ගමන් වාර ගණන මිලියන 10 ඉක්මවන අතර මෙම බොහෝ ගමන් වාර සඳහා තම තමන්ගේ පෞද්ගලික රථ වාහන හෝ කුලී රථ භාවිත කිරීමට බොහෝ දෙනෙකු හුරු වී සිටී. මෙය අවම කිරීමට නම් පොදු ප්‍රවාහන සේවාව ප්‍රමිතිකරණයකින් යුතුව ඉහළ නැංවිය යුතු බව රජයේ අදහසයි. ඒ අනුව මෙවැනි වැඩපිළිවෙළවල් තුළින් ඊට අනුබලයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අත්හදා බැලීමක් වශයෙන් පසුගියදා රාජගිරිය හන්දියේ සිට ආයුර්වේද හන්දිය දක්වා සිදුකළ බස් රථ ප්‍රමුඛතා මංතීරු වැඩ සටහන සාර්ථක වූ බව දක්වා සිටින රජය මෙය ස්ථිර වැඩපිළිවෙළක් ලෙස කොළඹ නගරයේ මාර්ග රැසකට යොදාගැනීමට අදහස් කෙරේ. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියද හිමිව ඇති මෙම වැඩපිළිවෙළ කාර්යබහුල වේලාවන්හිදී පහත සඳහන් මාර්ග කොටස්වල ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- ගාලු පාරේ මොරටුව සිට රත්මලාන දක්වා වැල්ලවත්ත දක්වාද වැල්ලවත්ත පාලමේ සිට කොල්ලුපිටිය දක්වාද කොළඹ දෙසට විහිදුණු ප්‍රමුඛතා බස් රථ මංතීරුව
- පාර්ලිමේන්තු පාරේ පාර්ලිමේන්තු හංදියේ සිට රාජගිරිය, බොරැල්ල, මරදාන සහ පිටකොටුව හරහා කොළඹ කොටුව දක්වා කොළඹ දෙසට විහිදුණු ප්‍රමුඛතා බස් රථ මංතීරුව
- කොළඹ චිත්තප්පලම් ඒ. ගාඩිනර් මාවතේ ගුවන් හමුදා වටරවුමේ සිට පිටකොටුව දක්වා කොළඹ දෙසට විහිදුණු ප්‍රමුඛතා බස් රථ මංතීරුව
- තුම්මුල්ල හන්දියේ සිට කෞතුකාගාර හන්දිය දක්වා කොළඹ දෙසට විහිදුණු ප්‍රමුඛතා බස් රථ මංතීරුව
- ඇස්වාට්ටුව වටරවුමේ සිට තුම්මුල්ල හන්දිය දක්වා කොළඹින් පිටතට විහිදුනු කොළඹ දෙසට විහිදුණු ප්‍රමුඛතා බස් රථ මංතීරුව

## විදුලි බස්

කොළඹ හා තදාසන්න නගරවල ජනතාවගේ ප්‍රවාහන පහසුකම් ඉහළ නැංවීම සඳහා විද්‍යුත් බස්රථ 1000 ක් ගෙන්වා ධාවනය කරවීමට කටයුතු යොදා ඇතැයි ලංකා පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමය පවසා සිටී.

උදය කාලයේදී පැය 3 ක් සඳහාද සවස් වරුවේ පැය 3 ක් සඳහාද මෙම බස් රථ ධාවනය කරවීමට අදහස් කර ඇති අතර රාත්‍රී 8 සිට 12 දක්වා විශේෂ සේවාවක් සැපයීමටද කටයුතු යොදන බව පැවසේ. සුඛෝපභෝගී සේවාවක් ලෙස සැලකෙන මෙම බස් රථවල ගමන් කරන මගීන්ගෙන් සාමාන්‍ය ගාස්තු මෙන් දෙගුණයක් අය කිරීමට සිදුවන බව වාර්තා වේ.

මේ වන විට විද්‍යුත් බස් රථ 3 ක් සාම්පල ලෙස චීනයෙන් ආනයනයට කටයුතු යොදා ඇති බව බස් රථ හිමියන්ගේ සංගමය පවසයි.

# හලෝ ඒකාබද්ධ කිරීමට සැලසුමක් !

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින ජංගම දුරකතන සේවා සමාගම් පහෙන් කීපයක් ඒකාබද්ධ කොට සමාගම් 3 ක් පිහිටුවීම කෙරෙහි ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අවධානය යොමුවී ඇත. ශ්‍රී ලංකාව තුළ සිටින මිලියන 20 ක ජනගහනය සඳහා ජංගම දුරකතන සේවා සමාගම් 3 ක් පමණක් තිබීම ප්‍රමාණවත් වන හෙයින් මෙම පියවර ගැනීමට කටයුතු කරන බවත් ඒ සඳහා එම සමාගම් අතර සාකච්ඡා පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් වාර්තා වේ.

මෙම ඒකාබද්ධය මගින් රට තුළ සංසරණය වන අතිවිශාල සිම් කාඩ් ප්‍රමාණය මගින් ඇතිවන ගැටලු අඩු කර ගැනීමට මෙන්ම ජනතාවට ගුණාත්මක බවින් ඉහළ දුරකතන සේවාවක් ලබාදීමටත් අපේක්ෂා කෙරේ.

මෙහිදී පෞද්ගලික දුරකතන සමාගම් එකක් හෝ දෙකක් රජයට සම්බන්ධ දුරකතන සමාගම් යටතේ පරිපාලනය සඳහා යොමු කිරීමට අදහසක් පවතින බව වාර්තා වේ.

# රජයේ ණය වැඩි වේ !

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් 2016 වසර සඳහා නිකුත් කරනු ලැබූ නවතම වාර්තාවට අනුව පසුගිය වසරේදී රජයේ මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 8840 කින් ඉහළ ගොස් ඇති බව පැවසේ. ඒ අනුව, 2015 වසර අවසානයේදී රුපියල් කෝටි 850320 ක් ලෙස පැවති සම්පූර්ණ රාජ්‍ය ණය ප්‍රමාණය 2016 වසර තුළදී රුපියල් කෝටි 938730 ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම නවතම මහ බැංකු වාර්තාවට අනුව සම්පූර්ණ රාජ්‍ය ණය ප්‍රමාණය තුළ ඇති මුළු දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 5341.5 ක් දක්වා සියයට 7.7 කින් ඉහළ ගොස් ඇති අතර මුළු විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 4045.8 ක් දක්වා සියයට 14.2 කින් ඉහළ ගොස් ඇත.

# පොලිසිය පොලිෂ් වෙයි ?

ශ්‍රී ලංකාවේ පොලිස් නිලධාරීන්ගේ නිල ඇඳුමේ වර්ණය වෙනස් කිරීමට සූදානමක් පවතින බව වාර්තා වේ. ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය සඳහා යෝජිත නිල ඇදුම සඳහා සුදුසු වර්ණය තේරීමට වර්ණ 05 කින් යුත් ඇඳුම් යෝජනා කර අදහස් විමසීමක් ආරම්භ කිරීමට පොලිස්පතිවරයා විසින් කටයුතු යොදා ඇත. නිල ඇඳුමේ නව වර්ණ ලෙස සුදු කමිසය සහ කළු කලිසම, ලා නිල් පැහැ කමිසය සහ තද නිල් කලිසම, ලා අළු පැහැ කමිසය සහ තද අළු කලිසම, ලා දුඹුරු පැහැ කමිසය සහ කාකි කලිසම හෝ දැනට පවතින කාකි කමිසය සහ කාකි කලිසම යෝජනා කොට ඇත.

මේ සඳහා මැති ඇමතිවරුන්ගෙන් මෙන්ම රජයේ උසස් නිලධාරීන්ගෙන්ද වෙන වෙනම කරුණු විමසීම සිදුකොට ඇති අතර බහුතර මතය අනුව ශ්‍රී ලංකා පොලිසියේ අනාගත නිල ඇඳුම තීරණය වනු ඇත.

මෙම නිල ඇඳුම වෙනස් කිරීම සම්බන්ධයෙන් මැති ඇමතිවරුන්ට හා රජයේ ඉහළ නිලධාරීන්ට පොලිස්පතිවරයා විසින් ලිපියක් යොමු කරමින් කරුණු 15 ක් විමසා ඇත. අධිරාජ්‍යවාදීන් විසින් කාකි ඇඳුම උණුසුම් කලාපීය රටවලට හඳුන්වා දුන්නද මේ වන විට ලොව බොහෝ රටවල් කාකි ඇඳුම භාවිතයෙන් ඉවත් කර ඇති බව එම ලිපියේ අවධාරණය කොට ඇත.

# දූෂණ මර්දන කාර්යාලය අවලංගු කෙරේ

ශ්‍රී ලංකාවේ පවතින රජය බලයට පත්වීමත් සමග ආරම්භ කරනු ලැබූ දූෂණ මර්දන කමිටු කාර්යාලය ලබන අගෝස්තු මාසයෙන් පසු අවලංගු කිරීමට රජය තීරණය කොට ඇත.

මෙම කමිටු කාර්යාලය නඩත්තු කිරීම සඳහා වසරක් පාසා වෙන් කරනු ලබන මුදල්වලින් නිසි ප්‍රයෝජනයක් නොවන බවත් කමිටු කාර්යාලයේ රාජකාරි කරන ඇතැම් නිලධාරීන් සිය බලතල අභිභවා කටයුතු කරන බවත් පෙනී ගොස් ඇති නිසා මෙම කාර්යාලය අත්හිටුවීමේ පියවර ගැනීමට රජය තීරණය කොට ඇත. දූෂණ මර්දන කමිටු කාර්යාලය මගින් සිදුකරන බොහෝ කාර්යයන් පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය සහ පොලිස් ස්ථාන මට්ටමින් කළ හැකි බැවින් මෙවැනි කාර්යාලයක් නඩත්තු කිරීම අනවශ්‍ය වියදමක් බව රජය පවසා සිටියි. එසේම මෙවැනි කාර්යාලයක් පිහිටුවීමෙන් රජය බලාපොරොත්තු වූ සේවාව ඉටු වී නොමැති බවද රජය පවසයි.

Dasatha
2017 මැයි May 2017

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editors - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Associate Editors - Nandana Prasadh
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada.
«Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

# මැයි දිනයේ එදා සහ මෙදා

මැයි දිනය යනු ලෝකය පුරාම වැඩ කරන ජනතාවගේ වාර්ෂික සැමරුම් දිනය ලෙස සලකනු ලැබේ. මේ දිනය රජයේ නිවාඩු දිනයක්ද කොට සමරනු ලබන රටවල් ලෝකය පුරා බොහෝය. එහෙත් මැයි දිනය බිහිවූ එදාත් මෙදාත් අතර පාටෙහි අරමුණෙහි හා සටනෙහි ඇති වී තිබෙන වෙනස පිළිබඳව ආපසු හැරී බැලීමට කිසිවෙකු තුළ උනන්දුවක් ඇතිවන බවක් නම් නොපෙනේ.

එදා ඇමරිකාවේ චිකාගෝ නුවරදී තම අයිතිවාසිකම් ඉල්ලා හඬ නැගූ කම්කරුවන්ට පාලකයන් තැබූ වෙඩි පහරවලින් සිදුරු වූ ඔවුන්ගේ සිරුරුවලින් ගැලූ ලෝහිත ධාරාවන්ගෙන් තෙත් වූ ඔවුන් ඇඳ සිටි රත් පැහැ ගත් ඇඳුම් රතු කොඩි බවට පත් වූ බවත් එතැන් සිට 'රතු කොඩිය' මැයි දිනයේ උපත හා අරමුණ කියා පාන සංකේතය වූ බවත් කියනු ලැබේ. එතැන් සිට එම රතු කොඩිය වැඩ කරන ජනතාවගේ අහිමි හිමිකම් පිළිබඳව නැතහොත් දිනාගැනීමට ශේෂව තිබෙන අයිතිවාසිකම් පිළිබඳව සිටි, සිටින හා මතු එන පාලකයන් අවදි කරවන එකම ඉඟිය බවට පත් විය. එහෙත් අද ඒ රතු කොඩිය නිල්, කොළ, කහ, දම්, තැඹිලි ආදි විවිධ පැහැ ගැන්වී තිබීම එදා සහ අද දක්නට ලැබෙන ප්‍රධාන වෙනසයි. තවමත් මෙයට එක් වී නොමැත්තේ කළු සහ සුදු පැහැ පමණි. ඒ දෙපැහැය මැයි දිනයේදී ඇණ කොටා ගන්නා වැඩ කරන ජනතාවගේ මරණ සඳහා ගැනීමට තබා ඇති සේය. පැහැය කුමක් වුවත් කම් නැතැයි කෙනෙක් කියන්නට පුළුවන. එහෙත් එදා එය රතු පැහැ ගත්තේ පාලකයන්ට එරෙහි බලවේගයක අරුත සාකල්‍යයෙන්ම පළ කරනු සඳහා බව සිහිපත් කළ මනාය. රතු පැහැය මිස වෙනත් කිසිදු පැහැයක් ලෝකයේ කිසිදු රටක මැයි දිනයේදී භාවිත නොවන බවද සැලකුව මනාය.

දෙවැන්න නම් එදා මැයි දිනය ලෝකයේ වැඩ කරන ජනයා එකට බැඳලන, එකට එක් කරන, ඔවුන්ගේ සමගිය ප්‍රාර්ථනා කළ දිනයක් වුවද අද මැයි දිනය වැඩ කරන ජනයා එකිනෙකාට එරෙහිව, වෛරය ගොඩ නගන, ඔවුන් බෙදාලන දිනයක් බවට පත්ව තිබීමයි. මග දිගේ ඔවුන් ඇණකොටා ගන්නා දිනයක් වී තිබීමයි. එකිනෙකාට ආවැඩීම විනා තම හිමිකම් දිනාගැනීම පිළිබඳ අරමුණක් ඔවුන් සතුව නොතිබීම එයට හේතුවයි.

තෙවැන්න නම් එදා සිටි, අද සිටින, මතුවට එන පාලකයන්ට එරෙහිව සටන් කළ ඔවුන් තමන්ට නොදෙන හිමිකම් ලබාදෙන්නැයි බල කළ වැඩ කරන ජනතාවගේ දිනය වූ මැයි දිනය අද සිටින, සිටිය හා මතු එන පාලකයන්ට ආවඩන, ඔවුන්ට ජය වේවා යි හඬ නගන දිනයක් වී තිබීමයි. මෙහි දෙවැන්න ලෙස දැක්වූ වැඩ කරන ජනයාගේ බෙදීම පදනම්ව ඇත්තේද මේ තෙවැනි කරුණ මතමය.

සිවුවන කරුණ නම් සිටි, සිටින හා මතු එන්නට සිටින පාලකයින් වැඩ කරන ජනයාට තමන් කළ, දැනටමත් කරන හා මතුවටත් කරන්නට සිටින අකටයුතුකම් සියල්ල අමතක කරන දිනයක් හැටියට මැයි දිනය පත්කරගෙන තිබීමයි.

පස්වන කරුණ නම් වැඩකරන ජනතාව බෙදා වෙන් කොට විවිධ පාටවලින් පවත්වනු ලබන එකම මැයි දින රැළියක වත් වෘත්තීය සංගම්වල අනුශාසකයින් යැයි කියාගන්නා දේශපාලනඥයින්ට මිස වැඩකරන ජනතා නියෝජිතයින්ට වේදිකාවේ අසුනක් හෝ කතාවක් පැවරී නොතිබීමයි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ එකම මැයි දින රැළියකවත් වැඩකරන ජනයාගේ අදහස් පළ නොවීමයි. කොළ පාටට නිල් පාටත්, නිල් පාටට කොළ පාටත්, නිල් පාටට නිල් පාටත් ආදි වශයෙන් ඇණුම් බැණුම් හුවමාරුවකට දේශපාලනඥයින්ගේ කතා සීමා වී තිබේ.

අවාසනාව නම් මේ කිසිවක් වැඩ කරන ජනතාවට කල්පනා නොවීමයි. දේශපාලනඥයින්ගේ අතකොළු බවට පත්වී මෙම දිනයේදී බස්වලින් රැලි පවත්නා තැන්වලට ගෙන්වීම, මුදල් හෝ අරක්කු මගින් සන්තර්පණය කිරීම ආදි තාවකාලික පටු රැවටිලිවලට හසුවී තම හිමිකම, තම සමගිය බාල්දු කිරීමයි. සිටි, සිටින හා මතු එන්නට බලාපොරොත්තු වන කවුරු කවුරුත් තම ඔළුවට අත සෝදන බව, ඔවුන් කවුරුනුත් ඉදිරි ඡන්දයකදී තමන් පාවිච්චි කරන්නට උත්සාහ ගන්නා බව තේරුම් නොගැනීමයි.

සමගියෙන් යුතුව, තමන්ට මතු ලබාගැනීමට ඇති හිමිකම් පිළිබඳව පොදු එකඟතාවකට පැමිණ සියලු වැඩ කරන ජනයා එකම තැනක රැස් වන්නට තරම් හැකි කමක්, එකම රතු පැහැති කොඩියක් ලෙළ දෙවන්නට හැකි කමක් ඇති කරගත හොත්, සිටි හෝ සිටින හෝ මතු එන පාලකයින්ගෙන් තම හිමිකම් ලබාගන්නට ඇති එකම මග එය බව සියලු වැඩ කරන ජනයා තේරුම් ගන්නා දිනයක් ඇති කර ගතහොත් එම දිනය සැබෑම මැයි දින සැමරුම ලෙස සැලකිය හැකි බව ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාව කවදා හෝ තේරුම් ගනීදැයි සිතීම දුෂ්කරය.

# කුණු කන්දට යට වූ ශ්‍රී ලංකාවේ දේශපාලනඥයෝ

■ දූරදර්ශි විසිනි

'දේශපාලනඥ' යන වචනයෙහි ශාස්ත්‍රීය විග්‍රහය නම් දේශපාලන + ඥ යන්නයි. එහි 'ඥ' යන්නෙන් අර්ථවත් වන්නේ 'දන්නා අය' යන්නයි. එවිට දේශපාලනඥ යන්නෙහි අරුත 'දේශපාලනය දන්නා අය' යනුයි. එහෙත් ලංකාවෙහි මෑතකදී දේශපාලනඥයන් හා බැඳුණු සිද්ධීන් හා සසඳන කල මේ විග්‍රහයට වෙනස් ස්වරූපයක් ගන්වන්නට සිදුවී තිබේ. එනම්, 'දේශපාලන + අඥ' යනුවෙනි. එවිට 'දේශපාලනය නොදන්නා අය' යන අරුත ඉන් ධ්වනිත වෙයි. දේශපාලනය දන්නා අය නම් කරන්නේ යම් ප්‍රශ්නයක් මතු වූ විට එය යළි පැන නොනැගෙන ලෙස සහමුලින්ම විසඳාලීමයි. එහෙත් ලංකාවේ දේශපාලනඥයන් කරන්නේ එයට තාවකාලික පැලැස්තරයක් යොදා යට ගසාලීමයි. එහි ප්‍රතිඵලය වන්නේ පෙර තිබුණු ප්‍රශ්නය මෙන් සිය දහස් ගුණයක ගැටලු සහගත ප්‍රශ්නයක් යළි මතු වීමයි. කොස්ගම හමුදා කඳවුර පුපුරා යාම, අරණායක සාමසර කන්දේ නාය යාම මීට හොඳම සාක්ෂි වේ. මෙය වඩාත්ම අර්ථවත් වන මෑත කාලීන සිද්ධිය නම් 'මීතොටමුල්ල කුණු කන්ද' පිළිබඳ සිද්ධියයි.

මේ කුණු කන්ද පිහිටි මීතොටමුල්ල භූමිය පෙර කුණු සහිත වූවක් නොවීය. එය ජනතාව අවසරයෙන් හෝ අනවසරයෙන් මහල්, දෙමහල්, තෙමහල් නිවාස තනාගෙන සැනසිල්ලේ ජීවත් වූ සෞම්‍ය ප්‍රදේශයක් විය. මෙහි රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ කාලයේදී 'දහම් පුරයක්' ද තිබුණු බව කියති. කොළඹ නගරයේ කුණු එකල කඳු ගැසුයේ කොළඹ-නුවර සහ කොළඹ-හලාවත ආදි ප්‍රධාන මාර්ග යන්ට යාව තිබුණු ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය අසල බ්ලූමැන්ඩල් ප්‍රදේශයේය. ඒ අසල මාර්ගයෙන් ගමන් ගන්නවුන්ට නාසා හකුළුවාගෙන යාමට සිදුවීමත් ප්‍රදේශවාසීන්ගේ දැඩි විරෝධතාවත් නිසා එහි කුණු කඳු ගසන්නට නොහැකි තත්ත්වයක් උදා විය. ඒ සමගම එදා එහි නිවීමට දුෂ්කර වූ ගින්නක්ද හට ගත්තේය. මේ අවස්ථාවේදී එදා පැවති රජය අගවිනිසුරුව සිටි සරත් එන්. ද සිල්වාගෙන් ලබාගත් අධිකරණ තීන්දුවක්ද ප්‍රයෝජනයට ගනිමින් මීතොටමුල්ලේ කුණු කඳු ගසන්නට වූයේ එයට පිළියමක් ලෙසිනි. 'අතීසාරයට අමුඩය ගසන්නාක්' මෙන් 'පය බරවායට කර බෙහෙත් බඳින්නාක්' මෙන් දේශපාලන+අඥයෝ මීතොටමුල්ල ඒ සඳහා තෝරා ගත්තෝය. එදා අධිකරණ තීන්දුවෙහි වූයේ මීතොටමුල්ලේ අක්කර දෙකක භූමි භාගයකට කෙටි කාලයක් පමණක් කුණු දමන්නටය. එහෙත් ඉන් ප්‍රයෝජන ගත් පැලැස්තරවාදී දේශපාලනඥයෝ 2009 සිට 2017 දක්වාම නොකඩවා වසර 8 ක් අක්කර 22 ක් පුරා අඩි 300 ක් උස කුණු කන්දක් හැදෙන තුරුම එහි කුණු පිරවූහ.

ලෝකයේ කුණු පිළිබඳ ප්‍රශ්නය අද ඊයේ පැන නැගුණක් නොවේ. ජනයා සාමූහිකව ජීවත් වන ස්ථානයන්හි කුණු ඇති වීමත් ඒවා බැහැර කිරීමේ අවශ්‍යතාවත් සාමාන්‍ය දෙයකි. එදා සිටම නාගරික වූ ලෝකය මෙය තේරුම් ගෙන සිටියේය.

ශ්‍රී ලංකාව ගතහොත් ශ්‍රී ලංකාවේ කුණු පිළිබඳ ප්‍රශ්නය ක්‍රි.පූර්ව යුගය තෙක් දිව යයි. ප්‍රථම වරට අනුරාධ ග්‍රාමය 'අනුරාධපුරය' බවට පත් කොට නගරයක් නිර්මාණය කළේ ක්‍රි. පූර්ව යුගයේ ජීවත් වූ පණ්ඩුකාභය රජුය. නගරය ජනාකීර්ණ වත්ම එහි කුණුවලින් සිදුවන අපවිත්‍රතාව හා ගැටලු දුටු දේශපාලන+ඥයකු වූ පණ්ඩුකාභය රජතුමා ඒ සඳහා 'පුරශෝධක, වච්චශෝධක' නම්වලින් යුත් වෙනමම කසලශෝධක පිරිස් පත් කොට ඒ ප්‍රශ්නයට විසඳුම් ඇති කළ බව මහාවංශයෙහි සඳහන්ව තිබේ.

ඒ එදාය.

බ්ලූමැන්ඩල් කුණු කන්ද මීතොටමුල්ලට ගෙන ගොස් "අපි ප්‍රශ්නය විසඳුවා" යයි පසු කාලයේ ලංකාවේ සිටි දේශපාලන+අඥයින් උදම් ඇනුවාට සැක නැත. එදා එහි නිවාස තනාගෙන සැනසිල්ලේ ජීවත් වූ පණ ඇති මිනිසුන් (මොවුන්ට දේශපාලනඥයින් කියන්නේ 'ජනතාව' කියාය) ගැන තුට්ටුවකටවත් ඔවුහු නොතැකූහ. එදා පටන්ම ඒ අහිංසක ජනතාව කුණු නිසා තමන් පත්ව ඇති තත්ත්වය ලිපි ලේඛන, සංදේශ, උද්ඝෝෂන ආදි විවිධාකාරයෙන් දේශාපාලනඥයින්ට පෙන්වා දුන්හ. ඒ සියල්ල බීරි අලින්ට වීණා වැයීමක් පමණක්ම වූයේය. දවසින් දවස කුණු කඳු ගැහෙන හැටි බලමින් කඳුළු සැලීම හැර ඔවුන්ට කළ හැකි වෙනත් දෙයක් නොවීය. ඡන්දයක් ළං වන විට දේශපාලනඥයින් කළේ නහය වසාගෙන ඒ පෙදෙසේ සැරිසැරීමත් කුණු ඉවත් කිරීමට

22 වන පිටුව බලන්න



# පුරන් වූ පින්කෙතට දෙවියන් වැඩම වීම



■ මාර්ටින් වික්‍රමසිංහ

**හෙළයේ මහා ප්‍රාඥයා සේ සම්භාවනාවට ලක් වූ මාර්ටින් වික්‍රමසිංහ සූරින්ගේ 127 වැනි ජන්ම දින සැමරුම මැයි මස 29 වෙනි දිනට යෙදී තිබේ. එතුමන් විසින් එදා ලියන ලද රසවත් සේම හරවත් ලිපියක කොටස් කිහිපයක් මෙසේ පළ කෙරෙනුයේ මේ මහා බුද්ධිමතාට ගරු පිණිසය.**

වෙනස් නොවන නිත්‍ය ආත්ම ධර්මයක් නැතැ යි අදහන බෞද්ධයන් කතරගම, විෂ්ණු, විබිසෙන් ආදි දෙවියන්ට ධනය, බලය, ලාභය පතා වැඳීම හා පඬුරු පිදීම බුදු සමයත් හින්දු සමයත් දෙකම කෙලසන ලාමක පිළිවෙතකි. එය බුදුන් වහන්සේ බැහැර කළ තිරශ්චීන විද්‍යාංගයක්, කෙලෙස් වැඩීමට උපයෝගී කොට ගැනීමක් වන බැවිනි.

හින්දුකාරයකු විෂ්ණු වන්දනා මානනය කිරීම කෙලෙස් වැඩීමට නොව තැවීමට මඟ පාදන්නකි. ඔහු විෂ්ණු පුදන්නේ වෙනස් නොවන, නොමැරෙන ලෝකෝත්තර ධර්මය පිළිබඳ සංකේතයක් ලෙස අදහන හෙයිනි. ඒ ඇදහීම නිසා දැඩි භක්තියක්, ප්‍රේමයක් ඔහු තුළ හට ගනියි. එහෙයින් විෂ්ණු පුදන අවස්ථාවෙහි ඔහු තුළ පුණ්‍ය චේතනාව හටගනියි. ඔහුගේ සිත පහන් වෙයි. මමත්වය තුනී වෙයි.

බෞද්ධයා විෂ්ණු පරම සත්තාව පිළිබඳ සංකේතයක් ලෙස නොසලකයි. විෂ්ණු, කතරගම ආදි දෙවිවරුන් යදින පුදන බෞද්ධයා එසේ කරන්නේ ධනය, බලය, කීර්තිය ලබන ලෝභ චේතනාවෙනි. නොඑසේ නම් තමාගේ හතුරකු වනසන අදහසිනි. බුදුනුවකු කතරගම දෙවියන්ට පඬුරු පිදීම හා වැඳීම පොලිස් නායකයාට අල්ලස් දීම හා වැඳීම වැන්න. එය පුණ්‍ය චේතනාව නසන පිළිවෙතකි. එහෙයින් කෙලෙස් වඩන්නකි.

නූගත් ගැමියා රෝගාතුර දරුවා මරණයෙන් බේරාගනු පිණිස තොවිල් පවිල් කරවයි. යකැදුරා ගොක්කොළ, කෙහෙල් පතුරු, හබරල කොළ හා ලී කෝටු ද ගෙන හූනියම් මැදුර හෝ සන්නි යකුගේ මඩුව හෝ තනයි. පන්දමෙන් හා විලක්කුවෙන් ඒ සැරසිලි එළිය කරයි. කිහිළි ගැසීමෙන්, දුම්මල පිලිස්සීමෙන් බෙර වැයුමෙන් හා නැටුමෙන් තොවිලයට ආදි කාලීන ගූඪ කලා වේශයක් දෙයි. තොවිලය මෙලොව ඉක්ම වූ ගුප්ත ලෝකෝත්තර ධර්මයක් කෙරෙහි මිනිසුන්ගේ හැඟීම් පුබුදන ආදිකාලීන පිළිවෙතකි.

තොවිලය වූ කලී කලාව, තිරශ්චීන විද්‍යාව හා ගූඪ ආගමික පිළිවෙත් ද සංකලනයෙන් උපන්නකි. තොවිලය කරවන ගැමියා බලාපොරොත්තු වන්නේ ධනය, බලය, ලාභය නො වේ. තම දරුවා මරණයෙන් බේරා ගැනීමෙන් සිදු වන පරාර්ථ සිද්ධියයි.

තොවිලය නිසා නූගත් ගැමියාගේ මමත්වය තුනී වෙයි. එහෙයින් දයා කරුණාව ඇතුළු ඔහුගේ පුණ්‍ය චේතනාව අවදිවෙයි. ඔහුගේ ඒ පහන් සිත පෝය දවසෙහි විහාරස්ථානයට ගොස් පහන් එළියෙන් හා සඳ රැසින් බැබළෙන ස්තූපයට බුදුරුවට සැදෑ සිතින් වඳින බෞද්ධයකු තුළ හටගන්නා පුණ්‍ය චේතනාවට නෑකම් කියන්නකි.

## පුණ්‍ය චේතනාව

මිනිස් සිතෙහි පුණ්‍ය චේතනාව නොපුබුදන තිරශ්චීන විද්‍යාවක්, සමයක්, දහමක් වෙතොත් එය තුට්ටුවක් නොවටනා ආගමකි. සියලු උසස් ආගම්වල පුණ්‍ය චේතනාව වඩන වන්දනා මානන විධියක් වී ය. ථෙර ථෙරී ගාථා, ධම්ම පදය, ජාතක කථා කියවීම් හා කියවනු ඇසීම ද පුණ්‍ය චේතනාව වඩන වන්දනා මානනයන් වීය.

අභිධර්මය ඉගැන්වීමෙන් හා දෙසීමෙන් පසු පුණ්‍ය චේතනාව වඩන ධර්ම සාහිත්‍ය හා වන්දනා මානන විධි බෞද්ධයන්ගේ සිතින් කෙමෙන් ගිලිහෙන්ට වී ය. ගම්වල පැරණි යතිවරයෝ උගත්කම් දක්කන අබිදම් දෙසීමට නොතතනා ජාතක කථාවක්, තෙර කෙනකුගේ හෝ තෙරණියකගේ චරිතයක් වස්තු කොට ගෙන බණ කීහ. ඒ බණ ඇසූ නූගත් ගැමියන්ගේ පුණ්‍ය චේතනාව පිබිද වැඩිණ.

දර්ශනය ලෝකයේ මුල අග හා ඒ පිළිබඳ හේතු ප්‍රත්‍ය ධර්මයන් සොයන්ට අනුබල දෙන අන්වීක්ෂණ ක්‍රමයකි. බුදුසමය ඊට ඉඳුරා පටහැනි විදර්ශනා මාර්ගයකි. විදර්ශනා මාර්ගය නිවන පසක් කර ගනු පිණිස ගත යුතු වැවහර මඟ මිස තතන තතනා තර්ක කරන්ට අනුබල දෙන අබිදම් මඟ නො වේ.

බුදුසමය අනික් ආගම් මෙන් ම මෙලොව ඇත්ත නොව ලෝකෝත්තර ඇත්ත සොයන්ටත් සාක්ෂාත් කරගන්ටත් ඉගැන්වෙන මාර්ගයකි. බුදුසමය 'නිවන' ලෝකෝත්තර ඇත්ත නමින් හඳුන්වයි. අනික් ආගම් පරමාත්මය, පරම සත්තාව හෙවත් ගූඪ සත්තාව (ගෝඩ් යන ඉංගිරිසි වදන 'ගූඪ' නමැති සකු වදන වැනිම ජර්මන් වදනින් බිඳුණක් ලෙස සලකනු ලැබේ) යන නම්වලින් ලෝකෝත්තර ඇත්ත හඳුන්වයි.

පුණ්‍ය චේතනාවෙන් හෙවත් ශ්‍රද්ධාවෙන් තොර ව මඟට පිවිසිය නොහැකි ය. ඕඝයෙන් එතෙර වන්නේ ශ්‍රද්ධාවෙනි. තෙරුන් හා තෙරණියන් ඕඝයෙන් එතෙර වූයේ ශ්‍රද්ධාවෙනි. ඔවුන්ගේ ශ්‍රද්ධා පුණ්‍ය චේතනා පිබිදුණේත් වැඩුණේත් බුදුන් දැකීමෙන් හා බුදු ගුණ සිහි කිරීමෙනි. මෙකල බෞද්ධයන්ට පුණ්‍ය චේතනාව වැඩිය හැක්කේ බුදු පිළිමය, චෛත්‍යය, බෝ රුක ආදි පුණ්‍ය සංකේතයන් වන්දනා මානනයෙනි. බුදුන් බමුණන් හා කළ වාද කථා නොව උන්වහන්සේගේ තෙරුන්ගේ හා තෙරණියන්ගේ උදාන වාක්‍ය, ගාථා ආදිය ලැදිව කියවීමෙනි. උගැන්මෙනි.

බුදුන් නො දෙසූ බමුණු විතණ්ඩ වාද විශේෂයක් වූ අභිධර්මය බෞද්ධයන්ගේ පුණ්‍ය චේතනාව වනසා ඔවුන් ලෝකායතිකයන් කරන්නකි. තර්කය භික්ෂූන්ට තහනම් කරන ලද විෂයයකි. අභිධර්මය තර්ක ජාලයකි. බුදුන් වහන්සේ කාලාම සූත්‍රයෙන් චින්තන නිදහස දුන්නේ සඟුන්ට නොව ගිහියන්ටයි. බුදුන් දෙසූ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසෙන සඟුන්ට ඒ නිදහස අහිමි ය. ඔවුන් පිළින දී ආර්ය මාර්ගයට පිවිසෙන බැවිනි.

අභිධර්මයත් තර්ක විතර්ක සහිත වාද කථා වැනි සූත්‍රත් උගන්වනු ලැබීම නිසා උගත් ගිහියෝ ශ්‍රද්ධාවෙන් පුණ්‍ය චේතනාවෙන් සංවේගජනක ලෙස පිරිහුණෝ ය. ආධ්‍යාත්මය පුබුදන බෞද්ධ ධර්ම සාහිත්‍ය ඇසුරු නොකරන වන්දනා මානනය ළාමක පිළිවෙතක් ලෙස බැහැර කරන උගත් බෞද්ධයන් වැඩිවීම නිසා පන්සල් පාළු වන්ට විය.

ඔවුන් පන්සල් වෙත ගෙන්වීමට අභිදම් දෙසුම් හා භාවනා විධි ඉගැන්වීම ද අරඹනු ලැබී ය. නගරයෙන් ඈත පළාත්වල විහාරස්ථානවලට පෝදා ගෑනුන් පිරිමින් අද්දනු පිණිස නාටකයට හරවන ලද බණ දෙසුම් අරඹනු ලැබී ය. යම රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව, මිළිඳු නාගසේන වාදය එවැනි බණ නාටක වෙයි.

කෙමෙන් පුණ්‍ය චේතනාවෙන් පිරිහුණු බෞද්ධයන් විහාරස්ථානයට ගෙන්වනු පිණිස දැන් යතිවරයෝ විෂ්ණු කතරගම ආදි දෙවියන් එහි වඩම්මති. බෞද්ධයන් දෙවියන් පුදන්නේ ධනය, බලය, කීර්තිය ආදිය ලබනු පිණිස ය. බුදුන් වහන්සේ උන්වහන්සේ දෙසූ ලෝකෝත්තර දහමත් නිසා උගත් බෞද්ධයන් තුළ ඉපිද නටබුන් වූ පුණ්‍ය චෛතසිකයෙන් ඇබිත්තක් ඔවුන්ගේ හදෙහි ඉතිරිව තිබේ නම් ඒද කඳකුමරුන් විසින් වනසනු ඇත. එවිට උගත් ගිහි බෞද්ධයන් පමණක් නොව යතිවරයන් ද අනාත්ම වාදය ගැන ඉතා ශූර ලෙස තර්ක කරන ලෝකායතිකයන් වෙති යි සිතමි.

ව්‍යවහාරික බුදු සමය මෙවැනි තැන තෙක් පිරිහුණේ උගත් බෞද්ධයන්ගේත් යතිවරයන්ගේත් හදින් පුණ්‍ය චේතනාව කෙමෙන් අතුරුදහන් වූ බැවිනි. උගත් බෞද්ධයෝ ධනය, බලය, කීර්තිය පතන අසංයත ලෝභියෝ වූහ. උගත් යතිවරයෝ තුති පැසසුම් වැඳුම් පිදුම් හා පසිඳුව ද පතන්නෝ වූහ.

මොවුන් දෙගොල්ල අත්වැල් බැඳගැනීම නිසා රයිග මයාගේ හා ගම්පලයාගේ යාළුකම වැනි සබඳකමක් ඇති විය. එය ආගමික හැඟීමෙන් උපන් සුහද නෑකමක් නොවී ය. ඔවුන්ගේ හදවත් ගඳකිළි වූයේ බුදුන්ට හා ශ්‍රද්ධා පුණ්‍ය චේතනාවට නොව මෙලොව සැප සම්පත්වලට ය. එයින් ආත්ම සංයමයට නොව අත්තුක්කංසනයට මඟ පෑදිණ.

ධන ලෝභියෝ බෞද්ධයන් අතරට වඩා අනික් ආගම් අදහන්නන් අතර බහුල වෙති. බලලෝභීහුත් කිත් යසස් පතන්නෝත් ඔවුන් අතරට වඩා බෞද්ධයන් අතර බහුල වෙති. තුති පැසසුම් වැඳුම් පිදුම් හා පසිඳුව ද පතන්නෝ යතිවරයන් අතර බහුල වූහ. මේ දෙගොල්ල ඔවුනොවුන්ගේ මමත්වය වඩනු සඳහා නොදැන බුදුසමය වහල් කොට ගත්හ.

කතරගම දෙවියන් වැඩමවීම ධන බලලෝභී බෞද්ධයන් කැඳවන උපායක් පමණක් නොව උපස්ථායකයන් නැති විහාරස්ථානයකට බරපැන් ගෙන දෙන මඟක් ද විය.

බුදු සමය ඕඝයෙන් එතෙර කෙරෙන පහුරක් වන්නේ ශ්‍රද්ධා පුණ්‍ය චේතනාව ඇත්තාට පමණයි. බුද්ධි විෂයක අභිධර්මය ඉගැන්වීමත් උගැන්මත් නිසා අන්තර්ඥානය වඩන බුදු සමය ගිහියන් හා පැවිද්දන් කරින් ගෙන යන පහුරක් වීය. පහුර කරට ගත්තන් ඕඝයෙන් නොව මැණික් ගඟෙන් එතෙර වන්ට කඳ කුමරුන්ගේ පිහිට නො සොයා කුමක් කරන්ට ද?

## ශිෂ්ට මනුෂ්‍යයෝ

ලොවේ සියලු ම ශිෂ්ට මනුෂ්‍ය වර්ගයන්ගේ ආදිම මුතුන් මිත්තෝ වැද්දන් මෙන් ජීවත් වූහ. මිථ්‍යා ඇදහිලි ලාමක අදහස් හා අනුවණකම ද ඇසුරෙන් උපන් සිරිත් විරිත්, උත්සව, වන්දනා මානන විධි ඇසුරෙන් උපන් සිරිත්, උත්සව හා වැඳුම් පිදුම් හැම ශිෂ්ට වර්ගයන්ගේ සංස්කෘතීන්හිත් ආගම්වලත් ඇත. වර්තමාන අපරදිග සංස්කෘතියෙහිත් සිංහල සංස්කෘතියෙහිත් කිතු සමයේ හා බුදු සමයෙහිත් ආදි කාලීනයන්ගෙන් උරුම වූ එවැනි සිරිත්, උත්සව හා වැඳුම් පිදුම් තවම පවතියි.

මගේ මේ කියුමට නිදසුන් වශයෙන් පිටු සීයක පොතකට පිරිමහින තරම් කරුණු එල විය හැකි ය. එයින් එකක් දෙකක් කියමි. සිංහල ගැමි මනමාලයා හා මනාලිය සුදු රෙදි අතුළ පැදුරු පෝරුවට නඟින්ට පෙර එහි සහල් වපුරා කිතුල් මෝලක් ද එක් කෙළවරක තබනු ලැබී ය. එය විවාහ ජීවිතයට ඇතුළු වන දෙදෙනාට අනාගතයෙහි නොඅඩුව ධාන්‍ය ලබා දෙනු පිණිස කෙරෙන කෙමකි. මේ කෙම් විධි ලෝකයේ හැම රටවල වැදි ජනයා අතර පැවැත්තේය. මානව විද්‍යාඥයන් මේ කෙම් විධි හඳුන්වන්නේ 'අනුකරණ මන්ත්‍ර' විශේෂයක් ලෙසිනි.

මනමාල යුවළට හැසල් ඇටවලින් ගැසීම එංගලන්තයෙහි පැවති සිරිතයි. හැසල් ඇට විසි කිරීම වෙනුවට සහල් ඇටවලින් ගසනු ලැබීම අනතුරු ව එංගලන්තයෙහි පැතිරි සිරිත විය. හැසල් ඇට විසි කිරීම පෙරදිගින් ඉංගිරිසින් ණයට ගත් කෙම් සිරිතකි.

පාට කඩදාසි කුඩුවලින් යුවළට ගසනු ලැබීම හාල් ඇටවලින් ගසනු ලැබීමෙහි ම පරිණාමයකි. මේ සිරිත් තුනෙහි ම මූලාශ්‍රය මනමාල යුවළට සසිරි බව පැතෙන වැදි කෙම් විදිය යි. මනමාල යුවළට හැසල් ඇටවලින් ගැසූ පැරණි අවිදග්ධ ඉංගිරිසි ජනයා "සරු වේවා" යි හඬ නැඟූහ. මේ සිරිත ඇස්. බෙරිගුල්ඩ් දේවගැතිතුමා ඉංගිරිසි ජනශ්‍රැතීන් අරබයා ලියූ 'ඒ බුක් ඔෆ් ෆෝක්ලෝර්' යන පොතෙහි විස්තර කොට ඇත. හාල්වලින් ගැසීම පෙරදිගින් ණයට ගන්නා ලද සිරිතක් ලෙසිනි බෙරිගුල්ඩ් දේවගැතිතුමා හඳුන්වන්නේ.

මිනිසුන්ගේ හා සතුන්ගේ සෙවණැලි ඔවුන් තුළ වෙසෙන භූතාත්මයන් ප්‍රාණාත්මයන් ලෙස ආදි කාලීන වැද්දෝ සැලකූහ. "පණ්ඩිතයන් වහන්සේ දිව උකුස්සාගේ ඡායාව මැඬගෙන අත්ලෙන් අත්ල ගසා නාද කළ සේක" යනු උමංදාවෙහි එන පාඨයකි. මේ පාඨයෙන් හෙළිවන ආදි කාලීනයන්ගේ වැදි ඇදහිල්ලෙහි නෂ්ටාවශිෂ්ට සලකුණු සහිත සිරිත් ඉංගිරිසින් අතර ද පැවැත්තේ ය. ඒ සිරිත් හා ඇදහිලි ඉංගිරිසි ජනශ්‍රැතීන් පිළිබඳ පොත්වල ආරූඪ වී ඇත.

## වැදි ඇදහිලි

වැදි ඇදහිලි හා ඒවා ඇසුරෙන් උපන් සිරිත් හා උත්සව ද ශිෂ්ට ජාතීන් අතර ඇත. ඒවා එකවර බැහැර කරනු ලැබීම ඔවුන්ගේ සංස්කෘතීන්ගේත් ආගම්වලත් ඒකමිතියට හා සන්දර්භයට (Integrated Pattern) හානිකර ය.

ඒකමිතිය නැතිවන විට ඒ සංස්කෘතීන් හා ආගම් හිමි ජාතීන්ගේ ස්වාධීනත්වයට හා ශික්ෂණයට ද හානි සිදු

10 වන පිටුව බලන්න

# ඇමරිකා VS උතුරු කොරියා

ලෝකයේ බොහෝ දෙනෙකු මේ දිනවල ඇස් දල්වාගෙන බලා සිටින්නේ උතුරු කොරියාව සහ ඇමරිකා එක්සත් ජනපදය දෙසයි. දෙපසට වී ඇනුම් බැණුම්, ආඩපාලි හා තම තමන්ගේ බලපුළුවන්කාරකම් කියා ගන්නා මේ දෙරට කොයි මොහොතක හෝ ඇවිලෙනු ඇතැයි ඒ බොහෝ දෙනෙකුගේ අදහසයි. කාලයක් තිස්සේ අළු යට ගිනි මෙන් තිබෙන මේ කලබගෑනිය අද වන විට වඩ වඩාත් අවධානයට ලක්වීමට දෙරටේම සිටින හිතුවක්කාර නායක දෙපළගේ කතා බහ සහ කරුණු කටයුතුද හේතු වී ඇත.

මෙසේ බැල්ම ලන්නන්ගේ අවධානය වැඩි වැඩියෙන් යොමුවන ඔවුන්ගේ කුතුහලය අවුස්සාලන දේවල් කරලීම හා ඒවා පිළිබඳ පුරසාරම් දෙඩවීම උතුරු කොරියාවේ දෛනික කාර්යයක් වන තරමට ඔඩු දුවා ඇත. එහි ආසන්නතම ඇවිස්සීම උතුරු කොරියාව විසින් පසුගිය අප්‍රේල් මාසයේදී සිදුකර තිබුණු අතර එයින් පසුව උතුරු කොරියාව වඩ වඩාත් ලෝක අවධානයට ලක් වීමට පටන් ගැනුණි.

උතුරු කොරියාවේ වත්මන් නායකයාගේ මුත්තණුවන් තව විදියකින් කිවහොත් උතුරු කොරියාවේ සමාරම්භක නායකයා වූ කිම් ඉල් සුං ගේ 105 වන ජන්ම දිනය සැමරීම වෙනුවෙන් ප්යොංයැං නුවරදී පැවති දැවැන්ත හමුදා සංදර්ශනයක් තනිකරම යුද ආයුධ සංදර්ශනයක් ලෙස පැවැත්වීම මෙම ආන්දෝලනාත්මක සිදුවීම විය. එහිදී ඔවුන් සතු මිසයිල බලපුළුවන්කාරකම් එළිපිට ගෙනහැර පෑම බොහෝ දෙනෙකු තුළ තැති ගැන්මක් ඇති කළ බව නොකිවමනාය. 'තියෙනවා... තියෙනවා... යැයි කට කියෙව්වාට උතුරු කොරියාවට ඇති දෙයක් නෑ' යනුවෙන් පැවසූ බොහෝ දෙනෙකු මේ සංදර්ශනයෙන් පසු මුනිවත රකින බව කිව යුතුය. ලෝකයේ බහුලව භාවිත කෙරෙන සන්නද්ධ බලවතා ලෙස සැලකෙන 'ස්කඩ්' මිසයිලය මෙන්ම උතුරු කොරියානුවන් විසින් මෙතෙක් කිසිදා ප්‍රදර්ශනය නොකළ අන්තර් මහාද්වීපික බැලිස්ටික් මිසයිලයද මෙම සංදර්ශනයට ඔවුන් රැගෙන විත් තිබුණි.

ලෝකයේ අන් රටවලට වඩා වෙනස්ම වූ දැඩි පාලන ක්‍රමයක පිහිටා කටයුතු කරන උතුරු කොරියාව ඔවුන්ගේ යුද තාක්ෂණ දියුණුව උරගා බැලීමේදී කිසිවෙකුටත් යටත් නොවන හිතුවක්කාරී ක්‍රියාමාර්ග අනුගමනය කරයි. එරට විසින් සිදුකරන න්‍යෂ්ටික අවිආයුධ අත්හදා බැලීම්වලට එරෙහිව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මේ වන විට සම්බාධක පනවා ඇතත් ඒ කිසිවක් පිළිබඳව මායිම් නොකරන උතුරු කොරියානුවන් සිය පර්යේෂණ කටයුතු නොනවත්වාම සිදුකරමින් සිටී. තම යුද තාක්ෂණ සමත්කම් හා වත්කම්වල පවතින සමෘද්ධිමත් බව ලොවට පෙන්වීමට යුද උමතුවකින් පෙළෙන උතුරු කොරියානු නායකයා එසේ වෙහෙසෙද්දී අසල්වැසි රාජ්‍යයන්හි නායකයන්ගේ හා විශේෂයෙන්ම ඇමරිකානු නායකයාගේ හිස ගිනි ගන්නේ නිතැතිනි.

ඒ නිසාම උතුරු කොරියාවේ සිට ඇමරිකානු මහාද්වීපය කරා මිසයිල විදුමක් කිරීමට උතුරු කොරියානුවන්ට හැකියාව ඇද්ද යන්න පිළිබඳව ඇමරිකාවේ දැඩි විමසිල්ල යොමුව ඇත. ඒ පිළිබඳව විවිධ අදහස් ඇමරිකාවේ ආරක්ෂක මණ්ඩලය වන පෙන්ටගනය සතුව ඇති බව පැවසෙන නමුත් ඒවා පිළිබඳව පැහැදිලි ප්‍රසිද්ධ ප්‍රකාශයක් මේ වන තෙක් නිකුත් කර නැත. නිරීක්ෂකයන් පවසන ආකාරයට KN-08 හා Hwasong-13 ලෙස දැක්වෙන ඇමරිකාව කරා ළඟා විය හැකි දිගු දුර විහිදුම් මිසයිල කිහිපයක්ම උතුරු කොරියානුවන් සතුව ඇත.

උතුරු කොරියාවේ මිසයිල ඇමරිකාව දක්වා විහිදුම් කිරීම කළ හැකිද නැද්ද යන්න කෙසේ වෙතත් උතුරු කොරියාව සිදුකරන අත්තනෝමතික න්‍යෂ්ටික අත්හදා බැලීම් මුළු ලෝකයටම තර්ජනයක්ව පවතින බව නම් සැබෑවකි. මෙවැනි තත්ත්වයක් යටතේ තවදුරටත් ඇහැ කන පියාගෙන සිටීම කළ නොහැක්කක් බව ඇමරිකානු නායකයාගේ අදහසයි. ඒ නිසා උතුරු කොරියාවේ මිසයිල වැඩසටහන්වලට ප්‍රතිචාර දැක්වීමක් ලෙස පසුගියදා ඇමරිකානු නාවික හමුදාවේ කාල් වින්සන් ප්‍රහාරක නෞකාව කොරියානු අර්ධද්වීපයට පැමිණ නැංගුරම් ලාගනු ලැබුණි. එහෙත් මෙයින් උතුරු කොරියානුවන් බිය වූ බවක් හෝ සැළුණු බවක් නොපෙනේ. ඒ වෙනුවට ඇමරිකානු යුද නැව තම මුහුදේ නැංගුරම් ලෑම පිළිබඳව දැඩි කෝපයට පත්ව සිටින උතුරු කොරියාව පවසා තිබුණේ තම යුද ශක්තිය තහවුරු කිරීමට අවශ්‍ය නම් ඇමරිකානු යුද යාත්‍රාව මුහුදේ ගිල්ලවා දැමීමට වුවත් තමන් සූදානම් බවයි.

සැබවින්ම ඉහත සඳහන් කළ හිටපු උතුරු කොරියානු නායකයා සැමරූ යුද සංදර්ශනය පැවැත්වූයේ මෙම කාල් විල්සන් යාත්‍රාව කොරියානු අර්ධද්වීපයේ ලැගුම් ගෙන සිටින අතරතුරය. මෙය උතුරු කොරියානු නායකයා ඇමරිකාවේ ක්‍රියාකලාපය මායිම් නොකරන බවට දුන් ඉඟියක් බව ඒ පිළිබඳව තතු පවසන අයගේ අදහසයි. එම සමරු සංදර්ශනයේදී උතුරු කොරියාවේ දෙවැනි බලවතා ලෙස සැලකෙන හමුදා නිලධාරී චෝර්ගෝගංසෝ නැමැත්තා පවසා ඇත්තේ 'කවර කාලයකදී කවුරුන් කොහොම අප වෙත න්‍යෂ්ටික ප්‍රහාර එල්ල කළත් ඒ ඕනෑම න්‍යෂ්ටික ප්‍රහාරයකදී උතුරු කොරියාවටම ආවේණික ක්‍රම මගින් ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට සූදානම්' බවයි.

එසේ කොරියානු මුහුදේ යුද නෞකා ස්ථාපිත කරන අතරතුරම ඊට පරස්පර විරෝධී කතාද ඇමරිකානු ධවල මන්දිරය දෙසින් වාර්තා වේ. ඉතාමත් මෑතකදී ඇමරිකානු ජනාධිපතිවරයා ප්‍රකාශ කර තිබුණේ කොරියානු අර්ධද්වීපයේ යුද තත්ත්වයක් ඇති කිරීමට වඩා උතුරු කොරියානු න්‍යෂ්ටික අර්බුදය සාකච්ඡා මගින් විසඳීමට කටයුතු කිරීම සුදුසු බවයි. එම කලාපයේ අර්බුදය සංසිඳලීම සඳහා චීන නායකයින්ගේ මැදිහත් වීම තමන් ඉතාමත් අගය කරන බවත් ඒ පිළිබඳව තමන් විශ්වාසයකින් පසුවන බවත් එහිදී ට්‍රම්ප් ජනපති පවසා තිබුණි. මෙතෙක් කලක් උතුරු කොරියාව සම්බන්ධයෙන් දැඩිව ක්‍රියා කළ ඇමරිකානු ජනාධිපතිගෙන් පළ වූ මේ අසාමාන්‍ය මෘදු මොළොක් ස්වභාවය බොහෝ දෙනෙකු මවිතයට පත් කර තිබූ අතර 'වැඩි සෙනෙහෙ දඹරයකට මුළ පෑදීමක්' ද යන්න සැක කටයුතු බව ඇතැම් අය පවසා තිබුණි. මේ අතර තවත් පුවතක වාර්තා වූයේ ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් උතුරු කොරියානු නායක කිම් ජොන් අන් හමුවීමට බලාපොරොත්තු වන බවයි. එහිදී ට්‍රම්ප් පවසා තිබුණේ මේ නායකයා හමුවීමට අවස්ථාවක් ලැබෙන්නේ නම් එය තමාට ගෞරවයක් බවයි. බලයට පත් වී දින 100 ක් ඉක්ම යාමටත් මත්තෙන් ඉතාමත් හිතුවක්කාරී පාලකයෙකුගේ ගති ලක්ෂණ පෙන්වූ ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් වරෙක උතුරු කොරියානු නායකයා හඳුන්වා තිබුණේ 'ඉතා දක්ෂ පුද්ගලයෙක්' ලෙසිනි.

වහසි බස් දොඩමින් ඇමරිකාව ප්‍රකෝප කිරීමට කටයුතු කරමින් සිටින උතුරු කොරියාවත්, ඊට ප්‍රතිචාර දක්වමින් තෙවැනි ලෝක යුද්ධයකට මාන බලමින් සිටින ඇමරිකාවත් අතර කෙරෙන සීතල යුද්ධයේදී තැළෙන පොඩිවෙන සෙසු රටවල් ගැන ඔවුනට කිසිදු වගක් නැත. 'තකට තක' පෑහුනාක් මෙන් පැටලෙමින් සිටින අපරිණත නායකයන් දෙදෙනෙකු විසින් ගනු ලබන තීන්දු තීරණ කෙසේ වේදැයි බලා සිටීමට පමණක් එම රටවලට සිදුවී ඇත.

1 වන පිටුවෙන්

## 25 ට අඩු නම්...

Ontario Drug Plan (ODP) යටතේ social assistance ලබාගන්නා පවුල් 900,000 කටද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මිලියන තුනකටද සහන සැලසේ.

අලුතින් හඳුන්වා දෙන ඖෂධ සහනය එයින් ඔබ්බට ගිය ක්‍රමයක් ලෙස දැක්වෙන අතර මෙමගින් ඔන්ටාරියෝ පළාතෙහි ජීවත් වන මිලියන සංඛ්‍යාත වූ දරුවන් සහ තරුණ පිරිසට විශාල සහනයක් සැලසේ.

මේ යටතේ ඖෂධ වර්ග 4,400 ක් නොමිලේ ලබාගත හැකි අතර සමස්තයක් ලෙස සැලකුවහොත් වයස අවුරුදු 25 ට අඩු සියලුම පුරවැසියන්ට ලබන ජනවාරියේ සිට සම්පූර්ණයෙන්ම නොමිලේ වෛද්‍ය පහසුකම් සැපයෙන බව පැවසිය හැක.

## ශ්‍රී ලංකාවේ නව...

තිබූ ත්‍රස්ත මර්දන පනතෙහි මෙවැනි නීතියක් ඇතුළත්ව නොතිබුණි. තවද ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට හානියක් සිදුකිරීමට උත්සාහ කිරීම හා ක්‍රියා කිරීමද වරදක් ලෙස එහි දැක්වේ.

මෙම නව ත්‍රස්ත මර්දන පනත යටතේ ත්‍රස්තවාදී ක්‍රියා විමර්ශනය කිරීමට පොලිස්පති විසින් විශේෂිත වූ ත්‍රස්ත මර්දන ඒජන්සියක් ස්ථාපිත කළ යුතුව ඇති අතර ඊට විශේෂ පරීක්ෂණ කණ්ඩායම් ඇතුළත් කළ යුතු වේ. යම් ත්‍රස්ත ක්‍රියාවක් සඳහා කිසිවෙකු අත්අඩංගුවට ගනු ලැබුවහොත් ඔවුන් පිළිබඳව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමටම වහාම දැනුම් දීම කළ යුතු බවද මෙහි සඳහන් වී ඇත.

# මැලේරියා එන්නත ලබන වසරේ සිට

ලොව පළමුවරට මැලේරියා රෝගයට එරෙහිව නිපදවනු ලැබ ඇති එන්නත 2018 වසරේදී භාවිත කිරීම ඇරඹීමට ලෝක සෞඛ්‍ය සංවිධානය තීරණය කොට ඇත.

RTS,S malaria vaccine නමින් හඳුන්වන මෙම එන්නත මගින් මිනිස් සිරුරේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය මැලේරියා පරපෝෂිතයන්ට (මදුරුවන්ට) එරෙහිව ක්‍රියාත්මක කිරීම සිදුකරන බව පැවසේශ්‍රී

ලබන වසරේ සිට RTS,S එන්නත් කිරීම ඇරඹීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මැලේරියාව බහුලව පැතිර ඇති ඝානාව, කෙන්යාව හා මලාවි යන අප්‍රිකානු රටවල් තුන තෝරාගෙන ඇත. මෙම රටවල් තුනෙහි වාර්ෂිකව මැලේරියාවට ගොදුරු වන සංඛ්‍යාව මිලියන 212 ක් බව පැවසෙන අතර ඉන් 429,000 ක් මරණයට පත්වන බවද වාර්තාවල සඳහන් වේ.

එම රටවල් තුනෙහි වයස මාස පහත් දාහතත් අතර වයස් කාණ්ඩයේ පසුවන ළදරුවන් හත්ලක්ෂ පනස් දහසකට මෙම එන්නත ලබාදීමට නියමිත වේ. මාසයකට වරක් බැගින් මාස තුනක කාලයක් මෙහි පළමු එන්නත් තුන ලබාදෙන අතර සිවුවන එන්නත මාස දහඅටකට පසුව ලබා දෙන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි.

මෙසේ මාත්‍රා හතරකින් යුතු RTS,S මැලේරියා එන්නත ලබාදීම මගින් මාස පහත් දාහතත් අතර ළදරුවන් දහදෙනෙකුගෙන් හතර දෙනෙකු මැලේරියා රෝගයෙන් බේරා ගැනීමට හැකිවනු ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය බලාපොරොත්තු පළ කරයි.

# මුහුණු පොතට 3000 ක්

සයිබර් ලෝකයේ ජනප්‍රියම සමාජ ජාල වෙබ් අඩවිය ලෙස සැලකෙන ෆේස්බුක් සමාජ වෙබ් අඩවියෙහි කටයුතු අධීක්ෂණය සඳහා 3000 ක පිරිසක් බඳවාගැනීමට අදහස් කර ඇති බව එහි නිර්මාතෘ මාර්ක් සකබර්ග් පවසයි.

මෙම කණ්ඩායමට පැවරෙන ප්‍රධාන කාර්යය වනුයේ ෆේස්බුක් තුළ කිසියම් සමාජ විරෝධී ප්‍රකාශනයන් හෝ දර්ශන පළ කෙරෙනවාදැයි යන්න අධීක්ෂණය කිරීමයි. මෙහිදී ෆේස්බුක් හරහා පළකෙරෙන වෛරී ප්‍රකාශන, ළමා අපචාර හා හානිකර දර්ශන ආදිය ප්‍රධාන වශයෙන් අවධානයට යොමු කෙරේ.

මිනීමැරම් සහ සියදිවි හානිකර ගැනීම් ආදිය සජීවීව වීඩියෝගත කර ඒවා ෆේස්බුක් මත මුදා හැරීමේ සිදුවීම් කිහිපයක් මෑත කාලයේදී දක්නට ලැබුණු අතර පසුගිය දිනක තායි ජාතිකයකු විසින් තම බිළිඳු දියණිය ඝාතනය කර එය ෆේස්බුක් තුළ පළ කිරීම ඉතාමත් කණගාටුදායක සිදුවීමක් වියශ්‍රී එම වීඩියෝව ඉවත් කරගන්නා මොහොත වන විට ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් එම කෲර සිදුවීම නරඹා තිබුණිශ්‍රී මෙවැනි සිදුවීම් සඳහා ෆේස්බුක් යොදාගැනීම පිළිබඳව තමා දැඩි කම්පනයට පත්ව සිටින බව පවසන සකබර්ග් ඒ පිළිබඳව ප්‍රකාශයක්ද ෆේස්බුක්හි පළ කොට තිබුණි. එහි ඔහු සඳහන් කොට තිබුණේ, ෆේස්බුක් සජීවී විශේෂාංගය හරහා ඇතැම් පිරිස් ඔවුන්ගේ මෙන්ම අන් අයගේද සිත් රිදවීමට කටයුතු කිරීම කණගාටුවට කරුණක් බවත් තමා ඉන් දැඩි ලෙස කම්පාවට පත්ව ඇති බවත්ය. ඒවා යම් තරමකට හෝ මගහරවා ගැනීමේ පියවරක් ලෙස ෆේස්බුක් අධීක්ෂණයට 3000 ක පිරිසක් මෙසේ යෙදවීමට අදහස් කළ බවද ඔහු පවසයි.

ෆේස්බුක් සමාජ ජාලයේ පළකෙරෙන හානිකර සිදුවීම් අධීක්ෂණය කොට නුසුදුසු ඒවා ඉවත් කිරීම සඳහා මේ වන විටත් 4500 ක කාර්ය මණ්ඩලයක් ෆේස්බුක් ආයතනයේ සේවය කරයි.


SRI LANKA'S NO.1
TRICO
Trico te
TRICO MARITIME
(Sole Authorized Agent of
Trico Meritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal
Effects and gift items clearance in Sri Lanka
Serving People Worldwide Reliably for 35 Years
SRI LANKA'S BEST AND
LARGEST CLEARING
FACILITIES IN THREE
MAJOR CITIES SINCE 1980
COLOMBO
GALLE
KURUNEGALLA
DOOR TO DOOR SERVICE
to any part of Sri Lanka
special service to
Colombo, Jaffna
Kilinochchi, Batticaloa,
Trincomalee, Vavuniya
& Mannar
TRICO
SINCE 1975
TRICO MARITIME FREIGHT FORWARDING CANADA INC.
CONTACT : DERRICK ANTON
647.833.3020 | 416.335.8800
Our Canadian Agents
OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL)
CALGARY: 403 971 6721 (SAMAN) • ALBERTA : 587 708 5665 (TONY) • WINNIPEG: 204 800 2364 (MANGALIKA)
Trico Maritime Customer Services & Warehouses in Sri Lanka
HEAD OFFICE
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000
COLOMBO WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000
KURUNEGALA WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967
GALLE WAREHOUSE
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841
Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Intersection: Markham Road/Nashdene Road
Tel: 413 335 8800
Fax: 416 335 8848
email: info@tricomaritime.ca
www.tricomaritime.ca

# ජන කවියා...

4 වන පිටුවෙන්

සුවඳ බොජුන් වැළඳූ මගෙ හිමි සඳ ට
නිබඳ බොජුන් රසකර දුන් වළඳන් ට
සුවඳ පළාපල මැවියන් හිමියන් ට
සුවඳ මල් නිතර තිබියන් රන්කඳ ට

හිමයේ ගොසින් මල් යහනක සිටිනව ද
කොමල අනගි සිරිපා දෙක රිදෙනව ද
හිඟේ නැතිව දෙවියෝ මුර කරනව ද
මගේ ඇත් රජුනි ඔබ අද කොතනක ද

යස ඉසුරු මැද රාජ භෝජන විඳිමින් සිටි සැමියාට කෙසේ නම් කටුක ආහාර අනුභව කළ හැකිද? දැන් ඇයට ආහාරපාන පිළිගැන්විය නොහැකිය. කළ හැකි එකම දෙය සැමියාගේ ආහාරය පිණිස සුවඳ පළාපළ මැවෙන්නට ප්‍රාර්ථනා කිරීම පමණකි. 'රන්කඳ' යනුවෙන් ඇමතීමෙන් ඇය තුළ වූ ප්‍රේමයට මඳකුදු හානියක් නොවූ බව පැහැදිලි වෙයි. 'කොමල අනගි සිරිපා දෙකට' පාවහන් නොමැතිව ඇවිදීම හේතුකොටගෙන අපහසුතාවක් ඇතිවීදැයි ශෝක වෙයි. සැමියා ඇයට ශක්තියකි. ඔහු දළ සහිත වටිනා හස්තිරාජයෙකි. වනගත දිවිය ඉතා කටුක බව ද ඇය දනී. එහෙත් එකී යථාර්ථය මනසින් පළවා හරින්නේ සැමියාට ඇති බලවත් ප්‍රේමය හා පති භක්තිය නිසාය. ඇගේ ප්‍රාර්ථනාව වන්නේ තම සැමියා දෙවියන්ගේ මුරකාවල් මැද මල් යහනාවක සිටිනු දැකීමටයි.

කැළේ තිබෙන කොයි දේවත් රස වේ වා
මලේ බඹරු මෙන් පිරිවර ඇති වේ වා
අව්වේ තිබෙන රැස්මාලා අඩු වේ වා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේ වා

තමා සහ තම පුතු හැර ගිය ද ඇය පතන්නේ සැමියාගේ යහපතයි. රස ආහාර පහසුවෙන් ලැබෙන්නටයි. හුදකලාව වසන ඔහුට පිරිවර ලැබෙන්නටයි. දැඩි සූර්ය තාපයෙන් පීඩාවක් නොවන්නට වනාන්තරයේ මාලිගා මැවෙන්නටයි. සත් ගුණවත් බිරිඳකට මිස තමා හැරගිය සැමියා වෙනුවෙන් මෙවැනි ප්‍රාර්ථනාවන් කළ නොහැකිය. 'බිම්බාව', 'යසෝදරාව' වන්නේ, කීර්තිය දරන්නේ ඇගේ ගුණවන්ත භාවය හේතුකොට ගෙනය. ඇගේ ගුණ සුවඳ බෞද්ධ කාන්තා ලෝකය පුරාම පැතිරෙයි.

කියන මැසිවිල්ල හිමි හට නොඇසේ වා
රන්කඳ මහිමි මට සිහිනෙන් නොපෙනේ වා
කම්රස විඳීමක් නැත මම දිවුරන වා
තනිකර ගියත් මම සීලේ පිහිටන වා

යසෝදරාවගේ පති භක්තිය ඉහත පද්‍යයෙන් තීව්‍ර වෙයි. ඇගේ දුක් ගැනවිලි සැමියා දැනගත යුතු නොවේ. මන්ද? සැමියා සිතට පීඩාවක් වන හෙයිනි. තවමත් ඔහු ඇයට රන්කඳකි. ඇගේ ස්ථිර අධිෂ්ඨානය කම්සැප හැරදමා තවුසියක ලෙස දිවි ගෙවීමටය. තම සැමියා හැර වෙනත් පුරුෂයෙකු ගැන සිතන්නටවත් ඇයට නොහැකිය. ඇගේ මනා ස්ත්‍රී පෞරුෂය මෙයින් ගම්‍යමාන වෙයි. ඇය සමස්ත ස්ත්‍රී වර්ගයාටම ආදර්ශයකි. කෙතරම් දුක් පීඩා පැමිණියත් ඒ සියල්ල විඳ දරාගෙන මිහි තලයෙහි පය ගසාගෙන සිටීමට තරම් පෞරුෂයක් ඇයට ඇත. වසන්ත සමයෙහි කුසුම් කැකුලක් මෙන් පාඨනයා හමුවට පමුණුවන යසෝදරාව කෙමෙන් විලිකුන් ඵලයක් බවට පත්වී පාඨක සිත්සතන් වශී කරන්නීය. ජනකවියා 'අබිනික්මන' දෙස හෙලූ උපේක්ෂා සහගත දෘෂ්ටිය යසෝදරාවතෙන් කදිමට නිරූපණය වෙයි.

බුදුන්වහන්සේ කිඹුල්වත් පුරයට පැමිණ සුදොවුන් රජුගේ මාලිගයට වැඩම කොට දන් වළඳන කල්හි යසෝදරාව බුදුන් හමුවට පැමිණීම ප්‍රතික්ෂේප කළේ 'තමාගෙන් වරදක් නොවී නම් උන්වහන්සේ තමා හමුවට පැමිණෙන බව' පවසමිනි. මෛත්‍රී කරුණාවට නිධාන වූ තිලොවට තිලක වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ සුදොවුන් රජු සහ සැරියුත් හිමියන් සමග යසෝදරාවන්ගේ ප්‍රාසාදයට වැඩම කොට දහම් දෙසූහ. උන්වහන්සේ ඒ සඳහා පාදක කොටගත්තේ 'සඳකිඳුරු ජාතකයයි' එය පතිභක්තිය සහ අඹුසැමි ප්‍රේමය විදහා දැක්වෙන රමණීය කතාවකි. බුදුන්වහන්සේ ස්ත්‍රීන් කෙරෙහි දැක්වූ සානුකම්පික දෘෂ්ටියට මෙය කදිම නිදසුනකි. සඳකිඳුරු කතාව යසෝදරාවගේ සිතට සිසිලස ළඟා කරවීමට සමත් වූ බවට නිසැකය.

නුවර අවධියේ දී රචනා කරන ලදැයි සැලකෙන 'යසෝදරාවත' වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අගනා කාව්‍ය ග්‍රන්ථයකි.

# පුරන් වූ පින්කෙතට...

7 වන පිටුවෙන්

වෙයි. කොපමණ අමන ඇදහිල්ලක් සිරිතක් වුව ද ජනකායකගේ ආගමෙන් සංස්කෘතියෙන් බලෙන් උදුරා ඉවත් කරනු ලැබීම ඒ ජනකායගේ ඒකමිතිය හා හික්මීම වනසන උපායකි. එවැනි අමන ඇදහිලි හා සිරිත් ආදිය කෙමෙන් අභාවයට යන්නට හැරිය යුතු ය. අභාවයට යන්නේ ඒ ඇදහිලිවලත් සිරිත්වලත් තැන් ගන්නා අනිත් ඇදහිලි හා සිරිත් කෙමෙන් පහළ වූ විට ය.

සිංහලයෝ ජාතියක් වශයෙන් තමන්ගේ හික්මීමට හේතු වන දේ වටහා ගන්නට අසමත් අනුකරණයෙහි රුසියෝ වූහ. කවර ආගමක් අදහන්නන් වුව ද හික්මවනු ලබන හැඟීමක් හෙවත් චෛතසිකයක් ගැමි ඇදහිලිවලට පිටුපසින් ඇත. එය හඳුන්වන්නේ පුණ්‍ය චේතනාව නමිනි. බෞද්ධයන් තුළ ඒ හැඟීම වඩන එක් විදියකි, වන්දනා මානනය. කිතුනුවන් තුළ ඒ හැඟීම් වඩන්නේ ඔවුන් දේවස්ථානයට ගොස් කරන වන්දනා මානනයයි.

උගත් බෞද්ධයන් හා යතිවරයන් අතරින් නම් වන්දනා මානනය අභාවයට ගොස් ඇත. අභිධර්මය ඉගැන්වීම හා උගැන්ම වන්දනා මානනය වනසන එක් උපායක් විය. ශ්‍රද්ධාව නමින් හැඳින්වෙන්නේ පුණ්‍ය චෛතසිකයෙහි ම අංගයකි. භක්තිය නමින් හැඳින්වෙන්නේ ද පුණ්‍ය චෛතසිකයෙහි අංගයකි. ඒ චෛතසිකයෙන් තොර වූවකු හික්මවන ශක්තියක් ග්‍රන්ථාරූඪ ආගමික මතාන්තරවල නැත.

විහාරස්ථානයට ගොස් බුදුරුව හා චෛත්‍යය වැඳීමත් දෙව්මැදුරට ගොස් කරන වන්දනාමානනයත් දෙකම එක සමාන සිත් පහදන සිරිත් වෙයි. ප්‍රකෘති ධර්මය ඉක්ම වූ අතීන්ද්‍රිය ධර්මයක් හඟින්ට පොදු ජනකාය හික්මවන භාවනාවකි වන්දනා මානනය. හුදු තර්කය හා බුද්ධිය අනුව විභාග කළහොත් හැම වන්දනා මානනයක් ම ළාමක ඇදහිල්ලක් සිරිතක් වෙයි.

උගතුන් අතර පමණක් නොව, පාසල් දරුවන් හා දැරියන් අතර ද අබිදම් සිතිවිලි හා මත පැතිරවීම නිසා වන්දනා මානනය නූගත් ගැමියන්ට උචිත සිරිතකගේ තැනට වැටිණ. වන්දනා මානනයට දැන් ගම්වල මිනිස්සු පවා නොයති. යතිවරයන් දැන් හැම පන්සලකම දේවාලයක් කරන්ට පටන්ගෙන ඇත.

එක් කලක ථෙරවාදී බෞද්ධයන්ගේ බලකොටුවක් වූ උපනගරයක් මා හත් අට මසකට පෙර පසුකොට යද්දී විෂ්ණු, කතරගම දෙවියන්ගේ රූප සහිත පෙරහැරක් මට දකින්ට ලැබිණ. එය හින්දු කාරයන් නොව බෞද්ධයන් විසින් සංවිධානය කරන ලද්දකි.

පෙරහැර හමුවීමෙන් මසකට පමණ පසු ඒ නගරයේ උගත් බෞද්ධයෙක් මට හමු විය. "දැන් හැම බෞද්ධ විහාරස්ථානයකට දේවරූපය පිවිසෙනවා. නූගත් බෞද්ධයන් නොව උගත් බෞද්ධයන් පේන අහන්ටත් බාර හාර පුදන්ටත් දේවාලවලට යනවා. බුදුරුව ඇතැම් පන්සලකින් ඉවත් කෙරෙන කාලය එන්ටත් පුළුවනි" යි ඔහු කීවේ ය. ඔහු වාසය කරන කුඩා නගරයෙහි පවත්වන ලද දේව රූප පෙරහැර ගැන මම කීවෙමි. එවිට ඔහු සිනාසෙමින් මෙසේ කීවේ ය.

පන්සල් දේවාලයන් වීම ගැන දවසක මම උගත් යතිවරයකුගෙන් ප්‍රශ්න කරා. උන්වහන්සේ කිව්වා " මොනව කරන්නද මහත්මයා, පසළොස්වක පෝය දාට වැඩි උගත්කමක් නැති ගෑනුත් පිරිමිත් පන්සලට ඇවිත් මල් පූජා කරලා යනවා. පසු දා ඒ මල් ඉවත් කරලා මලසුන් සුද්ද කරවන්ටත් අපි සල්ලි වියදම් කරන්න ඕනෑ. පන්සලේ දේවාලයෙන් ආදායමක් ලැබෙනවා. සමහර උගත් පොහොසත් උදවිය දේවතාරූඪ වූ කපුවාගෙන් පේන අහන්ට රුපියල් පනහ හැට වියදම් කරනවා"

## ගීත ගෝවින්දය

විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා උගන්නා ගැමි සිසුවකු කී කතාවක් මට මතක් වෙයි. ඔහුගේ ගමෙහි කුඩා පන්සලෙහි විශාල දේවාලයක් ඇත. පෝය දවසක දෙවියන්ට බාර හාර පුදන්ට ගිය උදවිය ඉදිරියෙහි භික්ෂුවක් ඉතා මිහිරි හඬින් සකු කවි කීය.

"ඒ සකු කවි මොනවාදැයි" අර ශිෂ්‍යයා භික්ෂුවගෙන් ඇසුවේ ය.

"ගීත ගෝවින්දයේ පද්‍යයි" භික්ෂුව පිළිතුරු දුන්නේ ය.

"ගීත ගෝවින්දය කුමක්දැයි පැට්රික් දන්නවාද?" යි මම ශිෂ්‍යයාගෙන් ඇසුවෙමි. "නෑ" යි ඔහු කීවේ ය.

'ගීත ගෝවින්දය' වංග කවියකුගේ සකු පද්‍යයක්. එය ශ්‍රී කෘෂ්ණ වෙස්ගත් විෂ්ණු, ගවයන් රකින කෙල්ලන් සමඟ පෙම් කෙළියෙහි යෙදීම වර්ණනා කරන ශෘංගාර කාව්‍යයක්.

මා යට දැක්වූ කරුණුවලින් හෙළිවන්නේ ආගමක් හා සංස්කෘතියක් විසින් හික්මුණු ජනකායක් වශයෙන් බෞද්ධයන් ඒකමිතියෙන්, සංයමයෙන්, සිරිතින් පිරිහුණු සැටියි. හැම ආගමක හා සංස්කෘතියක බුද්ධිගෝචර දේ මෙන් හැඟීමට හසුවන මනස්ගාත ද ඇත.

මිනිසුන් හික්මවන්නේ අභිධර්මය නොව ඔවුන්ගේ හැඟීම් පුබුදා පහන් සංවේගයෙන් ඒ හැඟීම් පවිත්‍ර කරන සිංහල සංස්කෘතියෙහි ඇතැම් දේ ය. වන්දනා මානනය, විහාරස්ථානවල චිත්‍ර, ප්‍රතිමා බැලීම, ථෙර ථෙරී ගාථා, ධම්මපදය, ජාතක කථා කියවීම, අවුරුදු උත්සවය හා තවත් එවැනි මිථ්‍යා ඇදහිලි ඇසුරෙන් උපන් සිරිත් විරිත් පැවැත්වීම එයින් කිහිපයකි. නොගැඹුරු බුද්ධිය හා මැකී ගිය පුණ්‍ය චේතනාව ඇති පොදු උගතුන්ගේ සිත් ගන්නා සංකල්ප හා මතාන්තර යති දර්ශනයෙහි ඇත.

ඒවා උගැන්මත් ඉගැන්වීමත් නිසා පුණ්‍ය චේතනාව වඩන වන්දනා මානනය සම්පූර්ණයෙන් පිරිහිණ. මීට අවුරුදු පනහකට හැටකට පෙර පොදු සිංහලයන් අවුරුදු උත්සවය පැවැත්වූයේ වන්දනා මානනයෙහි ම අංගයක් ලෙසිනි. කුමන මිථ්‍යා මතාන්තර ඇසුරෙන් උපන්නත් ජාතික ආගමික චාරිත්‍ර සහිත ඇතැම් උත්සව බෞද්ධයන් හා කිතු සමය ඇතුළු අනෙක් ආගම්වල ද වන්දනා මානනයෙහි අංගයක් කරගත හැකි ය. එයින් එකම දේශයක් මවුබිම කොට ගෙන වෙසෙන ජනකායගේ ශ්‍රද්ධා භක්තියත් ජාතික හැඟීමත් වෙනස්කම්වලට යටින් ඇති ඒකමිතිය පිළිබඳ හැඟීමත් වැඩෙයි.

1968 ජනවාරි මාසයෙහි මම මාසයක් පමණ කියුබාවේ හවානා නගරයෙහි ගත කෙළෙමි. එහි දෙසතියක් තිස්සේ පැවැත්වුණු සංස්කෘතික සම්මේලනයට එකතුවුණු මම කියුබාවේ ජනයාගේ සංස්කෘතියෙහි ඇතැම් කරුණු පිළිබඳ මඳ දැනුමක් ලැබීමි. එයින් එකක් දෙකක් මගේ සිත් ගත්තේ ය. එහි සුදු මිනිසුන් අතර ස්පාඤ්ඤ ජාතිකයන්ගෙන් පැවත එන්නෝ බහුල වෙති.

ඉතාලි ප්‍රංශ ජාතිකයන්ගෙන් පැවැතෙන්නෝ ද වෙති. නීග්‍රෝ, චීන, රතු ඉන්දියානු ජාතිකයෝ ද වෙති. වර්ණ භේදයෙන් තොර ව වෙසෙන මොවුහු ස්පාඤ්ඤ බස කතා කරන එකම මිශ්‍ර ජාතියකි. ඔවුන්ගේ සංස්කෘතිය ස්පාඤ්ඤ, නීග්‍රෝ, චීන ආදීන්ගේ සංස්කෘතීන්ගේ සංකලනයෙන් පහළ ව වැඩෙන ස්වාධීන සමාජ සමයකි.

මෙය වඩාත් හොඳින් මට වැටහුණේ භාවනා නගරයෙහි නවීන චිත්‍ර, ප්‍රතිමා කලාගාරය බලන්ට ගිය අවස්ථාවෙහි ය. අවුරුදු සීයකට වැඩි කලක් එහි වූයේ ස්පාඤ්ඤ, ප්‍රංශ චිත්‍ර ප්‍රතිමා කලා ඇසුරෙන් වැඩුණු අනුකාරක කලාවකි. 1925 දී වික්ටර් මැනුවෙල් චිත්‍රකාරයා අර අනුකාරක චිත්‍ර කලාව ඉඳුරා බැහැර කළේ ය. ඔහු නීග්‍රෝ, චීන, මැක්සිකෝ ජාතීන්ගේ චිත්‍ර කලාවන්ගෙන් ද එළිය ලබා ස්වාධීන චිත්‍ර කලාවක් නිපදවූයේ ය. කතෝලික ආගම පිළිබඳ චිත්‍ර ද මේ ස්වාධීන චිත්‍ර කලාව අනුව නිපදවා ඇත.

මොවුන්ගේ ඇතැම් ආගමික උත්සව පවා බටහිර කිතුනු සංස්කෘතිය අනුව නොව ඔවුන්ගේ ස්වාධීන මිශ්‍ර සංස්කෘතිය අනුව පවත්වනු ලැබේ ය. අලුත් අවුරුදු (ජනේරු) උත්සවය ඇතැම් තැන්වල පවත්වන ලද්දේ එක්වුණු සුදු, කළු, කහ ජාතිකයන් විසින් ආදි කාලීන වැදි සිරිත් අනුවයි. එම උත්සවය අප රට යකැදුරන්ගේ තොවිල් පලකට මඳක් සමාන විය. ඕනෑ රටක පොදු ජනකායගේ සංස්කෘතියට හා කලා ශිල්පවලට අනුකූලව ජාතික උත්සව හා සිරිත් පැවැත්වීමට හුරුකමත් කතෝලික සසුනට ඇත.

එහෙත් මීට අවුරුදු හැට හැත්තෑවකට පෙර විසූ ඉංගිරිසිකාරයින්ගේ නොගැඹුරු හේතුවාදීය මතාන්තර අනුව සකස්වුණු ඉංගිරිසි සංස්කෘතියට හසුවුණු ලංකාවේ කතෝලික සසුනෙහි අධිපතිහු ද සිංහලයන්ගේ ජාතික සිරිත් හා සමාජ සිරිත් අවඥාවෙන් බැහැර කළහ.

හේතුවාදය හා තර්කය ගරු කොටගත් කිතු සමයෙහි ගූඪ ධර්ම සමර්ථනය කරන්ට එංගලන්තයෙහි ඇතැම් කිතුනු චින්තකයෝ වෑයම් කළහ. මීට අවුරුදු දෙසීයකට පෙර විසූ ස්කොට් ජාතික හියුම් නමැති දර්ශනවාදියා තර්කය අනුව කිතු සමය ඔප්පු කරන්ට වෑයම් කළ ඔවුන් හැඳින්වූයේ කිතු සමයෙහි සතුරන් ලෙස ය. අපේ රටේ ඇති වූ 'පානදුරා වාදය' වැනි ආගම්වාදවලටත් හේතු වූයේ පැරණි ඉංගිරිසිකාරයන්ගේ නොගැඹුරු තර්කවාදයට උගත් බෞද්ධයන් ගොදුරු වීමයි.

මෙකල විහාරස්ථානය පුරන් වූ පින්කෙතක් වැන්න. සුදු මිනිසුන් මෙහි පැතිර වූ නොගැඹුරු තර්කවාදයට උගත් බෞද්ධයන් හා යතිවරයන් ද ගොදුරුවීම නිසා ය එය සිදු වූයේ. අනාත්ම සංකල්පය වනාහි බෞද්ධ පරමාර්ථය, නිවන අවුරාගත් වටපාරක් වැන්න. තර්කය නමැති දෙරෝදයෙහි නැඟුණු උගත් යතිවරයෝ අනාත්මවාදය නමැති වටයෙහි හති වැටෙන තෙක් දුවති. අධ්‍යාත්මය වඩනු කැමැති මිනිසාට අනාත්ම සංකල්පය පරම සත්තාවට පිවිසවන දොරටුවකි. 'පරම සත්තාව කුමක්දැ' යි කිසිම ආගමක් අදහන්නෙක්, විද්‍යාඥයෙක්, චින්තකයෙක් හරි හැටි නොදනිති. භෞතිකවාදියාට පරම සත්තාව මිරිඟුවකි. ආත්මවාදියාට පරමාත්මයකි, විශ්ව විඥානයකි. විද්‍යාව ඉක්මවා සිතන විද්‍යානඥයාට භෞතික ධර්ම ඉක්ම වූ අතීන්ද්‍රිය ධර්මයක් ඇතැයි කියන සලකුණකි. අනාත්මවාදියා එය දකින්නේ නිර්වාණය ලෙසිනි. වටරවුමේ දුවන ඔහු ඊට ළං නො වේ.

බෞද්ධයන් පුණ්‍ය චේතනාවෙන් හා චරිතයෙන් පිරිහෙන්නේ යතිවරයන් ඔවුන් අනාත්මවාදය නමැති වටයෙහි දුවවන බැවිනි. ථෙර ගාථා ළැදිව විමසන්නකුට මගේ තර්කයෙහි ඇත්ත වැටහෙනු ඇත.


ANTON
DHARMASEELAN
MORTGAGE AGENT
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST
FOR ALL YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS-BEST RATES
MORTGAGE ALLIANCE
BROKER #10530

## කැනේඩියානු සංචාරයක මතකය.

# නයගරා ඇල්ල මගහැර නැව් යන හැටි බලා වරෙන්........

විස්තර සහ සේයාරූ
■ අනුරුද්ධ වැලිගමගේ






කැනඩාවත්, ඇමෙරිකා එක්සත් ජනපදයත් අතර මායිමේ පිහිටි නයගරා දියඇල්ල ලොව වැඩි සංචාරක පිරිසක් නරඹන අතිශය ජනප්‍රිය සංචාරක ඉසව්වක්. ටොරොන්ටෝවට නුදුරින් ජීවත් වන බොහෝ දෙනා සෑම ගිම්හානයකටම දවසක් හෝ මේ ඉසව්වට යන බව රහසක් නොවෙයි. සොබාදහමේ මහඟු දායාදයක් වන නයගරා ඇල්ල ආශ්‍රිත සංචාරක බල ප්‍රදේශයට යනෙන සංචාරකයින්ට කරන්නට ඇති පදම් දේ තිබෙනවා. එහෙත් ඒ ඉසව්වට යන අයගෙන් කීයෙන් කී දෙනෙක් ඇල්ල බලනවා ඇරෙන්නට අසල ඇති තවත්



වැදගත් තැන් මග හරිමින් කාලය නාස්ති කරනවාද? මේ මතකයන්ගේ අරමුණ ඊළඟ වතාවේ ඔබ නයගරා බලන්නට යනවිට ඒ තැන්වලටත් යන්නට අවස්ථාව උදා කර දීමයි.

පංච මහා විල් හරහා එකතුවන ජලය කැනඩාවේ ශාන්ත ලෝරන්ස් ගංගාව හරහා කිලෝමීටර 3769 ක් දුර ගෙවා අත්ලාන්තික් සයුරට එක්වෙනවා. අනුපිළිවෙලින් සුපිරියර්, මිචිගන්, හියුරන්, ඊරි විල් කරා එන ඒ මහා දියකඳ නයගරා ඇල්ල හරහා ගොස් ඔන්ටාරියෝ විලට එක්වෙනවා. ශාන්ත ලෝරන්ස් ගඟ ඇරඹෙන්නේ ඔන්ටාරියෝ විලෙන්. මේ මාර්ගය ප්‍රමුඛ නැව් මාර්ග යක්. වාණිජ නැව් මෙන්ම පෞද්ගලික යාත්‍රා ගමනාග මනයේදී තිබූ ප්‍රධානතම බාධකය වූයේ නයගරා ඇල්ල තරණය කිරීමයි . කලක් තිස්සේ මිනිසුන්ට වද දුන් ඒ ගැටලුව විසඳුණේ ඊරි විලත් ඔන්ටාරියෝ විලත් යාකරමින් තැනුණු කිලෝමීටර 43 ක් දිග වෙලන්ඩ් ඇල (Welland Canal) මගින්. 1824, 1839, 1887 දී තැනුණු ඇළමාර්ග වැඩි දියුණු කරමින් අද භාවිත වන වෙලන්ඩ් ඇල ඉදිකෙරුණේ 1913 දී. මිනිසුන් පඩිපෙළක් බසිනවා මෙන් තටාකයෙන් තටාකයට නැව් ඇතුළු කරමින් තැන් (Locks) 8 කදී එකී යාත්‍රා උස් පහත් කිරීම විදුලි සෝපානයක ක්‍රියාවලියට සමානයි .




### වෙලන්ඩ් ඇල මධ්‍යස්ථානය සහ ගේට්ටු අංක 3 (Welland Canal Centre & Lock 3)

එලිසබත් රැජින අධිවේගී මාවත (Queen Elizabeth Way-QEW) දිගේ ශාන්ත කැතරින් (St' Catherines) නගරය පසුකරද්දී හමුවන අහස් මංපෙත (Garden City Skyway) මතදී ඔබ සමහරවිට මේ පරිශ්‍රය ඈතින් දැක ඇති. අංක 3 දරණ ගේට්ටුව හරහා නැව් ගමන් කරන වේලාව අන්තර්ජාලයේ ඇති නිසා ඔබට පහසුවෙන් ගමන සැලසුම් කරගන්නට පුළුවන්. ජල තටාකයට නැව් ඇතුළු කරන පිට කරන අයුරු, අනතුරු වලකන ආරක්ෂක උපක්‍රම, ළග ඇති පාලම් උස් පහත් කරන අයුරු මෙන්ම මෙහිදී සුවිසල් නැව් ඇලේ උස වෙනස්කම් අනුව විදුලි සෝපානයක මෙන් උස් පහත් කරන අයුරු පියවරෙන් පියවර කැමරාවට නගා ගන්නට හෝ වීඩියෝ ගත කරන්නට මෙහි ඇති නැරඹුම් අටල්ල කදිම තැනක්.

### ශාන්ත කැතරින් කෞතුකාගාරය (St. Catherines Museum)

සංචාරය සඳහා බොහෝ මුදල් වැයවන බව බහුතරයක් පිරිස සිතන මිථ්‍යා මතයක්. සංචාරයේදී වැදගත් වන්නේ කලබලයෙන් යාම නොව තොරතුරු සොයාගෙන යාමයි. වෙබ් අඩවි කිහිපයකින් තොරතුරු සහ සංචාරක අත්දැකීම් වර්ගීකරණය කර ඇති ආකාරය බැලීමෙන් ඔබට මෙය පහසුවෙන්ම කළ හැකියි. ඉතා වටිනා දැනුම් ගබඩාවක් වන මෙයට ඇතුළු වන්නට කිසිදු මුදලක් අය කරන්නේ නැහැ. නමුත් ඔබට කැමති නම් ඔවුන්ගේ සේවය වෙනුවෙන් ඔබට යම් මුදල් පරිත්‍යාගයක් කළ හැකියි. වෙලන්ඩ් ඇලේ සහ ඒ ප්‍රදේශයේ ඉතිහාසය, ලාක්රෝස් (Lacrosse) නමැති පාරම්පරික ක්‍රීඩාව පිළිබඳ බොහෝ තොරතුරු මෙහිදී දැනගත හැකියි. මෙහි තිරගත වන වෙලන්ඩ් ඇල පිළිබඳ වාර්තා චිත්‍රපටය මිල කළ නොහැකි අත්දැකීමක්. නොමිලයේ වාහන නවතා තැබිය හැකි සියලු පහසුකම් පිරි මේ පරිශ්‍රයේ කුඩා දරුවන්ට විනෝද වන්නට බොහෝ දෑ තිබෙනවා.

### වෙලන්ඩ් බිත්ති චිත්‍ර (Weland Murals)

වෙලන්ඩ් ඇල සහ ආශ්‍රිත සංවර්ධනය විසින් බිහිවූ වෙලන්ඩ් නගරය කැනඩාව පුරා විසිරුණු චිත්‍ර ශිල්පීන් රැසකගේ සහභාගීත්වයෙන් 1986 දී අරඹා ඇති ව්‍යාපෘතියක් මගින් නගරයේ තැනින් තැන සුවිශාල බිත්ති චිත්‍ර ඇඳ තිබෙනවා. දැනට එහි ඇති චිත්‍ර ගණන 29 ක්. අන්තර්ජාලයෙන් ඔබට එම චිත්‍ර 29 පිහිටා ඇති තැන් පැහැදිලිව දැන ගන්නට පුළුවන්. ඔබ චිත්‍රවලට ආසා කරන්නෙක් නම් ඔබ මෙයට ලොබ බඳීවි. හැබැයි මෙය තරමක් කල්ගත වන තැනින් තැනට යා යුතු වැඩක්. කුඩා දරුවන් සමග පහසු වන දෙයක් නොවෙයි. කලින් කලට අලුතින් චිත්‍ර එකතු වන, තිබෙන චිත්‍ර සංරක්ෂණය වන මේ ව්‍යාපෘතිය දිනෙන් දින අලුත් වන දෙයක්.

අප වෙලන්ඩ් නගරයේ සිට නයගරා ඇල්ල වෙත යන මග වැටී තිබුණේ වෙලන්ඩ් ඇල යටින් යන උමගක් ඔස්සේ. වෙලන්ඩ් ඇලේ විශාල නැවක් ගමන් ගන්නා මොහොතක දුම්රිය මාර්ග බාධකයට හැරවී හුන් අප දුටු දසුන ජීවිතයේ තවත් අමතක නොවන අත්දැකීමක්. වාහන ගමන් කරන මාර්ගයට අමතරව අප ඉඩ සලසා දුන් දුම්රිය මාර්ගයද මේ උමග තුළින් දිවෙනවා.

### නයගරා විල මත (Niagara on the Lake)

නිසි ජලය, නිසි දේශගුණය නිසා ඉතා සශ්‍රික ප්‍රදේශයක් හැඳින්වෙන්නේ මේ නමින්. එහි සරු පසේ වැවෙන මිදි, චෙරි, බෙරි වර්ග, මල් වර්ග බලන්නටත් ගිම්හානයේදී ඔබට පුළුවන්. නිස්කලංක විවේකයක් සඳහා නවාතැන් පොළ රැසක් මේ ප්‍රදේශයේ තිබෙනවා.






### මිදි සහ වයින් (Grapes & Wine)

රසයෙන් වැඩි වයින් නිෂ්පාදනය සඳහා සුදුසු මිදි මේ ප්‍රදේශයේ තිබෙනවා. ලෝ පතල කැනේඩියන් අයිස් වයින් (Canadian Ice Wine) විශේෂ බොහොමයක් මේ ප්‍රදේශයේදී නිපදවෙනවා. මිදි වත්තක්, මිදිවලින් වයින් නිපදවෙන හැටි, වයින් ගබඩා කර ඇති සැටි මෙන්ම අගනා වයින් බිඳක රස බලන්නටත් මේ ඉසව්වේ සරන ඔබට කිසිදු මුදලක් වැය වන්නේ නැහැ.

### චෙරි සහ බෙරි නෙලන්නට (Cherry & Berry Picking)

නයගරාවට නුදුරු ලින්කන් (Lincoln) නගරය චෙරි වගාවට ප්‍රකටයි. කට පිරෙන්නට විවිධ ගස්වලින් විවිධ රස චෙරි ගස්වලට නැග ගෙඩි කඩා කන්නට පුළුවන්. අන්තර්ජාලයෙන් එම ගොවිපොළ මහජනතාව සඳහා අරඹන දින වකවානු දැනගන්නට පුළුවන්. අපේ අත්දැකීම්වලට අනුව වඩාත් වැදගත් වන්නේ පුළුවන් තරම් උදයෙන් එම ස්ථානවලට යාමයි. එවිට



තදබදයෙන් තොරව රිසි සේ හොඳ අස්වැන්නක් නෙලා ගන්නත්, පවුල් කිහිපයක් එකට එක්වන අවස්ථාවක් කර ගන්නටත් පුළුවන්.

බ්ලූ බෙරි, ස්ට්‍රෝබෙරි ඇතුළු බෙරි වර්ග රැසක් රස බලන්නට හැකි ගොවිපොළ රැසක් Lincoln, Grimsby, Pelham, St' Catherines, Welland වැනි නගරවල තිබෙනවා. ලංකාවෙන්, වෙනත් රටවලින් එන නෑදෑ හිතවතුන් මෙන්ම හිත මිතුරන් සමග දිනක ගමනකට මෙය කදිමයි.

### ලැවෙන්ඩරා මල් ගොවිපොල (Lavendar Farms)

බොහෝ සුවඳ විලවුන් සඳහා ගන්නා ලැවෙන්ඩරා මල් වතු මවන්නේ මහත් අසිරියක්. ගිම්හාන කාලයේදී ඒ ගොවිපොළ පරිශ්‍රයන්හිදී විවිධ ප්‍රදර්ශන පැවැත්වෙනවා. මේ ගොවිපොළ චාරිකා සඳහා යම් මුදලක් ගෙවිය යුතු වෙනවා. ඒ ඇතුළු වීමේ ගාස්තු හෝ යම් අවම ගාස්තුවක් ලෙසින්.

තවත් ගමනකින් හමුවෙමු.
anuruddhawe@yahoo.com



# නළපාන ජාතකය

**මේ වෙසක් සමයයි. මෙවර අපි දූල පුතාලට ගෙන එන්නේ ජාතක පොත් වහන්සේ තුළ ඇතුළත් ජාතක කතාවක්.**

**බුදුරජාණන් වහන්සේ කොසොල් ජනපදයෙහි චාරිකා කරමින් සිටින අවස්ථාවක භික්ෂූන් වහන්සේලා විසින් ඇසූ පැනයකට පිළිතුරු ලෙස මේ කතාව දේශනා කරන ලද බවයි සඳහන් වන්නෙ.**

ඉස්සර කාලේ කොසොල් ජනපදයෙහි නළපාන නම් ගමේ නළපාන නම් පොකුණට යාබදව තිබුණු මහා විශාල වනාන්තරයේ වඳුරු රංචුවක් වාසය කළා. මේ වඳුරු රංචුවේ වඳුරන් අසූදහසක් පමණ සිටියා. මේ සියල්ලන්ටම එක නායකයෙක් සිටියා. නායක වඳුරා නිතරම තම පිරිවර ගැන සොයා බැලුවා. අවවාද උපදෙස් දුන්නා. බොහෝ අවස්ථාවල කැළයේ තිබෙන හොඳ නරක ස්වභාවයන් ගැන කියා දුන්නා.

"මේ රූස්ස කැළෑවේ හරියට වස විෂ තියෙනවා. ඒවා පළතුරු විදියට වගේම ජලය විදියටත් තියෙන්නට හැකියි. ඒ වගේම ජල රකුසන් අරක් ගත් විල් පොකුණු තියෙනවා. මගේ වඳුරු පිරිවර ඒ හැම දේකින්ම ගැළවී කටයුතු කිරීමට මනා සිහිබුද්ධියකින් සිටිය යුතුයි. මින් පෙර ආහාරය නොගත් නුපුරුදු කෑම නොකෑ යුතුයි. මගෙන් නොවිමසා නුපුරුදු විල් පොකුණුවලට නොබැසිය යුතුයි. නොවුවමනා ගමන් බිමන් නොයා යුතුයි"

දිනපතා තමන් වෙත ලැබුණු මේ අවවාද උපදෙස් සිතෙහි තබාගනිමින් වඳුරු රැළ තමන්ට අවශ්‍ය ආහාර පාන සොයා ගනිමින් බොහොම නිදහසේ සැහැල්ලුවෙන් සතුටින් කැළෑවේ වාසය කළා.

දිනක් මේ වඳුරු රංචුව කැළෑවේ තරමක් ඈතට යන්න පිටත් වුණා. මෙහෙම යද්දි වෙහෙස නිසා හැමෝටම දිය පිපාසාව ඇති වුණා. ළඟ පාතක විලක් හෝ පොකුණක් ඇත්දැයි විමසිලිමත් වෙමින් යද්දී ඉතාමත් අලංකාර විශාල පොකුණක් දකින්නට ලැබුණා. ඒත් එය ඔවුන් කලින් දිය බිව් හුරුපුරුදු පොකුණක් නොවෙයි. ඒ නිසා කෙතරම් දිය පිපාසය තිබුණත් ඊට කිට්ටු වීමට වඳුරු රංචුව බිය වුණා. මෙය නායකයාට දැනුම් දිය යුතු අවස්ථාවක් බව වඳුරන්ට වැටහුණා. ඔවුන් නායකයා සොයා ගියා.

"නායක තුමනි, අපි දැඩි දිය පිපාසයකින් පසු වෙනවා. ලස්සන නිල් දිය පිරුණු පොකුණක්ද අපිට හමුවී තියෙනවා. ඒත් එය අපට නුහුරුයි. ඔබ වහන්සේගේ අවවාදයට අනුව ඒ බව ඔබට දැනුම් දීමටයි අප ආවේ"

"බොහෝම හොඳයි. ඔබ ක්‍රියා කර ඇති සැටි ප්‍රශංසනීයයි. හොඳයි යමු බලන්න"

වඳුරු නායකයා දිය පොකුණ දෙසට ගියා. ගොසින් හොඳින් විමසා බැලුවා. දිය පොකුණ දෙසට වැටුණු අඩි සලකුණු මිස දිය පොකුණෙන් ගොඩට ආ අඩි සලකුණක් ඔහුට සොයා ගැනීමට නොහැකි වුණා. ඒ නිසාම එම පොකුණ දිය රකුසන් අරක් ගත් පොකුණක් බව වඳුරු නායකයා තේරුම් ගත්තා. ඔහු මෙසේ තම පිරිස ඇමතුවා.

"දරුවනි, ඔබලා නුවණැත්තතන් සේ කටයුතු කළ නිසා ඔබේ ජීවිත බේරුණා. මේ පොකුණ දිය රකුසන් අරක් ගත් පොකුණක්. සෙවිල්ලක් බැලිල්ලක් නොමැතිව ඔබ පොකුණට බැස්සා නම් දිය රකුසන්ගේ ගොදුරක් වනු නොඅනුමානයි"

බියෙන් තැති ගත් වඳුරු රංචුව තම නායකයාට මෙසේ පැවසුවා.

"රජතුමනි, ඔබ කොහොමද ඒ බව දැනගත්තෙ?"

"පොකුණු ඉවුර දෙස බලන්න. එහි පොකුණට බැස්සවුන්ගේ අඩි සලකුණු මිස එයින් ගොඩ ආ අයෙකු නැති බව ඔබටත් පෙනේවි"

"සැබෑමයි මහරජතුමනි. අප දියරකුසාගෙන් ගැළවුණේ ඔබ නිසයි. එහෙත් අපිට හරිම දිය පිපාසාවයි. දැන් අපි වතුර බොන්නෙ කොහොමද?"

ගොඩබිම මෙලෙස කතාබහ සිදුවද්දී තම ගොදුර පොකුණට බහිනකම් පොකුණේ සිටි දිය රකුසා මහත් නොඉවසිල්ලෙන් බලා සිටියා. එහෙත් වඳුරන් බසින පාටක් නම් පෙනුණේ නෑ. දියට බසිනවා වෙනුවට තැති ගැනී පොකුණ දෙස බලා සිටින වඳුරන් රංචුවකුයි දිස් වුණේ. ඉවසීමේ සීමාව ඉක්මවා ගිය දිය රකුසා ජලයෙන් පිටට හිස එසවූවා.

"ඇයි කට්ටිය ගොඩට වී බලා සිටින්නේ. මේ පොකුණට බැස හිතේ හැටියට ප්‍රණීත ජලය පානය කරන්න" යැයි පවැසූවා.

එහිදී ඉදිරියට ආවේ නායක වඳුරයා.

"ඔබ මේ පොකුණට අරක් ගත් දිය රකුසාද?"

"ඔව්... ඒ මම තමයි. මේ විලට බසින ඕනෑම අයෙකු මගේ ආහාරයට ගොදුරු කර ගැනීමට මට හැකියි. දැන් ඔබ සියලු දෙනාමත් මගේ ගොදුරු. ළඟ පාතක වෙනත් පොකුණක් නැති නිසා දිය පිපාසය නිවා ගැනීමට ඔබ පොකුණට බැසිය යුතුමයි."

"දිය රකුස, ඔබ එසේ සිතා සිටිනවා නම් එය ඔබට වූ විශාල වැරදීමක්. අප දිය බොනවා. එහෙත් දියට බසින්නේ නෑ. ඔබට හැකියාව ඇත්තේ දියට බසින අය අල්ලා ගැනීමට පමණයිනෙ"

වඳුරු නායකයාගේ කතාව අසා සිටි දිය රකුසා මහ හඬින් සිනාසුණා.

"හහ්... හහ්... හා..... හා..... හොඳයි එහෙමනම් දියට බසින්නේ නැතුව දිය බී පෙන්වන්නකෝ" කියමින් නැවතත් දිය යට ගිලී නොපෙනී ගියා.

වඳුරු රැළ නායකතුමාව වට කරගත්තා.

"රජතුමනි අපි කොහොමද වතුර බොන්නෙ. දැන් නම් අපට හරිම අමාරුයි"

"මොහොතක් ඉවසන්න දරුවනි"

මෙසේ කී නායක වඳුරා හොඳින් වටපිට නිරීක්ෂණය කොට බැලුවා. පොකුණ අසල විශාල බට පඳුරක් තිබුණා. ඒ දෙසට ගිය නායක වඳුරා බට දණ්ඩක් කඩා ගත්තා. ඊට පසු එය මුවට තබා වැරෙන් පිම්බා. බට දණ්ඩ මැද තිබූ ගැට සියල්ල ඉවත් වී එය එකම සිදුරක් ඇති නළයක් බවට පත් වුණා. ඉන්පසු වඳුරු රංචුවටම සෑහෙන තරමට ඒ බට ගසෙන් බට දඬු කඩා පිඹ නළ සකස් කර සෑම වඳුරෙකු අතටම දුන්නා.

අවසානයේදී පොකුණේ ඉවුර වටේටම හිඳගත් වඳුරු රංචුව පොකුණට නොබැසම බට දඬු පොකුණ තුළට දමා ජලය උරා බිව්වා. ජල රකුසා පරාද වුණා.



## ළමා කවි

### ලෝ වැඩ සඟරාව

| | | | |
|---|---|---|---|
| අසු කොට ගත නොතබති | ආදාරය | ඇවිස නොකියන බස් කනට යවුල් | ලෙස |
| වද කොට මැරුවත් නැත | එව්චාරය | සිත සතොසින් කිය කියතොත් පිය | බස |
| ලසු කොට නොසිතව් පව් | පරදාරය | පරුස තෙපුල් බිණුවා නම් මහ | දොස |
| නිරයට ඇදයට යන එම | පාරය | එවිස නොයයි පරලොව දුක් දී | මිස |
| අසුවාම කියන බස් අර | තරයේ | පෙර සිට වියතුන් නොකියා | වැළකී |
| මුසවා බස් කීවොත් එක | මුරයේ | දෙලොවට වැඩ නැති බස් | අකුසලකී |
| වසවා දෙව් ලොව යන මං | තරයේ | කෙළියට වත් ඒ වැඩ නැති | බසකී |
| පැසවා මිස නාරී ගොර | නිරයේ | නිරයට වැද යන රජ මහ | වතකී |
| පලදෙන පව් පින් දෙක | නොබලා මේ | අන්සතු සැපතක් දැක දළ | ලොබිනේ |
| පවසන බස් උරසක් | මාලාමේ | උන්ට නොවී මට වේවයි | සිතිනේ |
| බිඳුවන බස් වැඩ නැති | කේලාමේ | මන් කළ ඒ සිත අටගත් | පව්නේ |
| මතුවන දුක් නොදැනෙන | වේලාමේ | උන් මතු නිරයේ දුක්මයි | විඳිනේ |

**වීදාගම මෛත්‍රිය හිමියන් විසින් රචනා කරන ලද 'ලෝවැඩ සඟරාව' කෝට්ටේ යුගයේදී ලියවුණු වටිනා ග්‍රන්ථයකි. ජීවිතය යහපත්ව පවත්වා ගැනීමට වුවමනා දහම් කරුණු රැසක් මනරම් ලෙස කාව්‍යාකාරයෙන් මෙහි ඉදිරිපත් කර ඇත.**

## ළමා ගී

### නව අවුරුදු අසිරිය

**කහවන් ගොයමට**
**රන් දිය වැහැලා**
**නියරින් ඉතිරෙනවා**
**ගස්වල හෙවණැලි**
**වැඩියෙන් කළු වී**
**මිහි මත වැතිරෙනවා**
**විහඟ වලා ගුවන වෙළා**
**දුර අහසේ නොපෙනී යනවා**
**කවියක් ගීයට හැරුණ කලක් දෝ**
**ඉපනැලි නළියනවා**

**මින්නේරිය වැව**
**දැන් නිල් කැටයකි**
**තැන තැන රඟ දෙනවා**
**එක දෙක දිය රැළි**
**සුළඟට කැඩි කැඩි**

**සුදු ඉරි මතුවෙනවා**
**මුතු අමුණා ගී මුමුණා**
**දුර වෙරළට රැළි ඇද්දෙනවා**
**මින්නේරිය වැව පට සළු ඇඳගෙන**
**ඔන්චිලි පැද්දෙනවා**

**මහසෙන් රජ වැඳ**
**නින්දට යන්නට**
**පෙරයම සැරසෙනවා**
**අවුරුදු දහසක්**
**කෙත්බිම් සරු කොට**
**හිනැහී සැනහෙනවා**
**යල වපුරා මහ වපුරා**
**ගොයමට දිය රැළි නංවනවා**
**මින්නේරිය වැව හෙට හී කවියෙන්**
**උදයට ළංවෙනවා**

**ගායනය - නාලිනී රණසිංහ**
**සංගීතය - ඩන්ස්ටන් පී. ද සිල්වා**
**ගී පද - මර්සලින් ජයකොඩි පියතුමා**


'MUDITHA'
Children for Children
Arts Exhibition
June 3rd, 2017 (Saturday)
2.30 to 6.30 pm
Room Ojibway
at Huron Park Recreation Centre
830 Paisley Blvd. W, Mississauga L5C 3P5
Over 150 arts under different themes created by children at the Arts Workshops on March 25th and April 8th, 2017, using variety of arts material
Certificate Awarding at 4.00 pm
Join us with the families and friends to encourage the younger generation for more creative work
ENTRANCE FREE
Presented by the Alumni Association of the University of Peradeniya (GTA and Suburbs)


Attrell TOYOTA
Brampton Auto Mall
TOYOTA RED TAG DAYS
NOW'S A GREAT TIME TO GET INTO A TOYOTA
Lease or Finance from 0%
Selected 2017 Vehicles
ඉක්මන් කරන්න ඉක්මන් කරන්න මේ අවස්ථාව ඔබටයි
ඔබ කැමති වාහනය ඉතා විශ්වාසවන්තව, හොඳ වට්ටම් සහිතව
ලබා ගැනීමට සිංහල භාෂාවෙන් කතා කරන ජේ (JAY) හමුවන්න.
ඔබට විශේෂ ත්‍යාගද හිමිකර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.
Call Jay : 647 - 893 - 9661
110 Canam Crescent Brampton ON L7A 1A9

# HAVE A BUSINESS IDEA !

**If you're thinking of starting a business, we can help you with developing and preparing your business plan.**

**Not only do we write business plans, but we also guide you through registering your business and helping your with accounting and taxation needs.**

**We provide a full range of accounting, tax and business advisory services for all types of businesses.**

## Accounting & Bookkeeping services

- Financial statement preparation
- General ledger preparation
- Cash flow projections
- Invoicing and billing
- Budget and forecast reports
- Audit assistance
- Payroll services

## Tax

- Corporate Tax Preparation
- Personal Tax Preparation
- Payroll tax
- HST/GST
- Filing and Assistance with CRA

## Business Advisory

- Business plan preparation
- Business name registration
- Business Incorporation
- Feasibility report preparation

**For friendly, reliable and confidential services.**

**Please contact Anura or Yacintha**

**PYNAX ACCOUNTING AND BUSINESS SOLUTIONS**

Phone - 416- 264- 6850
647-789-7990
18 Bedle Avenue, Toronto,
ON, M2H 1K8
www.Pynax.com
Email: yp@bell.net



**SILVY FERNANDO, LL.B.**

**BARRISTER, SOLICITOR & NOTARY PUBLIC**



LAWYER FOR:

- PERSONAL INJURY
- HOME REFINANCE, PURCHASE, AND SALE
- FAMILY LAW
  (LEGAL AID CERTIFICATES ARE ACCEPTED)
- DEBT RECOVERIES/DEBT SETTLEMENT
- IMMIGRATION
- LANDLORD/TENANT ISSUES
- POWER OF ATTORNEYS AND AFFIDAVITS
- WILLS
- NOTARIZING AND COMMISSIONING

UNIT 111 – 7800 WOODBINE AVENUE, MARKHAM, ON L3R 2N7

Tel: 416-272-6587 Email: silvy@sflegal.ca





















## විශාඛාවේ සියවස් සැමරුම ටොරොන්ටෝවේ පැවති 'මාස්ටර් සර්' සංගිත ප්‍රසංගය

කොළඹ විශාඛා විද්‍යාලයේ සියවස් සැමරුමට සමගාමීව ටොරොන්ටෝවේ 'ඔන්ටේරියෝ විසාකියන්ස්' ආදි ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කල ප්‍රවීන ගායිකා විශාරද නීලා වික්‍රමසිංහයන්ගේ 'මාස්ටර් සර්' සංගිත ප්‍රසංගය අප්‍රේල් 1 වනදා දොන් බොස්කො රඟහලේදී අතිඋත්කර්ශවත් ලෙසත් ඉතා සාර්ථකවත් පැවැත්විනි.

විශාරද නීලාවන් සමග කපිල හේරත්, සුරේෂ් මාලියද්ද, මහි පැස්කුවෙල් හා සම්පත් පෙරේරා සංගීතයෙන් හා ගායනයේන් ප්‍රසංග යට දායකත්වය ලබා දුන් අතර 'රංගරා' කලායතනයේ සිසුවියන් නර්ථනයෙන් ප්‍රසංගය වර්ණවත් කළහ.











ලෝකනාථ ශාක්‍යසිංහ ධර්මරාජ බුදු සමිඳා
ලෝකවිදූ අංගීරස දසබලධාරී මුණිඳා
ලෝකතිවංකර සම්මා සම්බුදු වූ බුදු සමිඳා
ශාක්‍යමුණී සෑසිපියා සුගත තථාගත මුණිඳා

කවි පබැඳුම - ආචාර්ය ජගත් රූපසිංහ

# අපේ වෙසක් උත්සවයේ අසිරිය


■ දර්ශනපති
මෝහාන් නන්දන නානායක්කාර


ශ්‍රී සුගත තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, සම්බුද්ධත්වයට පත්වීම හා පරිනිර්වාණය යන තෙමඟුල අනුස්මරණය කිරීම උදෙසා පැවැත්වෙන වෙසක් මංගල්‍යය ලක්දිව පැරැණි රජදවස පටන් ඉතා අත්‍යලංකාර අන්දමින් සැමරූ බව වංශකතාවන්හි සඳහන් වේ. අපේ අනෙකුත් බෞද්ධ උත්සවවලට මෙන් වෙසක් උළෙලටද දිගු ඉතිහාසයක් ඇත. පැරැණි සිංහල රජ දවස එය මහත් හරසරින් සැමරූ ආකාරය පිළිබඳව මෙහිලා සලකා බැලීම අපේක්ෂා කෙරේ.

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී ලංකාගමනයත් සමග දේවානම්පියතිස්ස රජ දවස ශ්‍රී සම්බුද්ධ ශාසනය මෙරට ස්ථාපිත විය. එතැන් පටන් සෑම වසරක් පාසාම අඛණ්ඩව වෙසක් මහා මංගල්‍යය මෙරට වැසියන් විසින් සමරන ලද බවට සාක්ෂි රැසකි. දේවානම්පියතිස්ස රජතුමා බුදුසසුනට රාජකීය සම්බන්ධය තවදුරටත් තහවුරු කරනු පිණිස සිය දෙවන අභිෂේකය වෙසක් පොහෝ දිනෙක පැවැත්වූ බව මහාවංශයේ දැක්වේ.

දුටුගැමුණු මහරජතුමා විසා නැකතට අනුව රුවන්වැලි මහා සෑයේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය පිණිස ප්‍රථම පස්පිඬැල්ල කැපුවේත්, තිස්ස රජතුමා තම අභිෂේකය සිදුකළේත් වෙසක් පොහෝ දිනක බව මහාවංශයේ එකොළොස් වන හා විසි වන පරිච්ඡේදවල සදහන්ය. අපේ පැරණි සිංහල බෞද්ධ රජවරුන් විසා නැකතින් උදාවන වෙසක් මංගල්‍යය ඉතා උතුම් කොට සළකා කටයුතු කළ බව සඳහන් කළ හැකිය.

දුටුගැමුණු මහරජතුමා තමාගේ සිය 24 අවුරුදු රාජ්‍ය පාලන සමයේ බුදුන් වහන්සේ උදෙසා වෙසක් පූජාවෝ 'සුවිස්සක්' පැවැත් වූ බව මහාවංශයේ තිස්දෙවන පරිච්ඡේදයේද, ථූපවංශයෙහි හා පූජාවලියේද දක්වා ඇත. ක්‍රි.පූ. 19 යෙහිදී රාජ්‍යත්වයට පැමිණි භාතිකාභය රජතුමා තම 28 වර්ෂයක් වූ රාජ්‍ය පාලන කාලයේදී සෑම වර්ෂයකම 'මහා වෙසක් පූජාව' පැවැත් වූ බව මහාවංශයේ තිස්හතරවන පරිච්ඡේදයේ සඳහන්ව ඇත. මී, ගිතෙල්, උක්සකුරු, කිරිබත් ආදියෙන් දන්වැට පවත්වමින් මහාර්ඝ පූජාමය පරිහාරයෙන් හෙවත් විචිත්‍ර පුද පෙරහරින් වෙසක් උත්සවය සිදුකළ ආකාරය මහාවංශටීකාවේ දක්වා ඇත. ඔහු ඉතා ශ්‍රද්ධා බුද්ධිසම්පන්න ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ බවද ඓතිහාසික වාර්තාවල ඔහුගේ පාලන සමය හා සම්බන්ධ තොරතුරුවල දක්වා ඇත.

ක්‍රි.ව. 67 -111 කාල පරිච්ඡේදයෙහි මෙරට රජ කළ වසභ රජතුමාගේ සුසාලිස් වසරක් රාජ්‍ය කාලය තුල අඛණ්ඩව සැම වර්ෂයකම වෙසක් උත්සවය ඉමහත් හරසරින් සමරන ලද බව වංශකතාවන්හි සඳහන් වේ. වරින්වර මෙරටට එල්ලවූ පරසතුරු ආක්‍රමණ හා අභ්‍යන්තර අවුල් වියවුල් හේතුවෙන් රටේ සාමය විනාශ වී ගිය විටෙක නම් මෙවැනි බෞද්ධ පූජෝත්සව පැවැත්විය නොහැකි වන්නට ඇත. එහෙත් ඉතිහාසගත තොරතුරුවලින් සනාථ වන්නේ විදේශීය අන්‍යාගමික රජවරුන් පවා හා එකල ලක්දිව බෞද්ධ කටයුතු උදෙසා විශාල අනුග්‍රහයක් ලබා දී ඇති බවයි. සාමාන්‍යයෙන් වංශකතාවල සඳහන් වන්නේ වැදගත් රජවරුන්ගේ ශාසනික හා ශාසනයේ උන්නතියට ඉටු කරන ලද කාර්යභාර්යයන් පමණකි. කෙසේ වෙතත් පැරණි රජදවස වෙසක් උත්සවය අඛණ්ඩව පවත්වාගෙන එන්නට ඇතැයි විශ්වාස කළහැකිය.

බෞද්ධ කටයුතු කෙරෙහි අනුග්‍රහය දැක්වූ රජවරුන් අතර එළාර රජු විශේෂත්වයක් ගනී. වළගම්බා රජුගෙන් පසු අනුරාධපුර රාජධානියේ රජකම පැහැර ගත් තිරිතර, දාඨිය ආදි දෙමළ රාජ්‍ය පාලකයින් විහාරාරාමවලට විවිධ පරිත්‍යාගයන් කළ බව සෙල්ලිපිවල සඳහන් වේ. බෞද්ධ ජනතාවගේ සහාය දිනාගැනීමේ අපේක්ෂාවෙන් ඔවුන් එසේ කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. වසරක් පාසාම මහා වෙසක් උත්සව පවත්වා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට තුන් සිවුරු දුන් බව මෙරට රාජ්‍ය පාලනය ගෙන ගිය වෝහාරතිස්ස රජුගේ බෞද්ධ කටයුතු ගැන කියවෙන මහාවංශය සඳහන් කරයි. මෙමගින් තහවුරු වන්නේ එකල රජවරු මහා දානමය පුණ්‍ය කර්මයන් සඳහා සුදුසු දිනයක් ලෙස වෙසක් පූජෝත්සවය සැලකූ බවයි.

ක්‍රි.ව. 253-266 අතර කාලයේ රාජ්‍ය පාලනය කළ ගෝඨාභය රජුද, ක්‍රි.ව. 266-278 අතර රජ කළ දෙටුතිස් රජතුමාද ඉමහත් හරසරින් විවිධ පුද පූජා පවත්වා වෙසක් මංගල්‍යය ඉතා අත්‍යාලංකාර අන්දමින් සමරන ලද බව වංශකතාවන්හි අන්තර්ගත තොරතුරුවලින් පැහැදිලි වේ. ක්‍රි.ව. 618-623 අතර කාලයේ මෙරට රජ කළ දල මුගලන් රජු වෙසක් පූජාදී චාරිත්‍ර සියල්ලක්ම ඉටු කළ බව මහාවංශයේ සඳහන් වේ. මෙමගින් තහවුරු වන්නේ එකල වෙසක් මංගල්‍යය රාජ්‍ය පාලකයින් විසින් අනිවාර්යයෙන්ම ඉටු කළ යුතුම වූ මහඟු චාරිත්‍රයක්ව පැවති බවයි. චිරාගත සම්ප්‍රදායයන් නොකඩවා ආරක්ෂා කළ තරමට මහජනතාවගේ ආදරය, කරුණාව හා පක්ෂපාතිත්වය රජවරුන්ට දිනාගත හැකි වූයෙන් එලෙස වෙසක් උළෙල සෑම පාලකයෙකු විසින්ම මහත් හරසරින් සමරන ලද බව තහවුරු වේ.

ක්‍රි.වර්ෂ 07 වන සියවසින් පසුව වෙසක් උළෙල සැණකෙළි ස්වභාවයක් ගෙන ඇත. ආගමික උළෙලක් ලෙස සැලකූ වෙසක් මංගල්‍යය පසුකලෙක ජාතික උත්සවයක් බවට පත්වන්නට ඇත්තේ පැරණි සිංහලයන් විසින් බුදු උපත සිදුවූ මාසය තමන්ගේ අලුත් අවුරුද්ද වශයෙන්ද සැලකූ නිසා යැයි ගොඩකුඹුරේ මහතා සඳහන් කරයි. ඔහු තවදුරටත් දක්වන්නේ සූර්යයා රාශි සංක්‍රමණයට පත්වීමෙන් ඇතිවන නක්ෂත්‍ර වර්ෂය අලුත් අවුරුද්ද වශයෙන් සැලකීමේ සිරිත එකල මෙරට ව්‍යවහාරයේ නොපැවති බවයි.

ක්‍රි.ව. 853-887 අතර කාලයේ දී මෙරට රාජ්‍ය පාලනය කළ දෙවැනි සේන රජු දවස ප්‍රථම වරට වෙසක් සැණකෙළියක් සම්බන්ධව තොරතුරු මහාවංශයේ දැක්වේ. එතුමා දුගී මගී යාචකාදීන්ට සියලු ආහාර පානාදියෙන් සංග්‍රහ පවත්වා වෙසක් උළෙල සැණකෙළි ස්වරූපයෙන් සමරා අත. 'වෙසාඛ කීළං කිළෙත්වා' යන පාඨයෙන් එය ජාතික සැණකෙළියක ස්වභාවය ලත් බව තහවුරු වේ.

පොළොන්නරු යුගයේදීද වෙසක් උත්සවය ඉතා අත්‍යාලංකාරයෙන් ජාතික මහෝත්සවයක් වශයෙන් සැමරූ බව පූජාවලියෙහි මෙන්ම චූලවංශයෙහිද සඳහන් වේ. මහා පරාක්‍රමබාහු රජතුමාගේ කාලවකවානුව තුළද ඉතා උසස් ආකාරයෙන් වෙසක් උළෙල සමරා ඇත. මහාවංශයේ වෙසක් පූජා 'වෙසාඛ පූජා' නමින් හඳුන්වා ඇත. පසු කලෙක සාහිත්‍යකරුවන් එය 'වෙසක් කෙළිය' නමින් හඳුන්වා ඇත. වෙසක් උත්සවය මුල් යුගයේ දානමාන ආදි වත්පිළිවෙත් සඳහා මුල්තැන දී පැවැත්වූහ. පසුකාලයේදී කෙළිසෙල්ලම් වලින් සමලංකෘත සැණකෙළියක ස්වභාවය ගත් බව තහවුරු වේ.

එදා සිට මේ දක්වාම බෞද්ධයින්ගේ ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වූ වෙසක් මහා මංගල්‍යය නොකඩවාම ශ්‍රී ලාංකීය බෞද්ධ ජනතාව මහත් අභිමානයෙන් සමරනු ලැබීම සම්මා සම්බුදුරජාණන් වහන්සේට කරනු ලබන උතුම් වූ කළ ගුණ සැලකීමේ මාහැඟි චාරිත්‍රය පසක් කරවයි.




■ **ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි**

ආදරණීය දුවේ පුතේ

"ආශ්‍රයට සුදුසු කෙනෙක් සොයන්නේ නම් තමාට වඩා ගුණයෙන් වැඩි අයෙකු හෝ ගුණයෙන් සමානයකු සමග ආශ්‍රයට යා යුතුයි. එසේ සොයා ගන්නට නොහැකි නම් තනිවම සිටීම වඩා හොඳයි. කිසිදු ගුණයක් නැති, අසත්පුරුෂ අය සමඟ නම් ආශ්‍රයට නොයා යුතුය." නොමනා, නුසුදුසු පුද්ගලයන්ගේ ආශ්‍රය නම් තමා විසින් තමාම නසා ගැනීමක් වනු ඇත

සාමාන්‍ය ජනවහරෙහි පවතින මෙවැනි අදහසක් ගැන ඔබත් අසා තිබෙන්නට පුළුවනි. පාසලට යනතෙක්ම කුඩා දරුවන්ගේ ළමා ලෝකයේ සිටින්නේ දෙමාපියනුයි. අනතුරුව පාසල් යන්නට ආරම්භ කළාට පසුව, ළමා ලෝකයේ ආදර්ශයට ගන්නේ ගුරුවර ගුරුවරියන්ය. ඒ ගුරුවරුන් කෙරේ ඇති කරගන්නා වූ විශ්වාසය සහ ලෙන්ගතුකම නිසාය. මීළඟට 'මෝරා යන' වයස හෙවත් අවුරුදු දහතුන පමණ වන විට යහළු යෙහෙළියන්ගේ ආශ්‍රයට වැටෙති. තම ජීවිතවල මුල් කාලයේ ආදර්ශයන් වූ දෙමාපියන්ට සහ ගුරුවරුන්ට වඩා හිත මිතුරන් කෙරේ විශ්වාසය තබන්නට පටන් ගනී. කතාබහ, ගමන බිමන, ඇඳුම් පැළඳුම් ආදි වශයෙන් ඒ සියල්ලකම වෙනසක් දකින්නට හැකිය. මේ ස්වභාවය බොහෝ විටෙක අවුරුදු දහඅටක්, විස්සක් පමණ වනතෙක්ම දැකගත හැකිය. වැඩිහිටියන් ලෙස තරමකින් හෝ සිතන්නට ආරම්භ කරන්නේ ඉන් අනතුරුවය. මේ ස්වභාවය සෑම දරුවෙකුටම එක හා සමානව නොවුණත්, බොහෝ දරුවන්ගේ හැසිරීම පවතින්නේ ඒ ආකාරයෙනි.

දරුවනේ, තවත් සිතා බැලිය යුතු ජීවිත ගමනේ පරිච්ඡේදයක් ගැන කතා කළ යුතු වෙයි. ඒ වයස විස්ස, විසිපහ වන විට ජීවිත ගමනේ ඇතිවන පරිණතභාවයයි. මේ ස්වභාවය සියලු දරුවන්ටම එක හා සමාන වන්නේ නැත. එයට හේතුව නම් අධ්‍යාපනික තත්ත්වය, සමාජ පරිසරය, ආශ්‍රය, දෙමාපියන්ගේ පසුබිම හා ආගම ධර්මයද හේතු සාධක වීමයි. නූගත්, එමෙන්ම යහපත් වූ සමාජ හෝ ආගමික හෝ ආශ්‍රයක් නැති තරුණයෙකුගේ හෝ තරුණියකගේ සිතුම් පැතුම් බොහෝම ආත්මාර්ථකාමී වෙන්නට පුළුවනි.

පරිණත බව සමගින්ම අන් අයට ඇහුම්කන් දෙන්නට නැඹුරු වෙයි. යම්විටෙක කොපමණ උගත් දරුවෙකු වුවද, ඉහළ තනතුරක් දැරුවද මෙසේ කියන්නට පුළුවනි. "මම මේ ගැන අම්මාගෙන්, තාත්තගෙනුත්, අහල බලන්නම්" යම් විටෙක තමා තරම් උගත්කමක් හෝ රට ලෝකයේ අත්දැකීම් දෙමාපියන්ට නොතිබුණත්, දෙමාපියන්ගේ මුහුකුරා ගිය ජීවිත අත්දැකීම් පිළිබඳ මේ උගත් දරුවන්ට අවබෝධයක් පවතිනවා ඇත. ඒ අතීත මතයද අවදිකර ගනිමිනි. පාසල් යන කාලයේ යහළුවන්ගේ වදන්වලට රැවටිලා දෙමාපියන්ගේ, ගුරුවරුන්ගේ අවවාදවලට ඇහුම්කන් නුදුන් ආකාරයන් සිහිපත් කරමින් වෙන්නට පුළුවනි. අම්මා තාත්තා යමක් කියන විට "ඕවා යල් පැනපු අදහස් හෝ හනම්ටි කාලේ දේවල්" යනුවෙන් අවඥාවෙන් යුතුව සරදම් කළ අයුරුද මතක් වීමෙන්ද වෙන්නට හැකි ය. තවත් දරුවන්ට අතීත මතකය සොඳුරු ලෙසද සිහිපත් කරමින් දෙමාපියන්ගේ ජීවිත අත්දැකීම් කෙරේ මනා වූ විශ්වාසයක් ඇතිකර ගැනීම නිසාද වෙන්නට පුළුවනි. "ඔව් මට මතකයි, පුංචි කාලේ ඉඳලම අම්මා, තාත්තා කියපු දෙයක් කවදාවත් වැරදුනේ නැහැ."

මේ ඉහත සඳහන් කරපු තොරතුරුවලින් යහපත් වූ දේ ගැන සිතා බලන්නට යයි, පින්වත් දරුවනේ, ඔබට ආරාධනා කරන්නට කැමතියි. එහෙම වුණත්, ජීවිතය ගැඹුරින් තේරුම් ගන්නට, නැවත නිවැරැදි කරන්නට ඉතාමත් අපහසු බරපතල වැරදීමක් වන තෙක් බලාසිටින්නට එපා යයිද පවසන්නටත් කැමතියි.

ඔබ දන්නවාද? සමහරවිට ජීවිතයේ බොහෝ දුක්ඛ දෝමනස්සයන්ට මුහුනපාලා ජීවිතය ගැන යම් හෝ වැටහීමක් ලබනා විට, ඔබේ දෙමාපියන්, කරුණාවන්ත ගුරුවරුන් මෙලොව ජීවත්ව නොසිටින්නට සිදුවේවි. "මම දන්නේ නැහැ, අම්මලා තාත්තලා මේවා කොහොම දැනගෙන හිටියද කියලා. මේවා ගැන කියලා හිත හදාගන්නවත් අම්මලා තාත්තලා දැන් ජීවත්ව නැහැනේ. මට සමාවෙන්න අම්මේ තාත්තේ."

මෙම ලිපියේ මුලදීම යහළුවන් ගැන, හිතමිතුරන් ගැන සඳහන් කළා මතක ඇති. බොහෝ අයෙකුගේ ජීවිතවල ලොකු වෙනස්කම් යහළුවන් නිසා ඇතිවී තිබෙන බව පෙනේ. සමහර අයට යහළුවන් නිසා හිරේ විලංගුවේ වැටෙන්නට පමණක් නෙවෙයි. ජීවිත නැතිවෙන තරමට බලපෑම් ඇතිවී තිබේ. සමහර අයගේ ජීවිත යහමඟට පත්ව තිබෙන්නේත් සත්පුරුෂ වූද කල්‍යාණවන්ත වූත් යහළුවන් නිසායි. මේ ලෝකයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යරත්නය වූ තථාගත බුදුරජාණන් වහන්සේ දේශනා කළ දහම් මඟට යොමුවෙන්නට යයි මම ආරාධනා කරමි. මේ උතුම් වූ දේශනා ගැන ටිකක් වත් සිතා බලන්නට යයි මම ඔබට කාරුණිකව සඳහන් කරමි. භාග්‍යවතුන් වහන්සේ විසින් මංගල සූත්‍රයේ දී පෙන්වා දුන් පළවෙනි සහ දෙවෙනි මංගල කරුණුවලින් ඔබ යමක් නුවණින් සිතා බලන්න. "අසේවනාච බාලානං, පණ්ඩිතානංච සේවනා." බාලයන් නම් වූ දුර්ගුණ ඇති පුද්ගලයන් ආශ්‍රය නොකිරීමත්, සුගුණ ඇති පණ්ඩිත නම් වූ සත්පුරුෂයන් ආශ්‍රය කිරීමත් මංගල කරුණුය. භාග්‍යවතුන් වහන්සේ කල්‍යාණමිත්ත සූත්‍රයේදී මෙසේ දේශනා කරති. 'කල්‍යාණමිත්තස්ස භික්ඛවේ අනුප්පන්නාචේව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නාච අකුසලා ධම්මා පරිහායන්ති,' (මහණෙනි, කල්‍යාණ මිත්‍රයන් ඇති තැනැත්තාට නූපන්නා වූද කුසල ධර්මයෝ උපදිත්. උපන්නා වූද අකුසල ධර්මයෝ පිරිහෙත්) හැබෑවටම දරුවනේ සිතා බලන්න. අපගේ යහළුවෙක් නිසා අඩුපාඩුකම්, වැරැදි, හදාගෙන වඩ වඩාත් හොඳ මඟටම පැමිණෙන්නට හැකි නම් එය කොපමණ වටිනවාද? සිඟාලෝවාද සූත්‍රයෙහි දේශනා කොට ඇති පරිදි වැරැදි වූ මිත්‍ර ප්‍රතිරූපකයෙක් හමුවුණොත් ජීවිතයේ සියල්ලම උඩුකුරු යටිකුරු වේවි. එහි විස්තර කරන අයුරින් අඤ්ඤදත්ථුහර නම්, තම වාසිය සඳහා යහළුවන් ඇසුරු කරන පුද්ගලයායි. නිතරම කුමක් හෝ ගැනීමට මාන බලයි. වචීපරම නම් වූ මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ නම් අතීතයෙන්ද අනාගතයෙන්ද වචනයෙන් පමණක්ම සංග්‍රහ කිරීමයි. අනුප්පියභාණී නම් චිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ නම් යමක් කිරීමේදී හොඳ නරක දෙකම අනුමත කිරීමය. එමෙන්ම මුහුණට ගුණ කියා නැති තැන දොස් පැවරීමය. මීළඟට, හතරවෙනුව දක්වන භයානකම මිත්‍ර ප්‍රතිරූපක තැනැත්තා නම් අපායසහාය මිතුරාය. ඔහු හෝ ඇය විසින් මත්වතුර හෝ මත්ද්‍රව්‍ය භාවිතයට උදව් දෙනු ලැබේ. එයට සහාය වෙයි. අවේලාවෙහි නිකරුනේ සංචාරයට කැඳවාගෙන යයි. කළ යුතු දේ පවා මඟහරවා ගෙන නැටුම් ගැයුම් වැනි විනෝදජනක දේටම පොළඹවයි. එමෙන්ම සූදුවටද පොළඹවයි. මේ සඳහන් කළ සියල්ලම යම් ජීවිතයක විනාශය පිණිසම හේතු නොවන්නේදැයි ඔබම සිතා බලන්න.

ඇතැම් තරුණ දරුවන් මතට හා සූදුවට යොමු වී ඇත්තේ මිතුරු වෙසින් පෙනී සිටින ඉහත සඳහන් කළ ආකාරයේ මිත්‍ර ප්‍රතිරූපකයන් නිසාය. නැතිනම් වැරැදි යහළුවන් නිසාය. මෙසේ නොමඟට ගිය දරුවන් නිසා හඬා වැළපෙන දෙමාපියන් කොපමණ නම් වෙත්ද? යහළුවන් නිසා නොමඟට වැටී මුළු පවුලක්ම අගාධයකට ඇද දමන ස්වාමි පුරුෂයන් නිසා අන්ත අසරණ වන භාර්යාවන් කොපමණ නම් වෙත්ද? ඔබත් මෙවැනි මිත්‍ර ප්‍රතිරූපකයෙක් නොවන්නට පළමුව වගබලා ගන්න. දෙවනුව එවැනි මිත්‍ර ප්‍රතිරූපක අයගෙන් ප්‍රවේශම් වන්න. ඔබට ඒ ගැන හරි අවබෝධයක් නැතිනම්, ජීවිතවල හැබෑ අත්දැකීම් ඇති දෙමාපියන්ගේ අදහස්වලටද ඇහුම්කන් දෙන්න.

මේ පහත සඳහන් කරන යහපත් කළණ මිතුරෙක් හෝ මිතුරියක් බවට පත්වෙන්නට ඔබට හැකිද? ඔබ දැනටමත් මෙවැනි යහපත් අයෙක් නම් කොපමණ අගනේද?

"ආශ්‍රයට සුදුසු කෙනෙක් සොයන්නේ නම් තමාට වඩා ගුණයෙන් වැඩි අයෙකු හෝ ගුණයෙන් සමානයකු සමග ආශ්‍රයට යා යුතුයි. එසේ සොයා ගන්නට නොහැකි නම් තනිවම සිටීම වඩා හොඳයි. කිසිදු ගුණයක් නැති, අසත්පුරුෂ අය සමඟ නම් ආශ්‍රයට නොයා යුතුය." නොමනා, නුසුදුසු පුද්ගලයන්ගේ ආශ්‍රය නම් තමා විසින් තමාම නසා ගැනීමක් වනු ඇත.

## ලක්දිව අසිරිමත් ධර්ම කතා

■ **ධර්ම සෙන්දනායක**

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් තෙමසකට පසු රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගල් ලෙනේදී මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්, රහතන් වහන්සේ 500 නමකගේ සහභාගිත්වයෙන් පවත්වන ලද ප්‍රථම ධර්ම සංඝායනාවේදී බුදුරජාණනන් වහන්සේ දේශනා කරන ලද සියලුම සූත්‍ර දේශනා සංඝායනා කොට දීඝ නිකාය, මජ්ඣිම නිකාය ආදි කොටස් මතක තබා ගනිමින් ඉදිරියට ගෙනයාමේ පූර්ණ වගකීම රහතන් වහන්සේ විසින් භාර ගනු ලැබූහ. විවිධ ලාභාපේක්ෂාවෙන් බුදු සසුනේ පැවිදි බව ලැබූ තීර්ථක පිරිස් බුදු දහම විකෘති කිරීමට සැරසීම නිසා ඉන් පසුවද අවස්ථා කීපයකදීම ධර්ම සංඝායනා කීපයක්ම පවත්වා ත්‍රිපිටක බුදු දහම ඉදිරියට ගෙන යාමට මහ සඟ රුවන මහත් කැපකිරීමක් කළහ.

ධර්මාශෝක රජතුමාගේ අනුග්‍රහය යටතේ මොග්ගලීපුත්ත තිස්ස රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් දඹදිව පැළලුප් නුවරදී පවත්වන ලද තෙවැනි ධර්ම සංඝායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රදේශ නවයකට ධර්මදූත කණ්ඩායම් යවන අතර රජුගේ පුත් මිහිඳු මහ රහතන් වහන්සේ ලක් දිවට බුදුදහම ගෙන වැඩි සේක. උන් වහන්සේ විසින් ත්‍රිපිටක බුදු දහම අර්ථ කථා (අට්ඨ කථා) ලිවීමද ආරම්භ කළහ. ලක්දිව දී පැවිදි වූ මුල්ම ලාංකිකයා වූ 'අරිට්ඨ' රහතන් වහන්සේගෙන් ඇරැඹී බුදු දහම කටපාඩමින් ගෙන එමින් රැක ගැනීමේ ගෞරවය හිමිවිය යුත්තේ ශ්‍රී ලාංකික සංඝ රත්නයටයි. අට්ඨ කථාවල සඳහන් වන ආකාරයට ලක්දිව රහතන් වහන්සේ රැසක්ම වැඩ සිටි බව පෙනේ.

එක් කලෙක ලක්දිව සතර මග සතර ඵලවලට පත් නොවූ එකද භික්ෂුවක් හෝ නොවූ බව සඳහන්වේ. මහා විහාරයේ දකුණු දොරටුවේ සිට රුවන්සෑය දෙස බලා සිට සමාධියට සම වැදී විදසුන් වඩා 30,000 ක් දෙනා රහත් වීමට මුල් වූ බවද සඳහන් වේ. ථූපාරාමයේ අභය වැව් ඉවුරේ නුවර දකුණු වාසලේ ආදි තැන්වලදී 30,000 ක් රහත් වූ බව සඳහන් වේ. එසේ රහත් වූ සංඛ්‍යාව මහ සෑ මළුවේ වැලිකැට සංඛ්‍යාවට වැඩි බව මහ තෙර නමක් පැවසූ බවක්ද සඳහන් වේ. පසු කලෙක සිතුල් පවුවේ හා තිස්සමහාරාම පමණක් රහතන් වහන්සේ 24,000 ක් වැඩ සිටි බව විභංග අට්ඨකථාවේ දැක්වේ.

විවිධ ප්‍රදේශවල, බොහෝ විට ලෙන් විහාරවල ජීවත් වූ රහතන් වහන්සේ පිළිබඳ රසවත් කථා සමන්තපාසාදිකාව, වැනි අටුවා පොත්වලත්, සහස්ස වත්ථු, සීහල වත්ථු, රසවාහිණී යන ග්‍රන්ථවලද දක්නට ලැබේ. මලියදේව තෙරුන්, කාලබුද්ධ රක්ඛිත තෙරුන්, තලගුරු වෙහෙර වැසි ධම්මදින්න තෙරුන්, මහා ඵුස්ස දේව තෙරුන්, ත්‍රිපිටක චූලාභය තෙරුන්, මහා තිස්ස මහා සිව තෙරුන් ආදී රහතන් වහන්සේ පිළිබඳ විවිධ තොරතුරු මේ ග්‍රන්ථවලින් දැක්වේ.

කාවන්තිස්ස රජු, මහානාග රජු, දුටුගැමුණු රජු, සද්ධාතිස්ස රජු, මහා දාඨික මහානාග රජු, වසභ රජු, ධාතුසේන රජු ආදි රජවරුන් නිරන්තරයෙන් රහතන් වහන්සේ ඇසුරු කළ බව එම ග්‍රන්ථ තුළින් දැකිය හැකිය. දුටුගැමුණු රජු ද්‍රවිඩ ආක්‍රමණිකයන්ගෙන් අනුරාධපුරය නිදහස් කර ගැනීමෙන් පසු එම සටනේදී මියගිය මිනිස් සංඛ්‍යාව පිළිබඳව දුකෙන් සිටින විට පියඟු දිවයින් වාසී රහතන් වහන්සේ නමක් රජු අස් වසමින් රජු අතින් මැරුණේ මිනිසුන් 1 1/2ක් පමණක් යැයි කී බවක් සඳහන් වේ. (මිනිසුන් 1 1/2යනු තිසරණ සහිත පන්සිල් සමාදන් වී සිටි එක් අයෙකුත්, තිසරණ පමණක් ගිය කෙනෙකුත් බවයි). කෙසේ වෙතත් මේ ප්‍රකාශය බුදු දහමට පටහැනිය. කවර ආකාරයේ වුවද ප්‍රාණඝාතය දරුණු අකුසල කර්මයකි. රහතන් වහන්සේ එසේ නොකරනු ඇත.

ගැමුණු කුමරු හා තිස්ස කුමරුන් අතර චුල්ලංගණියේ සිදුවූ සටනින් පැරැදී පලා යන අතර, වනයේ සැඟවී සිටියදී අධික කුස ගින්නක් දැනී කෑමට යමක් ඇත්දැයි ආරක්ෂාවට සිටි ඇමැතියාගෙන් ඇසූ විට රන් භාජනයක සඟවාගෙන තිබුණු ආහාර පිළිගැන්වීය. රජු ඒ ආහාරය කොටස් හතරකට බෙදා

19 වන පිටුව බලන්න



# දුක සහ බිය



වෙසක් කලාපය
බු.ව. 2561

■ කිරින්දේ ශ්‍රී ධම්මානන්ද හිමි

තමන්ගේ ප්‍රශ්නවලට ස්ථිර විසඳුම් ලබා නොදෙන නිරන්තරයෙන් වෙනස්වන සුළු මේ ලෝකයෙහි වෙසෙන තමන්ටත් තමන්ගේ ප්‍රියයන්ටත් රැකවරණ ලබා ගැනීමට මිනිසා නිතරම අපේක්ෂා කරනවා. ඔහු තමන්ට මුහුණපාන්නට සිදුවන කිසියම් ප්‍රශ්නයක් විසඳා ගන්නා ලදැයි සිතන විට ඒ ප්‍රශ්නය හා බැඳුණු හේතු - ප්‍රත්‍යය වෙනස් වී තවත් ප්‍රශ්න මාලාවක් හටගන්නවා. මේ නිසා ඔහු පෙර සිටි අවුල්, අසරණ තත්ත්වයටම නැවත පත් වෙනවා. මුහුදු වෙරළෙහි වැලි මාලිගා තනන කුඩා දරුවකු ගලා එන හැම රැල්ලකටම බයෙන් ඉන්නවා වාගේ, මිනිසාත් නිතරම සිටින්නේ බිය මුසු වූ අපේක්ෂාවෙන් යුක්තව. රැකවරණය උදෙසා ඇති දැඩි අපේක්ෂාවත් මරණය කෙරෙහි දක්වන බයත් හේතුකොට ගෙන මිනිසා මිථ්‍යා විශ්වාසයන්ට ගොදුරු වෙනවා.

විශ්වයේ ඇති හිස් බවෙන් වට වී සිටින මිනිසා තමන් තුළ බය ඇති කිරීමට හේතු වන දේ කෙරෙහි භක්තියක් ඇති කර ගන්නවා. මුල් ආගමික විශ්වාස බිහි වුණේ මෝහය හා නාඳුනන බලවේගයන් කෙරෙහි වූ බය පදනම් කොට ගෙන. මෙලොව ඇති සියලු දේ අපූර්ව අද්භූත බලගතු දෙවිවරුන් විසින් පාලනය කරනු ලැබෙන බවත්, විශ්වයේ සියලු දේ සිදු කෙරෙන්නේ මේ දෙවිවරුන් විසින් බවත් විශ්වාස කරනු ලැබෙන්නේ මේ මෝහය හා බය නිසාය. මෙවන් විශ්වාස තුරන් කරලීමට විද්‍යාව මගින් ඉමහත් සේවයක් ඉටු වී ඇතත්, විද්‍යාව හේතුකොට ගෙන නූතන මිනිසාගේ දැනුම වර්ධනය වී ඇතත්, අතීතයේ සිට දායාද වශයෙන් ආ නොයෙකුත් මිථ්‍යා විශ්වාස බොහෝමයක් අදත් මිනිසුන් අතර පවතිනවා.

තමන් විසින්ම අටවාගෙන ඇති මේ බන්ධනයෙන් සම්පූර්ණයෙන් මිදීමට මේ දක්වා මිනිසා සමත් වී නැත. මිථ්‍යා විශ්වාස හේතුකොට ගෙන සිත දුබල වී වහල් බවට පත්වෙනවා. මෙවන් මිථ්‍යා විශ්වාස මුල් බැසගෙන පවතින්නේ නූගත් අය අතර පමණක් නොවේ. ඉතා උගත් පිරිස් අතරත් මිථ්‍යා විශ්වාස බලවත්ව පවතිනවා. "බය කොතැනක ඇති වුණත් ඒ බය ඇති වන්නේ අඥාන පුද්ගලයින් තුළ මිස ඥානවන්තයින් තුළ නොවේ" ය යන බුද්ධ වචනය සිහිපත් කළ යුතුයි.

## සන්තාපය හේතු කොට ගෙන අපට සිදුවන දේ

"ඊර්ෂ්‍යාව, ද්වේෂය, බය ආදි හැඟීම් පුරුද්දක් වශයෙන් පවතින්නට වූ විට ඒ හේතුකොට ගෙන ඇත්තටම ලෙඩ රෝග උද්ගත වේ" යැයි ඇලෙක්සිස් කැරල් නම් වෛද්‍යවරයා පවසනවා. දියවැඩියාව, අධික රුධිර පීඩනය, අම්ලය නිසා උදරයේ ඇතිවන තුවාල, සමේ රෝග, ඇදුම ආදි විවිධ රෝග හට ගන්නේ, එසේ නැත්නම් උත්සන්න වන්නේ බිය මුසු අපේක්ෂාව හා සන්තාපය හේතු කොට ගෙන බව වෛද්‍ය විද්‍යාව මගින් පිළිගැනෙන මතයයි.

ජීවිතයේ අප බලාපොරොත්තු වන දේ ලබා ගැනීමට නැඹුරු වීමේදී ඇතිවන සිතිවිලි මගින් කායික අපහසුතා, විපර්යාස ඇති වීමට ඉඩ ඇත. රෝගීන් බොහෝ විට සුවය ලබන්නේ රෝග නිදානය පරීක්ෂා කොට බලා වෛද්‍යවරයන් විසින් කෙරෙන නිගමනයන්ට අනුකූල ආකාරයට නොව, රෝගීන්ගෙන් අපේක්ෂාවන්ට අනුකූල ආකාරයකට යන්න වෛද්‍යවරුන් දරන අදහසය. මානසික පීඩා හේතු කොටගෙන සෞඛ්‍යය පිරිහීමට පත් වේ. සිත්තැවුල් සහ අසහනයට නිසියාකාරව මුහුණ දීමට නොදන්නා ව්‍යාපාරිකයින් බොහෝ විට තරුණ වයසේදීම මිය යනවා. බාහිර ලෞකික ලෝකයේ ඇතිවන විවිධාකාර ගැටුම්වලින් කම්පාවට පත් නොවී අධ්‍යාත්මික ශාන්තිය පවත්වාගෙන යෑමට සමත් අය ශාරීරික හා ස්නායු ආබාධයන්ගෙන් ආරක්ෂා වෙනවා.

ශාරීරික හා මානසික ආබාධයන්ගෙන් වැඩි කොටසක් සිත්තැවුල් නිසා හටගන්නා බව අත්දැකීම්වලින් පැහැදිලියි. වයසට යෑමෙන් පිච්චෙන ලේ ප්‍රමාණයට වඩා වැඩි ලේ ප්‍රමාණයක් සිත් තැවුල් හේතු කොට ගෙන පිච්චෙනවා. බය, සිත්තැවුල් හා අපේක්ෂා ආදිය ආත්ම සංරක්ෂණය සඳහාත් එක්තරා ප්‍රමාණයකට අවශ්‍යයි. එහෙත්, මේ හැඟීම් පාලනය කළ හැකි තත්ත්වයේ පැවතිය යුතුයි.

නිරන්තරයෙන් පවතින බය හා දිගින් දිගට පවතින සිත් තැවුල් මිනිස් සිරුරට ඉතා හානිකරයි. මිනිස් සිරුරේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය මේ හේතුවෙන් බොහෝ සේ දුබල වේ.

ශාරීරික ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ නොයෙකුත් ආබාධයන්ට ප්‍රතිකාර කිරීමේදී රෝගියාගේ මානසික තත්ත්වය ගැන සොයා බැලීම් ඉතාම වැදගත් බව වෛද්‍යවරුන් දරන මතයයි. සිත්තැවුල් මගින් ප්‍රශ්න නොවිසඳෙනවා පමණක් නොව එමගින් එම ප්‍රශ්න තවත් උග්‍ර වී ශාරීරික හා මානසික විනාශයද ඇතිකරන බව වෛද්‍යවරුන් වටහා ගෙන ඇත. සිත් තැවුල් හේතු කොටගෙන පීඩා විඳින්නේ ඒ පුද්ගලයා පමණක් නොවේ. ඔහු නිසා ගෙදර පරිසරය, කාර්යාල පරිසරය, බොහෝ විට සමාජ පරිසරයද දූෂ්‍ය වේ. සිත්තැවුල් හේතු කොටගෙන පුද්ගලයකු වගකීමෙන් තොරව කරන කටයුතු නිසා සාමයට බාධා පැමිණෙන අතර ඔහු වටා සිටින අයගේ සතුටත් විනාශ වෙනවා.

සිත්තැවුල් පමණටම බයත් හානිකරයි. සිත් හි නිරන්තරයෙන් පවතින බය හේතු කොටගෙන පුද්ගලයකු මානසික අසහනයෙන්, දැඩි වේදනාවෙන් පෙළෙන්නට පටන් ගන්නවා. බය ක්‍රම ක්‍රමයෙන් ජීවිතය කා දමන අතර මනස දීන කරනවා. බය එක්තරා අසුබවාදී බලවේගයක්. එමගින් අනාගතය අඳුරු කෙරෙනවා. සිතෙහි බිය පවතින විට සිතීම විකෘති වෙනවා. මේ අයහපත් මානසික තත්ත්ව පුද්ගලයකුගේ පෞරුෂයට අහිතකර ලෙස බලපාන අතර ඔහුගේ සිතෙහි හොල්මන් මෙන් පැලපදියම් වෙනවා. බය අපට කොතරම් අහිතකර ලෙස බලපාන්නේද කියතොත් එය මිනිසාගේ පරම සතුරා වශයෙන් හැඳින්වෙනවා. බය කෝටි සංඛ්‍යාත ජන සමූහයකගේ සිත් අරක් ගෙන ඇත. මෝහාන්ධකාරයේ වෙලී ගැලී සිටින මානව වර්ගයාගේ ඉරණම වී ඇත්තේ දෙවිදේවතාවන්ගෙන්, යක්ෂ - ප්‍රේත - කුම්භාණ්ඩයන්ගෙන්, භූතයන්ගෙන් ඇති වෙතැයි විශ්වාස කෙරෙන බියෙන් වෙළී මිරිකී පීඩා විඳිමින් ජීවත් වීමය.

මුහුණ පාන්නට සූදානමක් නැති බලාපොරොත්තු රහිත ව්‍යවසනයක් ඉදිරියෙහිදී ඇති වන බය නිසා සිහිවිකල් තත්ත්වයක් වුවත් ඇති වීමට ඉඩ තිබේ.

# ලක්දිව අසිරිමත්...

19 වන පිටුවෙන්

(සංඝරත්නයට, රජුට, ඇමැතියාට, වෙළඹට) සිරිත් පරිදි මුල්ම කොටස පිළි ගැනීමට මහා සංඝයාට කාල ඝෝෂා කරන ලෙස ඇමැතියාට දැන්වූ විට එම ශබ්දය දිව කණින් ඇසූ ගෝතම තෙරුන් වහන්සේ තම ශිෂ්‍ය 'තිස්ස කුටුම්බිය පුත්ත' තෙරුන් රජුගේ දානය පිළිගැනීමට යැවූ බව 'රසවාහිණියේ' දැක්වෙන අතර 'අංගුත්තර' අටුවාවෙහි දැක්වෙන්නේ 'බෝධිමාතු තිස්ස' තෙරුන් නමිනි.

සද්ධාතිස්ස රජතුමාද බොහෝ ලක්දිව බෞද්ධ කථාවල දක්නට ලැබෙයි. මිහින්තලේ අසළ කළුදිය පොකුණ සමීපයේ, කළු තිඹිරි ගසක් යටදී, කළුවර පෝය දිනෙක, කළු හෙයින් කාලබුද්ධරක්ඛිත නම් වූ රහතන් වහන්සේ 'කාලකාරාම සූත්‍රය' දේශනා කරන අවස්ථාවේදී තරමක් ප්‍රමාද වී පැමිණි සද්ධාතිස්ස රජු හිටිවනම රාත්‍රිය පහන් වන තුරු එම දේශනාව ශ්‍රවණය කළ බව ග්‍රන්ථ කීපයක සඳහන් වේ.

තවත් අවස්ථාවකදී සද්ධාතිස්ස රජුට වටුමස් කෑමට ආශාවක් ඇති වී එය ප්‍රකාශ කළොත් දහස් ගණන් වටුවන් මැරීමට මිනිසුන් පෙළඹෙතැයි සැක කොට වසර 3 ක්ම ආශාව මැඩගෙන සිටියේය. රජුගේ කණින් ලේ සැරව ගලා යන්නට විය. සතුන් නොමරන මිනිසෙකු සොයා 'ත්‍රිකෝටි පාරිශුද්ධ වටු මසක් ලදොත් ගෙනෙව' යි කීය. ඔහු උදෑසන මැරුණ වටුවන් විකුණන මිනිසෙකුගෙන් වටුවන් තිදෙනෙකුගේ මස් මිල දී ගෙන උයා රජුට පිළිගැන්වීය. රජු එම මස් ස්වල්පයක් ගෙන මුවෙහි තැබූ කෙණෙහිම එහි රසයෙන් මහත් සතුටක් ලැබීය. මා වැනි රජෙකුට වසර 3 ක් තිස්සේ වටුමස් කෑමට නොලැබුණේ නම් මහා සංඝයා වහන්සේ කොහෙන් ලබන්නද යැයි සළකා කටට ගත් මස් ස්වල්පයද ඉවත දැම්මේය. ළඟින් සිටි ඇමැතිවරයා ඒ දැක දණින් වැටී කටින් ගෙන අනුභව කළේය. ඔහු නිර්දෝෂී බව රජතුමා අවබෝධ කර ගත්තේය. පසුවදා වනතුරු මස් තැබීමට නියම කළේය.

පසුවදා සුපුරුදු පරිදි කන්ථකසාල පිරිවෙන්වාසී මහ තෙරුන් වහන්සේ පිඬු පිණිස රජමැදුරට වැඩියහ. තවත් භික්ෂු නමක්ද එහි වැඩියහ. ආගන්තුක හිමි නම රජුගේ ආරාධනාව මත වඩින්නට ඇතැයි මහ තෙරුන් වහන්සේ සිතීය. ඒ භික්ෂූන් වහන්සේ මහ තෙරුන් වහන්සේගේ අතවැසි හිමි නමක් වෙන්නට ඇතැයි රජු කල්පනා කළේය. එම තෙරුන් වහන්සේ වඩා හිඳුවා මුලින්ම කැඳ පිළි ගැන්වීය. අනතුරුව එක් වටුවෙකු බැගින් තෙරුන් වහන්සේට පිළිගැන්වීය. ඉතිරි වටුවාගේ මස් භික්ෂූන් වහන්සේලාගෙන් නොවිචාරා අනුභව කිරීම නුසුදුසු යැයි සිතා මහ තෙරුන්ට පිළිගැන්වුවද අතින් පාත්‍රය වසා ප්‍රතික්ෂේප කළේය.අනෙක් තෙරනම පිළි ගත්තේය. රජුට වටුමස් කෑමේ ආශාව ඉටුකර ගැනීමට නොහැකි විය. දන් වැළඳීමෙන් පසු ආපසු වඩින අතර 'ස්වාමීනී එක් උගත් භික්ෂු නමක් සමඟ වැඩීම මැනවි' යැයි රජතුමා පැවසීය. එම ප්‍රකාශය නිසා එම භික්ෂුව රජතුමාගේ ආරාධනාවක් අනුව නොපැමිණි බව මහතෙරුන් වහන්සේට වැටහිණි. වෙනත් දිනයකදීද එම මහතෙරුන් වහන්සේ තවත් අතවැසි භික්ෂු නමක් සමඟ රජ මැදුරට වැඩියහ. එදිනද රජතුමා වටු මස් පිළියෙළ කර තිබූ අතර, මහ තෙරුන් වහන්සේ එක් වටුවෙකුගේ මස් පිළිගත් අතර අතවැසි භික්ෂුව වටුවෙකුගේ මස්වලින් අඩක් පමණක් පිළි ගත්තේය. එවිට ඉතිරි වටු මස් අනුභව කිරීමෙන් රජුගේ ආශාව සංසිඳිණි.

'සීහල වත්ථු' නම් ග්‍රන්ථයේ සඳහන් වන 'ඵුස්සදේව' තෙරුන් වහන්සේ සම්බන්ධ කථාද ඉතාම සිත්ගත් කථාවන්ය. මේ තෙරුන් වහන්සේ දුටුගැමුණු රජතුමාගේ සහෝදරියකගේ පුතෙකු බව මෙහි සඳහන් වන අතර මහා වංශයේ එසේ සඳහන් නොවේ. උන් වහන්සේ ලක්දිව 'කාලකන්දර' හෙවත් 'කටකඳුරු' නම් විහාරයක වැඩ සිටියහ. උන් වහන්සේ පිඬු සිඟා වඩින විට කුඹුරුවල වැඩ කරන ගොවීහු ගොනුන් ලිහා දමා තෙරුන්ට වැඳීමට පැමිණෙති. මේ සිරිත නොකඩවා කෙරෙන විට එම ගවයෝද ඊට පුරුදුවී තෙරුන් එනතුරු බලා සිටියහ. ඉතා හොඳින් වත් පිළිවෙත්වල යෙදෙමින් නිරතුරුව භාවනාවෙන් කල් යැවූ ඒ තෙරුන් කෙරෙහි පැහැදීමෙන් එම ගවයෝ මරණින් මතු දෙව්ලොව උපත ලැබූහ. එම දෙවිවරු පන්සියදෙනා ශක්‍ර දෙවියන් හමුවට ගොස් 'ඵුස්සදේව' තෙරුන් ගැන ගුණ වැනීමක් කළහ.

ශක්‍ර දෙවියන්ටද එම තෙරුන් දැකීමට ආශාවක් ඇති විය. ශක්‍ර දෙවියෝ තෙරුන් හමුවට ගොස් දෙව්ලොවට යාමට ආරාධනා කළහ. සෘද්ධි බලය නැති බැවින් තමාට පැමිණීමට නොහැකි බව පැවසූ විට ශක්‍ර දෙවියන් විසින් තෙරුන් ඔසවාගෙන දෙව්ලොවට ගෙනයනු ලැබූහ. මෙසේ කීප වරක්ම ශක්‍ර දෙවියන් විසින් ඵුස්සදේව තෙරුන් දෙව්ලොවට ගෙනගිය අතර තෙරුන් විසින් දෙවියන්ට ධර්ම දේශනා කර ඇත. චක්‍රවර්ති මාර දිව්‍ය පුත්‍රයා වරක් මේ තෙරුන් වහන්සේ භාවනා කරමින් සිටින අතර පැමිණ විවිධ වෙස් ගනිමින් භාවනාවට බාධා කළහ. අවසානයේදී තෙරුන්ගේ ඉල්ලීම අනුව මවන ලද බුදු රුවක් දෙස බලා බුද්ධානුස්සති භාවනාව වඩා සමාධියට සම වැදී ඒ තුළින් විදසුන් වඩා රහත් වූ බවද සඳහන්වේ. මේ තෙරුන් වසර 19 ක්ම 'ගත පච්චා ගතවත' පුරා ඇත.

අම්බඛාදක තිස්ස තෙරුන් වහන්සේගේ කථාවද සීලය පිළිබඳ සිත්ගත් කථාවකි. එක්තරා සාගත කාලයකදී මේ තෙරුන් වහන්සේ පිණ්ඩපාතයේ වැඩි අතර කිසිදු අහරක් නොලැබ ක්ලාන්ත වී අඹගසක් යට නිදාගෙන සිටියහ. ඒ අඹගසයට ඉදුන අඹ ගෙඩි රැසක්ම බිම වැටී තිබිණි. එහෙත් පිළිගැන්වීමකින් තොර අහර වැළඳීම ඇවැතක් සිදුවන බැවින් තෙරුන් වහන්සේ ඒ අඹ දෙස නොබැලූහ.

එතැනින් ගිය උපාසකයෙක් මේ තෙරුන් දැක අඹ ගෙඩි කීපයකින් පානයක් සකස් කොට තෙරුන්ට පිළිග ැන්වීය. එය වැළඳීමෙන් කාය ශක්තියක් ලැබුණද, නැගිට යාමට තරම් ශක්තියක් නොතිබිණි. ඒ බව දුටු උපාසකයා තෙරුන් ඔසවාගෙන උන් වහන්සේගේ ආරාමයට ගෙන ගියේය. උපාසකයාගේ කර මතින් යන අතර 'මොහු මාගේ නෑයෙක්ද නොවෙයි. හිතවතෙක්ද නොවෙයි. මොහු මට මෙසේ උපකාර කරන්නේ ඇයි?' යනුවෙන් තමන්ගෙන්ම ප්‍රශ්න කරමින් ඔහුට මහත් ආනිශංස ලබාදීමට සිතා කර මතදීම භාවනා වඩා රහත් බව ලැබූහ.

මෙවැනි කථා රැසක්ම 'සීහල වත්ථු' 'සහස්ස වත්ථු' ආදි සිංහල බණකථා සාහිත්‍යයේ සඳහන්වේ.




# පිරිතේ ආරම්භය හා විකාශනය

■ ශාස්ත්‍රපති උඩුබද්දාවේ අස්සජි හිමි

වර්තමාන පිරිත් ක්‍රමයේ ආදිතම අවස්ථා පිළිබඳ විමර්ශනය කරන විට එහි මූලාරම්භය ප්‍රාග් බෞද්ධ යුගය දක්වා සම්බන්ධ වන බව පෙනේ. 'පරිත්ත' යන වචනය ප්‍රාග් බෞද්ධ යුගයේ භාවිත වූ ක්‍රම අතර දක්නට ලැබේ. විශේෂයෙන්ම ජාතක කථා ආශ්‍රිතව ආරක්ෂාව සඳහා නොයෙක් මන්ත්‍ර ආදිය භාවිත වූ බවක් හා බහුලවම ඒවා පිරිත් අර්ථයෙන් ක්‍රියාත්මක වන්නට ඇතැයිද අනුමාන කළ හැකිය. සාමාන්‍යයෙන් පිරිත සඳහා උපයෝගි කරගනු ලබන පිරිත් නූල් වැනි දේ ජාතක කථාවලදී ආරක්ෂාව සඳහා යොදා ගෙන ඇති බවක් පෙනී යයි.

එමෙන්ම සමහර පිරිත් සූත්‍රවලට අයත් වන කොටස්වල ප්‍රාග් බෞද්ධ යම් යම් ඇදහිලිවල ඡායාවන් දැකගත හැකිවේ. එසේ වුවත් එය එක එල්ලේම ඉදිරිපත් කළ නොහැකි අදහසකි. කෙසේ වෙතත් මෝර ජාතකය ආශ්‍රයෙන් පිරිත් පොතට ඇතුළත් වී ඇති මෝර පිරිතෙහි මුල් කොටසේ අන්තර්ගත වන්නේ 'සූර්ය වන්දනාව' යි. මේ පිළිබඳව අටුවා මතය වන්නේ එය 'බ්‍රහ්ම වන්දනාව' බවයි. එම පිරිතේ දෙවන කොටසට 'බුද්ධ වන්දනාව' ඇතුළත් වන අතර, අටුවාව එය විග්‍රහ කරන්නේ " පරිත්ත" යනුවෙනි. ඒ අනුව එම වන්දනා ක්‍රමය තුළින් ආරක්ෂාව ලබා ගැනීම සඳහා උපයෝගී කර ගත් විධික්‍රමයක් දක්නට ලැබෙන බව උපකල්පනය කළ හැකිය.

පූජා චාරිත්‍රවලින් යුත් පරිත්‍රාණ දේශනාවක් මුල් වරට දක්නට ලැබෙන්නේ විශාලා මහ නුවර තුන් බිය දුරු කිරීම සඳහා බුදුන් වහන්සේ රතන සූත්‍රය දේශනා කළ අවස්ථාවේදීය. ඒ දේශනා අවස්ථාවලදී බලිකර්ම සඳහා යොදා ගන්නා උපචාර විධි යොදා ගැනීමට උපදෙස් දී තිබේ. එයින් බලි කර්මයකට සමාන සේ මෙය ආරම්භ කර තිබූ බව පෙනේ. ඒ නිසා එහිදී පිරිත් දේශනාව අංග සම්පූර්ණ පූජා චාරිත්‍ර විධියක් බවට පත්ව ඇති බව හා බුදුන් වහන්සේ ලවාම එය අනුමත කරවාගෙන ඇති බවත් නිගමනය කළ හැකිය.

## ලක්දිව පිරිතේ ආරම්භය හා විකාශනය

ලක්දිව පිරිත පිළිබඳව විජය පුරාවෘත්තයේ යම් සඳහනක් මුල් වරට දක්නට ලැබේ. බුදුන් වහන්සේ දුන් උපදෙස් මත ශක්‍රයා විසින් මෙහෙයවන ලද උපුල්වන් දෙවිඳු පැවිදි වෙස් ගෙන ලංකාවට විජය ඇතුළු පිරිස පිටත් වන්නට සූදානම් වූ අවස්ථාවේ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා පිරිත් පැන් ඉස පිරිත් නූල් බැඳ එන්නට ඉඩ සැලසූ බවට වංස කථා සාක්ෂි දරයි. මේ පුරාවෘත්තයෙන් කරුණු රාශියක් පිළිබඳව යම් වැටහීමක් ලබා ගත හැක. ඉන් වැදගත්ම කාරණාව නම් ලංකාවට පැමිණි ආර්යයන් බෞද්ධයන් බව දැක්වීමය. අනිත් කරුණ නම් ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීමට පෙර සිටම ඉන්දියාවේදීම ආර්යයන් පිරිත් භාවිත කර ඇති බවයි. එසේම සිංහල වර්ගයාගේ ආරම්භයේ සිටම සෙත් පිරිත් භාවිතය දැන සිටි බවද සනාථ කර ගත හැකිවේ.

මුල් කාලීන අවස්ථා පිළිබඳ මහාවංසය ආශ්‍රිතව කරුණු පරීක්ෂා කර බලන විට සුලබව පිරිත් දේශනා කිරීමක් ගැන සාක්ෂි සොයා ගැනීම අපහසුය. දුටුගැමුණු අවධිය වන විට ලාංකීය බෞද්ධ ජනතාව පරිත්‍රාණ පූජා යම් තරමකින් තම ජීවන රටාවේ සුබ සිද්ධිය සඳහා දායක කරගත් බවක් දක්නට ලැබේ. ඒ යුගයේදී මේ සඳහා භාවිත කර ඇත්තේ 'ධම්ම සජ්ඣායන යන පදයයි. රුවන්වැලි සෑයේ ධාතු නිධානෝත්සවය නිමිති කරගෙන දුටුගැමුණු රජතුමා මෙම ධම්ම සජ්ඣායනාවක් සිදු කර ඇත. මෙයින් පෙනී යන්නේ පැරණි කල මෙය ජනප්‍රිය නොවූ බවකි. එසේ නැතිනම් මෙම වචනය ජනප්‍රිය නොවී තිබුණු බවයි. කෙසේ වුවද මේ පිළිබඳව නිශ්චිත නිගමනයක් දීම අසීරු වුවද මහා විහාරික හෝ අභයගිරි, ජේතවන දෙනිකාය අතින් හෝ පිරිත ජනප්‍රිය වූවා යයි අනුමාන කළ හැකිය. බුද්ධඝෝෂ හිමියන්ගේ අටුවා තුළින් හා බුද්ධදත්ත හිමිගේ කෘතිවලින් ඒ සඳහා යම් සාධකයක් ලබා ගත හැකිය.

ලාංකික පිරිත පිළිබඳව ප්‍රබල සාධකයක් දක්නට ලැබෙන්නේ 1 වන උපතිස්ස (ක්‍රි.ව. 362 - 409 ) රජුගේ කාල වකවානුවේදීය. ඒ කාලයේ ඇති වූ දුර්භික්ෂ හා රෝග බියක් සංසිඳුවා ගැනීම සඳහා රතන සූත්‍රය දේශනා කර ඇත. උත්කර්ෂවත් ලෙස පැවැත්වූ එම උත්සවය විශාලා මහනුවර පිරිත් දේශනයට සමානව පවත්වා ඇත.

මාර්ගය දෙපස සරසා බුද්ධ ප්‍රතිමාවක් තනා ඒ පිළිමයේ දෙඅත් මත ගලින් කළ පාත්‍රයක් තබා භික්ෂූන් පිරිවර කොට වීථි සංචාරය කරමින් මුළු නගරය පුරාම පිරිත් පැන් ඉස ඇත. එයින් මොහොතකට පසුව වර්ෂාව ලැබුණු බව මහාවංසය සඳහන් කරයි. මහාවංසයේ ගංගා රෝහණ වර්ණනාව ලෙස දැක්වෙන්නේ මෙම රතන සූත්‍ර දේශනාව බව වල්පොළ රාහුල හිමියන්ගේ අදහසයි. එසේම පිරිත් කීමෙන් ආරක්ෂාව සිදුවෙතැයි යන විශ්වාසය ඇතැම් විට උපතිස්ස රජුගේ දවසටත් වඩා පැරණි වන්නට හැකි බව ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා ප්‍රකාශ කරයි. නමුත් උපචාර සහිත පිරිත් දේශනයක් ගැන ඓතිහාසික පුරාවෘත්තයේ සඳහන් වන්නේ පළවැනි උපතිස්ස යුගයේ නිසා එය වැදගත් සාක්ෂියක් සේ සනිටුහන් කළ හැකිය. පසු කාලීන තිස් පැයේ පිරිත්වලට මෙහි ආභාෂය බොහෝ සෙයින්ම ලැබෙන්නට ඇතැයි නිශ්චය කළ හැකිය. අනතුරුව පිරිත් උත්සවයක් ගැන සඳහන් වන්නේ හතරවැනි අග්බෝ (ක්‍රි.ව. 638 - 674) රජුගේ කාලයේදීය. නමුත් නිශ්චිත හේතුවක් හෝ විස්තරයක් ඒ පිළිබඳව සඳහන් නොවේ.

පළවැනි උපතිස්ස සමයට සමාන අයුරින් දෙවැනි සේන (ක්‍රි.ව. 851 - 885) රාජ්‍ය කාලයේ පිරිත් උත්සවයක් පවත්වා ඇති බව මහාවංසයේ දැක්වෙයි. මෙම උත්සවයද දුර්භික්ෂ සමය නැති කර රටට සෞභාග ්‍යය උදාකර ලීම පිණිස සිදුකර ඇති බව සඳහන් වේ. මෙහිදී බුද්ධ ප්‍රතිමාව වෙනුවට අනඳ හිමියන්ගේ ප්‍රතිමාවක් උපයෝගී කරගෙන තිබේ. මේ සඳහා අනඳ ප්‍රතිමාව යොදා ගැනීම ඉතා උචිත ක්‍රියාවක් බව වල්පොල රාහුල හිමියන්ගේ අදහසයි. ඒ විශාලා මහනුවර පිරිත් දේශනා කර අවසන, බුද්ධ පාත්‍රයෙන් පැන් ඉසිමින් වීථි සංචාරය කළේ ආනන්ද හිමියන් බැවිනි. එසේම මෙම රාජ්‍ය සමයේදීම රතන සූත්‍රය රන්පත්වල ලියූ බව ඓතිහාසික සාධකවලින් තහවුරු වෙයි. තුන් නිකායේම භික්ෂූන් වහන්සේලා සහභාගි කරවාගෙන සිදු කළ පිරිත් උත්සවයක් පස්වැනි කාශ්‍යප රජුගේ (ක්‍රි.ව. 913 -923 ) රාජ්‍ය කාලය තුළ දක්නට ලැබේ. මේ තුළින් රෝ, බිය, දුක් පලවා හැරිය බවක් සඳහන් නමුදු මෙම පිරිත් උත්සවය කෙබඳු අයුරින් පැවැත්වූවාද යන්නට පැහැදිලි සාක්ෂි සෙවීම දුෂ්කරය.

පිරිත් පිළිබඳ තවත් සඳහනක් හය වැනි මිහිඳු රජුගේ මිහින්තලා සෙල් ලිපියෙහි දක්නට ලැබේ. මෙහි සඳහන් වන කරුණු අනුව එකල සිල්වත් භික්ෂූන් නිරන්තරයෙන්ම තම පරිහරණයට ගත යුතු පිරිත් කිහිපයක් භාවිතයේ තිබූ බව පෙනේ. ඒ අතරින් කරණීයමෙත්ත සූත්‍රයට සුවිශේෂත්වයක් හිමිව ඇත. මේ කරුණුවලින් සනාථ වන්නේ මේ කාලය වන විට පිරිත බොහෝ සමීප දහමක්ව තිබූ බවයි .

විශේෂයෙන්ම පොළොන්නරු යුගය වන විට ඉතා දියුණු චාරිත්‍ර විධිවලින් සුසංහිත පරිත්‍රාණ දේශනා දක්නට ලැබෙන බව වංශ කතා සාහිත්‍යය තුළින් තහවුරු වෙයි. මේ මතය වල්පොළ රාහුල හිමියන්ද සනාථ කරනු ලබයි. මහා පරාක්‍රමබාහු යුගයේදී පිරිත් සජ්ඣායනා කිරීම සඳහා 'පඤ්චසත්තක මන්දිර' යනුවෙන් වෙනම මණ්ඩපයක් තනා එහිදී පිරිත් පැන් හා පිරිත් නූල් බෙදා දී ඇත. නිශ්ශංක මල්ල රජුගේ 'නිශ්ශංකලතා මණ්ඩපය' ද එසේ උපයෝගි කර ගනු ලැබූ මණ්ඩපයකි. පොළොන්නරු කතිකාවතේ සඳහන් කරුණු අනුව පැහැදිලි වන්නේ මහජනයා නිතර නිතර පිරිත් දේශනා කරවාගෙන ඇති බවයි. පිරිත වඩාත්ම ජනප්‍රිය දේශනා ක්‍රමයක් බවට දඹදෙණි යුගයේ පත්ව ඇති බව දඹදෙණි කතිකාවත්වල සඳහන් තොරතුරුවලින් සනාථ වේ. ඒ සාධක අනුව සර්ව රාත්‍රික පරිත්‍රාණ දේශනා ක්‍රමය ඇරඹියේ මේ යුගයේදි යැයි නිශ්චය කිරීමට පුළුවන.

කුරුණෑගල යුගයට අයත් දළදා සිරිතේ පිරිත් පිළිබඳ විශේෂ සටහනක් දක්නට ලැබේ. එනම් අභිනව රාජ්‍ය පාලකයකු රජ මාලිගයේ වාසය කිරීමට පැමිණෙන විට මහා සංඝරත්නය ලවා පිරිත් කරවාගෙන පැන් ඉස්සවා ආරක්ෂාව ලබා ගත් බවයි. ඒ අනුව කුරුණෑගල යුගය වන විට රාජ්‍ය පාලකයින් තම විශේෂ අවස්ථාවලදි පිරිත් දේශනා කරවාගෙන සෙත් ප්‍රාර්ථනා කර ගත් බව පෙනී යයි. ඒ අනුව මේ යුගය වන විට පිරිත බොහෝ දුරට ජනප්‍රිය පූජා චාරිත්‍රයක් බවට පත්ව ඇති බව නිගමනය කළ හැකි වන්නේ විශේෂයෙන්ම දළදා චාරිත්‍රවලදි පවා එය ආධාර කර ගැනීමට කටයුතු කර ඇති හෙයිනි.

කෝට්ටේ පැරකුම්බා සමයේ පැපිලියානේ සෙල්ලිපියේ පිරිත් උත්සවයන් ගැන සඳහන් වී තිබේ. එසේම උපුල්වන් විභීෂණ ආදි දෙවිවරුන්ට පූජා පවත්වන දේවාලවල භික්ෂූන් වහන්සේලා දිනපතා සවස දේවාලයට ගොස් රජ මාලිගාවේදී රජුට පිරිත් කී පරිද්දෙන් පිරිත් කියා ඒ දෙවිවරු දිව්‍යානුභාවයෙන් වැජඹෙත්වා යි ප්‍රාර්ථනය කර ඇත.

රතන සූත්‍රය පිරිවහන කිරීමෙන් මේ කවර දෙවියෙකු ලවා හෝ තම අදහස ඉටු කරවා ගත හැකි බලයක් නායක තෙරවරුන්ට ඇතැයි යන විශ්වාසයක් එකල ලාංකික බෞද්ධ ජනතාව අතර තිබී ඇත. ඒ අනුව මේ කාලය වන විට පිරිත් චාරිත්‍ර හා දේව සංකල්ප අතර යම් කිසි සබැඳියාවක් තිබූ බව උපකල්පනය කළ හැකි ය.

පිරිතේ විකාශනය පිළිබඳව සලකා බලන විට එහි වඩාත් වෙනසක් දක්නට ලැබෙන්නේ මහනුවර යුගයේදීය. විශේෂයෙන්ම මහායානික අදහස් හා දෙවියන් පිළිබඳ සංකල්ප ප්‍රබල ලෙස පිරිත් චාරිත්‍ර සමග බද්ධ වූ ආකාරයක් මෙකල දක්නට පුළුවන. මහනුවර යුගයේ දෙසූ පිරිත්ද හින්දු ශාන්ති කර්ම ආදියට බෙහෙවින් සමාන විය. බලි තොවිල්වලදී ගන්නා බුලත්, නා දලු, කුස තණ, ආදි ද්‍රව්‍යයන් පිරිතකදී භාවිතයට ගන්නා ලදී. දෙවියන් යැදීමද ශබ්ද පූජා පැවැත්වීමද පිරිත සඳහා අත්‍යවශ්‍ය සාධක සේ සැලකිණි.

වර්තමාන ලාංකික බෞද්ධ සමාජය තුළ පිරිතේ ක්‍රියාත්මක ස්වරූපය විමර්ශනය කර විට බොහෝ සෙයින්ම සෙත් පිරිත් ක්‍රමය ජනප්‍රිය ක්‍රමයක් සේ ජනතාවට සමීප වී තිබේ. ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ සෑම සුබ කටයුත්තකදී මෙන්ම විපත් අවස්ථා වලදීද ඒ පිහිටාධාරය පැතීම දක්නට ලැබේ. ඊට අමතරව තිස්පැයේ පිරිත් ක්‍රමයද ජනප්‍රියව ඇත. සති පිරිත වැනි දීර්ඝ කාලයක් හා විශාල මුදලක් වැයවන පරිත්‍රාණ පූජා විහාරස්ථානය ආශ්‍රිතව සිදු කරයි.




■ සිරිසේන විතානගේ

# උක්තාඛ්‍යාත සම්බන්ධය

'උක්තාඛ්‍යාත සම්බන්ධය' පිළිබඳව පසුගිය කලාපයෙන් අපි විස්තර කළ අතර එය තවදුරටත් මෙසේ විමසා බලමු.

■ ප්‍රාණවාචී නාමයන්ට ගෞරවාර්ථයක් එක් කිරීම සඳහා යොදනු ලබන ප්‍රත්‍යයන් සහිත උක්තවලින් එක් අයකු ප්‍රකාශ වුවත් ආඛ්‍යාතය බහුවචනයෙන් යෙදේ. ඕ, හු, ආණ, අණි, අණු ආදිය ගෞරවාර්ථ ප්‍රත්‍යයෝය.

උදා - නා හිමියෝ අනුශාසනා කළහ.
ගුරුළුගෝමීහු අමාවතුර ලියූහ.
පියාණෝ දරුවන් කෙරේ ප්‍රේම ඉපදවූහ.
තෙරණියෝ ආරාමයට වඩිති.

සැ.යු. ගෞරවාර්ථයේ නිපාත පද ලෙස සැලකෙන වහන්සේ, වහන්දෑ සමග යෙදෙන උක්තයන් සඳහා යෙදෙනුයේද බහුවචන ආඛ්‍යාතයයි.

උදා - උන්වහන්සේ අපට කරුණාව දක්වති.
පියාණන්දෑ සම්පත් පවරා දුන්හ.

වහන්සේ සමග 'සේක' යන්නත් වහන්දෑ සමග 'දෑය' යන්නත් ආඛ්‍යාතයට එක්වීම සිංහලයේ විශේෂත්වයකි.

උදා - භික්ෂූන් වහන්සේ දනට වඩින සේක.
මෑණියන්දෑ පුතුට ඔවදන් දුන්දෑය.

■ ප්‍රාණවාචී උක්ත කිහිපයක් 'ද, ත්' යන නිපාතවලින් බැඳුණු විට ආඛ්‍යාතය බහුවචන වේ.

උදා - නිමල් ද පියල් ද සුනිල් ද ගී ගැයූහ.
ගුරුවරයාත් ශිෂ්‍යයාත් අනතුරට මූණ පෑහ.

■ පුරුෂ දෙකකට හෝ තුනකට අයත් උක්ත කිහිපයක් 'ද, ත්, ය' යන නිපාත පදවලින් බැඳුණ විට පළමුව ප්‍රථම පුරුෂ උක්ත පදයත් දෙවනුව මධ්‍යම පුරුෂ උක්ත පදයත් අවසානයේ උත්තම පුරුෂ උක්ත පදයත් පිළිවෙළින් තබා ඒ අනුව යෙදෙන අවසාන උක්ත පදයේ බහුවචනයට අනුව ආඛ්‍යාතය තබනු ලැබේ.

උදා - පියදාසද ඔබද මමද හෙට ගමට යන්නෙමු.
ඔහුත් ඔබත් සමගියෙන් සිටින්නහුද?
හෙට නුඹයි මමයි පන්තිය පිරිසිදු කරමු.
නිමලාද සුමනාද තරග කරති.

■ සහ, හා, සමග යන නිපාතයන් දෙවන කර්තෘට පසුව යෙදීමේදී ආඛ්‍යාතය සිටිනුයේ මුල් කර්තෘට අනුවය. එයට හේතුව පළමුව යෙදෙන තැනැත්තා ප්‍රධාන කර්තෘ ලෙස සැලකෙන බැවිනි. මෙවැනි තන්හි මුල් තැනැත්තා උක්තය ලෙසත් දෙවැන්නා අනුක්තය ලෙසත් යෙදේ.

උදා - නිමල් කමල් සහ සෙල්ලම් කරයි.
කුසුම් අමල් හා ගමට ගියාය.
සෙන්පතියා දුනුවායන් සමග පෙරමුණට යයි.

සැ.යු. එහෙත් හා, සහ යන නිපාතයන්ගෙන් කර්තෘන් දෙදෙනා ඒකීය කොට (එකට සම්බන්ධ කොට) යෙදුණු කල්හි ආඛ්‍යාතය සිටිනුයේ බහුවචනයෙනි.

උදා - අමල් හා කමල් විභාගයෙන් සමත් වූහ.
ජෝන් සහ විලියම් සෙල්ලම් කරති.

■ උක්තය හෝ, නොහොත් යන නිපාත මගින් සම්බන්ධ වීමේදී ආඛ්‍යාතයට ඉතාම සමීප උක්තයට අනුව ආඛ්‍යාතය තිබිය යුතුය.

උදා - උදාර හෝ මම හෝ පණිවුඩය ගෙන එන්නෙමි.
ජනපතිතුමා හෝ ඇමතිවරු හෝ එයට වග කියති.
සංවිධායකවරු නොහොත් කණ්ඩායමේ ප්‍රධානියා ඉදිරියට එයි.
විදුහල්පතිතුමා නොහොත් ගුරු මණ්ඩලය තීරණය දෙති.

■ හෙවත් නිපාතයෙන් උක්ත සම්බන්ධ වීමේදී ආඛ්‍යාතය සිටිනුයේ උක්ත අයත් වන වචනයෙනි. සම්බන්ධ වන දෙදෙනාම එකම තැනැත්තන් වන හෙයිනි.

උදා - විධායක ජනාධිපති හෙවත් සේනාධිනායකයා සියල්ලට නායකත්වය දරයි.
ආඥාපති හෙවත් හමුදා ප්‍රධානියා සටන් මෙහෙයවයි.
මුග්ධයෝ හෙවත් මෝඩයෝ නන් දොඩවති.

■ ඇත, නැත යන නිපාත පදවලින් අවසන් වන වාක්‍යවල කර්තෘ ප්‍රථමා විභක්තිය ගෙන උක්තවම සිටී.

උදා - නගරය පුරා මිනිස්සු ඇත.
මෙයට පෙර මම එය දැක නැත.
මම මීට එකඟ නැත.
කිසිවෙක් පරසතුමල් දැක නැත.

සැ.යු. එහෙත් 'ඇත', 'නැත' යන්න සමග තවත් ක්‍රියා රූපයක් ඈඳුන හොත් එවැනි වාක්‍යයන්හි කර්තෘ අනුක්තව සිටී.

උදා - දෙවිවරුන් බුදු පුදට පැමිණ ඇත.
මා කිසි දිනක එය දැක නැත.

■ වාක්‍යාවසානයෙහි යුතු, මැනවි, යෙහෙකි යන නිපාත යෙදෙන වාක්‍යවල කර්තෘ අනුක්තව යෙදිය යුතුය.

උදා - පයින් යන්නන් දකුණෙන් යා යුතුය.
රජුන් දැහැමි වුව මැනවි.
ගුරුවරුන් සිසුන් කෙරේ දයාබර වුව මැනවි.
මිනිසුන් පරිත්‍යාගශීලී වීම යෙහෙකි.

සැ.යු. එහෙත් යුතු යන නිපාතය ආඛ්‍යාත ප්‍රත්‍ය ගන්වා යෙදුව හොත් කර්තෘ උක්ත රූපයෙන් සිටී.
උදා - පයින් යන්නෝ දකුණින් යා යුත්තාහ.
සියල්ලෝ මේ ස්ථානය පිරිසිදුව තබාගත යුත්තෝය.

■ ඇතැම් වාක්‍යයන්හි උක්ත දෙකක් (ද්විත්ව උක්ත) ඇත්තේය. ඒ දෙකින්ම හැඟවෙන්නේ එක් අයෙකි. එබැවින් මුල් උක්තයට අනුව ආඛ්‍යාතය තැබිය යුතුය.

උදා - අපේ ආදිම අගනුවර අනුරාධපුරය විය.
මගේ ගුරුතුමා දක්ෂ ලේඛකයෙක් වූයේය.
අපි ශ්‍රී ලාංකිකයෝ වෙමු.

සැ.යු. ඉහත වාක්‍යවල දෙවැනි උක්ත පද ආඛ්‍යාත පූරණය සඳහා වන අතර ආඛ්‍යාතය නිතරම 'වෙයි, විය, වූහ' ආදි 'ව' ධාතුවෙන් නිපන් එකක්ම වීම විශේෂ ලක්ෂණයකි. ඉහත ආඛ්‍යාත පද දෙස බලන්න.

■ තෙමේ යන්න පුරුෂ ලිංග ඒකවචන පදයයි. තොමෝ යන්න ස්ත්‍රී ලිංග ඒකවචන පදයයි. මේ දෙක්හිම බහුවචනය 'තුමූ' යනුයි. උක්තය වශයෙන් යෙදෙන මෙවැනි තැන්වල ආඛ්‍යාතය තැබිය යුත්තේ සංඛ්‍යා (වචන) භේදය හා ලිංග භේදය සැලකිල්ලට ගෙනය.

උදා - රජ තෙමේ රට රකී.
බ්‍රාහ්මන තෙමේ ගිනි දෙවියන් පිදුවේය.
ඕ තොමෝ සිතුවම නිම කළාය.
උඉ තුමූ අපට දම් දෙසති.

■ ආඛ්‍යාතයෙන් ප්‍රාර්ථනයක් හැඟවෙන විට කර්තෘ යෙදෙනුයේ ප්‍රථමා විභක්තියෙනි. උක්තවය.

උදා - සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
ශ්‍රී ලංකා ක්‍රීඩකයෝ ජය ලබත්වා !
පාලකයෝ දැහැමි වෙත්වා !

■ සංසය හෙවත් සැකය ප්‍රකාශ වන අන්තර් වාක්‍යවලදී උක්තය කුමන පුරුෂයකට අයත් වුවද කුමන සංඛ්‍යාවකට (වචනයකට) අයත් වුවද ආඛ්‍යාතය වර්තමාන කාල ප්‍රථම පුරුෂ බහුවචනයෙන්ම තැබිය යුතුය. කර්තෘ අනුක්තව සිටීමද මෙහි විශේෂ ලක්ෂණයකි.

උදා - හෙට මා කැටුව යාමට තාත්තා එතී මම සිතමි.
ළමයකු මෙබඳු වීරකම් කරතී මින් පෙර අසා නැත.
රැජිනක කිරුළ අත හරිතී කවුරු අදහත්ද?
අප සිප් නොදනිතී නොසිතව.

ඉහත සෑම අන්තර් වාක්‍යයකම කර්තෘ අනුක්තව සිටින අයුරුත් ආඛ්‍යාතය වර්තමාන බහුවචන ස්වරූපයෙන් සිටින අයුරුත් නිරීක්ෂණය කරන්න.

## කර්තෘකාරක සහ කර්මකාරක වාක්‍ය රටා

සිංහල භාෂාවේ වාක්‍ය නිර්මාණ රටා දෙකක් ඇත. එකක් කර්තෘකාරක නමින්ද අනෙක කර්මකාරක නමින්ද හැඳින්වෙයි. මෙතෙක් අප මෙහි විවිධ රීති සඳහා නිදසුන් වශයෙන් දී ඇති සියලු වාක්‍ය කර්මකාරක ගණයට අයත් වෙයි. ඒ සියල්ලකම උක්තාඛ්‍යාත සම්බන්ධය යටතේ ආඛ්‍යාතයෙන් (කරනු ලබන ක්‍රියාවෙන්) උක්ත වී ඇත්තේ කර්තෘ බැවිනි. ඒ සියලු වාක්‍යවලදී ආඛ්‍යාතය තබා ඇත්තේ කර්තෘ පදයට ගැළපෙන ලෙසය. නැවත ඔබට එය සිහිපත් කළහොත් 'මිනිසා ගස කපයි' යන තැන 'කපයි' යන ආඛ්‍යාතය තබා ඇත්තේ 'මිනිසා' යන උක්තයට ගැළපෙන පරිදිය.

එහෙත් කර්මකාරක වාක්‍යවල ආඛ්‍යාතයෙන් උක්ත වන්නේ කර්තෘ නොව උක්තව සිටින කර්මයයි. එහි කර්තෘ සිටින්නේ අනුක්තවය. එබැවින් ඒ උක්ත වන කර්මයට ගැළපෙන පරිදි ආඛ්‍යාතය තැබිය යුතුය.

'ගොපල්ලා ගවයන් බලයි' යන්න කර්තෘකාරක වාක්‍යයකි. මෙහි 'බලයි' යන ආඛ්‍යාතයෙන් උක්ත වන්නේ 'ගොපල්ලා' යන කර්තෘයි. එබැවින් 'බලයි' යන ආඛ්‍යාතය තැබුණේ ඒ කර්තෘට අනුවය.

'ගොපල්ලා විසින් ගවයෝ බලනු ලබති' යන්න එහි කර්මකාරක වාක්‍යයයි. මෙහිදී 'ගොපල්ලා' යන්න 'ගොපල්ලා විසින්' යනුවෙන් අනුක්ත වී ඇත. 'ගවයන්' යන අනුක්තය 'ගවයෝ' යනුවෙන් උක්ත වී ඇත. එබැවින් මෙය කර්මකාරක වාක්‍යයක් වේ. ආඛ්‍යාතය තබා ඇත්තේ එම උක්ත වූ කර්මයේ පුරුෂයට හා සංඛ්‍යාවට (වචනයට) අනුරූපව 'බලනු ලබති' යනුවෙනි.

පහත වගුවෙහි ඇති වාක්‍යද කියවා ඉහත කී ලක්ෂණ හොඳින් වටහා ගැනීමට උත්සාහ ගන්න.

| කර්තෘකාරක වාක්‍ය | කර්මකාරක වාක්‍ය |
|---|---|
| ළමයා බත් කයි. | ළමයා විසින් බත් කනු ලැබේ/ කැවේ. |
| මිනිස්සු සඳ බැලූහ. | මිනිසුන් විසින් සඳ බලන ලදී/ බැලිණි. |
| මව දරුවන් රකී. | මව විසින් දරුවෝ රකිනු ලබති/ රැකෙති. |
| ගොවියෝ ගොනුන් බඳිති. | ගොවියන් විසින් ගොන්නු බඳිනු ලබති/බැඳෙති. |
| ගරුවරයා මා පැසසීය. | ගුරුවරයා විසින් මම පසසන ලදිමි/පැසසිණිමි. |

සැ.යු. ඉහත දැක්වුණු සියලු කර්මකාරක වාක්‍යවල පිළිවෙළින් සිදුවී ඇති පහත දැක්වෙන වෙනස්කම් හොඳින් කල්පනාවට ගන්න.

1. ආඛ්‍යාතයෙන් උක්ත වී ඇත්තේ ප්‍රථමා විභක්තියට පෙරළුණු කර්මයයි.
2. උක්ත වූ ඒ කර්මයට අනුව ආඛ්‍යාතයෙහි පුරුෂ හා සංඛ්‍යා යෙදී ඇත.
3. පෙර උක්තව සිටි කර්තෘ පදය 'විසින්' යන්න එකතුව අනුක්ත වී ඇත.
4. පෙර වූ කර්තෘකාරක ආඛ්‍යාතවලට 'ලබ' ධාතුව එක්ව ලබයි, ලදි ආදි නව ක්‍රියා රූප සැකසී ඇත.

## අභ්‍යාස

### පහත දැක්වෙන වාක්‍ය නිවැරදි කර ලියන්න.

1. සාමාජිකයන් සියල්ලන්ම උත්සවයට සහභාගි වෙති.
2. රජතුමා සේනාව සමග යුද්ධයට ගියහ.
3. සියලු ඥාති මිත්‍රාදීන් මේ ආරාධනය පිළිගන්න.
4. නඩුවේ සියලුම විත්තිකරුවන් නිදහස් විය.
5. මම තවම ඒ පොත කියවා නැත.
6. ශිෂ්‍ය ශිෂ්‍යාවෝ මේ උපදෙස් පිළිගැනීම මැනවි.
7. සුළිසුළඟට හසුවූ වෘක්ෂ ලතාවෝ කඩා වැටුණෝය
8. ලොරි රථ කීපයක් එක් පෙළට ගමන් ගත්හ.
9. සැන්දෑ වන විට ගව රැළ ගාල් කරා ඇදේ.
10. ගොවීන් විසින් දින දෙකකදී කුඹුරු වපුරා අවසන් කළහ.

### පහත වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න

1. බැතිමත්හු දෙවි දේවතාවන් පිදූහ.
2. අපි ගුරුවරුන්ගේ ආශිර්වාදය ලැබුවෙමු.
3. යුද්ධ භටයෝ සටනේදී සතුරන් මරුමුවට පත් කළහ.
4. උයනේ නිදැල්ලේ සිටි මිතුරෝ මා එතැනට කැඳවූහ.
5. සත් පුරුෂයෝ මහජන ප්‍රසාදය ලබන්නෝය.

### පහත වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න

1. ගෙවිලියන් විසින් කුකුළු පැටව් විකිණෙති.
2. ධර්මය විසින් ධර්මයෙහි හැසිරෙන්නෝ රැකෙති.
3. මා විසින් දැරිය පෝෂණය කෙරිණි.
4. රජය විසින් රට වැසියෝ ආරක්ෂා කෙරෙති.
5. දිවියන් විසින් මුවෝ මැරෙති.

**ලබන කලාපයෙන් සිංහල පාඩම තවදුරටත් හදාරමු**

# කුණු කන්දට යට වූ...

6 වන පිටුවෙන්

සැලසුම් සකස් කරගෙන යනවා යැයි බොරු පොරොන්දුවලින් ඔවුන් රවටා ඔවුන්ගේ ඡන්දය ලබාගැනීමත් පමණය.

මීතොටමුල්ලට මුලින්ම කුණු ගෙන ආවෝ කවුරුන් වුවද ඒ මින් පෙර ලංකාවේ හිටපු පාලකයෝය. ඒ 2009 දී පමණය. බස්නාහිර හිටපු මහඇමති සුසිල් ප්‍රේමජයන්ත ඇතුළු පිරිස් ප්‍රතිචක්‍රීය කොට කුණු ප්‍රශ්නය විසඳන්නට රට රටවල් ගානේ ගිය අයුරු පුවත්පත් ආදියෙහි පළ විය. 2017 වීත් ඒ ගමන් මගින් ඔවුන් කළ සංචාර හැරුණු විට දශමයකින්වත් විසඳුමක් නම් නොලැබිණි. පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු පිරිස් කොළඹ කුණු ප්‍රශ්නය පිළිබඳව ශබ්ද නගා කතා කරමින් ඒ ප්‍රශ්නයට විසඳුම් යෝජනා කළද ඒවාද ක්‍රියාත්මක නොවීය. මේ අවස්ථා දෙකේදීම තම දේශපාලන හෙංචයියලාගේ විරෝධතා ලොකු කොට සලකමින් ජන ජීවිත ලඝු කොට සලකමින් තම යෝජනා හකුළා ගන්නට ඔවුහු ක්‍රියා කළහ. මින් අවුරුදු 2 කට පෙර නව රජය බලයට පත්වන විටද මීතොටමුල්ලේ ජනයා මේ කුණු ප්‍රශ්නය විසඳන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියහ. හිරුණිකා සහ මරික්කාර් දෙදෙනාද ඒ ප්‍රශ්නය විසඳා දෙන බවට ප්‍රතිඥා දෙමින් ඒ අසරණයින්ගෙන් ඡන්දය ලබාගෙන බලයට පත් වූහ. නව රජය පත් වූ පසුද කුණු කන්ද පිළිබඳව ඔවුන්ගේ ඇස් අරවන්නට එහි ජනයා නොකළ දෙයක් නැත. එහෙත් ඉනිදු වූ එකම ඵලය නම් දවසින් දවසම කුණු කන්දේ උස වැඩිවීම පමණය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ අසරණ ජන ජීවිත තිස් ගණනක් රටට අහිමි වීමත් දිගු කලක් තිස්සේ එහි සිටි ජනයා ගොඩ නගා ගත් ජීවිත මුළුමනින්ම කුණුවලින් වැසී යාමත් පමණමය.

මේ සියල්ලට වඩා ලස්සන දේ නම් මේ දිනවල හිටපු දේශපාලනඥයෝත් සිටින දේශපාලනඥයෝත් දෙගොල්ලන් අතින්ම සිදුවූ වරද ඔවුනොවුන් පිට පටවමින් කුණුවලින් ගහගන්නට වී තිබීමයි. මෙයින් ගත හැකි දේශපාලන වාසියක් තිබේදැයි බලන්නට හිටපු අය උත්සාහ ගන්නා අතර සියල්ල හිටපු අය පිට පටවා තමන්ගෙන් වූ අතපසුව වසාගන්නට සිටින අය දඟලන අයුරු හාස්‍යජනකය.

දැන්වත් දෙපිරිස එක්ව ඉතිරිව සිටින මිනිසුන්ගේ ජීවිත සැපවත් කරන්නට කළ හැකි දෙයක් කිරීමටත් හෙට අනිද්දාටත් ඇතිවන කුණු පිළිබඳව කරන දෙයක් කොට යළිත් කුණු කඳුවලින් කොහේ හෝ සිටින මිනිසුන් මිය යන තත්ත්වයක් ඇති නොවීමට කටයුතු යොදන්නටත් ඔවුන්ට වුවමනාවක් ඇති බවක් නොපෙනේ. අප මුලදීම කී ඔවුන්ගේ අඥ බව මතුවන්නේ මෙතැනදීය.

මීතොටමුල්ල ඛේදවාචකයෙන් සංඛ්‍යාත්මකව මිය ගියේ තිස් ගණනකි. ඉවක් බවක් නැතිව 'පරිසරය සුරකිමු' යි දිවුරුම් දී සිටින රටක මේ කුණු කන්ද ගොඩ නැගුණේ පරිසරය ගැන තුට්ටුවක්වත් නොසලකාය. මේ කුණු ගොඩ ගසන ලද භූමිය පෙර වගුරු බිමකැයි කියති. එහි ගොඩ ගැසුණු කුණු මගින් උරාගත් භූමිගත ජලය අපවිත්‍ර වීමෙන් සහ අවට වාතය අපිරිසිදු වීමෙන් පසුගිය කාලය පුරා රෝගී වූත් රෝගීව මිය ගියා වූත් ජනයාගේ සංඛ්‍යාවද විශාල බව කියනු ලැබේ.

කෙසේ වෙතත් ඛේදවාචකය සිදුවී හමාරය. යළි යළිත් කුණු ගොඩ ගැසෙනු ඇත. ටික දිනකින් සියල්ල අමතක කොට පැලැස්තර දැමීමේ දේශපාලන+අඥ ක්‍රියාවලිය නවතා නිසි විසඳුම් දී යළි මෙවැනි ප්‍රශ්නයක් පැන නොනැගෙන තැනට කටයුතු කිරීම රජයේත් විපක්ෂයේත් කාගේත් වගකීම බව මතක් කර දෙනු කැමැත්තෙමු.


# Tutoring
## From Grade 08 to 12

| Mathematics<br>Physics<br>Programming<br>(Java, C#) | **Grade 12 Mathematics**<br>Advance Functions<br>Limits<br>Calculus |
|---|---|

- Supporting for homework and tests
- Full attention for improving knowledge
- Home Visits possible

Experience and qualified teacher for excellent results

Contact
**Kithsiri Jayasinghe**
(BSc. , MSc.(UK) Mathematics & Comp. Science)

Email: jayakithsiri@hotmail.com
Phone: (416) 745-6675, (647) 705-1606



# NEW CREATION FELLOWSHIP CHURCH
## SRI-LANKAN SINHALESE CHURCH. Scarborough, Ontario

**මේ ලෝකයේ මැවුම්කරු,පාලනකරු සහා මිදුම්කරු වන සර්වබලධාරි දෙවියන් වහන්සේ ගැන ඔබ දන්නවාද?**

ස්වර්ගයේ සියලු ආධිපත්‍යය, ගෞරවය, මහිමය, දේවත්වය මේ සියලුම දේ අතහැර මනුෂ්‍ය ශරිරයක් ගෙන මේ ලෝකයට පැමිණ මා සහ ඔබ වෙනුවෙන් ගුටිකාපු, අපහාස ලත්, නින්දාවට පත්, නිර්වස්ත්‍ර කරනු ලැබ ඉතාමත්ම කෲර විදියට මරණයට පත්වුණ දෙවි කෙනෙක් ඔබ අසා තිබේද? ඒ තමයි ඔබටයි මටයි ජිවනය දෙන්න දේව පුත්‍ර යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඒ ස්ථානය ගත්තා.

**මතෙව් 27:32**

ඔව්හු නික්ම යද්දි සීමොන් නම් කිරේනියේ මනුෂ්‍යයෙකු සම්බ වී, උන්වහන්සේගේ කුරුසිය උසුලාගෙන යන්ට ඔහුට බල කළෝය.

1. එදා සීමෝන් දැනගෙන හිටියද ක්‍රිස්තුස්වහන්සේ උසුලාගෙන ගියේ සීමෝන්ගේ කුරුසිය කියලා?
(අද දවසේ කීදෙනෙක් මේගැන දන්නවාද???)
අද දවසේ යේසුස් වහන්සේ ඔබට කථා කරනවා

2. එදා සීමෝන් දැනගෙන හිටියද ඔහු ගෙනියන්නේ ඔහුගේම කුරුසිය කියලා?
(අද දවසේ කිදෙනෙක් අන්ධව ජිවත් වෙනවද සත්‍යය දැනගෙන)
ඔබට අවදි වෙන්න කාලය ඇවිත්....

3. එදා සීමෝන් දැනගෙන හිටියද ඔහු වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ කුරුසියට ගියා කියලා.
(ඔව් අද දවසේ ගොඩාක් අය නොදන්න දේත් මෙයමයි. ලෝක ජනගහනය බිලියන 7.5 ක් කුරුසියට ඇණ ගසන්න බැරි නිසයි ඔබ වෙනුවෙන් ඒ මිලය උන්වහන්සේ ගෙව්වේ....)
මොහොතක් නිහඬව මේ ගැන සිතන්න....
යේසු ඔබට ආදරෙයි

**අද උන්වහන්සේ කුරුසියේ නෑ, මරණය පරාජය කළ යේසුස් ජිවමානයි.**

**වැඩි විස්තර දේවගැති රොහාන් සිල්වා: 647-990-8312**
**සෑම ඉරුදිනකම සිංහලෙන් දේව මෙහෙය සවස 5.00 ට. (ළමුන්ට ඉංග්‍රීරිසි භාෂාවෙන්)**



## Affordable solutions to protect your family

Focus on taking care of your family. Let's talk about the customized life insurance options I can offer to protect you today, with the flexibility you need for tomorrow.



**Kasun Kirtisinghe**
416-708-4000
kasun.kirtisinghe@sunlife.com
www.sunlife.ca/kasun.kirtisinghe
365 Front Street North
Bell Tower Market Place
Belleville, ON K8P 5A5

Sun Life Financial
Life's brighter under the sun

Sun Life Assurance Company of Canada is a member of the Sun Life Financial group of companies.
© Sun Life Assurance Company of Canada, 2017.

TB TISSA BOYAGODA, LLM

## KNOW YOUR RIGHTS



**TISSA BOYAGODA, LLM**
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka

**Areas of Practice**

- Criminal Law
- Family Law
- Real Estate
- Immigration Matters
- Civil Litigation
- Small Claim Court Matters
- Power of Attorneys
- Last Wills
- Notarizations

GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED

1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4

100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3

TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com

www.tissaboyagodalaw.com

# දැනුම සමග කටට රසට




■ තිසරි ශිබා

මාතර ඉපදී හැදී වැඩුනු අපි ජීවිතේ හොදම කාලය ගත කලේ ඒ සුන්දර ගම්මානයේදීය. අද නාගරික වුවත් එදා ගම නගරයෙන් එපිට හුදෙකලා විය. ගම මැදින් ගලා ගිය නිල්වලාව ගමට සොඳුරු දසුනක් විය. නිල්වලා නදිය අසල ඉරිදා පොළට එකල මා යන්නේ ආත්තම්මා සමගය. ඒ මාටින් මාමාගේ බක්කි කරත්තෙනි. අද මෙන් එකල දියුණු ප්‍රවාහන පහසුකම් අවම වූ හෙයින් බක්කි කරත්තවල නැගී එදිනෙදා වැඩ කර ගන්නෝ සුලබ දසුනකි. මාතරට බක්කි කරත්ත අරුමයක් නොවීය.

ආත්තම්මා ඉරිදා පොළට යන බොහෝ දිනවල මා ඈ අතේ එල්ලෙන්නේ එදිනට මට බොහෝ වාසි ලැබෙන නිසාය. ආත්තම්මා සමග පොළට යන මට එහි සිටින ගැමි ගැහැනුන්ගෙන් ලැබෙන්නේ නොමද සැලකිල්ලකි.

“අනේ චූටි මැණිකෙ, ඔහේට අද දෙන්න කිසි දෙයක් නෑ. මේ වරකා බෑය ඇරෙන්න. මැණිකෙ මේක ගෙනියන්න”

“එපා හින්නි හාමිනේ. ඕක විකුණගන්න පුළුවන්. වත්තෙ කොස් ගහේ ගෙඩි වවුලො කාලා නිස්කාරනේ වැටිලා යනවා. මහතුන්ට කියපන් අපේ ගෙවල් පැත්තෙ ඇවිත් ගෙඩි ටික කඩලා දීල යන්න කියලා”



“මම කියන්නම් ඉස්කෝලෙ හාමිනේ. උන්දෑ ඇහැක් වෙලාවක ඇවිත් කඩලා දීල යයි”

හින්නි හාමිනේ නැන්දා පොළේ එළවළු විකුණු ගැහැනියකි. අවුරුදු කාලෙට අප නිවසට එන ඕ නිවසේ වැඩපළට උදව් වූ අතර ආත්තම්මා අවුරුදු කන්නට ඇයට මුදලින් පමණක් නොව බඩු බාහිරාදියෙන්ද උදව් කළාය. අප ඇයට හින්නි හාමිනේ නැන්දා කීවාට ඇය හීනි නැත. තරබාරු ගැහැනියක වූ ඇයට හින්නි හාමිනේ නම පබැදුනේ කෙසේදැයි මම නොදනිමි. අප ගමේ එවැනි හින්නි හාමිනේලා, හින්නි මහතුන්ලා, හින්නි බාප්පලා එකල බොහෝ සිටි අතර ඔවුන් එකෙකුවත් හීනි මිනිසුන් නොවුණු බව පමණක් මගේ මතකයේ ඇත.

සතියකට පමණ එළවළු මිල දී ගන්නා ආත්තම්මා නැවතත් මාටින් මාමාගේ බක්කියෙන් නිවස වෙත එන අතර පොළට ගොස් අප එනතෙක් මාටින් මාමා පොළ ළඟ ඇති මාර ගස අසල බක්කිය නවතාගෙන විටක් හපමින් සිටින්නේය.

“අද බඩු ගිනි ගණන්නෙ ඉස්කෝලෙ හාමිනේ. තව ඉස්සරහට වසල හමාරයි. මේක අබුද්දස්ස කාලයක්”

ඉරිදා පොළට ගොස් එන ආත්තම්මාගේ ප්‍රධාන රාජකාරිය ඒ ගෙන එන එළවළු අසුරා තබා ගැනීමයි. චූටි චම්මාත්, මද්දු චම්මාත් ඇයට උදව් කරන්නීය. මට ලැබූ වරකා බෑයෙන් මදුලක් දෙකක් කටට දා ගත් චූටි චම්මා ඒ ඇට ඉවත් කර වෙනම ගොඩ ගසන්නීය. පහුගිය දිනක කොස් ගස යට වැටුණු ගෙඩිවලින් ඇට ඉවත් කර ගත් ඕ විශාල මුට්ටියක ඒ කොස් ඇට බහා දුම්මැස්ස උඩ තැබූ අතර හින්නි නැන්දාගෙන් ලැබුණු වරකා බෑයේ කොස් ඇට ටිකද ඒ මුට්ටියටම දැම්මාය

“ඔන්න අම්මෙ දැන්නම් කොස් ඇට අච්චාරුව හදන්න තරම් කොස් ඇට තියනවා” චූටි චම්මා කොස් ඇට අච්චාරුවට ආසා බව දන්නා ආත්තම්මා එය සාදන්නේ ඇයම වෙනුවෙනි.

කොස් ඇට එකල මට පේන්න බැරි කෑමකි. කොස් ඇට තිබුණු දාට බත් නොකන මා පැටි මාමාගේ බේකරියෙන් ගෙන එන මාලු පාන් එකකින්, ජෑම් පාන් එකකින් හෝ සීනි කුරුල්ලකුගෙන් දවස ගෙවන්නෙමි. එවැනි දිනෙක ආත්තම්මා මට බත් කැවීමට ගන්නා උත්සාහය ගඟට කැපූ ඉනි මෙන් අපතේ යන්නීය. ‘හැමදාම දකින කුකුළාගේ කරමලය’ මෙන් එදා මට කොස් ඇට එපා වුවත් අද එහි වටිනාකම මෙතැකැයි කිව නොහැකි තරම්ය. ඉතා අපහසුවෙන් සොයා ගත් කොස් ඇටවලින් කොස් ඇට අච්චාරුව මා සෑදුවේ චූටි චම්මාගෙන් අසා ගෙනය. ඇය සිනා වුණේ ගමෙනුත් දැන් සොයා ගැනීමට අසීරු කොස් ඇට මා සොයා ගත්තේ කෙසේදැයි අසමිනි.

සියල්ල මුදලට විකිණෙන සමාජයක ගමෙන් බත් ගස ඈත් වීම ගැන මා පුදුම වන්නේ නැත. ඒ බස, ඒ සිරිත් විරිත්, ඒ කෑම බීම, ඒ ගති පැවතුම්, ඒ ගැමිකම අද විශාල මාරුතයකට අසු වී ගසා ගෙන යන අතර එහි අවසානය කෙසේ සනිටුහන් වේදැයි මා දන්නේ නැත.

**Shikifood**

thisu.shika@gmail.com

## කොස් ඇට අච්චාරුව හදමු

### අවශ්‍ය දේ

කොස් ඇට අවශ්‍ය පමණ
රතුලූනු
අමු මිරිස්
අඹරා ගත් අබ ස්වල්පයක්
තලා ගත් සුදුලූනු
තලා ගත් එන්සල්, කරාබු නැටි ස්වල්පයක්
කෑලි මිරිස්
කහ ස්වල්පයක්
විනාකිරි
තෙල්
ලුනු
රස අනුව සීනි

### සාදා ගන්නා ආකාරය

කොස් ඇට සෝදා තලා ගන්න. පොත්ත ඉවත් කරගෙන එය වතුර බාජනයකට දමා තම්බා ගන්න. දැන් වතුර පෙරා පැත්තකින් තියන්න. තෙල් තාච්චියකට තෙල් දමා තම්බා ගත් කොස් ඇට බැද ගන්න. (ගොඩක් වෙලා යනතුරු බදින්න අවශ්‍ය නැහැ. යන්තම් බැද ගත්තම ඇති) දැන් කොස් ඇට ඉවත් කර සුද්ද කර ගත් රතුලූනු ඒ තෙලටම දමා බදින්න. අමු මිරිසුත් යන්තම් බැද ගන්න. (අමු මිරිස් බදින කොට පුපුරන නිසා සැලකිලිමත් වෙන්න ) මැටි බාජනයක් ලිප තබා එයට විනාකිරි දාන්න. විනාකිරි උතුරන විට අඹරා ගත් අබ, තලා ගත් සුදුලූනු, එන්සල්, කරාබුනැටි, කෑලි මිරිස්, කහ සහ ලුනු දමා කලවම් කරන්න. දැන් එයට යන්තමින් බැද ගත් කොස් ඇට, රතුලූනු සහ අමු මිරිස් එකතු කරන්න. රස අනුව සීනි එකතු කර මද ගින්නේ විනාකිරෙන් තැම්බෙන්න දෙන්න. විනාකිරි සේරම අච්චාරුවට උරා ගත් පසු ලිපෙන් ඉවත් කරගන්න.



NOVA Immigration Solutions Inc.
A CANADIAN IMMIGRATION CONSULTANCY FIRM
100% PARENTAL SUPER VISA AND 98% STUDENT VISA SUCCESS RATES
416 298 0990
shani.hanwella@novaim.ca
SHANI HANWELLA
Registered Canadian Immigration Consultant, CEO,
Former Visa Officer, Canadian High Commission,
Colombo, Sri Lanka
1585 Markham Road, Suite 405, Scarborough, ON M1B 2W1
www.novaim.ca

EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca



### We'll Target The Best Rates!

Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.

### Mortgage Renewals and Refinancing

First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!

### Investment Properties

Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!

### Safe and Secure Application

Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.

**Manzeel Patel**
Mortgage Broker - M11002628

**Direct: 647-272-8355**

Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7

T 416 - 840 - 6368
F 416 - 850 - 5153

info@everythingmortgages.ca
www.everythingmortgages.ca

RMG · Meridian · MERIX · Lendwise · Scotiabank · Paradigm · Alterna · Equitable Bank · blueprint · Bridgewater Bank · MCAP
Industrial Alliance · radius financial · ICICI Bank · National Bank Financial Group · Canadiana Financial Corp · CMLS Financial · First National Financial LP · B2B Bank
Optimum Mortgage · TD · XCEED · Street Capital · Fisgard · Home Trust · HomEquity · Savings Better Banking

Century 21 Leading Edge Realty Inc. Brokerage | invis Canada's Mortgage Experts™

**THUSITH WEERASURIYA**
REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT

416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM

"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"



Bus: 905-405-8484 Fax : 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.

| | | | |
|---|---|---|---|
| Markham<br>165 Main St N. | Scarborough<br>1825 Markham Rd. | Ajax<br>527 Kingston Rd. W | Toronto North<br>1053 McNicoll Ave. |
| Yorkville<br>1300 Bay St. | Stouffville<br>6393 Main St. | Whitby<br>408 Dundas St. W | Don Mills<br>801 York Mills Rd. |

Designed@niukraids.ca

IMPERIAL MORTGAGES INC.

Residential Mortgages, Commercial Mortgage,
Refinancing, Second Mortgage,
First Time Home Buyers

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

Abby Sri Haran
Senior Mortgage Specialist

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782



ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT



ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com




සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

# වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

## Gamini - 416 822 2789

All Ads & Classified Ads are also Published in the ONLINE Edition at

## WWW.DASATHA.COM

For NO ADDITIONAL CHARGE

**Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com**





## CSLA අවුරුදු උළෙල

කැනඩා ශ්‍රී ලංකා සංගමය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය අප්‍රේල් 22 වැනි දින දොන් බොස්කෝ රඟහලේදී ඉතාමත් විචිත්‍රවත් ලෙස පවත්වනු ලැබුණි. 49 වන වරටත් පවත්වනු ලැබූ එම උළෙලෙහි විවිධ අවස්ථා කැමරා ඇසින්....










**You Focus on Your Business.**
**Leave the burden of Accounting & Tax on us.**

# GS ACCOUNTING CO.

## සාධාරණ අයකිරීම් මිත්‍රශීලි සේවය සහ උපදෙස් සමගින්

- සිංහලෙන් පැහැදිලි කිරීම්
- 100% නිවැරදිතාව සහ රහස්‍යභාව
- සාකච්ඡා මගින් උපරිම බදු වාසි ලබා දීම
- ගිණුම් සහ බදු ක්ෂේත්‍රයේ උපරිම සුදුසුකම් සහ පළපුරුද්ද ලබා ඇති දෙදෙනෙකුගේ දායකත්වය

- New Business Registration
- Payroll, T4,T4 Summary, ROE
- Bookkeeping & Accounting
- Income Tax
- HST Remittance

Sole proprietorship
Partnership
Corporation
Non for Profit Organization

**Siri / Sriyani Gamage**

**Office:**
# 210 - 1560 Brimley Road, Scarborough ON M1P 3G9
**Tel: 416-571-4270 / 647-352-1560**
**Fax - 647 352 1561**

**Residence :**
1274 Warden Avenue, Scarborough, On. M1R 2R6
**Tel: 416 331 8349**

**Email: gsaccounting@ymail.com** **Web: www.gsaccounting.ca**

**Minimize Your Taxes / Maximize your Refund**

දසත Dasatha



# ශ්‍රීපා කඳු සෙවණේ ජීවිතය

## මේජර් තෝමස් ස්කින්ර ගේ මතක සටහන්

■ කේ. ජී. එච්. මුනිදාස

"හැම කඳු වැටියකම මුදුනේ කෙනෙකුට අශ්ව කරත්තයකින් වුවද ගමන් කළ හැකි තරමේ පුළුල් මාර්ගයක් විය. එක් කඳු පන්තියක සිට තවත් කඳු පන්තියක් කරා ගමන් ගනිද්දී හරස් මාර්ගයක් හමුවන අතර එය අනිවාර්යයෙන්ම පහළ නිම්නයේ ඇති ගංගාව පහසුවෙන් තරණය කළ හැකි ස්ථානයකට කෙනෙකු යොමු කරයි"

බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ සිටි අග්‍රගණ්‍ය මාර්ග සැලසුම්කරු ලෙස නම් දරා සිටි මේජර් තෝමස් ස්කින්ර සබරගමුව දිස්ත්‍රික්කය සඳහා භූමි සිතියමක් නිර්මාණය කිරීමේ කාර්යයෙහි නියැළී 1930 ගණන්වල ශ්‍රී පාද අඩවියේ ගත කළ ජීවිතයේ තම අත්දැකීම් ආවර්ජනය කරමින් සම්පාදනය කර ඇති 'Fifty Years in Ceylon' (පනස් වසරක් ලංකාවේ ගත කළ ජීවිතය) නම් සිය ග්‍රන්ථයෙහි එසේ දක්වා ඇත.

වේලකට අඟලක පමණ කරවල කැබැල්ලක් සමඟ බෙදා දුන් සිංහල හාලේ බත් ආහාරයට ගනිමින්, බූරු ඇඳකට, හකුළන මේසයකට හා පුටුවකටද සීමා වූ පහසුකම් සහිත, තල කොළ සෙවිලි කළ පැල් කොටයක මේජර් ස්කින්ර ශ්‍රී පාද ගිරි ශිඛරය මුදුනේ දිවි ගෙවූ බව වාර්තාගතයි.

මේ අන්දමින් සිය රාජකාරියේ නිරතව වනගත ජීවිතයක් ගත කරද්දී වල් අලින් ඇතුළු නොයෙකුත් වන සතුන්ගේ අතවරයන්ට මුහුණ පෑමට ඔහුට සිදු විය. විශේෂයෙන්ම බුද්ධිමත්ව තෝරාගත්, නිසියාකාරව තැලී මට්ටම් වුණු අලි - ඇතුන්ගේ ගමන් මාර්ග තම කාර්යයන්හිදී බෙහෙවින් ප්‍රයෝජනවත් වූ බවද ස්කින්ර සඳහන් කරයි.

එක් අවස්ථාවක කඳු මුදුනේ සිට හාත්පස පරික්ෂා කළ ඔහුට කඳු පන්තියේ දකුණු කෙළවරේ වූ අනාවරණ ස්ථානයක් දක්නට ලැබී එහි ගොස් තත්ත්වය සොයා බැලීමට තීරණය කළේය. තම සේවකයින් දෙදෙනකුට සතියකට සෑහෙන කෑම-බීම සපයා දී, ඔවුන් කල් තියා එහි යවා භූමි නිරීක්ෂණ සිදු කිරීමට සුදුසු තැනක් සකස් කර ගැනීමට ස්කින්ර පියවර ගත්තේය. යහපත් කාලගුණික තත්ත්වයක් එළැඹෙන තෙක් බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් කඳු මුදුනේ පසුවීමට සිදු වන බැවින් එම කාලය තුළ සේවකයින්ට ආපසු කඳවුරට පැමිණිය හැකි බව ඔහුගේ අදහස විය.

කෙසේ වෙතත් යථා කාලයේ තම මිනිසුන් ගැන සාංකා සහගත වූ මේජර් ස්කිනර් ඔවුන් ගැන සොයා බැලීමට තමන්ම පිටත්ව ගියේය. ඇළ මාර්ගයක් ඔස්සේ සැතපුමක් පමණ දුරක් ගමන් කළ ඔහු අතරමග නතර විය. අඳුරු වනයේ නිහඬතාවය ඔහුගේ සිත සසල කළේය. මුහුදු මට්ටමින් අඩි 6000 කට වඩා උඩින් පිහිටා ඇති ප්‍රදේශයක් බැවින් අවට වාතයේ ඝනත්වය එහි පැවති නිසළ බව වැඩිදියුණු කරන බවක් ඔහුට හැඟිණි. බොහෝ ඈත මිනිසුන් කතා කරන්නාක් මෙන් හැඟීමක් ඔහු තුළ ඇති විය.

අසල ගසකට නැග ගත් ස්කින්ර උපරිම වෙර යොදා "හූ...." හඬක් නැඟීය. ක්ෂණිකව ඊට පිළිතුරු හූවක් ලද ඔහු නොබෝ වේලාවකින් මිනිසුන් දෙදෙනා තමන් වෙත කැඳවා ගැනීමට සමත් විය. කඳවුරෙන් පිටත් වූ තැන් සිට මුළු කාලයම තමන් ගමනේ යෙදුණු බව විනා අන් කිසිදු තොරතුරක් මිනිසුන්ගෙන් හෙළිකර ගත නොහැකි විය. කොතෙක් දුර ඇවිද්දත් අවසානයේ ස්කින්ර විසින් ඔවුන් සොයා ගන්නා විට තමන් සිටින්නේ කොතැනද කියා හෝ අවබෝධයක් ඔවුන්ට නොවීය. වනාන්තරයේ අතරමං වූවන් ස්වභාවයෙන් කරන්නාක් මෙන් ඔවුන්ද නිසැකයෙන්ම එක දිගට කවාකාර ගමනක යෙදුණා විය හැකියි.

"කඳවුරෙන් පිටත්ව යද්දී ඔවුන් ගෙන ගිය ආහාරපාන සියල්ල අවසන් වී තිබිණි. ඒ අන්දමින් මට ඔවුන් සොයා ගැනීමට ලැබුණේ ඉටු දෙවියන්ගේ මැදිහත්වීමක් නිසා බව මම සිතමි. එසේ නොවන්නට ඔවුන් අන්ත වෙහෙසට පත්ව කැළයේ මිය යෑමට පවා ඉඩ තිබිණි"

කඳවුරේ පසු වූ සියල්ලන්ම චිත්ත ප්‍රමෝදයට පත් කරමින් ස්කින්ර සහ මිනිසුන් දෙදෙනා එහි ළඟා වූහ. කැලයේ අතරමංව සිටි තම සගයන් දෙදෙනා සොයා ගැනීමට වෙහෙසුණු තම ස්වාමියාට ඔවුහු සිය කෘතඥතාවය එක හඬින් පළ කළහ.

එදින උදය ආහාරයෙන් පසුව නැවතත් ගමන් ඇරඹූ මේජර් ස්කින්ර සහ ඔහුගේ පිරිස දින එකහමාරකින් ධාරානිපාත වැහි වළාවකින් අනතුරුව කඳු යායේ දකුණු කෙළවරේ වූ අපේක්ෂිත ස්ථානයට ළඟා වූහ. මහා වර්ෂාව විසින් කැළෑවෙන් එළියට පන්නා දමන ලද සියලුම වන සතුන් එළිමහනේ තණ කමින් සිටිනු දක්නට ලැබිණි. ගෝන්නු පමණක් දහතුනක් එහි වූහ. සියුමැලි සිරුරින් යුත් දෙනුන් හැඩි-දැඩි සිරුරැති පිරිමි සතුන්ගෙන් වෙන් කර හඳුනාගත හැකි විය. ආහාරයට දඩ මස් බිඳක් හෝ නොමැතිව තමන් පසුවන අවස්ථාවක එවන් සතුන් සමූහයකගේ දර්ශනය පවා ඔවුන් තුළ ජනිත කළේ බලාපොරොත්තු කඩවීමකට සමාන මානසිකත්වයකි.

පසු දින උදය බෑවුමේ උස් තැන්නකට නැඟ අවස්ථාවෝචිතව කාලගුණික වාතාවරණය ප්‍රයෝජනයට ගනිමින් අවශ්‍යය නිරීක්ෂණයන් සිදු කිරීමේ අරමුණ ඇතිව මේජර් ස්කින්ර තනිවම කැළය හරහා පිටත්ව ගියේය. සමීක්ෂණ උපකරණද රැගෙන අනපේක්ෂිත ගමන් මාර්ගයේ ගස්වල තමන් තබන සලකුණු ඔස්සේ ඉදිරියට එන ලෙස ඔහු සිය මිනිසුන්ට අවවාද කළේය.

තැනිතලා භූමිය ඉක්මවා පියමන් කළ ඔහු බලාපොරොත්තු වූ දිසාවට වැටී ඇති සතුන්ගේ ගමන් මගකට වැටී ඉදිරියට ඇදුණේය. සැතපුම් භාගයක් පමණ මෙසේ ගිය විට යාබද නිලු ගාලකින් නික්මුණු සර-සර හඬකින් තිගැස්සුණේය. ඊළඟ මොහොතේ උදාර පෙනුමකින් යුත් දිවියෙකු හරියට අඩි අටක් උඩින් පිම්මේ පැන ඔහු සිටි තැනට අඩි 2 ක් පමණ ආසන්නව නතර විය. ගොදුරකට පනින ඉරියව්වෙන් බිම දිගා වූ දිවියා ඇස් නොපියා ඔහු දෙස බලා සිටින්නට විය. ඔහුගේ පා හඬ ඇසීමෙන් එය ගෝනකුගේ යැයි දිවියා සිතුවා විය හැකියි.

කොතෙක් වේලා ඔවුන් එකිනෙකා දෙස නෙත් යොමා ගෙන සිටියාද කියා ස්කින්රට අවබෝධයක් නැතත් එම කාලය තුළදී තමාට මරණ බියක් ඇති නොවුණු බව ඔහු අවධාරණය කරයි. මිනිස් ඇසකින් එල්ල වන ඒකාකාරී බැල්ම කිසිදු සතෙකුට දරා සිටිය නොහැකි බව ඔහු අසා තිබේ. එබැවින් ඒ මොහොතේ උපදවා ගත හැකි උපරිම චිත්ත ධෛර්යයෙන් ඔහු සිය දෙඇස් දිවියාගේ දෑස් වෙත රඳවාගෙන පසු වූයේය. තම බැල්ම ඉවතට ගත්තා නම් හෝ මඳක් පසුබෑවා නම් දිවියාගේ ඉදිරි පාදයෙන් එල්ල විය හැකි එක් ප්‍රහාරයකින් ඔහුගේ දිවි තොර වීමට ඉඩ තිබිණි.

වැඩුණු දිවියකුට ගෝනකු හෝ මීමකු එක පහරකින් මරා දැමිය හැක. කෙසේ වෙතත් නියත අනතුරකින් තමා ගැලවුණු අන්දම ගැන සිතා ත්‍රාසයෙන් මුසපත් වූ ඔහු දිවියාට පිටුපා වන සත්ව ආර ඔස්සේ වේගයෙන් දිව ගියේය. වාසනාවකට මෙන් ඔහුගේ සුනඛයා ඔහු පසුපස ආවේය. එසේ නොවන්නට හොඳ උදය ආහාර වේලක් සපයා ගැනීමට දිවියාට ඉඩ තිබිණි.

නොයෙක් අවස්ථාවලදී තමාට දිවියන් හමුවී ඇතත් එබඳු අනර්ඝ සත්වයෙක් ඊට පෙර කිසි දිනක නොදුටු බව අවධාරණය කරන ස්කින්ර මෙසේද කියයි. " වනාන්තරයේදී වල් අලින් හා අනෙකුත් වන සතුන් සම්බන්ධයෙන් ඉතාමත් අවදානම් අවස්ථාවන්ට මා මුහුණ පා ඇතිමුත් මගේ නිබඳ සහචරයා වන ක්‍රොග් (බල්ලා) මට ආරක්ෂාව ලබා දුන්නේය. ඔහු නොසිටි හැම විටම මගේ ආත්ම ආරක්ෂාවට තුවක්කුවක් රැගෙන යාමට මම පුරුදුව සිටියෙමි. ඔහු මා අසල සිටින විට ආරක්ෂාව පිළිබඳව අනවශ්‍ය බියක් මා තුළ නොවීය. සුනඛයින් වෙත අසාමාන්‍යය බියක් අලි - ඇතුන් දක්වන අතර වන සතුන් කෙරෙහි සුවිශේෂී අවධානයක් දැක් වූ ක්‍රොග් දුටු පමණින් පලා යාමට වල් අලින් පෙළඹෙනු මා දැක තිබේ."



# 14 කොටස

පියදාස වැලිකන්නගේ

# එයා හරි අපූරු ළමයෙක්

එදා පාසල හැරී අඩි පාර දිගේ පැමිණි වනසිංහ “එහෙනම් මං යනවා” යි කියමින් හැරී යද්දී “හරේ” යි කියාගෙන මම අඩිය ඉක්මන් කළෙමි. තනියම යන බොහෝ අවස්ථාවල මගේ ගමන මටත් නොදැනීම හැල්මේ දිවීමකට හැරෙයි. මිනී පිට්ටනිය ඇත්තේ උස් තැනිතලා බිමකය. ඒ හරියේ තැනින් තැන කළුගලින් පඩි බැඳ ඇත. මා බොහෝවිට කරන්නේ පඩියෙන් පඩිය නැගීම නොවේ. පඩියක් හැර පඩියකට පැනීමය. එදාද මා පැමිණියේ ඒ සුපුරුදු ගමනිනි. සොහොන් පිටියේ වම්පසින් දිවෙන පාරට ගල්පඩියේ සිට පනිනවාත් සමගම කලිසමේ තට්ටම හරියෙන් ඉරී ගිය බව මට දැනිණ. මම නැවතී පස්සට හැරී අත ගා බැලීමි. කලිසම ඉරී ඇත. ඉරී ගොස් ඇති විදිය ගැන සිතන විට අනිත් කලිසම වුවද එතරම් කාලයක් අඳින්නට නුපුළුවනැයි මට සිතිණ. මේසයක හා කුඩා බංකුවක ප්‍රශ්නය විසඳාගත් අයුරින් කලිසමක හා කමිසයක ප්‍රශ්නය විසඳාගත නොහැකිය. ඒ ගැන ලොකු මහත්තයාට කියන්නට පුළුවන්කමක්ද නැත. මා අදත් අඳින්නේ ඔහු දුන් කලිසම් හා කමිසය. අම්මාටද කිව නොහැක. අක්කා කොටහළු වුණ දිනයේ ඇය වෙනුවෙන් චේන් පොටක් මිල දී ගැනීම සඳහා අම්මා මලරම්බන් කන්කානිගෙන් ණයට ගත් රුපියල් එකසිය පනහ තවමත් ගෙවා අවසන් කර නැති බව ඇය ළඟදී දිනෙක කී වගද මගේ සිහියට නැගිණ. පොඩිමැණිකේ නැන්දා, උක්කුං මාමා සහ ලොකු මාමා, අම්මා මෙන්ම පවුල් බරින් මිරිකී සිටින්නෝ වෙති. ඉතිරිව සිටින්නේ අප්පච්චි පමණි. එහෙත් කිසිම ප්‍රශ්නයක් ගැන ඔහු සමග කෙලින් කතා කිරීමේ පුරුද්දක් අපට නැත. ඔහුට කිව යුතු යමක් වෙතොත් අප එය සන්නිවේදනය කරන්නේ අම්මා මගිනි. එසේ කියන කිසිවකට කවදාවත්ම ඔහුගෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබෙන බවද මම දැන සිටියෙමි.

ප්‍රතිචාරය කුමක් වුවද කලිසමක් ගෙන දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටීමට මම තීන්දු කෙළෙමි. ගෙදර ගිය සැටියේම කලිසමේ පස්ස පැත්ත පෙන්නා කලිසමක් ගෙන දෙන ලෙස අප්පච්චිට කියන්නැයි මම අම්මාට කියා සිටියෙමි.

“ඕක මහලා අඳින්ට බැරිද පුතේ...?” අම්මා මඳ වේලාවක් කිසියම් කල්පනාවක ගැලී සිට මගෙන් ඇසුවාය.

“ළමයි එහෙම ඇඳගෙන එන්නෙ නෑ අම්මේ...”

“ඔය මිනිහට කියලා වැඩක් නෑ. ඕක කිව්ව ගමන් දෙන උත්තරේ මං දන්නවා” අම්මා දිග සුසුමක් ඉහළට ඇද කීවාය. මම ඇගේ මූණ දෙස බලාගෙන සිටියෙමි.

“උඹ කොල්ලව ගෝරමේන්තුවෙ ලොක්කෙක් කරන්ට හිතාගෙනනෙ පස්සර ඉස්කෝලෙට යැව්වෙ.... මං ළඟ සල්ලි නැතෙයි කියලා කියාව්....” මඳ වේලාවකට පසු අම්මා කීවාය.

ඇගේ ඒ කතාවෙන් පසු අප්පච්චි කෙරෙහි මා තුළ ඇතිවූයේ දැඩි කලකිරීමකි. බූරුවා ගැසීමට මුදල් සපයා ගන්නා ඔහුට මා වෙනුවෙන් කලිසමක් මිල දී ගන්නට නොහැකි වීම මගේ කරුමයකැයි මම කල්පනා කෙළෙමි. ආත්ම වේදනාවෙන් මගේ සිත පුපුරු ගසන්නට පටන් ගැනිණ. දෙනෙතට කඳුළු පුරන්නට වූයේද ඇස් කෙවෙනි රිදුම් දෙමිනි.

“මං මලරම්බන් කන්කානිට කියල බලන්නම් පුතේ. කන්කානිගෙ ළමයෙකුත් ඔය ඉස්කෝලෙට යනවනෙ. ඒ ළමයා අඳින කලිසමක් ඉල්ලාගන්ට බැරිවෙන එකක් නෑ....”

“අම්මට පිස්සුද? ඕවා ඉස්කෝලෙ ළමයින්ට ආරංචි වුණාම මල්ලි කොහොමද ඒ ඉස්කෝලෙට අඩියක් තියන්නෙ?” අපට ඇහුම්කන් දීගෙන සිටි අක්කා එකපාරට කඩා පැන්නාය. ඇගේ කඩා පැනීම මට මහත් පහසුවක් විය.

“අම්මේ උඹට ඕනෑ නම් කන්කානිගෙන් කලිසමක් ඉල්ලාගෙන ඕනෑ එකෙකුට ගිහින් දීපන්. මේ ගෙදරට විතරක් ගේන්ට එපා” යනුවෙන් කෝපයත් සමග දැවටී තිබුණ වදන් වැල මගෙන් පිට නොවූයේ අක්කාගේ කඩා පැනීම නිසාය.

“මං දන්නවා. කන්කානිගේ පුතා ඉන්නේ අපේ පන්තියේ. සොරඩි ගාලා මං ඉස්කෝලේ එනවයි කියන එක දැනටමත් ළමයි හුඟ දෙනෙක් දන්නවා. ඒ අස්සෙ ඉල්ලා ගත්ත කලිසම් ඇඳගෙන එන බව දැනගත්තාම මට පණ නහගන්ට හිතේවි” මම මහත් ආයාසයෙන් කීවෙමි.

“මං එච්චර දුරට හිතුවෙ නෑ පුතේ. උඹ ඔය අනිත් කලිසම ඇඳගෙන ඉස්කෝලෙ පලයන්. මං කොහොම හරි උඹට කලිසමක් ගෙනත් දෙන්නම්කෝ” අම්මා දිග සුසුමක් ඉහළට ඇද දෙනෙත් බුද්ධ පින්තූරය වෙත යොමුකරගෙන කීවාය.

මම අනෙක් කලිසම ඇඳගෙන පසු දා පාසලට ගියෙමි. ඒ යන විටත් මගේ කල්පනාවට අසුවූයේ මුහුණ දෙන්නට සිදුවී ඇති ප්‍රශ්නය ගැනය.

ඉකුත් දෙසතිය තුළ සොරඩි ගෑමෙන් උපයාගත් මුදල වැය වූයේ ඩ්‍රෝවින් පොතක්, දියසායම් පෙට්ටියක් හා සිතියම් පොතක් ගැනීමටය. මාස දෙකක නොගෙවූ පහසුකම් ගාස්තු ගෙවීමටය. කලිසමක් ගන්නට නම් ඊළඟ පඩි දවස එනතෙක් බලාගෙන සිටිය යුතුය. ඒ දවස එළඹෙන්නේ දවස් දහයකට පසුය. “මං කොහොම හරි උඹට කලිසමක් අරන් දෙන්නම්” යි අම්මා කියන්නට ඇත්තේද ඒ දවස ගැන සිතා විය හැකි යැයි මට සිතිණ. එහෙත් අඳින්නට ඇති අනිත් කලිසම එතෙක් කල් පවතීදැයි මම සැක කෙළෙමි. ඒ කලිසම ඇඳගෙන හැල්මේ දුවමින් පස්ස පැත්ත අත ගා බැලූ අවස්ථා කොපමණදැයි මට කිව නොහැක. එවන් අවස්ථාවල එහි තැනින් තැන නූල් ඇදී ඇති සැටියක්ද මට පෙනිණ. කලිසම දින දෙක තුනකට වඩා ඔරොත්තු නොදෙනු ඇතැයි මට හැඟිණ.



ඊ ළඟ සෙනසුරාදා මම අම්මත් සමග වත්තේ වැඩට නොගයෙමි. ඒ ගැන විමසූ විට මා ඇයට කීවේ අවශ්‍යයෙන්ම කළ යුතු පාසල් වැඩ වගයක් ඇති බවය.

“ගියත් වැඩ කරන්ට බැරිවෙයි වගේ...” කියමින් අම්මා ගෙතුළින් පිට වූයේ අහස දෙස බලාගෙනය. අහස කළු වලාකුළින් වැසී තිබිණ. දසතින්ම දක්නට ලැබුණේ මන්දාරම් ගතියකි. ගස්, වැල්, අත්තක්, ඉත්තක්, කොළයක් පවා නොසොල්වා බිරන්තට්ටු වී බලාගෙන සිටින්නාක් මෙන් මට පෙනිණ. ඉකුත් දින කීපයට වඩා දැඩි සීතල ගතියක්ද දැනිණ. මම මන්නා පිහියත්, ගෝනියකුත් ගෙන මිදුලට බැස්සෙමි.

“ඉස්කෝලෙ වැඩ තියනවයි කියල නේද කිව්වේ?” ගෙතුළ සිට අක්කා ඇසුවාය.

“පොඩි වැඩක් තියෙනවා. ඒකත් ඉවර කරලා ඉන්නෝනා අක්කෙ” යි කියාගෙන මම මිදුලෙන් අඩිපාරට ගොඩ වී වේගයෙන් ගමන් කෙළෙමි.

මා ගියේ සොහොන් පිටිය වටකරගෙන ඇති කැළෑවත් සමග වැඩුණු පුවක් අරඹේ උතුරු පැත්තටය. අහලක පහලක කිසිවෙක් නොවූහ. දෙකට නැමූ ගෝනිය උර මත දා ගෙන මන්නා පිහිය අතැතිව සොහොන් පිටිය හරහා එන මා දුටු කලවැද්දෙක් කැළෑව තුළට වැදී නොපෙනී ගියේය. මම පුවක් ගස් දෙස බැලීමි. ඒ හැම ගසකම පාහේ රබ්බඩ ගැසී ගෙන එන පුවක් වලු තිබිණ. මම කැළය කපාගෙන පුවක් ගසක් වෙත ගියෙමි. ගෝනිය ඇට්ටේරියා පඳුරක් මත දමා පුවක් ගසට නැගීමි. විනාඩි කීපයක් ඇතුළත පුවක් වල්ලක් කපාගෙන බිමට බසින්නට මට පුළුවන් විය. ඒ අයුරින් පැයකට ආසන්න කාලයක් තුළ පුවක් ගස් දහයක දොළහක පුවක් වලු කපා ගන්නට මට පුළුවන් විය. යක්කු මට අරියාදු නොකළහ. එහෙත් කූඩැල්ලන්ගෙන් නම් ගැලවීමක් නොවීය. දෙපා බිම තැබූ සැණින් උහු මගේ ඇඟේ එල්ලෙති. මම උන් මන්නා පිහියෙන් හූරා දැමීමි. ඇතැමෙකු ඇඟිලි තුඩුවලින් ඇද වීසි කෙළෙමි.

එක් අවස්ථාවක හිටිහැටියේ වාගේ වේගයෙන් හුළං හමන්නට විය. මා නැග සිටි පුවක් ගස එහාටත් මෙහාටත් පැද්දුණේ අයිලයක් මෙනි. මා පුවක් ගස බදාගෙන සිටියේ කොයි මොහොතක හෝ ගසත් සමග කැළෑව මත පතිත වනු ඇතැයි යන බියෙනි. ඒ ගසේ පුවක් වල්ල කපාගෙන මා බිමට බැස ගත්තේ මහත් වෑයමිනි.

කැළෑව තුළට අඳුර ගුලි ගැසෙන්නට වූයේ වේගයෙනි. සීතල ගතියද දැඩිවෙමින් පැවතිණ. දෙතුන් වරක් එහාට මෙහාට යමින් පුවක් වලුත් ගෝනියත් සොහොන් පිටිය අද්දරට ගෙනා මම වටපිට බැලීමි. එක් මිනී වලක් අසල ඇටකටු කීපයක්ද තිබෙනු මට පෙනිණ.

“මිනිස්සු මේ පැත්තට එන්නෙ නැත්තෙ ඕවා හින්දා තමයි. ඒත් ඉතින් මොනවා කරන්නදැ” යි සිතින් කියාගත් මම පුවක් වලු එකිනෙක ගෙන පොළොවේ ගසන්නට වීමි. පොළොවේ ගසද්දී වල්ලෙන් ගැලවෙන පුවක් එහේ මෙහේ විසිරෙයි. අවසානයේ ඒ සියල්ල එකතු කරගෙන ගෝනියට දා ගත් මම දෑත් දෙපා දෙස බැලීමි. එල්ලී සිටි කූඩැල්ලන් ඇද දැමීමි. සූරා දැමීමි. ඉන්පසු වැලකින් ගෝනි කට බැඳ කරට ගෙන සොහොන් පිටියෙන් පිට වීමි.

කලින් මෙන් සීතල ගතියක් මට නොදැනිණ. ඒ වෙනුවට මුළු සිරුරම උණුසුම් වී දහදිය බිඳු නැගෙමින් තිබිණ.

“මේ පුවක් ගෝනිය කොහෙන්ද ලොකු මල්ලියේ” පුවක් ගෝනිය පිල්කණ්ඩිය මත තැබූ සැටියේම අක්කා දෙනෙත් මහත් කොටගෙන ඇසුවාය.

“උඹේ කකුල්වලින් ලේත් ගලනවා”

“දොඩවන්නෙ නැතිව ගිහින් ලුණු වතුර ටිකක් ගෙනෙන්”

අක්කා ගෙනා ලුණු වතුර මම අත් දෙකේත්, කකුල් දෙකේත් අතුල්ලා ගතිමි. ඇඟිලි කරු අතර රැඳී ලේ උරා බී පිම්බී සිටි කූඩැල්ලන් තුන් හතර දෙනෙකු ලුණු වතුර ගෑවෙත්ම බිම ඇද වැටුණේ ඇඹරෙමිනි. දෑත් දෙපා පුපුරු ගසන්නටත්, දැවිල්ල ඉහවහා යන්නටත් පටන් ගැනිණ. මම දත කා ගෙන ඒ අමාරුකම් විඳ දරා ගතිමි.

“මට සබන් කෑල්ලකුයි ගෝනියකුයි ගෙනත් දියන් අක්කේ” මා දෙස බලාගෙන සිටි අක්කාට මම කීවෙමි.

“පුවක් ගේන්නද?”

“ඔව්”

“කොහෙන්ද?”

“පස්සෙ කියන්නම්” අක්කා ගෝනියකුත් සබන් පොත්තකුත් ගෙනත් දුන්නාය.

“සබන් ඉවර වෙලා. ඔච්චරයි තියෙන්නෙ”

මන්දාරම් ගතිය පෙරට වඩා වැඩිය. වරින් වර සුළඟ හමන්නට වූයේද ගස්වැල් පෙරලා දමන්නට තැත් කරන්නෙකු මෙනි. දෑත් දෙපාවල දැවිල්ල මැඩගෙන නගින්නේ සීතලකි. කාලගුණයේ විපරීත බවක් ඇතැයි මට සිතිණ.

මගේ අදහස වූයේ පුවක් ගස්වලට නැග පුවක් කැඩීම නොවේ. පළමුවරට පුවක් කඩන්නට කැළෑව තුළට රිංගද්දී ගස් යට පුවක් රාශියක් වැටී තිබෙනු මගේ ඇස ගැසිණ. ඇතැම් පුවක් ගෙඩි පැල වී තිබිණ. ඇතැම් ගෙඩිවල ලෙලි කුණු වී ඇතිවා සේද පෙනිණ. ඒ අතර ලේන් දත් වැදී වැටුණ කහ පැහැති පුවක් ගෙඩිද විය. මගේ අදහස වූයේ වැස්ස ඇදහැලෙන්නට පෙර ඒ ජාතියේ පුවක් ගෝනියක් ගෙන ඒමය. ලුණු වතුර තැවරී ඇති දෑත් දෙපාවල සබන්

32 වන පිටුව බලන්න

# එයා හරි...

31 වන පිටුවෙන්

අතුල්ලා ගත් පසු කූඩැල්ලන් මට වද නොදෙනු ඇතැයි මම කල්පනා කෙළෙමි.

ගස් නැගලා පුවක් ගෝනියක් කඩා ගත්තාට කලින් මට පුවක් ගෝනියක් අහුලා ගන්නට පුළුවන් වේ යැයිද වැස්සට කලින් ගෙදර යන්නට පුළුවන් වනු ඇතැයිද මට සිතිණ.

සොහොන් බිමේ උතුරු පැත්තට ගිය මම සබන් පොත්තට කෙළ ගසා දෑත් දෙපාවල අතුල්ලා ගතිමි. අනතුරුව ගෝනියත් මන්න පිහියත් ගෙන කලින් සාදාගත් මග දිගේ ගොස් පුවක් අරඹට ළඟා වීමි.

'කූඩැල්ලන් තියා යකෙක් ආවත් මං මේ වැඩේ නවත්තන්නෙ නෑ. වැඩේ නවත්තන්ට නම් මට කලිසමක් ගෙනත් දීපියව් කියල මං යකාට වුණත් කියනවා" යි මම වැටුණ පුවක්, ගෝනිය තුළට දමමින් සිතින් කීවෙමි. වැඩි වේලාවක් ගත නොවීය. පුවක් ගෝනිය පිරිණ. ගිනිතිල්ලා වැලකින් ගෝනි කට බැඳගත් මම මහත් වෑයමින් එය කරට ගෙන සොහොන් බිම මැදින් ගමන් කෙළෙමි.

වරින් වර වේගයෙන් හමන සුළඟ ඇතැම් විට මගේ ගමනට බාධාවක් විය. ඒ නිසාම දෙතුන් පොළක නවතින්නටද මට සිදුවිය. සිතෙහි හටගෙන තිබුණ ජයග්‍රාහී සතුට කූඩැල්ලන්ටවත්, සුළඟටවත්, වෙහෙසටවත් ඔබා යටපත් කළ නොහැකි විය. මා පුවක් ගෝනිය පළමු පුවක් ගෝනිය තැබූ තැනම තබා දිග සුසුමක් ඉහළට ඇද වටපිට බැලීමි. අනතුරුව "අක්කේ" යි හඬ නගා කතා කෙළෙමි. දෙවරක් කතා කළද ඇගෙන් උත්තරයක් නොලැබිණ.

"නංගියේ කෝ අක්කා?" ගෙයි මුල්ලකට වී මා දෙස බලාගෙන සිටි නංගීගෙන් මම ඇසීමි.

"කොහෙද ගියා... දන්නෙ නෑ...."

මම ලුණු වතුර ගෙන දෑත් දෙපාවල අතුල්ලා ගත්තේ බංකුව මත ඉඳගෙනය. දෙපාවල එල්ලී සිටි කූඩැල්ලෝ හතර පස් දෙනෙකු බිම වැටී ඇඹරෙන්නට වූහ. මම උන් අල්ලා වීසිකර දැමීමි. මුළු ගතම දැවිල්ලෙන් හා වේදනාවෙන් පුපුරු ගසන ගතියක් මට දැනිණ. උණු උණුවේ කහට කෝප්පයක් බොන්නට ඇත්නම් මැනවැයි මට සිතිණ.

"නංගියේ තේ උගුරක් බොන්ට වතුර ටිකක් ළිපේ තියාපන්කෝ" යි දෑත් බැඳගෙන මා දෙස බලාගෙන සිටි නංගීට මම කීවෙමි.

වැස්ස ඇදහැලෙන්නට පටන් ගැනිණ. බොර වතුර මිදුල දිගේ ගලාගෙන යන සැටි මම බලාගෙන සිටියෙමි. අම්මත් අක්කත් දුවගෙන ආවේ තෙමීගෙනය.

"ඇයි ලොක්කා උඹ හොරකමේ ගියේ?" අම්මා ගෙට ගොඩ වූ සැටියේම පුවක් ගෝනි දෙස බලා හඬා වැළපෙන ස්වරයෙන් ඇසුවාය.

"අපේ පවුල්වල අය මොන වැරදි කළත් හොරකම් කරන්නෙ නෑ පුතේ"

"අම්මට පිස්සුද? මොනවද මේ දොඩවන්නෙ?" මම මහත් සේ විමතියට පත්ව කෑගසා ඇසීමි.

"එහෙනම් මේ පුවක් කොහෙන්ද?"

"මං කනත්තෙ පුවක් අරඹෙන් කඩාගෙන ආවා" අම්මාට එකවර කතා කරගත නොහැකි විය. ඇගේ දෙනෙතින් කඳුළු කඩා හැලෙන්නට පටන් ගැනිණ. අක්කා දුකින් මා දෙස බලාගෙන සිටියාය.

"අනේ පුතේ උඹ දුක් විඳිනවා" මඳ වේලාවකට පසු අම්මා ගොත ගසමින් කීවේ පහත් වී තෙමුණ රෙදි පොටකින් කඳුළු පිස දමා ගනිමිනි.

"අපි කවුරුත් දුක් විඳිනවා අම්මේ" මම කීවෙමි.

"ලොක්කියේ ඔය සර්වවිසාදි බෝතලය ගෙනෙන්" අපේ ගෙදර කෝකටත් තෛලය අම්මා පොළෙන් ගෙන එන සර්වවිසාදි තෙල බව මම දැන සිටියෙමි. කූඩැල්ලන් කා ලේ ගලන දෑත් දෙපාවල ඇය තෙල් ගා ඇතිල්ලුවාය.

කලිසම් කමිස ජෝඩුවකුත් නංගිට ගවුම් රෙද්දකුත් මිල දී ගන්නා ලද්දේ ඒ පුවක් විකිණීමෙන් ලත් මුදලිනි. ඒ කාරියේදී ලොකු මාමා අම්මාටත් මටත් බෙහෙවින් උදව් කෙළේය.

කනත්ත වටා දැවැන්ත පවුරක් මෙන් නැගී කැළෑවත් පුවක් අරඹත් මට පෙනුණේ මුදල් සපයාගත හැකි සරුබිමක් ලෙසිනි. එහෙත් මතු කිසි දිනෙක එහි නොයන ලෙස අම්ම මට තරයේ අවවාද කළාය. මුත්තා, උක්කුං මාමා හා ලොකු මාමාද පොඩිමැණිකේ නැන්දාද සිටියේ ඇගේ පැත්තේය. ඔවුන් කොයි කවුරුනුත් නොකියා කීවේ සොහොන් පිටියවත් ඒ වටා ඇති කැළයවත් තනිව අඩිය තැබීමට සුදුසු තැනක් නොවන බවය.



"මල්ලිට වෙච්ච දේ මතකයි නේද පුතේ?" අම්මා බිය රැඳි දෙනෙතින් යුතුව වෙවුළන හඬින් මගෙන් ඇසුවාය.

"ඔය යක්කු, භූතයෝ, පෙරේතයෝ ඔක්කොම ඉන්නෙ අපිව කන්ට බලාගෙනද? ඇයි උන් එකෙකුටවත් අපි මේ විඳින දුක පේන්නෙ නැද්ද?" මා ඒ ප්‍රශ්නය ඇසුවේ අම්මාගෙනි. 'සැන්ටිපෝට්' මහතා අවුරුදු කීපයකට පෙර ගුරු දෙගුරු සමිතිය ඉදිරියේ කළ කතාව සිහියට නැගීමෙන් ආවේශ වූවෙකු මෙනි.

"මං ඔය සොහොන් පිට්ටනිය ළඟින් හැමදාම හවසට එනවා. කෝ ඔය එකෙක්වත් මට හම්බවෙලා තියෙනවද? පුවක් අහුලන්ට ගිය දවසෙවත් ඔය කියන උන්ගෙන් එකෙක්වත් මං ළඟට ආවද? ආවා නම් මං ඒකා ලව්වත් පුවක් අහුලෝ ගන්නවා අම්මේ...." අනතුරුව මා සිනාසෙමින් කීවේ ආවේශයෙන් වගේ කී වදන් කීපයේ සැර බාල කරන අදහසිනි.

**ලබන කලාපයෙන් තවත් කොටසක්**

BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers
Any Document Shipping worldwide
DHL EXPRESS
AIR-SEA-LAND
Household Goods & Commercial Cargo
Packing / Relocation / Transport / Express delivery
DELIVERY SERVICE ALL PART OF SRI LANKA (GIFT PACK)

Warehouse In Colombo
LAKSIRI SEVA (PVT) Ltd
66 New Nuge Road,Peliyagoda
Kelaniya
Tel: 11-257-4180

Kurunegala Warehouse
Laksiri Seva (PVT)Ltd
118/96 Negombo Road
Malkaduwawa
Kurunegala
Tel : 037-2052-810

Warehouse In Batticaloa
LAKSIRI SEVA (PVT)Ltd
26,Hmyl Lane
Main Street,Addapalam
Ninthavur
Tel : 0672051050

Toronto: - 416-321-0400
IAM
International Association Of Movers
Proud member of
CIMC
Canadian International Movers Club
Ajax / Whitby - Mr.Prasad,1-289-200-4288
Ottawa : Kannan -1-613-828-2221 Montreal: Uthayan -1-514-736-2525
Web:www.briskcargo.com Email: info@briskcargo.com
919 Ellesmere Road Suite # 306 M1P2W7



# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2017 මැයි 01 දින සිට මැයි 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)



### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කිරීම ශුභයි. සතුරු කරදර අඩුය. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ජයග්‍රහන ලැබේ. විනෝද කටයුතුවල යෙදීමේ අවස්ථා සැලසේ. රැකියා, වෙළඳ ව්‍යාපාරවලින් දියුණුව ලැබේ. ඉක්මන් තීරණ ගැනීමට පුළුවන. ආදායම සරු වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 7 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. විනෝද වීමට සිත් දේ. කලාවට සංගීතයට ප්‍රිය වේ. සතුරු කරදර අඩු වේ. රැකියා දියුණුව සැලසේ. බාධක බිඳ ඉදිරියට යාමේ හැකියාව ඇත. ආදායම් මාර්ග සරු වේ. තනි මතයට වැඩ කිරීමට සිත් දේ. පිනට දහමට යොමු වේ.

### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ දෙවැන්නේ ගමන් කරමින් මේ මාසය ඇරඹේ. ලග්නයේ රවි උච්ච වී බුධ සමග යෝග වී සිටීම ශුභයි. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. රැකියාවේ දියුණුව ඇති වේ. සමාජ සේවා කටයුතුවලට යොමු වේ. සතුට විනෝදය අගය කරයි. තම මතයට ක්‍රියා කරන සේ පෙනේ. ලැබීම අතින් යහපත් කාලයකි.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 11 වැන්නේ උච්ච වී ගමන් කිරීම ශුභයි. රැකියා වෙළඳ ව්‍යාපාරවලින් ලාභ ලැබේ. ධන ලාභ ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විනෝදයට, අලංකාර කටයුතුවලට වියදම් කරයි. අෂ්ටම ඒරාෂ්ටකය ලබා ඇති අතර සඳුත් සමග ශනි යෝග වී ඇත්නම් වඩාත් ප්‍රවේසම් විය යුතුව ඇත.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 11 වැන්නේ රවි සමග යෝග වී ගමන් කිරීම ශුභයි. අධ්‍යාපන කටයුතුවලට ඉතාමත් ශුභ කාලයකි. විභාග ජය ලැබේ. උසස් මිතුරන්ගේ ඇසුර ලැබේ. රැකියා කටයුතුවලදීද ශුභයි. රැකියා අපේක්ෂිත අයට රැකියා ලැබීමේ භාග්‍යය ඇත. මිල මුදල් ලාභ ඇත. ගේ දොර මිල දී ගැනීමේ අවස්ථාව හිමි වේ. ශුභ ඵල ලැබෙන කාලයකි.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. ආදායම් මාර්ග සරු වේ. අධ්‍යාපනයට ඉතා ශුභ වේ. විභාග ජය ලැබේ. රැකියා ව්‍යාපාර දියුණුව ඇති වේ. කීර්ති ප්‍රශංසා ලැබේ. ආදායම් මාර්ග ශුභ වන අතරම වියදමද අධික වේ.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු ලග්නයේ ගමන් ඇරඹීම ශුභයි. රැකියා දියුණුව වරප්‍රසාද ඇති කෙරේ. භූමි ලාභ ඇත. උසස් අධ්‍යාපනයට යොමු වේ. ආදායම් මාර්ග සරු වේ. සමාජ සේවා වැඩකටයුතුවල යෙදේ. පින්දහම් කටයුතුවලට වඩාත් යොමු වේ. ශුභ ඵල ලැබේ.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 10 වැන්නේ ගමන් කරයි. ගේ දොර වාහන ලාභ ඇත. රැකියා දියුණුව, උසස් වීම් ලැබෙන කාලයකි. 4 වැන්නේ සිකුරු උච්ච වී දිග්බලයෙන් සිටීමද ශුභයි. දියුණුව ඇති කෙරේ. ක්‍රීඩාවට කලා අංශයට ප්‍රිය වේ. අධ්‍යාපනයට යහපත් වේ. රජයේ තනතුරු ලැබීමට ඉඩ ඇත. ලග්නයේ සඳු ගමන් කරනවා නම් ලග්න ජන්ම ඒරාෂ්ටකය බලපවත්වයි.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 7 වැන්නේ ගමන් කරයි. රැකියා කටයුතු දියුණු වේ. අධ්‍යාපන කටයුතුවලට යහපත් වේ. ක්‍රීඩා කටයුතුවලට, සංගීත කලාවට ඇල්ම දක්වයි. ආදායම ශුභ වන අතර වියදමද අධික වේ. උත්සාහයේ තරමට ජය ලබාගත හැක. සඳු 2 වැන්නේ නම් අනතුරු පීඩා ඇතිවීමට ඉඩ ඇති හෙයින් ප්‍රවෙසමෙන් කටයුතු කරන්න.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි උච්ච වී 9 වැන්නේ බුධ සමග යෝග වී ගමන් කිරීම ශුභයි. අධ්‍යාපන කටයුතු වඩාත් සාර්ථක වේ. අලුත් දේ ඉගෙනුමට සිත් දේ. රැකීරක්ෂා දියුණුව ඇති කෙරේ. විවිධ තානාන්තර ලැබේ. මිතුරු ඇසුර යහමින් ලැබේ. ගේ දොර ඉඩකඩම් ගැනීමට හැක. ගමන් බිමන් අධික වේ. ආදායම් මාර්ග සරු වේ. මුදල් ගනුදෙනුවලදී ප්‍රවේසම් වන්න. බාධක කරදර මැඩ ඉදිරියට යා යුතුව ඇත.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු 6 වැන්නේ ගමන් කරයි. අලුතෙන් ආරම්භ කරන කටයුතු ශුභ වේ. භූමි ලාභ ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. සතුරු කරදර අඩු වේ. ගේ දොර ඉඩකඩම් ගැනීමට අවස්ථාව එළඹේ. රැකියා දියුණුව ඇති වේ. ආදායම් මාර්ග සරු වේ.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ 8 වැන්නේ ගමන් කරයි. හවුල් ව්‍යාපාරවලින් බොහෝ ලාභ ලැබිය හැක. නිසි වයසේ අයට මංගල යෝග උදා වනු ඇත. සමාජ සේවා කටයුතුවල යෙදෙන කාලයකි. මිතුරු මිතුරියන්ගේ ඇසුර උපකාරය ලැබේ. මවුපිය දේපළක උරුමය ලැබිය හැක. පදිංචිය වෙනසක් ඇතිවිය හැක. ධන ලාභ ඇත.




**එම්. වයි. ධර්මවිජය**
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca

# ඇත්තටම මිය ගිහින්ද?



ශල්‍ය වෛද්‍ය
■ **ආනන්ද දිසානායක**

මරණය යනු කුමක්ද? යමෙකුගේ මරණය සිදුවන මොහොත කුමක්ද? මේ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම නූතන වෛද්‍ය විද්‍යාවට වුවද අසීරු කටයුත්තකි.

හදවතේ ගැස්ම නතර වීම සහ ස්වසනය නතර වීම එම පුද්ගලයාගේ මරණය සිදුවූ මොහොත ලෙස බොහෝ දෙනා සලකති.

කෙනෙකුගේ ආයුෂ කොපමණදැයි තීරණය කිරීමට වෛද්‍ය විද්‍යාව තවමත් සමත් වී නැත. මරණයකදී ක්‍රමයෙන් ශරීරයේ උෂ්ණත්වය ඉවත් වීම යනුවෙන් අදහස් කරන්නේ එම පුද්ගලයාගේ ශරීරයේ සියලුම පටක මිය යාම විය යුතුය. එහෙත් මෙහිදී මතක් කළ යුතු කරුණක් වන්නේ මොළය පමණක් මිය ගිය අවස්ථාවකදී ශරීර උෂ්ණත්වය පරිසර උෂ්ණත්වයට ක්‍රමයෙන් ළං වීමයි.

එසේම කෙනෙකු මිය ගිය ස්ථානයේ පරිසර උෂ්ණත්වය සාමාන්‍ය ශරීර උෂ්ණත්වය වන සෙල්සියස් අංශක 37 ට වඩා වැඩි නම් මළ සිරුරේ උෂ්ණත්වය වැඩි වන බවද කිව යුතුය. උදාහරණයක් ලෙස ගතහොත් පරිසර උෂ්ණත්වය සෙල්සියස් අංශක 40 පමණ වන අරාබිකරයේ රටක, කෙනෙකු මිය ගිය විට මළ සිරුරේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 37 සිට 40 දක්වා වැඩිවෙයි.

මරණය සිදුවීමේදී ප්‍රථමයෙන්ම අක්‍රිය වන්නේ මොළයයි. මක්නිසාද යත්, ඔක්සිජන් හා ග්ලූකෝස් නැතිව මොළයේ ස්නායු සෛලවලට ජීවත් විය හැක්කේ ඉතා සුළු කාලයක් බැවිනි.

ශරීරයේ අනෙකුත් අවයවවලට ඊට වඩා වැඩි කාලයක් ඔක්සිජන් හා ග්ලූකෝස් නැතිව, එනම් රුධිර සංසරණයක් නැතිව ජීවත්විය හැකිය. උදාහරණයක් ලෙස ගතහොත් රුධිර සංසරණය නතර වී පැය පහක කාලයක් පමණ යමෙකුගේ අතකට හෝ පාදයකට ජීවත් විය හැකිය.

කෙනෙකුගේ අතක් සම්පූර්ණයෙන්ම කැපී ශරීරයෙන් ඉවත් වී ගියද ක්ෂණිකව ශල්‍ය කර්මයකට භාජනය කර, රුධිර සංසරණය නැවත ඇති කිරීමෙන්, එම අත ජීවත් කරවිය හැක.

හිසට ඇතිවන බරපතළ තුවාල සහ හිසෙහි ඇති වන වෙනත් රෝග නිසා, එම රෝගීන්ගේ ස්වසනය ප්‍රමාණවත් අන්දමින් සිදු නොවන විට යන්ත්‍රයක් මගින් කෘත්‍රිම ස්වසනය ලබා දෙයි. එහෙත් එම පුද්ගලයාගේ හිසට ඇතිවන තුවාලය බරපතළ වීමෙන් හෝ කපාලය තුළ පීඩනය අධික වීමෙන් මොළයට රුධිරය සැපයුම අඩුවීම නිසා මොළයේ සෛල මිය යා හැකිය. නමුත්, ඔහුගේ ස්වසනය යන්ත්‍රානුකූලව සිදුවන නිසා රුධිරයට සපයන ඔක්සිජන් ප්‍රමාණය නොවෙනස්ව පවතින බැවින් හෘදය ක්‍රියා කරයි.

හෘදයේ ක්‍රියාකාරිත්වය හෘදය තුළම පිහිටි හෘදගතිකරය නම් ස්ථානයෙන් ඇතිවන තරංගාත්මක සන්නිවේදනයන් හෘද පේශීන්ට විහිදී ගොස් හෘද ස්පන්දනය සිදුවේ. මොළය හා හෘදය අතර ස්නායු සම්බන්ධයක් ඇතත් එයින් සිදුකරන්නේ හෘද ස්පන්දන වේගය අඩු වැඩි කිරීම පමණකි. එම සම්බන්ධය නැතිව වුවද රුධිරයෙහි ඔක්සිජන්, ග්ලූකෝස් සහ අනෙකුත් ද්‍රව්‍යයන් නිසි අයුරින් පාලනය කළහොත් ඕනෑම කාලයක් එසේ හෘදය ක්‍රියා කරවිය හැකිය.

රුධිර සංසරණය එසේ සිදුවන්නේ නම් ආහාර මාර්ග පද්ධතිය, අක්මාව, වකුගඩු අග්න්‍යාසය ඇතුළු අනෙකුත් අවයවද මිය යාමෙන් තොරව ජීවත් කරවිය හැකිය. මොළය මිය ගොස් ඇති විට එම රෝගියාගේ සිහිය සම්පූර්ණයෙන්ම නැතිව යයි. එසේ වනුයේ මොළයෙහි ඇති විතංශිකා භවනය (Reticular Formation) ක්‍රියා විරහිත වන බැවිනි. එසේම ඔහුගේ සියලුම කපාල ස්නායු ක්‍රියා විරහිත වේ. මොළය පමණක් මිය ගිය මෙම රෝගියාට සිතුවිලි ඇතිවන්නේ නැත. බාහිර උත්තේජන දැනෙන්නේ නැත. මතකය පිහිටා ඇති යයි සලකන මස්තිෂ්ක බාහිකයද මිය යාම නිසා මතකය තිබිය නොහැකිය. නමුත් ඔහුගේ රුධිර සංසරණය සිදුවේ. හදවතේ ගැස්ම සිදුවේ. පෙනහලු යන්ත්‍ර මගින් ක්‍රියා කරයි. ශරීරයේ අනෙකුත් පටක ජීවත් වේ. මෙම අවස්ථාව ඇත්ත වශයෙන් ශාකයකට සමාන කළ හැකිය. එනම්, ශාකයකට මොළයක් නැත. නමුත් ශාකයේ සෛල ජීවත් වේ.

වසර කීපයකට පෙර ඉතාලියේ එක්තරා රෝහලක සිදුවූ අපූරු සිදුවීමක් මෙසේ වාර්තා වී තිබුණි. එනම් මොළය මිය ගිය මවක ශල්‍ය කර්මයකට භාජනය කිරීමෙන් දරු උපතක් සිදුවීමයි. දරු ප්‍රසූතියට මාස කීපයක් තිබියදී එම මවගේ මොළයට තදබල වෛරස් ආසාදනයක් ඇතිවී රෝහල් ගත කරන ලදී. රෝගී තත්ත්වය උග්‍ර වූ බැවින් වෛද්‍යවරු මව ස්වසන යන්ත්‍රයකට සවිකර තැබූහ. මේ අතරතුර මවගේ රෝගය තවත් උග්‍ර විය. මොළය නැවත පණ ගැන්විය නොහැකි ලෙස මිය ගියේය. නමුත් කුස තුළ සිටින දරුවා බේරා ගැනීමේ අරමුණින් ඇයට කෘත්‍රිම ස්වසනය සහ පෝෂණය ලබාදීම දිගින් දිගටම කරගෙන යන ලදී. ළදරුවා මවු කුස තුළ හොඳින් වැඩුණේය. අවසානයේ නියමිත කාලය එළැඹි පසු සැත්කමකින් දරුවා යහතින් මෙලොව එළිය දුටුවේය. ආශ්චර්යය නම් දරුවා මේ කාලය තුළ වැඩී ඇත්තේ මොළයක් නැතිව කෘත්‍රිමව ජීවත් කරවන ලද සිරුරක් තුළය.

මොළය පමණක් මිය ගොස් යන්ත්‍ර මඟින් සිරුර ජීවත්වන පුද්ගලයකු මිය ගොස් ඇති බව ඥාතීන් හට දැනුම් දීම කොතරම් සදාචාරාත්මකදැයි සලකා බැලීම වටී. ඔවුන් හට එම පුද්ගලයා පෙනෙනුයේ ශ්වසනය සිදු කරන, හදවතේ ගැස්ම තිරය මත දිස්වෙන නොමැරුණ අයෙකු ලෙසයි.

ශරීර අවයව බද්ධ කිරීම අද ඉතා දියුණු තත්ත්වයකට පත්ව තිබේ. මොළය මිය ගිය එහෙත් රුධිර සංසරණය සිදුවන පුද්ගලයින් අවයව දන්දීමට ඉතාම සුදුසු දායකයෝය. ජීවත්ව සිටින පුද්ගලයෙකුගෙන් ලබා ගත නොහැකි බොහෝ අවයව එනම් හෘදය, පෙනහලු, අක්මාව, අග්න්‍යාසය, කුඩා අන්ත්‍ර ආදිය මෙවැනි පුද්ගලයකුගෙන් ලබාගත හැකි අතර මේ මගින් ජීවත් වීමට වාසනාව නැති වෙනත් රෝගීන් කිහිප දෙනෙක්ම මේ පුද්ගලයාගේ අවයව බද්ධ කිරීමෙන් ජීවත් කරවිය හැකිය.

එසේම කෘත්‍රිම ශ්වසනයෙන් ජීවත් වන පුද්ගලයාගේ ශ්වසන යන්ත්‍රය අනවශ්‍ය ලෙස තබා ගැනීමෙන් ජීවත් කරවිය හැකි වෙනත් රෝගියෙකුට පාවිච්චි කිරීමට ඇති අවස්ථාව නැතිවී යයි. එසේ ම දැඩි සත්කාර ඒකකයක අනවශ්‍ය ලෙස රෝගියෙකු තබා ගැනීමේදී විශාල මුදලක්ද වැය කිරීමට සිදුවේ.

ඉහත සඳහන් සියලු කරුණු සලකා බලා, මරණය යන්නට නව අර්ථ කථනයක් දීමට අද ලෝකයේ බොහෝ රටවල වෛද්‍යවරු පෙලඹී සිටිති. එක්සත් රාජධානියේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මරණය වෛද්‍ය විද්‍යාත්මකව හා නීතිමය වශයෙන් අර්ථ දක්වා ඇත්තේ මෙසේය.

"පුද්ගලයෙකුගේ මරණය යනු ඔහුගේ සිහිය නැවත ඇති කිරීමට ඇති හැකියාව ස්ථිර ලෙසම නැතිවී යාම සහ ආධාරකයකින් තොරව ශ්වසනය කිරීමේ හැකියාව ස්ථිර ලෙසම නැතිවී යාමයි"

එක්සත් රාජධානියේදී පුද්ගලයෙකුගේ මොළයේ මරණය නිශ්චය කරන්නේ කෙසේද යන්න දැන් සලකා බලමු. ඒ සඳහා නියමිත නීතිමය රාමුවක් එරට ඇත.

ප්‍රථමයෙන්ම රෝගියාගේ මොළයේ මරණයට හේතුව සැක හැර දැනගත යුතුය. ඒ සඳහා බොහෝ විට සී.ටී ස්කෑන් පරීක්ෂණය හෝ එම්.ආර්.අයි පරීක්ෂණය සිදු කරනු ලබයි. දෙවනුව රෝගියාගේ රුධිරයේ ස්නායු පද්ධතියේ හෝ ශරීරයේ මාංශ පේශීන් අඩපණ කරන කිසිදු ඖෂධයක් නැති බවට සැක හැර දැනගත යුතුය. ඒ සඳහා රුධිර සාම්පල් පරීක්ෂා කරනු ඇත. එසේම රෝගියාගේ පරිවෘත්තිය ක්‍රියාවලියේ දුර්වලතා නොතිබිය යුතු අතර රෝගියාගේ උෂ්ණත්වය ඉතා පහළ අගයක නොතිබිය යුතුය.

ඒ සියලු අංග, සම්පූර්ණ වී ඇත්නම් රෝගියාගේ මොළ නටුවේ (Brain Stem) ක්‍රියාකාරිත්ව සහ කපාල ස්නායුවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරනු ලැබේ. මේ සඳහා වසර පහකට වඩා පළපුරුද්දක් ඇති වෛද්‍යවරුන් දෙදෙනෙකු සහභාගි විය යුතු අතර, ඉන් එක් අයෙක් හෝ නිර්වින්දන, ස්නායු ශල්‍ය හෝ ස්නායුවේදී විශේෂඥ වෛද්‍යවරයෙකු විය යුතුය. ඉන් අනතුරුව රෝගියා ශ්වසන යන්ත්‍රයෙන් තාවකාලිකව ඉවත් කරනු ලැබේ. ඉන්පසු රුධිරයේ කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩි වනතුරු තබයි. මෙම කාලය තුළ රෝගියා ආධාරයකින් තොරව ශ්වසනය සිදු නොකරන්නේ නම් ඔහුගේ ශ්වසන කේන්ද්‍රය (Respiratory Centre) ක්‍රියා විරහිත වී ඇතැයි නිශ්චය කරනු ඇත.

ඉන්පසු නැවතත් ඔහු ශ්වසන යන්ත්‍රයට සවිකර තබන අතර යම් කාල පරාසයකට පසු එම පරීක්ෂණයන් නැවතත් සිදුකරයි. කෙසේ වුවත් පරීක්ෂණ දෙකෙන්ම රෝගියාගේ මොළය මිය ගිය බව නිශ්චය වුවහොත්, පළමු පරීක්ෂණය සිදුකළ මොහොත ඔහුගේ මිය ගිය වේලාව ලෙස නීතිමය වශයෙන් එරට සලකනු ලැබේ.

ලංකාවේ ද එවැනි ක්‍රමවේදයක් තිබුණද එය අකුරටම ක්‍රියාත්මක නොවේ. ඊට හේතු වන්නේ මොළය මිය ගිය එහෙත් රුධිර සංසරණය සිදුවන අයගෙන් අවයව ලබා ගැනීම අප රටේ තවමත් ළදරු වියේ පවතින නිසාය.


Century 21
Percy Fulton Ltd. Brokerage
COMMITTED TO TURNING
Your Dream Home into Reality
Dissanayake Danapala
B.A., Dip in Urban Development
Sales Representative
* Provide Consulting and Project Management Services for Renovations and new Custom Build Homes.
* Complementary Home Evaluation
* Staging to Increase Value
* Helping to find out mortgage
* Reasonable and competitive amount of cash pay back to the buyers from my commission
CALL: 416 697 9925
dissahomes@gmail.com
Dissa
Your Premier Real Estate Agent
MLS
REALTOR


LAL LAW OFFICE
❖ Real Estate
❖ Mortgages
❖ Immigration Law
❖ Family Law
❖ Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com


Ceylon Herbal Tea
Tea21
CINNAMON TEA
Benefits of cinnamon tea..
• Positive effect on blood sugar.
• Aid weight loss and belly fat reduction.
• Helps to reduce menstrual discomfort and cramps.
GREEN TEA
A cup of tea 21 green tea and a life long benefits…
• Helps to reduce cholesterol levels.
• Helps to loose weight.
• Prevent hair loss.
• Contains most amount of anti oxidant polyphenols.
• Skin care and many more...
HIBISCUS TEA
Benefits of drinking tea 21 hibiscus tea…
• Can prevent pre-cancerous cells from growing by inducing apoptosis.
• Good for heart diseases and diabetes.
• Protects liver
• Relief from cramps and menstrual pain and many more...
BLACK CUMIN SEEDS
LIVER FRIEND TEA
Benefits of drinking a cup of black cumin tea…
• Stimulates the energy of the body.
• Decrease fatigue and dispiritedness.
• Anti-hypertensive, carminative and anti-parasitic and many more...
BITTER GOURD TEA
Benefits of tea 21 bitter gourd tea …
• Very low in calories.
• Helps to reduce blood glucose level.
GINGER TEA
Ginger tea has a lot of benefits such as…
• relieve stress.
• Fight against respiratory problems.
• Reduce inflammations and many more….
Imports by
S. N. S ENTERPRISES
Telphone : 416 890 9521

**මෙවර දසත කවි අරණ වෙන්වන්නේ මව ගැන ලියවුණු කවි කීපයක් වෙනුවෙනි.**

## මව්වරුන්ගේ දිනය

මුදු හතකින් එපිට නිවසක
හුදෙකලා දුරකතනයක කෙළවර
"ආ.. පුතේ.. මං හිතුවා විතරයි"
කණ වැකෙන ඒ සෑම දවසම
මව්වරුන්ගේ දිනක් වේ මට

පැතලි වූ පරිඝණක තිරයක
රිදී හිසකෙස් මැද සිනාසෙන
කාලයේ ඉරි ඇඳුනු නුඹ මුව
ඇස ගැටෙන ඒ සෑම දවසම
මව්වරුන්ගේ දිනක් වේ මට

රිදෙන උර, හිරි වැටුණු දෙපතුල
දුවකගෙන් මඟහැරෙන යුතුකම
හිතට වැද බර අඩි තබා හිත
ගිනි තබන ඒ සෑම දවසම
මව්වරුන්ගේ දිනක් වේ මට

තබා උර නැග ගොසින් ගිරි හෙල්
තැබූ පසුවද බිමක දවසක්
හිතෙන් මා තවමත් ඔසවගෙන
පිය නගන මගේ අම්මා
බුදු පහන අස දෑත් එක්කර
එක්කලද මා පතන පැතුමට
මව්වරුන්ගේ දිනය අද බව
නොදන්නවා ඇති අම්මා

**අමා ජයසිංහ**

## ගස යට නතර වුණු අම්මාගෙන්

පාන්දර පුතා මට කියූ විදියට
බොහෝ දුර ඇවිත් නැග පුතුගෙ රථයට
නතර කර පසුව නගරෙක ගසක් යට
හුස්ම හිරවුණත් පෙන්නුවෙ නෑ පිටට

පුත නුඹ වඩාගෙන මම ඉස්සර දිනෙක
ගමනක මහන්සිය හැර ගන්නට රැයෙක
නැවතුණ මෙතන මේ ගස හොඳ හැටි මතක
මෙතනට මාව ගෙන ඒමම පුදුමයෙක

ඉතින් පුතේ නුඹ බිහිවූ දිනේ සිට
ඇතින්නියකගේ හදකින් ලද පෙමට
ගිහින් එම් කියාවත් නොකිය යන විට
ඇහෙන් ගලා හැලුණා හදවත බිමට

අතේ තියපු රුපියල් දාහ හරි බර
හිතේ සවිය ගෙන ඉම් දෑස් ගුළිකර
රතේ පදිද්දී කලබලයකින් තොර
පුතේ පරිස්සම් වී පලයන් ගෙදර

**මහින්ද ප්‍රසාද් මස්ඉඹුල**

## මවු සෙනෙහස

අම්මා පෙවූ කිරි කඳුලක ඇති අගය
මට නම් දැනෙන්නේ මහමෙරටත් වැඩිය
කළු ගලකට වඩා මව් සෙනෙහස දැඩිය
අම්මා බුදුන් වාගෙයි ගෙන් ගෙට වැඩිය

පොඩි කල පටන් තේරෙන තුරු හයහතර
සෙවණැල්ලක් ලෙසින් පසුපස විය නිතර
එය නියමයක් මෙනි පවතින තුරු සසර
දරුවට කිසි කෙනෙක් ලොව නැත මව විතර

නැළවිලි ගීවලින් පිරවෙයි ගුවන් තලේ
දරුවා නැළවේවි ඇකයේ ගිමන් හලේ
රජමාලිගාවන් තුළ මෙන් දිළිඳු පැලේ
අම්මා තමයි එම ලොව දිග් විජය කළේ

**ආරියසේන බණ්ඩාරනායක**

## අම්මා

නටු අග පිපෙන සුවදැති කුසුමන් දහසක්
අම්මා තරම් නෑ ඒවායේ සුවදක්
අහසේ දිලෙන තරැකැට ගෙන දසදහසක්
අම්මා නමින් හදනෙම් වෙනමම අහසක්

**වත්තහේනේ හිමරතන හිමි**



## මහලු මඩමේ අම්මා

මහගේ දොර ජනෙල් දොරගුලු උගුල්ලා
ආරංචියි වත්ත වල් වැද ගිහිල්ලා
ඉවසන්නට නොහැකි මෙය හද අතුල්ලා
නුඹලා දරුවනේ උත්තර දියල්ලා

දරු පස් දෙනකු දුක කුස තුළ උහුල්ලා
හැදු වැඩු අයුරු සිහිවේ හද වෙවුල්ලා
තනිවම මහලු මඩමක මුළු ගැනිල්ලා
මම අද සිටිමි ඇලුණා මෙන් කොහොල්ලා

සිතු පැතු දෙයම වළ පල්ලට ගිහිල්ලා
තනිවී මහලු මඩමක දුක ඇවිල්ලා
මගෙ දරුවනේ පොඩියක් මෙහි වරෙල්ලා
සැනසෙන්නට ටිකක් උණුහුම දියල්ලා

තනිකම පාලුකම මතුවී ඇවිල්ලා
මගෙ හද ගිනිගොඩක දැවි දැවි අතුල්ලා
අවුරුද්දකට වත් සැරයක් වරෙල්ලා
එක සැරයක් ඉඹින්නට අත දියල්ලා

**පියදාස ගන්දර**

## අපෙ අම්මා

මහගස් යායම අතු ඉති හැලුවා
නවම් මහට බකිනිය වත්තේ
නිල්ගල දොළ පාළුවට ගිහිල්ලා
කොළ නිවාඩු ඇවිදින් වාගේ

සිත් අහසට හිරිපොද වැහි වැහැලා
බලාපොරොත්තුව අතු ලියලා
කිරි කට්ටිය අලුතින් දලු දමලා
වසන්තයක් යළි ඇවිදිල්ලා

හිරුට කලින් මහ කන්දෙන් බැහැලා
නිදි ගත් පිනි කැට ඇහැරවලා
බොරළු ඇනෙන පය රිදවුම් නොතකා
පය ඔසවනවා අපෙ අම්මා

**නන්දි අලුත්ගේ රත්නවීර**

## මව්කගේ ජීවිතයක්

මිල මුදල හිඟ වුවත් දුක සැප බෙදාගෙන
දරුවන් දැඩි කළේ සතුටින් අප දෙදෙන
දැන උගත් වූ ඔවුන් අද ලොව දිනාගෙන
සැප සම්පත් විඳිති අද සිත සන්තොසින

ගත සවිය මඳ වුවත් ඔවුන්ගේ නොදරුවන්
රකින්නෙ අද අපයි වැඩ මුර බෙදාගෙන
මා කැනඩාවෙ දියණිය හට සවිය දෙන
අතරයි ඔහු ලක්බිමේ පුතු හට සුරත දෙන

කෑම සහ බීමද ඉස්තරම් ලෙස ලැබේ
ඒත් ඒ හැම දෙයම එකම සුසුමට දැවේ
සිහිවෙද්දි දයාබර ළබැඳියාණන් මගේ
කෑවාද බීවාද සැපක් ලැබුණද සිතේ

උගතුන් වුවත් අපෙ දරුවන් නොම දන්නා
කරුණක් තිබේ උන් හට පහදා දෙන්න
වයසක වුවත් ඔබෙ මවු සහ පිය දෙදෙන
තවමත් සිතින් තරුණයි අදර හැඟුමින

දරුවන් උස් මහත් වී පියඹන තුරුම
බත්පත නොකෑවෙමු මෙන් වෙන් වී මෙහෙම
එක සයනයේ සැතපී නිදි සුව විඳුම
ගෙන දුන්නා දිවියට අපෙ ළබැඳිකම

උපන් දිනද නැටුමද ගැයුමද ආදී
සාද බොහෝ ඇත ඔවුනට මග පෑදී
දරුවන් සතපවා නින්දට රෑ වෙද්දී
උන් යනවා මා මෙහි තනිවම ඉද්දී

අම්මා නොවෙයි මා දැන් ආයම්ම වෙලා
සිහිවෙයි පෙර ගෙවූ හැටි මවුපියෝ වෙලා
තාත්ත ලක්බිමේ අද හුදකලා වෙලා
යන්නට මට දෙන්න දියණියෙ පියාඹලා

**චිත්‍රා අබේවික්‍රම - දෙල්ගොඩ**

## අම්මා සහ අපි

අකුරු කර දවසක
තුරුලු කර ළයට
කප්පරක පැතුම් පොදි බැඳගෙන
දුරක ගිය අප නැවත එද්දී
අත් නලල බැඳ ගෙන
ඇස් දෙකම සිහින් කර බල බලා
දත් හැලුනු මුව පුරා
සිනහවුණු අම්මා

සිත් පුරා සැනසී
බත් කව කවා වෙව්ලන අතින්
දුක් දරන් ගිය ගමන්
දැන් ඉතින් අහවරයි කියමින්
පිල් කඩේ ඉඳගෙන
ගුත්තිලය කවි පොතේ
කවි කීව අම්මා

හිස් තබා උකුලේ
නොමැති කල සැනසෙන්න මොහොතක්
සමතලා කර දෙවැට ගුරුපාර
මේ කටුක අධිවේග මං දිගේ
හෙට හිතා අද මරා
බර දරා යනෙන අප දෙස බලා
ළයම උනුකර එරුණු දෙතනේ
කිරි මුදු වියලිලා
හිතට කිරි එරී
හඬනවද අම්මා...

**විජය කුමාර හේරත්**


OPEN
7 DAYS
Arun's
Fresh Bakery
Sri Lankan & South Indian Cuisine
Bakery, Catering and Take - out
We do catering for all occasions
Contact - 905 553 3454
9222 KEELE ST W, Unit 7 and 8. Concord. ON. L4K 5A3
Snacks
Side Dish
Lunch
Bakery
Dinner
Drink & Desserts


AirCare Plus
ONE CALL WILL FIX IT ALL
Sales | Service | Repair | Installation
Line: 416.605.8300
Email: ashokdon@live.ca
WISH YOU A HAPPY SINHALA AND TAMIL NEW YEAR
Heating & Air Conditioning
FAST, AFFORDABLE SERVICE
Ashok Hettege
Licensed H.V.A.C Technician
Furnace
Gas Piping
Hot Water Tank
Tankless Water Heater
Humidifier
Air Cleaner
Air Conditioning
Dishwasher & Fridge Water Line Installation
Gas Stove and Gas Dryer Installation
සීත කාලය නිමා විය. තාපන යන්ත්‍රය (Furnace) ලද විවේකයෙන් නිසි ඵල ලබාගන්න. එහි නඩත්තු කටයුතු, අලුත්වැඩියා කටයුතු සහ අලුතින් සවිකිරීමේ කටයුතු සිදුකර ගැනීමට මෙය සුදුසුම කාලයයි.
ග්‍රීෂ්ම ඍතුව සඳහා ඔබ සූදානම්ද?
ඔබගේ වායුසමීකරණ යන්ත්‍රය නිසි ප්‍රමිතියකින් සහ විදුලිබලය පිරිමසා ගන්නා ආකාරයෙන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අලුත්වැඩියා, නඩත්තු කටයුතු මෙන්ම නව වායුසමීකරණ යන්ත්‍ර සවිකර ගැනීම සඳහා විමසන්න.
A MEMBER OF
CanLanka
BUSINESS ASSOCIATION
2004-2014
10
CELEBRATING
10 YEARS IN BUSINESS
SATISFACTION 100% GUARANTEE



















## ටොරොන්ටෝ හෙළ මහා අවුරුදු උළෙල

සිංහල අලුත් අවුරුද්දට සමගාමීව පවත්වන ටොරොන්ටෝ හෙළ මහා අවුරුදු උළෙල අප්‍රේල් 15 වන දින ටොරොන්ටෝහි කොරියන් කල්චරල් ශාලාවේදී ඉතාමත් උත්කර්ශවත් ලෙස පවත්වන්නට යෙදුණි. මේ එහි විශේෂ අවස්ථා කිහිපයක් කැමරා ඇසින්....









GET THE APP
WE'RE GONNA WOW you!
R. Indran
Sales Consultant
416.835.8147
indran.rajanathan@performance.ca
SHOWING NEW AND PRE-OWNED VOLKSWAGEN MODELS
මෝටර් රථයක් මිල දී ගැනීමේදී විශ්වාසවන්ත කාර්යක්ෂම
සේවාවක් සඳහා හමුවන්න ඉන්ද්‍රා
Serving the community for 16 years with your Automotive needs
Don Valley Volkswagen
SATISFACTION 100% GUARANTEE
1695 Eglinton Avenue East, Toronto, ON M4A 1J6 • www.donvalley-vw.ca
GOLF • BEETLE • ALLTRACK • PASSAT • CC • JETTA • TIGUAN • TOUAREG | ATLAS - COMING SOON!


THE BEST FASHIONS...EXCLUSIVELY FROM SRI LANKA...!
FOR STUNNINGLY BEAUTIFUL YOU & FAMILY!
Pls Call 416 432 1532
Rashanthi Hettiarachchi
rashanthi@gmail.com
Dream Weavers
Handlooms
A Surprisingly Beautiful
Fashion Collection for You...
Come and Explore...
Fit On and Select...
Hand Made-
Sri Lanka
100% Pure Cotton
& Pure Silk
artistrybatiks.com
dreamweavershandlooms.com
Artistry Batiks
NEW ARRIVALS EVERY MONTH !


AJITH BERAGAMA LL.B, LL.M
BARRISTER, SOLICITOR AND NOTARY PUBLIC
experienced, quality, knowledgeable and affordable service
AB Ajith Law Office
Real Estate Law
Landlord and Tenent Law
Personal Injury Law
Wills & Estates Law
Immigration Law
Family Law
24/7 Hotline - 647 328 6623
10 MILNER BUSINESS COURT,
3 RD FLOOR SCARBOROUGH M1B 3C6
OFFICE - 647 777 8347
FAX - 647 777 8348
EMAIL - AJITH@AJITHLAWOFFICE.COM


BUY / SELL / LEASE COMMERCIAL & RESIDENTIAL REAL ESTATE
" LIST YOU HOME WITH PROFESSIONALS & SAVE MONEY ! "
For Quick Results CALL NOW !
▪ Excellent Personalized Service ▪ Free Market Evaluation
▪ Best Negotiations
Higher Standards Agents... Higher Results !...
HOMELIFE Higher Standards
Homelife Today Realty Ltd., Brokerage*
Toll Free : 1.888.777.0191
Tel : 416.298.3200
Fax : 416.298.3440
RAJ SINNATHAMBY
SALES REPRESENTATIVE
647.981.7892
E : sinnaraj5@hotmail.com
*Independently Owned and Operated,
* Not intended to solicit clients currently under contact with another brokerage.
KUDDITHAMBY YOGESWARAN
SALES REPRESENTATIVE
416.356.7814
E : yoges797@gmail.com


Why Pay More?
1%
Are You Planning to Sell a Property?
Listing Commission*
BUY or SELL through us and get an amazing chance to
WIN
1 of 10 GREAT PRIZES INCLUDING 2016 HONDA CIVIC
1st Prize
8 TVs
I will guide you through the process in a professional, friendly and accountable manner
Call for more information
Nishantha 416 417 0763
Century 21
Nishantha Donsiyambalapitiyage Sales Representative Email:nishan.don@gmail.com
Innovative Realty Inc. 2250 Markham Road Unit 3 Toronto ON M1B2W4. Office: 416 417 0763

RE/MAX Diamond Realty Inc., Brokerage

Independantly Owned and Operated




IT IS A FANTASTIC TIME TO
INVEST IN REAL ESTATE
LET ME HELP YOU GET STARTED!!

CALL DAN!

ATTANA KUMBURE GEDARA
SALES REPRESENTATIVE
Mobile: (647) 995-3391
Office: (416) 235-2500
danAKG.realtor@gmail.com
www.danakg.ca



RE/MAX Diamond Realty Inc. Brokerage

REALTOR® MLS MULTIPLE LISTING SERVICE®


බියකරුය මේ සසර
ත්‍රිමාන සජීවීකරණ කෙටි සිංහල චිත්‍රපටය
2017 මැයි 22
ටොරොන්ටෝ මහමෙව්නාව භාවනා අසපුවේදී
කරන ලද පාප කර්මයන් අති බිහිසුනු ලෙස විපාක දෙන බියකරු නිරයේ ස්වභාවය ඔබගේ නෙත් ඉදිරියේ විදහා දක්වන 3D සජීවීකරණ තාක්ෂණය ඔස්සේ නිම වූ නවතම රූප පෙළකින් විවෘත මහජන ප්‍රදර්ශනයක් ලෙසින්
ප්‍රදර්ශනය කරන වේලාවන්:
ප.ව. 6.00 - 7.00
ප.ව. 7.00 - 8.00
ප.ව. 8.00 - 9.00
ප.ව. 9.00 - 10.00
ප.ව. 10.00 - 11.00
නොමිලේ ඔබට නැරඹිය හැකිය
අවුරුදු 16 පහල ළමුන් සහ ඉතා සංවේදී අය නැරඹීමෙන් වළකින්න
අවුරුදු 10 වැඩි ළමුන්ට දෙමාපියන්ගේ අනුමතිය ඇතිව නැරඹීමට හැක.
3D
බියකරුය මේ සසර

කෙටි කතාව

# බත් මුල

■ ලක්ෂ්මන් කොඩිතුවක්කු

එය පොලිතින් දවටනයකට බෙදා පත්තර පිටුවකින් ඔතා තිබිණි. සාමාන්‍ය කඩේ විකුණන බත් පාර්සලයටත් වඩා තරමක් ලොකු වූ එය තැලී පොඩිවී තිබුණේ ඔහුගේ කිහිල්ලට තද වීමෙනි. ව්‍යංජන වශයෙන් කුඩා මාළු කෑල්ලක්, මැල්ලුමක්, බැදපු මිරිස් කරල් දෙක තුනක්, පෙඟුණු පපඩමක් හා මේ දිනවල වෙළෙඳ පොලේ අඩු මිලට ඇති එළවළු වර්ග දෙකකින් එය සම්පූර්ණ වී තිබිණි. බිම එලූ පැදුර මත විවර වී වහල දෙස බලා ඉන්නා බත් මුලෙන් නැග එන පිළුණු ගඳ ඔහුගේ නාස් පුටු අතරට කා වැදුණද "ඔය දුගඳ අමතක කර උඹලට ඔය බත්මුල කන්නට බැරිද යකෝ" යැයි කවුරුන් හෝ කියන්නා සේ ඔහුගේ සවන් අතරට කොහේදෝ සිට වැදුණේ ඈත සිට හමා එන උණුසුම් සුළං රැළි අතරිනි.

ඔහු බත්මුල ගෙන බිරිඳගේ අතට දුන්නේ සතුටු සිතිනි. මේ දින කිහිපයේම තරමක් කෝපාග්නව කල්ගෙවූ බිරිඳගේ මුහුණ මන්දිස්මිතියෙන් කල එළි වූ අයුරු ඔහු දුටුවේය. එවේලේම ඇය දරුවන් දෙදෙනා සමඟ බත්මුල ගෙන වාඩිවූයේ කිරි බොන වයසේ දියණිය උකුලේ හොවාගෙනය. දරුවන් බත්මුල ලෙහන අතරේ ඇය හැට්ටයෙන් එළියට ගත් තනපුඩුව කිරි දරුවාගේ මුවට ළංකර එක් අතකින් හිරකරගත්තේ අනෙක් අතින් බත් මිටක් කටේ ඔබා ගැනීමේ බලාපොරොත්තුවෙනි. එහෙත් එක්වරම ආ පිළුණු ගඳින් නහය හකුලුවා ගත් ඇය අනෙක් දරුවන් දෙදෙනාගේ මුහුණු දෙස බලා බත් ගුලි දෙකක් අත රැඳි ඔවුන්ගේ අත්වලට ගසා එය වැළක්වූයේ ඔහුටද ආඩපාලි කියමිනි.

"මදෑ උදේ ඉඳන් බඩ ගින්දරේ ඉඳල බත් ටිකක් කන්න ගියා, තමුසේ කොහෙන්ද ඕයි මේ බත්මුල උස්සන් ආවේ. ගඳේ බෑ. උඹල එහෙම මේ දහජරාව කාල බඩේ අමාරු එහෙම හදාගන් නෑ ඕන්" එසේ කිවූ ඇය දරුවා ලොකු දියණියගේ අතට දී මල්ලක් අරන් මිදුලට බැස්සේ "මං ණයටවත් කොහෙන් හරි කළමනා ටිකක් අරන් එනකං හිටපල්ලා" කියමිනි. බැස යන හිරුගේ කිරණ කදම්බයන් පැල්පත ඇතුළට එබී බලන ආලෝකය තුළින් ඔහුට දරුවන්ගේ රූ පෙනුනේය. නිහඬව දරුවන් දෙස බලා සිටි ඔහු කිරි නැතිව අඬන කුඩා දියණිය නලවා ගන්නට වෙහෙසන ලොකු දියණියගේ නැලවිලි ගීයට කන්දුන්නේය.

ඔන්න බබෝ ඇතින්නියා - ගල් අරණේ සිටින්නියා

ගලින් ගලට පනින්නියා - බබුට බයේ දුවන්නියා

ඔහු එයට සවන් දීගෙනම බත් මුල දෙස නැවත බැලුවේය. බත්මුල එහි තිබූ පත්තර පිටුව විවර වී පෙනෙන පළල් වූ දිගු මුද්‍රිත අකුරු ඔහුගේ නෙතු අසළ නතර වූයේ නිරායාසයෙනි. 'අද අපේ රට සහලින් ස්වයංපෝෂිතයි' එය හිමිහිට මිමිණූ ඔහු කටු මැටි බිත්තියේ හැංගී සිටි හූනෙකුගේ "චුක් චුක්" ගා නැගෙන හඬට කන් දුන්නේ ඊට පහළින් ඇති බොඳවූ කුඩා අකුරුද කියවන්නට උත්සාහ කරමිනි. දැලක් මෙන් ඇස්වල පැටලී ඇති දුර්වල පෙනුම එයට බාධාවක් වූ හෙයින් ඔහු මිදුලට බැස අහස දෙස බැලුවේය. ලොකු දියණියට කුඩා දියණිය නලවා ගැනීමේ වෑයම සාර්ථක වී ඇති අයුරු ඔහුට දැනුණේ ඇඬීම නැවතුනද නැලවිලි ගීය නොනැවතී ගලා යන අයුරු සවණට වැකීමෙනි.

උදේ සිට සවස් වනතුරුම සවණට වැදුණු ඝෝෂාවත්, කටේ කෙළ හිඳෙනතුරු කෑ ගැසූ නිසා සිරුරට දැනෙන පීඩාවත් එම නැලවිලි ගී රස තුළින් මකා ගන්නට උත්සාහ දැරූ ඔහු මිදුලේ ඇති ගල්කණ්ඩිය උඩ වාඩිවී වළාකුළු දෙස බලා උන්නේය. හිමිදිරියේම පොත් විකුණන රැකියාවට යෑමට මිදුලට බසින්නට සූදානම් වූ ඔහුගේ ගමන අහසේ හෙණ හඬ පුපුරමින් ගුගුරා නතර කළේ මහ වැස්සක් බිමට පතිත කරමිනි. කුඩා කල පොත් මිටිය ගෙන පාසල් ගිය ඔහුට නැවත පොත් මිටි තුරුලට ගන්නට සිදුවූයේ අනපේක්ෂිත ලෙස රැකියාව අහිමි වීම නිසාය. පොත් සාප්පුවලට ගොස් ණයට පොත් ගෙන මහපාරේ යන බස්වල නැග විකුණන ඔහු සවසට ගණුදෙනු පියවා ලැබෙන වට්ටම් මුදලින් දරු පවුල ජීවත් කරවන්නට මහන්සි ගත්තේ තමාගේ ජීවිතයට එය ස්ථිර රැකියාවක් බවට පත්කරමිනි. එහෙත් සමහර දිනවල දැඩි හිරු අව්වේ කෙතරම් මහන්සි වුවද ගතමනාවක් සොයාගන්නට බැරි විට ඔහුගේ සිතට දුකක් ගෙන දෙන්නේය. එදිනම ලැබෙන සොච්චම් මුදලින් පාන් ගෙඩියක් හොද්දක් අතේ එල්ලාගෙන ඔහු ඉතිරි මුදල ඇඟිලි තුඩින් ගණින්නේ බස් ගාස්තු පියවා ගැනීමටය. ඉඳහිට වාසියක් වූ දා ඔහු හාල්, පොල් මෙන්ම දරුවන්ට ටොෆි විස්කෝතුද මිල දී ගෙන මධුවිතක් තොල ගෑමටද අමතක කරන්නේ නැත.

"ආ මෙන්න අම්මේ තාත්තේ, නෝනලා මහත්තයලා, අද මගෙන් අලුත්ම පොත් ටිකක්. මෙන්න රටේ ඉතිහාසය.... කාශ්‍යප රජතුමා ගැන අලුත්ම පොතක්, පිට වුණා විතරයි. කාශ්‍යප රජ්ජුරුවො සීගිරිය හැදුවේ, සීගිරිගල උඩට වතුර ගත්තේ මොරටු කැම්පස් ගිහිල්ලද? නැහැ.... එතකොට ගල්වල සිතුවම් ඇන්ද චිත්‍ර ශිල්පියෝ චිත්‍ර ඇන්දේ හේවුඩ් ගිහිල්ලද? නැහැ.... ඉතිහාසෙ ගැන දැනගන්න ඔබේ දරුවාට මල් පහේ පොතක්. මෙන්න තව පොතක්.... ශිෂ්‍යත්ව ජය කණුව... ලොකු ඉස්කෝලවලට පොරකන පොඩි මිනිස්සුන්ගේ ජය කණුව රුපියල් සීයයි. කඩේ දෙසීයයි, තුන්සීයයි කියන පොත් මා ළඟ ලාභයි. හෙට නැහැ අද විතරයි අදම ගෙදර අරන් යන්න....." ඔහු ඔහුටම ආවේනික වූ වචන ගොන්නකින් බසයේ මගීන් අමතයි.

"මෙන්න මහා පරාක්‍රමබාහු රජතුමා ගැන තව පොතක්. රුපියල් එකසිය පනහයි... වැව් දාගැබ් බැඳලා, රට ස්වයංපෝෂිත කරපු රජවරුන්ගේ ඉතිහාසය. මෙන්න ශ්‍රේෂ්ඨ රුසියානු නවකතා මැක්සිම් ගෝර්කි මහත්තයගේ මිනිසෙකුගේ උපත, විපතද උතුම් උපතද උතුම්. මෙන්න මහල්ලාද දිනන්නේ මාළුවාද දිනන්නේ. ලෝක ප්‍රකට පොතක් හොමිංවේගේ මහල්ලා සහ මුහුද, ලෝක සාහිත්‍යය සිංහලෙන්. මා ළඟ විතරයි. මෙන්න තව එකක් උදේ ඉඳන් රෑ වෙනකං සුපර් ස්ටාර්ල වෙන්න දඟලන අපේ දරුවන්ට සිංහලේ රබන් පද" ඔහු රබන් පද දෙක තුනක් ගයා අල්ලේ තබාගෙන තව පොතක් පෙන්වයි.

"නාවර පෙරන හොටු - ඇඳ නෙක වැරහැලි කිළුටු

කැහැටු දරුවන් සිටිත් - මුඩුක්කුවේ දොරකඩට විත්"

ඔහු ප්‍රබුද්ධ පොත පෙරළා ඇස ගැටුණු පිටුවක නිසදැස් කණ්ඩයක් කියවයි. සමහරෙක් අප්‍රියාවෙන් මෙන් ඔහු දෙස බලා මුහුණු හකුළුවා ගන්නේ බසයේ වීදුරු කවුළුවෙන් පාර දිහා බලමිනි. ඔහුට එහි වගක් නැත. "මහගම සේකර මහත්තයගේ අදටත් ගැලපෙන පොතක්. ලාභයි දරුවන්ට ගිහිල්ල දෙන්න"

එම බසයෙන් බැස තව බසයකට ගොඩවෙන ඔහු නැවත පොත්වල වරුණාව පටන් ගන්නේ ලොකු හුස්මක් ගනිමිනි. කිසි දිනෙක පොත් සම්පූර්ණයෙන් නොකියවන ඔහු ඒවායේ තැන් තැන්වලින් අහුලාගත කෑලිවලින් මිල දී ගන්නන්ගේ ආකර්ශණය ලබාගැනීමට උත්සාහ ගන්නේ හැකි පමණින් පොත් විකුණා ගැනීමටය.

එහෙත් වැස්ස හරස් වීමෙන් අද දින සිදුවූ අලකලංචිය පිළිබඳ ඔහු කම්පාවට පත්වී ඇත්තේය. වැහි වළාකුළුවලින් ගැබ්බර වූ අහස තම කුස සැහැල්ලු කළද, තමාගේ හිසට පාත් වූ බර පිළිබඳව ඔහු නැවත නැවත මෙනෙහි කළේය. අත් හකුළුවාගෙන අහස දෙස බලා ඔහු හීල්ලුවේ වැස්ස ඉක්මණින් නතර වේවායි යන අදහසිනි. එහෙත් නොනැවතුණු වැස්සේම මඟට බසින්නට සිතුණේ කෙසේ හෝ පොත් ටිකක් විකුණා අද දවසටවත් කීයක් හෝ හරිහම්බ කර ගැනීමේ අදහසිනි.

"අද කොහොමද විල්සන් පොත් විකුණන්නේ? බලනවකෝ අනෝරා වැස්ස. පොත් තෙමුණාම ඒවට තමුසෙට ගෙවන්න පුළුවන්ද? අනෙක මේ වැස්සෙ මිනිස්සුන්ට මොන පොත්ද?"

"ඒක තමයි මහත්තයෝ මමත් මේ කල්පනා කළේ. අද කොහොමහරි ගතමනාවක් හොයාගන්න ඕනෙ නිසයි ආවේ. කමක් නැහැ. මං යන්නං හෙට වැස්ස පෑව්වොත් එන්නංකෝ".

නිහඬව තමා දෙස බලා සිටිනා පොත් සාප්පු අයිතිකරුට එසේ පැවසූ ඔහු අතේ ඇති ඉටිරෙද්දෙන් ඔලුව වසාගෙන නැවත වැස්සේම එළියට බැස්සේය. අරමුණක් නොමැති ඔහුගේ චංචල සිත ඔහුව බස් නැවතුමක නතර කළේය. යාන්තම් තුරල් වී ගෙන එන වැස්ස දෙස බලමින් ඔහු සුසුමක් පිට කළේය. ඒ සමඟම ඈතින් ඇදී එන ජන ගඟත් මහා ඝෝෂාවත් ඔහුගේ අසරණ සිත පුදුමයට පත් කළේය.

"කාගෙද මේ බලවේගේ අපෙ මැතිඳුගේ බලවේගේ"

"අපි මැතිඳුට - මැතිඳු අපිට - අපේ මැතිඳුට ජය වේවා"

ඔහු එම පෙළපාළිය පිටුපසින් ගමන් කළේ නැත. එම අරමුණක් නැති සිතම ඔහුව ඒ පසුපස ගමන් කෙරෙව්වේය. පෙළපාලියේ ගමන් කරන ගැහැණු පිරිමි මිනිස් රූප අතරින් ඔහු දුටුවේ ඉදිරියේම ගමන් කරන සුදු ඇඳගත් පාංශු දේහධාරී තලතුනා මිනිසෙකි. කිසිවක් නොකියවන ව්‍යාජ සිනාවක් මවාගෙන දෙපසට අත වනන ඔහු මේ ජනයා ඉදිරියේ දෙවියෙක් බවට පත්වී ඇත්තේ ඔහුටත් අදහාගත නොහැකි අයුරිනි. ඔහු ප්‍රබුද්ධ කවි පොතේ කවි පංතිය සිහියට නගා ගැන්මට උත්සාහ කළේය. ඇට පෑදුණු, නාවර පෙරා නොගත්තද ඉහෙන් කණින් දාඩිය පෙරාගත්, වැරහිලි නොඇන්ඳද සිතුම් පැතුම් වැරහැලි කරගත් ජනයා ඔහු පිටුපස ගමන් කරන්නේ දහසක් බලාපොරොත්තු පොදි බඳිමින් බව ඔහු පසක් කරගත්තේය. එහෙත් ඔහුට නැවත හැරෙන්නට නොහැක. ඔහු පිටුපසින් තවත් ජනයා ඒ පෙළපාලියට එකතුවන්නේ ජන ඝෝෂාව නැවත නැවත පුනුරුච්චාරණය කරමිනි. ඔහු ඉදිරියට යන්නේ නැවත පෙළපාලියේ පිටුපස බලමිනි.

"මොකද ඕයි ගල් බිල්ල වගේ කටවහගෙන යන්නේ. කෑගහනවා. කෑ ගැහැව්වට පාඩු වෙන්නෙ නැහැ"

කඩින් කඩ හැලෙන මඳ වැස්ස නොසළකා තෙත බරිත වූ මිනිසුන් අතරින් මතුවූ ගැහැණියක් තමා අසළට කෑගසමින් කඩා පාත් වූයේ ඔහුව බිරාන්ත කරමිනි.

බසයේදී පොත් විකුණන විට පිටවෙන හඬ ඔහුගෙන් පිට නොවූයේය.

"හයියෙන් කෑගහල කියනව ඕයි. පක්ෂයක් පාටක් මොකටද බත් මුලකටයි රුපියල් දෙසීයකයි" ඔහු නැවත හයියෙන් කෑ ගැසුවේය. ගැහැණියගේ කටහඬ ඔහුගේ හඬ අභිබවා ගියේය.

"තියෙන පිටි ටිකෙන් තමයි යක්කුනේ මං ඔය රොටි දෙක තුන හැදුවේ. කන්නම දෙයක් නැත්නං මාව මරාගෙන කාහල්ල... මේකි පපුවේ එල්ලිලා කිරි හොයනවා. උඹලට මදිවෙල දඟලනවා. සොහොන් පළේ ඇට තමයි කන්න තියෙන්නේ".

අද උදයේ තමන්ගේ මූණ නොබලා බිරිඳ දෙසූ ආඩපාලි වදන් එම ගැහැණියගේ හඬ ඡේදනය වී ඔහුට ඇසෙන්නට විය.

"බස් නැති පාරට බස් දුන් පියාට ජයවේවා" ඔහු නැවත කෑගසුවේය. තමන්ගේ ජීවිතය පිළිබඳව ඔහුට මහත් කළකිරීමක් දැනෙන්නට විය. රැකියාව අහිමි වී පාරට වැටුනු අතීතයට ගිය ඔහුගේ හිතට එදිනටත් වඩා දැනුණු කළකිරීමෙන් ඔහුගේ දෑසට කඳුලක් මතු වූයේය. කිසිම දිනෙක දේශපාලකයකු පිටුපස නොගිය ඔහුගේ පා යුග පෙළපාලිය සමඟ ඉදිරියට ඇදුණේ ඔහුටත් නොකියාමය. ලයිට් කණුවක වසා සිටි කපුටෙක් "කාක් කාක් කාක්" කියා පියඹා යන හැටි ඔහු බලා සිටියේය තොරතෝංචියක් නැතිව කෑගසන මිනිසුන්ගේ හඬට බියවී ඉගිලී යන කපුටා දෙස බලා සිටි ඔහු නැවත කෑගසන්නට පටන් ගත්තේය.

පෙළපාළිය හමාර වී පෝලිමේ වරුවක් සිට ලබාගත් බත් මුල ඔහු කිහිල්ලට තද කරගත්තේය. ඇසිපිය නොහෙළා බත්මුල් බෙදන මිනිසා දෙස ඔහුද ඇසිපිය නොහෙළා බලා සිටියේය.

"මොකද, ඕයි බලන් ඉන්නෙ... එක බත් මුලයි එක් කෙනෙකුට" ගොත ගසමින් යමක් කීමට වෙහෙසුණු ඔහුට පෙර මිනිසා ඉක්මන් වූයේය.

"රුපියල් දෙසීයද... ඒක දෙන්න විදිහක් නැහැ. සල්ලි දෙන්න හිටිය මුදලාලිට අනෙක් පැත්තෙ එවුන් වෙඩි තියලා.... මන්ත්‍රීතුමා කිව්වා ඊළඟ පෙළපාළියේදී දෙන්නං කියලා".

ඔහු සෙනඟ අතරින් තෙරපී පාරට බැස්සේය. පොතකත්, කෑම වේලකත් රසය ඔහුගේ සිතේ අහුමුලුවල හැංගී ඔච්චම් කරන්නට විය.

"බඩගින්නෙ ඉන්න මිනිහට මොන පොත්ද ඕයි. පොත් කියවන්නත් බඩ පිරෙන්න එපායැ" දිනක බසයේදී පොත් විකුණන විට ඇඟට ගොඩවුණු බීමත් මගියාගේ වදන් ඔහුගේ සිත පිළිසකර කිරීමට වෙහෙස ගත්තේය. කිසිදිනෙක බසයක හොරෙන් ගමන් නොකළ ඔහු සෙනඟ අතරට සිරවී හොරෙන් යන්නට අණ ලැබුණු සිතට සාප කළේය. ක්‍රම ක්‍රමයෙන් වෙනස්වෙන මනසෙන් සිතට දුන් වේදනාව සමඟින් ඔහු ගෙදර දෙස හැරී පැදුර උඩ මත සැතපී සිටිනා බත් මුල දෙස නැවත බැලුවේය. කොහෙන්දෝ සිට ආ බළල් තඩියෙක් එහි රස බලයි. කැහැටු ගැහුණු බළල් තඩියා රස කරමින් කන බත් මුල දුටු ඔහුගේ සිතට කෝපයක් උපන්නේ නිතැතිවමය. කුසගින්නත් සමඟ නැඟි කෝපය සමඟ ඔහු බළල් තඩියා දෙසට පැන්නේය.

"කොච්චර අමාරුවෙන්ද යකෝ මං ඔය බත් මුල අරගත්තේ" ඔහුට හිතට ආ ආවේගය සම්පූර්ණ කරන්නට ලැබුනේ නැත. පය පැකිලී බිම වැටුණේය.

# අප තුළ හෝ පොළෝ තලයෙහි සදාකාලික කිසිවක් වේද?



වඩාත් සැලැකිලිමත්ව සාරියක් හැඳ දෑතෙහි වළලු කිහිපයක්ද පැලැඳ සිටි ඇය කියා සිටියේ තමා හතළිස් පස් හැවිරිදි වියෙහි පසු වන බවත් ඇය සමඟ සිටින මහලු පුද්ගලයා ඇගේ මාමණ්ඩිය බවත්ය. අපි සියල්ලෝම බිම වාඩි වී සිටියෙමු.

අප ඉදිරි පසින් දිස් වූයේ විශාල උද්‍යානයකි. එහි නුග රුකක්, අඹ ගස් කිහිපයක්, පියකරු බෝගන්විලියා මල් පඳුරු හා හැදීගෙන එන තාල වර්ගයේ ගස්ද විය. ඈ මහත් දුකට පත්ව සිටියාය. දෙඅත් සැලෙමින් තිබිණ. ඇය උත්සාහ කරමින් සිටියේ හැඬුම් බරව එකවර කඩා හැලෙන සිය කතාවද, ඇතැම් විට කඳුළුද වළකා ගනු පිණිසය. ඇගේ මාමණ්ඩිය මෙසේ කියයි. “මගේ මේ ලේලිය ගැන ඔබතුමා සමඟ ටිකක් කතාබහ කර ගන්නයි අපි ආවෙ. අවුරුදු තුන හතරකට පෙර ඇගේ සැමියාත්, ඊට පසු පුතාත් මිය ගියා. දැන් ඇයට ඇගේ ඇඬිල්ල නතර කර ගන්න බැරුවයි ඉන්නෙ. ඇඟපතත් හොඳටම දිරාපත් වෙලා. අපිට නම් තේරෙන්නේ නැහැ මොනව කරන්නද කියල. අපට පුරුදු වෛද්‍යවරුන්ගේ උපදෙස්වලිනුත් පලක් වී ඇති බවක් පෙනෙන්නට නැහැ. ඒ හැර ඇගේ අනෙක් දරුවන් සමග ඇති ආශ්‍රයත් දැන් අඩු වීගෙන යන බවකුයි පෙනී යන්නෙ. දවසින් දවස ඇඟත් කෙට්ටු වෙනවා. අපි දන්නෙ නැහැ මේක කොහෙන් කෙළවර වෙයිද කියල. ඈ අපට බල කරලම කියා හිටියෙ ඔබතුමා හමුවිය යුතු බවයි”

“මගේ සැමියා නැතිවුණේ අවුරුදු හතරකට පෙර. ඔහු වෛද්‍යවරයෙක්. මැරුණෙ පිළිකාවකින්. ඇතැම් විට ඔහු එය මගෙන් වසන් කර ගෙන සිටින්න ඇති. මා එය හරියටම දැනගත්තෙ පහුගිය අවුරුද්දෙ හෝ ඊට ආසන්න වකවානුවකයි. වෛද්‍යවරුන් ඔහුට වේදනා නාශක හා වෙනත් සහනදායක බෙහෙත් හේත් දුන් නමුත් හිටියෙ හරිම වේදනාවෙන්. ඔහු දුබල වී මගේ දෑස් ඉදිරිපිටම මිය ගියා”

ගලා එන කඳුළු බිඳු නවතා ගැනීමට මෙන් ඇය කතාව නතර කළාය. අත්තක් උඩ හිඳ ගෙන සිටින පරෙවියන් නාද කරයි. මුදු මොළොක් වූ උගේ සිහින් හඬ නෑසෙන තරම්ය. දුඹුරු මුසු අළු පැහැයක් ඇති ඇඟපත තරමක් විශාල වුවද උගේ හිස කුඩාය. ටික වේලාවකට පසු උඟ ඉගිළ ගියෙන් අත්ත ඉහළටත් පහළටත් පැද්දෙමින් තිබිණ.

“ඔහු නැතිව මේ තනිකමත්, අර්ථයක් නැති මේ ජීවිතයත් මට කොහොමවත් දරාගන්න බැහැ.මගේ දරුවන්ට මම ආදරෙයි. මට ළමයි තුන් දෙනෙක් හිටියා. එක්කෙනෙක් පිරිමි. අනෙක් දෙන්නා ගැහැනු ළමයි. ගිය අවුරුද්දෙ දවසක පිරිමි ළමයා එයාට අසනීප බව දන්වල ලිපියක් එවා තිබුණා. දවස් කිහිපයකට පසුව ප්‍රධාන ගුරුතුමා දුරකථනයෙන් මා අමතා කියා සිටියේ ඔහු මිය ගිය බවයි”

මෙහිදී වාවාගත නුහුණු ඈ ඉකිබිඳිමින් හඬන්නට වූවාය. ටික වේලාවකට පසු ඇය පුතාගෙන් ලද ලිපියක් ඉදිරිපත් කළ අතර, එහි කියා තිබුණේ තමාට අසනීප බැවින් ගෙදර එන්නට වුවමනා බවත්, ඇය සනීපයෙන් ඇතැයි ඔහු සිතන බවත්ය. ඇය වඩාත් විස්තර ඇතිව කියා සිටියේ ඔහු ඇයගේ දුක සැප සොයා බලමින් තමා ගැන බෙහෙවින් සැලැකිලිමත්ව සිටි බවය. ඇය සමග ගෙදර රැඳී සිටීමට මිස පාසල් යෑමට ඔහුට වුවමනාවක් නොතිබුණු බවය.

තමාගේ වියෝ දුක ඔහුටත් බල පෑ හැකි යැයි බියපත්ව කිසියම් ප්‍රමාණයකින් පාසල් යනු පිණිස ඔහුට බල කොට ඇත්තේද ඇයයි. එහෙත් දැන් ඒ ගැන කළ හැකි දෙයක් නැත. ගැහැනු ළමයි දෙදෙනද තවමත් බාල වියෙහි පසු වන බැවින් මේ සිදු වූ දේවල් ගැන ඔවුන්ට හරිහමන් අවබෝධයක්ද නැත.

ඇය එකවරම මහ හඬින් හඬා වැටුණාය. “මට තේරෙන්නෙ නැහැ මොනව කරන්නද කියල. මේ මරණය නිසා මගේ ජීවිතයේ මූලික අත්තිවාරම් සියල්ලම දෙදරා ගිහිල්ලයි තියෙන්නෙ. නිවහනක් මෙන් ශක්තිමත් පදනමක් විදියට සැලකුණු දෙයක් මතයි අපි විවාහ ජීවිතය ගොඩනඟා ගෙන තිබුණෙ. දැන් ඒ හැම දෙයක්ම කඩා බිඳ වැටිල තියෙන්නෙ මේ මහා විපැත්තිය නිසයි”

ඇගේ මාමණ්ඩිය ආගමික විශ්වාසයෙහි හා සම්ප්‍රදායයෙහි එල්බ ගත් පුද්ගලයකු විය යුතුය. එහෙයින් ඇගේ කතාවට ඔහු මෙසේ එකතු වෙයි. “මේ ඇය මතට පාත් වූ දේව සාපයක්. වුවමනා කරන හැම පුද පූජාවක්ම ඇය කරලයි තියෙන්නෙ. එයිනුත් කිසිම පලක් වී නැහැ. මම පුනරුප්පත්තිය විශ්වාස කරන කෙනෙක්. නමුත් ඇය එහෙම හිතාගෙනවත් හිතට සහනයක් ඇති කර ගන්නෙ නැහැ. අඩුගානෙ ඒ ගැන කතා කරන්නවත් ඇයට වුවමනාවක් නැහැ. ඒ සියල්ල කිසිම තේරුමක් නැති දේවල් කියලයි ඇය කියන්නෙ. ඉතින් ඒ නිසා ඇයට කිසියම් සහනයක් දෙන්න පුළුවන්කමක් අපට නැහැ”

අපි ටික වේලාවක් නිහඬ ව සිටියෙමු. මේ වන විට ඇගේ ලේන්සුව තෙතබරි වී තිබිණ. එහෙයින් ලාච්චුවෙන් ඇද ගත් පිරිසිදු ලේන්සුවක් තවමත් දෙකොපුලින් වැගිරෙන කඳුළු බිඳු පිස හරිනු පිණිස ඇයට පිහිට විය. රතු පැහැති බෝගන්විලියා මල් පොකුරක් කවුළුව තුළින් එබිකම් කරයි. දකුණු දෙසින් විහිදෙන දීප්තිමත් හිරු එළිය එහි හැම පත්‍රයකම පතිතව තිබිණ.

ඔබට වුවමනා කරන්නෙ මේ ගැන වඩාත් ගැඹුරෙන් යුතුව කතාබහ කරන්නද? නැතහොත් කිසියම් විස්තර කිරීමකින් හෝ තර්කානුකූල මතවාදයක් ගෙන හැර පෑමකින් හෝ හිතට යම් සහනයක් ලබා ගන්නද? එහෙමත් නැති නම් තෘප්තියක් ගෙන දෙන කුමන හෝ වචන ස්වල්පයකින් ඔබේ දුක වෙනතකට යොමු කරවා ගන්නද?

“මා කැමතියි මේ ගැන ගැඹුරෙන් සාකච්ඡා කරන්න. එහෙත් ඔබ කියන්ට යන කරුණුවලට මුහුණ දීමේ හැකියාවක් හෝ ශක්තියක් මට තිබේදැයි මා දන්නේ නැහැ. මගේ සැමියා ජීවත්ව සිටියදී නම් ඔබේ ඇතැම් දේශනවලට පැමිණීමේ පුරුද්දක් අපට තිබුණා. එසේ වුවත් දැන් සමහර විට ඔබ කියන කරුණු තේරුම් ගැනීමට මට වඩාත් දුෂ්කර විය හැකියි”

“ඔබ දුකට පත්ව සිටින්නේ ඇයි? ඒ ගැන විස්තරයක් කිරීම සුදුසු නැහැ. එසේ කළ හොත් එය ඔබේ හැඟීම් ඇසුරෙන් කැරෙන නිර්මාණයක් වන හෙයිනි. එබැවින් ප්‍රශ්නයක් අසන විට එයට පිළිතුරු ඉදිරිපත් කිරීම නොමැනවි. හුදෙක් සවන් දෙන්න. ඔබම තේරුම් ගන්න. මරණය ගැන මෙලෙස දුකක් ඇති වන්නේ ඇයි? රටේ බලවත්ම ප්‍රභූ පුද්ගලයාගේ සිට අන්තිම හිඟන්නා දක්වා, දුප්පත් - පොහොසත් හැම ගෙදරකම දකින්නට ලැබෙන මේ දුකට හේතුව කුමක්ද? ඔබ දුකින් සිටින්නේ ඇයි? ඒ දුක ඇති වී තිබෙන්නේ ඔබේ සැමියා වෙනුවෙන්ද? එසේ නැතහොත් ඔබ වෙනුවෙන්ද? ඉදින් ඔබ හඬන්නේ ඔහු වෙනුවෙන් නම්, ඔබේ කඳුළින් ඔහුට පිහිටක් විය හැකිද? ඔහු මිය ගොස් ඇත්තේ එය අවලංගු කළ නොහැකි ලෙසය. ඔබ කුමක් කළද ඔබට කවදාවත් ඔහු ආපසු ගෙන්වා ගත නොහැකියි. කඳුළු වැගිරැවීමෙන් හෝ ඇදහිලි, විශ්වාසවල එල්බ ගැනීමෙන් හෝ පුද පූජා පැවැත්වීමෙන් හෝ දෙවිවරුන්ට කන්නලව් කිරීමෙන් හෝ ඔහුට නැවතත් පණ දීමට පුළුවන්කමක් ඔබට නැහැ. ඒ වනාහි ඔබ විසින් පිළිගත යුතුව ඇති යථාර්ථයකි. ඒ ගැන ඔබට කිසිවක්ම කළ නොහැකියි. එහෙත් ඔබ හඬා වැටෙන්නේ ඔහු වෙනුවෙන් නම් ඒ ඔබේ තනිකම, ඔබේ ජීවිතයේ හිස් බව, ඔබ ලද ඉන්ද්‍රියාස්වාදය හා සහවාසය නිසයි. එසේ නම් ඔබ හඬා වැටෙන්නේ ඔබේම හිස් බව නිසා නොවේද? ඔබේ කලකිරීම නිසා නොවේද? ඇතැම් විට ඔබ මේ පළමුවරට ඔබේ අභ්‍යන්තරයෙහි පවතින අසරණකම ගැන දැනුම් තේරුම් ඇතිව සිටිනවා විය හැකියි. ඉදින් ඔබ වෙත කාරුණිකව පෙන්වා දෙනු පිණිස අපට අවසර ඇති නම්, ඒ ගැන මෙසේද කිය හැකියි. එනම් ඔබ, ඔබේ සැමියා වෙත ලාභාපේක්ෂාවෙන් ආයෝජනයක් කොට ඇති අතර එයින් ඔබට සැප පහසුව, තෘප්තිය හා ආස්වාදය ලැබී තිබෙනවා නො වේද? පාඩුවක් සිදුවී ඇතැයි යන හැඟීමත්, තනිකම හා කාන්සිය නිසා ඇති වූ සිත් වේදනාවත් යනුවෙන් දැන් ඔබට දැනෙන මේ සියල්ලම ඔබේ කලකිරීමෙහි එක්තරා විලාසයක් නොවේද? කරුණාකර ඒ දෙස බලන්න. ඊට එරෙහිව ඔබේ හදවත දැඩි කොට නොගන්න. ඒ අතරම ‘මා මගේ සැමියාට ආදරෙයි. මා ගැන අල්පමාත්‍රයක්වත් මම සිතුවේ නැහැ. මා හැම විටම ඔහු මගේ අණසක යටතේ තබාගෙන සිටිය නමුදු, මට වුවමනා කළේ ඔහු ආරක්ෂා කර ගන්නයි. ඒ හැර ඒ හැම දෙයක්ම ඔහුගෙ ’ම හිතසුව පිණිස මිස කිසි විටෙකත් මා ගැන සිතා ගෙන නොවේ’ යයි නොකියන්න. දැන් ඔහු මිය ගොස් ඇති බවත්, ඔබේ යථාර්ථයත් ඔබ තේරුම් ගනිමින් සිටියි. ඔබට පෙන්වා දී තිබෙන්නේ ඔහුගේ මරණයෙන් කම්පිත වූ ඔබේ සිතෙහි ඇති සැටියයි. ඔබ ඇතැම් විට ඒ දෙස බලන්නට අකමැති විය හැකියි. බිය පත්ව එය ප්‍රතික්ෂේප කළ හැකියි. එසේ වුවත් තව ටිකක් හොඳින් පරීක්ෂාකර බැලුවහොත්, ඔබ හඬන්නේ කලකිරීම නිසා හටගත් ඔබේම තනිකම හා අසරණකම නිසා බව ඔබට වැටහෙනු ඇත.

“ඔබ නම් හරිම නපුරුයිනෙ?” ඈ කියයි. “මා ඔබ හමුවට ආවේ හැබෑ සහනයක් බලාපොරොත්තුවෙනුයි. ඉතින් ඔබ මේ මොනවද මට කියන්නෙ?”

“බොහෝ දෙනකුට තිබෙන මුළාවක් තමයි එය. එනම් වෙනත් කෙනකු ඔබ වෙත ලබා දෙන හෝ ඔබට ම ඇති කර ගත හැකි හෝ සිතේ සහනයක් බඳු දෙයක් ඇතැයි කියන මුළාව. කියන්න කනගාටුයි, මට නම් හිතෙන්නෙ එහෙම දෙයක් නැහැ කියලයි. ඉදින් ඔබ සහනයක් සොයා යන්නේ නම් ඔබේ ජීවිතය රැවටිල්ලක හසු වෙලයි තියෙන්නෙ. එසේම රැවටිල්ල බිඳී ගිය විට ඔබ දුකට පත්වන්නේ සහනය ඔබෙන් බැහැර කොට ඇති නිසයි. එලෙස දුක තේරුම් ගැනීමට හෝ එය අතික්‍රමණය කිරීමට හෝ කෙනකු තම අභ්‍යන්තරයෙහි ඇත්ත වශයෙන්ම සිදුවනුයේ කුමක්දැයි දැකගත යුතුයි. එසේම එය සැඟවිය යුතුද නැත. ඉදින් මේ සියල්ල පෙන්වා දීම නපුරු දෙයක් නොවේ. එසේ නොවේද? එය මඟ හැරවිය යුතු අශෝභන දෙයක්ද නො වේ. ජීවිතයේ නොයෙකුත් සිදුවීම්වලින් කම්පා නොවී, සුළු හෝ සිත් පැරීමකින්ද තොරව, පිවිතුරු නවතාවෙන්ම යුතුව වහාම ඔබ තේරුම් ගන්නේ මේ සියල්ල වඩාත් පැහැදිලිව දැක ගන්නා විටයි. මරණය වූ කලී අප හැම කෙනෙකුටම උරුම වූවක්. කෙනකුට එයින් ගැලවිය නොහැකියි. අප නොයෙකුත් අටුවා, ටීකා සෙවීමේ උත්සාහයක නිරතව සිටින්නේද, විවිධ විශ්වාසවල එල්බ ගෙන සිටින්නේද එය අතික්‍රමණය කිරීමේ අපේක්ෂාවෙනුයි. එහෙත් ඔබ කුමක් කළත් එය හැම විටම පවතින දෙයක්. හෙට හෝ තව ටික වේලාවකින් හෝ අවුරුදු ගණනාවකට පසුව හෝ එය එසේමයි. ජීවිතයෙහි මේ අතිශයින්ම වැදගත් වූ යථාර්ථය හා සබඳතාවක් ඇති කර ගත යුතුව තිබෙන්නෙ ඒ නිසයි”

“එහෙත්” කියමින් කතාබහට එක්වන ඇගේ මාමණ්ඩිය අවිච්ඡින්න වූ ආත්මයක් හා තිර පැවැත්මක් පිළිබඳ සාම්ප්‍රදායික විශ්වාසය ඇදබාන්නට පටන් ගනියි. ඔහු දැන් සිටිනුයේ, විදග්ධ තර්කනයෙන් හා උපුටා දැක්වීමෙන් යුතුව සාර්ථකව පිය මං කැරුණු සිය පදනම මතුයෙහිය. එකවරම කය සෘජු කොට හිඳ ගත් ඔහුගේ දෙනෙතෙහි පිළිබිඹු වූයේ, මහා සංග්‍රාමයක ඇවිළ ගැනීම් හා වාග්

48 වන පිටුව බලන්න

# WANT TO BE A DOCTOR?

*THEN CONSIDER*

## ALL SAINTS UNIVERSITY
SCHOOL OF MEDICINE

**416-839-6461**




LAST 2 YEARS **(CLINICAL ROTATIONS)** OF EDUCATION COMPLETED AT TEACHING HOSPITALS IN **USA & CANADA**

2 CAMPUSES TO CHOOSE: **DOMINICA ST. VINCENT**

PROVISIONAL ADMISSION WITH MIDTERM MARKS









NOW **ENTER DIRECTLY FROM HIGH SCHOOL TO MEDICAL SCHOOL**



**STUDY MEDICINE AT ALL SAINTS UNIVERSITY**

**CALL TO REGISTER: 1-866-602-9555 or 416-743-9222**

**For our 10th Anniversary in operation, All Saints University will offer 50% tuition fee scholarship plus an additional 25% interest free loan, which is payable at the end of the program. MCAT preparatory classes in Toronto will be of one year duration only (three semesters)**

## Saliroo Creations

All Your Publishing Needs
under one roof

### Graphics
Illustrations, Logos,
Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

### Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

### Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**
**Tel : 416 201 0628**

## French Tutoring

Individual and small group classes for French learners'French reading, writing, and conversing'Any grade from grade 1-12, university minors and French Immersion

**Kumudu Abeywardena,** B.A
(Modern Languages), Dip (AFC)
**T.P - 647 824 1897**

## MARRIAGE PROPOSALS

Respectable parents from Colombo Sri Lanka seeks a partner for their son. Born in 1989. Fair complexion. 5' 11" tall. He is working in a reputed Bank. Please send your replies with family details.

**Contact : athula.ca@yahoo.com or 647 640 9202**

# පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා

## ගුරුන්නාන්සේට වූ ඇබැද්දිය

එක්දහස් නවසිය හැටේ වර්ෂයේ වයඹ පළාතේ බිංගිරිය ප්‍රදේශයේ කනිටු පාසකට ස්ථාන මාරුවක් ලැබ ආ ඒකනායක ගුරුන්නාන්සේ පෙනුමෙන් හැඩි දැඩි සැරපරුෂ රෞද්‍ර පෙනුමකින් යුත් ගුරුවරයෙක් විය. පාසලේ වැඩ භාරගත් මුල් දිනයේදීම ඔහුට මුල් ගුරුන්නාන්සේ පැවරුවේ පහළ බාලාංශ පන්තියේ ඉගැන්වීම් කටයුතුය. කී දේ නොඅසන දඩබ්බර කුඩා දරුවන් සිටි මෙම පන්තියේ එම දඩබ්බර ළමුන් මෙල්ල කිරීම සඳහා ඔහු ළමුනට පෙන්වූයේ තිබුණාටත් වඩා දැඩි තද පරුෂ රෞද්‍ර මුහුණකි. පංතියේ ඉගෙන ගැනීමේ කටයුතු නිසියාකාරව නොකරන එම කුඩා ළමුනට නිතරම දඬුවම් කළ ඔහුට ළමුන් තුළ වූයේ දැඩි බියකි. මේ නිසා මෙම ළමෝ අතර ඔහුට නමක් පටබැඳින.

ඈත සිටම පංතියට එන ගුරුතුමා යන්තම් හෝ දකින ළමෝ "යකා එනවෝ.... යකා එනවෝ...." යයි මහ හඬින් කෑ ගසන්නට පටන් ගන්නේ සියලුම ළමෝ එක හඬින්ය. ඒකනායක ගුරුන්නාන්සේ උදෑසන පාසලට එනවිටත් ඉන් පසු පංතියට එනවිටත් කෙරෙන ළමුන්ගේ මෙම කෑගැසීම කොතෙක් තරවටු කළද නතර කිරීමට ඔහුටවත් වෙනත් ගුරුවරයකුට තබා මුල් ගුරුන්නාන්සේටත් නුපුළුවන් විය.

මෙම මහා ගාලගෝට්ටිය මැද පංතියට එන ඒකනායක ගුරුන්නාන්සේට පාසල අවසන් වනතුරු කැසිකිළියටවත් යාමට නොහැකිව පංතියේම රැඳී සිටීමට සිදුවූයේ හදිස්සියකටවත් පංතියෙන් පිටව ගොස් නැවත පංතියට එනවිට ළමුන්ගෙන් නැගෙන එම මහා ඝෝෂාව නතර කර ගැනීමට නොහැකි වන බැවිනි.

ළමුන්ගෙන් නැගෙන එම මහා ඝෝෂාව නිසා අවට පංතිවල ඉගැන්වීම් කටයුතුද නතර කිරීමට සිදුවන අතර මේ නිසා ඒකනායක ගුරුන්නාන්සේට පාසලේ අනෙකුත් සිසුන්ගේද ගුරුවර ගුරුවරියන්ගේද සමච්චලයට ලක්වීමට සිදුවිය.

මෙම අවඥා සහගත හිරිහැරය විඳ දරා ගැනීමට නොහැකි වූ ඒකනායක ගුරුන්නාන්සේ අවසානයේ තීරණයක් ගනිමින් ස්ථාන මාරුවක් ඉල්ලා වෙනත් පාසලකට මාරුවීමක් ලබාගෙන ගියේ වෙනත් කළ යුතු දෙයක් නොමැති තැනය. ස්ථාන මාරුවක් ලැබ යන ඒකනායක ගුරුන්නාන්සේ වෙනුවෙන් පාසලේ පවත්වන ලද සමුගැනීමේ උත්සවයෙන් පසු ඔහු පාසලෙන් අස් වී යන බැව් දැනගත් ඔහුගේ පංතියේ මෙම කුඩා දරුවන් පාසලෙන් ඔහු පිටත්ව යන දෙස බලා සිට අත්පුඩි ගසමින් "යකා යනවෝ.... යකා යනවෝ...." යැයි මහ හඬින් එළියට පැන කෑගසන්නට පටන් ගත්තේ දැඩි ප්‍රීතියකිනි.

## ආච්චිගෙන් ලැබුණු කජු පාර්සලය

එක්දහස් නවසිය හැටේ වර්ෂයේ වයඹ පළාතේ වීරපොකුණ මාහෙලෙම්බුව ප්‍රදේශයේ රජයේ පාසලක සේවය කළ සමරජීව ගුරුතුමා දරුවන් දෙදෙනකුගේ පියෙකි. හෙතෙම පෙනුමෙන් කඩවසම් තරුණ ගුරුවරයකු විය.

මොහු පාසලේ සේවය කළේ අසල නිවසක නවාතැන් ගෙනය. අටවැනි පන්තිය බාරව කටයුතු කළ මොහුගේ පන්තියේ සිටි සිරියාවතී මනා රූසපුවකින් යුත් ශිෂ්‍යාවක් වූ අතර ඈ තම ගුරුතුමා කෙරෙහි රහසිගතව සිත් බැඳගත්තේ ඔහු දරුවන් දෙදෙනකුගේ පියකු බැව් නොදැනය.

ගෙදර දොර උයන පිහන රසවත් කෑම කාහටත් හොරා මුල් බැඳගෙනැවිත් ගුරුතුමාට දීම සිරියාවතීගේ සිරිතක් විය. සිරියාවතීගේ සිතෙහි ඇති කූට උපක්‍රම නොදත් සමරජීව ගුරු ඒ හැමදෙයක්ම රස කර කර භුක්ති වින්දේය. මේ සියලු දේ ඉවෙන් මෙන් දැන සිටි සිරියාවතීගේ ආච්චි ඈ ගැන නිතරම සෙවිල්ලෙන් පසුවූවාය.

දිනක් තම මව්පියන් කුලී වැඩකට ගිය අවස්ථාවක් බලා සිටි සිරියාවතී තම ආච්චිට හොරා ගෙදර තිබූ කජු ඇට, මල්ලකට පුරවාගෙන එය තැලීම සඳහා අවශ්‍ය උපකරණද රැගෙන අසල කැළයකට ගියේ කාහටත් හොරාය. මේ සිද්ධිය රහසිගතව බලා සිටි සිරියාවතීගේ ආච්චිද ඈ කැළයට යන අතරතුර සෙමින් සීරුවේ ඇය පසුපස කැළයට පියමැන්නේ තම මිණිපිරිය කරන කියන දෑ දැකගනු රිසියෙනි.

ගලක් උඩ තබා කජු ඇට තලන සිරියාවතී දුටු ආච්චිට යක්ෂාරූඪ විය. ඈ ඒ ගැන සිරියාවතීගෙන් ප්‍රශ්න කළ විට දැනගන්නට ලැබුණේ තම ගුරුතුමා කජු කෑමට මහත් ආශාවක් දැක්වූ බැවින් ඔහුට ගෙන ගොස් දීමට කජු තැලීමට පටන් ගත් බවය. මේ ගැන වැඩිදුර ප්‍රශ්න කිරීමේදී කජු තැලීම ඉවතලා ගෙදර දිවගිය සිරියාවතී කිසිත් නොදන්නාක් මෙන් පසු වූවාය. කජු මද තලා පාර්සලය බැඳගත් සිරියාවතීගේ ආච්චි එය රැගෙන පසුදා උදෑසන පාසලට ගියේ කජු පාර්සලය සමරජීව ගුරුතුමාට දීමේ අටියෙනි.

උදය පාසලේ ආරම්භක රැස්වීම අවසන්වී ගුරු භවතුන් හා සිසුන් පන්තිවලට යෑමට සූදානම් වෙද්දී කජු පාර්සලය තම අතින් සමරජීව ගුරුතුමාට දීම යෙහෙකැයි සිතූ සිරියාවතීගේ ආච්චි සමරජීව ගුරුතුමා කැඳවා "මෙන්න මහත්තයො දුව මොකද මම මොකදැ" යි කියමින් කජු පාර්සලය සමරජීව ගුරුතුමා අත තැබුවේ අවට සිටියවුන් සිනහ ගන්වමිනි.

## විදුහල්පතිතුමියගේ භාණ්ඩ සමීක්ෂණය

පඬුවස්නුවරට ආසන්න මහා විද්‍යාලයක විදුහල්පති ලෙස සේවය කළ ධනවතී ගුරුතුමිය අකුරටම වැඩ කළ නිර්භීත ගුරුවරියක් වූවාය. විදුහලේ අනෙකුත් ගුරු භවතුන් සමඟ ඉතා සුහදශීලීව කටයුතු කළ ඈ සිසුන්ගේ මෙන්ම ආචාර්ය මණ්ඩලයේද ආදර ගෞරවයට භාජන වූ කාර්යක්ෂම ගුරුවරියක් වූවාය.

විද්‍යාලයේ සියලුම අංශවල ඩෙස්ක්, පුටු, මේස, අල්මාරි, බංකු ඇතුළු භාණ්ඩ සමීක්ෂණය සඳහා කල්වේලා ඇතිව දන්වා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිලධාරීන් පිරිසක් විදුහලට පැමිණීමට නියමිතව තිබිණ. විද්‍යාලයේ ඒ ඒ අංශවල ගුරු භවතුන් මේ සඳහා දැනුවත් කළ විදුහල්පතිතුමිය තම තමාගේ අංශවල භාණ්ඩ නිසියාකාරව නොඅඩුව තිබේදැයි සොයා බලන ලෙස දැන්වීය.

මේ සෑම අංශයකම වූ බඩු බාහිරාදියෙහි කිසිම අඩුපාඩුවක් නොතිබූ අතර විද්‍යාලයේ ඩෙස්ක්, පුටු, බංකුවල පමණක් අඩුපාඩුවක් විය. භාණ්ඩ සමීක්ෂණයට පෙර එම අඩුපාඩුවද සපුරාලිය යුතු බැවින් විද්‍යාලයේ සිංහල විෂය භාර ධර්මදාස ගුරුතුමා කැඳවූ විදුහල්පතිනිය ඔහුට මේ පිළිබඳ පවසා ඊට විසඳුමක් විමසුවාය.

විද්‍යාලයේ ඉහළ පන්තිවල පිරිමි සිසුන් කිහිප දෙනෙක් පාසල් වේලාවෙන් පසුව නතර කරගත් ධර්මදාස ගුරුතුමා භාගයට කැඩුණු ඩෙස්ක්, පුටු, බංකු ආදියෙහි ඉතිරි කොටසත් කඩා සෑම එක් භාණ්ඩයක්ම දෙකක් වන සේ ගණන් ගැනීමට සලස්වා තැබුවේ භාණ්ඩ සමීක්ෂණයේදී එකම භාණ්ඩය දෙකක් ලෙස පෙන්වීමට හැකිවන අයුරිනි. ඉන් විද්‍යාලයේ එතෙක් අඩුපාඩුවක්ව පැවැති ඩෙස්ක්, පුටු, බංකුවල අඩුපාඩුවද භාණ්ඩ සමීක්ෂණයට පෙර සපුරාලීමට හැකි විය.

නියමිත දින භාණ්ඩ සමීක්ෂණ නිලධාරීහු විද්‍යාලයට පැමිණි අතර සමීක්ෂණයේදී විද්‍යාලයේ කිසිම අංශයක බඩුබාහිරාදිය අඩුපාඩුවක් නොතිබූ බව සටහන් කර විදුහල්පතිනිය ඇතුළු මුළු ආචාර්ය මණ්ඩලයටම ස්තුතිය පුද කරමින් පිටව ගියහ.

(සත්‍ය සිදුවීම් වන මෙම කතාවල එන නම් මනඃකල්පිතය)

**ඩී. එන්. දිසානායක**

පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා

# ශ්‍රී ලංකාව ලෝකයට ගෙන ගිය විදේශ ලේඛකයෝ

■ සුජීව දිසානායක

ඈත අතීතයේ පටන්ම අප රට ලෝකයේ බොහෝ ජාතීන් සමඟ විවිධ සබඳතා පවත්වා ඇති ජාතියක් වන්නෙමු. දැනට හමුවන සාධකයන්ට අනුව ශ්‍රී ලාංකීය ජාතිය පැරණි ඉන්දු නිම්න සභ්‍යත්වය සමඟද සබඳතා පවත්වා ඇති බව විශ්වාස කෙරේ. හලාවත, පොම්පරිප්පු වැනි ස්ථානයන්ගෙන් හමුවන නටබුන් හා හරප්පා නටබුන් අතර සමානතා දක්නට ඇත. එවන් දිගු ඉතිහාසයක් ඇති අප රට පිළිබඳ ලෝකයේ විවිධ ජාතීන් තොරතුරු වාර්තා කර ඇත. ග්‍රීක, රෝම, ඉතාලි, චීන, අරාබි මෙන්ම ඉන්දීය යන ජාතීන් අප රට පිළිබඳ ඈත අතීතයේදීද පෘතුගීසි, ලන්දේසි, බ්‍රිතාන්‍ය වැනි ජාතීන් මෑත ඉතිහාසයේද ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කර ඇත. විශාල ලේඛකයන් ප්‍රමාණයක් අප රට පිළිබඳ තොරතුරු වාර්තා කර ඇති අතර මේ ලිපිය තුළින් බලාපොරොත්තු වන්නේ ඔවුන්ගෙන් කිහිපදෙනකු පිළිබඳ තොරතුරු වාර්තා කිරීමටයි.

## ඇරිස්ටෝටල්

දැනට ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කර ඇති ආදිම ලේඛකයා ලෙස සලකන්නේ ඇරිස්ටෝටල්ය. ග්‍රීක ජාතිකයෙක් වන මොහු දේශපාලන විද්‍යාවේ පියා ලෙසද සලකනු ලැබේ. පොලිටික්ස් නම් ග්‍රන්ථය ඇරිස්ටෝටල් විසින් රචනා කරන ලද දේශපාලනය පිළිබඳ මාහැඟි ග්‍රන්ථයයි. 'ඩිමුන්ඩෝ' නම් ඇරිස්ටෝටල් රචනා කරන ලද කෘතිය තුළින් අප රට පිළිබඳ වැදගත් තොරතුරු රැසක් ලබා ගත හැක. ක්‍රි.පූ. 07 සියවසේ පමණ ජීවත් වන්නට ඇතැයි සිතන මොහු නුවණැත්තන්ගේ ගුරුවරයා ලෙසද සලකනු ලැබේ. ශාස්ත්‍රීය විවේචනය, අලංකාර ශාස්ත්‍රය, තර්කය, දේශපාලනය පිළිබඳ ග්‍රන්ථ ලියූ මොහු පුනරුප්පත්තිය පිළිබඳ විශ්වාසය තැබූ අයෙකි.

## මෙගස්තීනිස්

මොහුද ග්‍රීක ජාතිකයෙකි. ක්‍රි.පූ. 4 වැනි සියවසේ පමණ ජීවත් වන්නට ඇතැයි සිතන මොහු චන්ද්‍රගුප්ත මෞර්ය අධිරාජයාගේ රාජ සභාවේ ග්‍රීක තානාපතියා ලෙස කටයුතු කළ අයෙකි. සෙලියුකස් නිකේටර් වෙනුවෙන් ඔහුගේ තානාපතියා ලෙස මෞර්ය රාජ සභාවේ කටයුතු කළ මොහු තමන් ඉන්දියාවේ සිටියදී අසා දැනගත් තොරතුරුත් තමන් දුටු තොරතුරුත් පදනම් කරගෙන ග්‍රන්ථයක් රචනා කරන ලදී. එය අප 'ඉන්ඩිකා' නමින් හදුන්වනු ලැබේ. එම ග්‍රන්ථය තුළින් මෙගස්තීනිස් අප රට පිළිබඳ ඔහු අසා දැනගත් දේ වාර්තා කර ඇත. එවකට ලංකාවේ පාලකයා වන්නට ඇත්තේ පණ්ඩුකාභය රජුය. නමුත් ඒ රජු පිළිබඳ ඉන්ඩිකාහි තොරතුරු වාර්තා වන්නේ නැත, අද මේ කෘතියේ මුල් පිටපත දක්නට නැති අතර එහි ඉතිරිව ඇත්තේ පසුකාලීන ලේඛකයන්ගෙන් උපුටා ගන්නා ලද කොටස්ය. මෙගස්තීනිස් කිසි දිනෙක ලංකාවට පැමිණ නැති නිසා මොහු ඉදිරිපත් කරන තොරතුරු සියයට සියයක් ක් නිවැරදිද යන්න ගැටලුවක්ව පවතී.

## කොස්මස්

ක්‍රි.ව. 6 වැනි සියවසේ පමණ ජීවත් වන්නට ඇතැයි සිතන කොස්මස් ඉන්ඩි කොප්ලස්ටස් ද ලංකාව පිළිබඳ තොරතුරු වර්තා කර ඇත. මොහු රචනා කරන ලද කෘතිය Topographia Christiana නමින් හඳුන්වනු ලැබේ. කොස්මස්ගේ කෘතිය තුළ දක්නට ඇති ඇතැම් තොරතුරු වෙනත් කිසිදු විදේශ මූලාශ්‍රයකින් හඳුනාග ැනීමටද නොහැකිය. මොහු එවකට ලංකාවේ දිග පළල පිළිබඳ තොරතුරු වාර්තා කරයි. කොස්මස් වාර්තා කරන ආකාරයට ලංකාව ගෞඩියා 300 බැගින් දිගින් හා පළලින් යුක්ත වේ. ටොපොග්‍රැපියා ක්‍රිස්තියානා කෘතියට අනුව එවකට ලංකාවේ එකිනෙකාට විරුද්ධ රජුන් දෙදෙනෙක් ලංකාව පාලනය කර ඇත. ඇතැම් විට එම රජවරු දෙදෙනා අතර බලය සඳහා මේ කාලයේ අරගලයක් පවතින්නට ඇතැයි අපට සිතිය හැකිය.

මෙම ග්‍රන්ථයෙන් අපට එවකට ලංකාවේ පෙර අපර දෙදිග වෙළෙඳාම පිළිබඳ තොරතුරු ලබා ගත හැකිය. ඉන්දියාව, පර්සියාව, ඉතියෝපියාව ආදි රටවලින් ලංකාවට වෙළෙඳුන් ආ බව කොස්මස් තම කෘතියේ වාර්තා කරයි. එම නැව්වලට චීනය වැනි රටවලින් ගෙනා පට රෙදි වර්ග, සඳුන් දර ආදිය මෙරට වෙළෙඳුන් විසින් ලබාදුන් බව කියවේ. මෙයින් පෙනෙන්නේ මේ කාලයේදී ලංකාව පෙර අපර දෙදිග වෙළෙඳාමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ බවය. කොස්මස්ට අනුව ක්‍රි.ව. 6 වැනි සියවසේදී ද ලංකාව තුළ පර්සියානු නිකායට අයත් කතෝලිකයන් ජීවත් වී ඇත. එය ඉතා වැදගත් වාර්තාකරණයකි. සාමාන්‍යයෙන් අප පිළිගන්නා ආකාරයට මෙරට කතෝලික දහම ගලා ආවේ ක්‍රි.ව. 16 සියවසේ පෘතුගීසි ආගමනයත් සමඟය. කොස්මස්ගේ වාර්තාකරණය නිවැරදි නම් ක්‍රි.ව. 6 වැනි සියවස වන විටත් මෙරට තුළ කතෝලිකයන් ජීවත් වී ඇත. තවද කොස්මස් වාර්තා කර ඇති ආකාරයට පර්සියාවෙන් මෙරටට අශ්වයන් පවා ආනයනය කර තිබේ. එලෙස ගෙනා අශ්වයන්ට තීරු බදු අය නොකළ බව ඔහු සඳහන් කර ඇත. මේ පුද්ගලයන්ට අමතරව ඔනෙසික්‍රිටස්, ඉරටොස්තිනිස්, ටොලමි, ප්‍රකෝපියස් වැනි පුද්ගලයන්ද ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කර ඇත. මේ අතරින් ටොලමිගේ Geographia ග්‍රන්ථය ඉතා වැදගත් කෘතියකි.

ප්ලිනී, ඇමිනස්, මර්සලින් වැනි රෝම ලේඛකයන්ද ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තබා ඇති අතර ඒවා තුළින්ද අප රට පිළිබඳ අධ්‍යයනය කළ හැකිය.

## හියුත්සාං

ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කළ ආසියාතිකයන් අතරින් වැදගත්ම ලේඛකයෙක් ලෙස මොහු පෙන්වා දීමට පුළුවන. ක්‍රි.ව. 603 දී චීනයේ හෝනං නම් ගමේ උපත ලැබූ මොහු හර්ෂවර්ධන රජු දවස ඉන්දියාවට ආ ලේඛකයෙකි. වසර 16 ක් ඉන්දියාව තුළ ගත කළ මොහු එරට බොහෝ තැන්වල සංචාරය කරන ලද්දෙකි. දකුණු ඉන්දියානු ප්‍රදේශයන් තුළද සංචාරය කළ මොහු එම ප්‍රදේශයෙන් විවිධ පුද්ගලයන්ගෙන් අසා දැනගත් තොරතුරු තම රට බලා ආපසු ගිය පසු සිය දේශාටන වාර්තාව තුළට ඇතුළත් කර තිබේ. අප එම වාර්තාව 'හියුත්සාංගේ භ්‍රමණ වෘත්තාන්තය හෙවත් ගමන් විස්තරය' නමින් හඳුන්වනු ලැබේ. මෙම කෘතියේ 11 වැනි පරිච්ඡේදය තුළ සිංහල දේශය හෙවත් ලංකාව පිළිබඳ වැදගත් විස්තර ගණනාවක් රචනා කර ඇත.

භ්‍රමණ වෘත්තාන්තය වාර්තා කරන වැදගත්ම කාරණයක් වන්නේ මෙරට ජනවාස වීම පිළිබඳය. හියුත්සාං හිමියන්ට අනුව ලංකාව ජනාවාස කර ඇත්තේ සිංහල නම් වෙළෙඳ පුත්‍රයෙකි. එයට අමතරව ලංකාවේ නිකාය භේදය. අනුරාධපුර දළදා මාළිගාව, මහාපාලි දන්සැල ආදි මාතෘකාද සාකච්ඡා කර ඇත. හියුත්සාං තම වාර්තාව තුළ ලංකාව හඳුන්වා ඇත්තේ රත්නදීප යන නමිනි. එහි අදහස මැණික් දිවයින යන්නයි. හියුත්සාං භික්ෂුවට අනුව රත්නදීපය සිහලදීපය වූයේ සිංහලයන් විසින් එහි සිටි පුද්ගලයන් පරාජය කර බලය ලබා ගැනීමෙන් පසුවය.

## පාහියන්

අප රට පිළිබඳ තොරතුරු වාර්තා කළ තවත් චීන ජාතිකයෙකු වන්නේ පාහියන් හිමියන්ය. ඔහු ශ්‍රී ලංකාවට පැමිණ සියැසින් දැක අප රට පිළිබඳ තොරතුරු වාර්තා කළ අයෙකි. ක්‍රි .ව. 412-414 අතර කාලය තුළ පාහියන් හිමි ලංකාව තුළ රැඳෙමින් තොරතුරු වාර්තා කර ඇත. එය සීයුකී නමින් හඳුන්වනු ලැබේ. අභයගිරි විහාරය පිළිබඳ පාහියන් හිමි ඉදිරිපත් කරන තොරතුරු ඉතා වැදගත් කරුණු වේ. උන්වහන්සේ ලංකාවට එන විට අභයගිරි විහාරයේ භික්ෂූන් වහන්සේලා 5000 ක් පමණ ජීවත් වී ඇත. ථෙරවාදයේ ප්‍රධාන මූලස්ථානය වූ මහාවිහාරය තුළ භික්ෂූන් වහන්සේලා 3000 ක් පමණ වාසය කර ඇත. මිහින්තලේ භික්ෂූන් වහන්සේලා 2000 ක් පමණ වාසය කර ඇත. පාහියන් හිමි ලංකාව ජනාවාස වීම පිළිබඳ කරන විස්තරය වඩාත් සංක්ෂිප්ත හා විශ්වාසදායක වාර්තාකරණය ලෙස පිළිගනු ලැබේ. පාහියන් හිමියන්ට අනුව ලංකාව ජනාවාස වීමට පෙර මෙරට මිනිස් වාසයක් තිබුණේ නැත. එය මකරුන්ගේ හා යක්ෂයන්ගෙන් පිරුණ බිමක් විය. මෙරටට වරින් වර විදේශ රටවලින් ආ වෙළෙඳුන් හරහා එය ජනාවාස වූ බව පාහියන් හිමි වාර්තා කරයි.

පාහියන් හිමි තම වාර්තාව තුළ මෙරට පැවැති දළදා පෙරහැර පිළිබඳවද වාර්තා කර ඇත. ඒ වනවිට දළදාව තැන්පත් කර තිබුණේ අභයගිරි විහාරයේ බව උන්වහන්සේගේ එම වාර්තාකරණයෙන් හඳුනාගත හැක. එමෙන්ම පාහියන් හිමියෝ ලංකාවට ආ චීන වෙළෙඳුන් පිළිබඳවද තම වාර්තාව තුළ තොරතුරු ඉදිරිපත් කරයි. එයින් පෙනෙන්නේ ක්‍රි.ව. 5 සියවසේදී පවා අප චීනය සමඟ සමීප වෙළෙඳ සබඳතා පැවැත්වූ බවයි.

මොවුන් දෙදෙනාට අමතරව චීන ජාතිකයන් වන හුඩෝ, ඉත්සිං, පාඕචාං, චාඕජුකුවා ආදින්ද අප රට පිළිබඳ තොරතුරු වාර්තා කර ඇත.

## කෞටිල්‍යය

කෞටිල්‍යය යනු ඉන්දීය ජාතිකයෙකි. ක්‍රි.පූ. 4 වැනි සියවසේ ජීවත් වූ මොහු මෞර්ය චන්ද්‍රගුප්ත අධිරාජයාට රාජ්‍ය බලය ලබා ගැනීම පිළිබඳ ඉගැන්වූ පුද්ගලයාය. චානක්‍ය යන නමින්ද විෂ්ණු ගුප්ත යන නමින් ද හඳුන්වන මොහු රචනා කළ ග්‍රන්ථය අර්ථ ශාස්ත්‍රය නම් වේ. මෙය ලෝක ඉතිහාසයේ රාජ්‍ය පාලනය පිළිබඳ ලියැවුණ පැරණි වැදගත්ම ග්‍රන්ථය ලෙසද පෙන්වා දිය හැකිය. කෞටිල්‍යයගේ අර්ථ ශාස්ත්‍රය තුළ ලංකාව පිළිබඳවද තොරතුරු සඳහන් කර ඇත. කෞටිල්‍යය ලංකාව හඳුන්වා ඇත්තේ 'පාර සමුද්‍ර' යන විශේෂ නාමයෙනි. ග්‍රීක රෝම හා චීන මූලාශ්‍ර සමඟ සසඳද්දී අර්ථ ශාස්ත්‍රය තුළ ලංකාව පිළිබඳ ඇත්තේ ඉතාමත් අඩු තොරතුරු ප්‍රමාණයකි.

## රොබට් නොක්ස්

ක්‍රි.ව. 17 වැනි සියවසේ ජීවත් වූ ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කළ වැදගත්ම බ්‍රිතාන්‍ය ජාතිකයකු ලෙස රොබට් නොක්ස් හඳුන්වා දීමට පුළුවන. මොහු ලංකාව තුළ වසර 19 කුත් මාස 6 ක් හා දින 14 ක් සිරකරුවකු ලෙස ගත කර ඇත. 1660-1679 ත් අතර කාලයේ ලංකාව තුළ සිරකරුවකු ලෙස ගතකළ මොහු අත් අඩංගුවෙන් මිදී නැවත සියරට බලා ගොස් තමන් ගතකළ ජීවිතය පිළිබඳ කෘතියක් සම්පාදනය කළේය. ලංකාවේ ඉතිහාසය කතාන්තරය හෙවත් එදා හෙළදිව නම් එම කෘතියට ඉංග්‍රීසි සාහිත්‍ය තුළ හිමිවන්නේ ඉතා වැදගත් ස්ථානයකි. Historical Relation of Ceylon නම් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය වූ මේ කෘතිය ඩේවිඩ් කරුණාරත්න මහතා විසින් සිංහලයට පරිවර්තනය කර ඇත.

රොබට් නොක්ස් ඇතුළු පිරිස ලංකාවට ගොඩ බැස ඇත්තේ ඔවුනගේ නැව ඉන්දියන් සාගරය මැදදී කුණාටුවකට හසුවීම නිසාය. ඔවුන් එම කුණාටුවෙන් මිදීම සඳහා සිදු කර ඇත්තේ ගමන් ගත් නැවේ කුඹගස කපා දැමීමයි. එනිසා ඔවුන්ට ඉදිරි ගමන අපහසු වූයෙන් නැවට අවශ්‍ය කුඹ ගසක් කපා ගැනීම සඳහා කොට්ටියාරම වරායට සමීප වී ඇත. දින 20 ක් පමණ ඒ ප්‍රදේශයේ ගත කරමින් සිටියදී ඒ බව දැනගත් රජුගේ කණ්ඩායමක් පැමිණ ඔවුන් උපක්‍රමශීලීව අත්අඩංගුවට ගෙන තිබේ. එලෙස අත්අඩංගුවට පත් රොබට් නොක්ස් හා පිරිස ගණනින් 16 ක් පමණ විය. ඔවුන් අතර නොක්ස්ගේ පියාද වුණි. එලෙස අත්අඩංගුවට පත් රොබට් නොක්ස් ලංකාව තුළ වසර 19 ක් පමණ ගතකර ඇත. රොබට් නොක්ස් හා ඔහුගේ පියා උඩරට සිරුකරුවන් ලෙස ගත කළේ කන්ද උඩරටට අයත් සත්කෝරලය නම් බිමේ බණ්ඩාර කොස්වත්ත ග්‍රාමයේය.

රොබට් නොක්ස් රචනා කළ ලංකාවේ ඉතිහාස

48 වන පිටුව බලන්න

# අප තුළ හෝ පොළො...

47 වන පිටුවෙන්

ප්‍රහාරයන්ය.

කරුණාව හා මෛත්‍රීයද, අවබෝධයද පලා ගොස් තිබිණ. පූර්ව හැඩ ගැසීමෙහි මහා බරින් තෙරපී ගත් හේ විශ්වාසය හා සම්ප්‍රදාය ස්වකීය ශුද්ධ භූමිය කොට ගෙන සිටියේය.

"එහෙත් ආත්මය යනු අප හැම කෙනකුම තුළ පවතින දෙයක්. 'බ්‍රහ්මන්' අවබෝධ කර ගන්නා තුරු එය නැවත නැවතත් උපත ලබමින් අඛණ්ඩව දිගටම පවතිනු ඇත. එකී සත්‍යයට එළැඹෙනු වස් අප විසින් දුක් කම්කටොලු විඳ දරා ගත යුතුයි. අප ජීවත් වනුයේ මුළාවකයි. ලෝකය යනු මායාවක්. එහි ඇත්තේ එක සත්‍යයක් පමණයි"

ඔහු අවසන් කෙළේය. ඔහු වෙත වැඩි අවධානයක් නොදක්වාම ඈ මා දෙස බැලුවාය. ඇය මුවග මඳ සිනහවක් මතුවෙමින් තිබිණ. අප දෙදෙනම බලා සිටියේ ආපසු පැමිණ සිටි පරෙවියා සහ බෝගන්විලියා මල් පොකුර දෙසය.

මේ පොළෝ තලය මතුයෙහි හෝ අප තුළ හෝ සදාකාලික වූ කිසිවක්ම නැහැ. යම් කිසිවක් ගැන සිතමින් එයට අඛණ්ඩ ස්වභාවයක් ගෙන දීමේ හැකියාවක් සිතීමට තිබෙනවා. එසේම වචනය, සංකල්පය හා සම්ප්‍රදාය චිරස්ථායි කරන්නටද එයට පුළුවන්. සිතීම සිතාගෙන සිටින්නේ තමා සදාකාලික යැයි කියාය. එහෙත් එය සදාකාලිකද? සිතීම යනු මතකයෙහි ප්‍රතික්‍රියාවක්.

ඉදින් ඒ මතකය ස්ථිර වූ දෙයක්ද? සිතීමෙන් චිත්ත රූපයක් නිර්මාණය කොට ගෙන, ඒ චිත්ත රූපය 'ආත්මය' නැතහොත් වෙනත් ඔබ කැමති කවර හෝ නමකින් හඳුන්වා ගනිමින් කිසියම් නොකැඩෙන සුලු චිරස්ථිතියක් එයට දිය හැකියි. ඒ අනුව, සිතීමෙන් සිය සැමියාගේ හෝ දරුවාගේ හෝ මුහුණ සිහි කළ හැකියි. ඒ මතකය රඳවා තබා ගත හැකියි. මේ හැම කටයුත්තක්ම කැරෙන්නේ සිතීමෙන්. සිතීම බිය නිර්මාණය කරයි. ඉදින් සදාකාලිකව පවතින්නට පෙලැඹීමක් ඇති වන්නේද මේ බිය නිසයි. හෙට දින ආහාර වේල හෝ ආරක්ෂාවක් හෝ නොලැබෙතැයි බිය වෙයි. මරණය ගැන බිය වෙයි. මේ බිය සිතීමෙහි ප්‍රතිඵලයක්. එසේම 'බ්‍රහ්මන්' යනුද සිතීමෙහි ප්‍රතිඵලයක්.

මාමණ්ඩිය මෙසේ කියයි. "මතකය හා සිතුවිලි ඉටි පහනක් වගෙයි. ඔබට එය නිවා දමා නැවත දැල්විය හැකියි. ඔබට අමතක වන අතර පසුව එය සිහි කර ගත හැකියි. ඔබ මරණයට පත්ව උපදින්නේ වෙනත් ජීවිතයකයි. ඉටි පහනෙහි නැවත දැල්වෙන්නේද එකම සිළුවක්. එහෙත් එය පෙර පැවැති සිළුවම නොවේ. මෙලෙස ඉටි පහන් සිළුවෙහි තියෙන්නෙ අවිච්ඡින්න වූ කිසියම් නිශ්චිත ස්වභාවයක්."

එය එසේ වුවත් නිවා දැමුණු පහන් සිළුව, නැවත දැල් වූ පහන් සිළුවක් වශයෙන් එයම වෙන්නේ නැහැ. අලුත් දෙයක් ඇති වනු වස් පැරැණි වූ දෑ අවසන් වෙයි. ඉදින් නිරතුරුව වෙනස් වන අවිච්ඡින්නත්වයක් ඇති විට අලුත් දෙයක් කිසිසේත්ම ඇති වන්නේ නැහැ. දහස් ගණනින් ඉකුත්ව ගිය දවස් අලුත් කළ නොහැකි යි. ඉටි පහන් සිළුවක් වුව දැවී අවසන් වෙයි. අලුත් දෙයක් ඇති වීම සඳහා හැම දෙයක්ම අවසන් විය යුතුයි.

මේ වන විට මාමණ්ඩියට උපුටා දැක්වීම් හෝ විශ්වාස හෝ වෙනත් අයගේ ප්‍රකාශයන් හෝ මත එල්බ ගත නොහැකි ය. එහෙයින් හෙතෙම තමා තුළටම වැද ගෙන නිහඬ වෙයි. ව්‍යාකූලව වඩාත් කුපිත වෙයි. ඔහු දැන් තමාටම අනාවරණය වී ඇති බැවිනි. ඔහු ගේ ලේලියට මෙන් යථාර්ථයට මුහුණ දීමේ වුවමනාවක් ඔහුට නැත.

"මට නම් මේ කිසි ම දෙයක් ගැන උනන්දුවක් නැහැ" ඈ කියයි. "මම ඉන්නෙ හරිම දුකෙන්. මට මගේ සැමියාත්, පුතාත් දෙන්නම නැති වුණා. මේ ළමයි දෙන්නෙක් ඉතිරි කරලා. දැන් මම මොනව කරන්නද?"

"ළමයින් දෙන්නා ගැන සැලැකිල්ලක් ඔබට ඇති නම් ඔබ ගැනත්, ඔබේ දුක් දොම්නස් ගැනත් කල්පනා කරමින් කාලය ගත කරන්න ඔබට බැහැ. ඔබ විසින් ඔවුන් දෙදෙන රැක බලා ගත යුතුයි; ඔවුනට නිවැරැදි අධ්‍යාපනයක් දිය යුතුයි. සුපුරුදු සාමාන්‍ය පුද්ගලයකු නොකොට ඔවුන් ඇති දැඩි කළ යුතු යි. 'ඔබේ සැමියාට ඇති ආදරය' යනුවෙන් ඔබ විසින් හඳුන්වනු ලබන ඔබේ කලකිරීම හේතුවෙන් ඔබ ගතින් වැහැරී, දිරාපත් වෙමින් හුදෙකලාවක ඇලී ගැලී සිටියහොත් ඔබ කරන්නේ, අනෙක් ළමයි දෙන්නාද විනාශ කිරීමක්. දැනුම්වත්ව හෝ නොදුනුම්වත්ව අපි හැම කෙනෙක්ම ආත්මාර්ථකාමී මිනිස්සු. අපට අවශ්‍ය දෑ ලැබෙන තාක් කල් අප කල්පනා කරන්නේ දැන් ඉතින් සියල්ල හරි යයි කියාය. එහෙත් මේ සියල්ල සුනු - විසුනු වී යන සිදුවීමක් ඇති වූ මොහොතක, කර කියා ගත හැකි දෙයක් නැති ව අප හඬා වැලැපෙන්නේ වෙනත් සහනයක් බලාපොරොත්තුවෙන්. එහෙත් ඒ බලාපොරොත්තුද බිඳ වැටෙනු නිසැකයි. ඉදින් දිගටම පවතිනුයේ මේ ක්‍රියාදාමයයි. එහි ඇති සියලු පටලැවිලි ඉතා හොඳින් දැන දැනත් එහිම හසු වී සිටීම ඔබට අවශ්‍ය නම් එසේ කරන්න. එහෙත් ඔබ ඒ සියල්ලෙහි අඥාන වූ හාස්‍යජනක ස්වභාවය දකින්නෙහි නම් ඔබේ ඔය හැඬුම්, වැලපුම් ඉබේම නවතිනු ඇත. තනිකමද තුරන් වී යනු ඇත. නව ප්‍රබෝධයකින් හා මුහුණෙහි රැඳි සිනහවකින් යුතුව දරුවන් සමග ජීවිතය ගත කරනු ඇත"

**ක්‍රිෂ්ණමූර්තීන්ගේ** The Only Revolution **නමැති කෘතිය ඇසුරෙන් පරිවර්තනය කොට සකස් කළේ ආරියරත්න විජයසිංහ**

# ශ්‍රී ලංකාව ලෝකයට...

47 වන පිටුවෙන්

කතාන්තරය නම් කෘතිය තුළින් අපට උඩරට රාජධානිය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු රැසක් අවබෝධ කර ගත හැකිය. රොබට් නොක්ස් ඇතුළු පිරිස මෙරට සිරකරුවන් බවට පත් වූ ආකාරය, ඔහුගේ පියාගේ මළගම, උණ රෝග යෙන් ඔවුන් පීඩා විඳි ආකාරය, නොක්ස් අලුතෙන් නිවසක් තනා ගත් ආකාරයත් එහිදී ඔහු රාජ උදහසකට ලක් වූ අයුරුත් මේ කෘතිය තුළින් අපට හඳුනාගත හැකිය.

ලංකාවේ භූගෝලීය පිහිටීම මෙන්ම උඩරට රාජධානියේ බෙදීම් ආදිය පිළිබඳවද නොක්ස් වාර්තා කරයි. සෙංකඩගල හෙවත් කන්දේ නුවර පිළිබඳවත්, පුත්තලම ලුණු ලේවාය පිළිබඳවත් ලංකාවේ ග්‍රාම නිර්මාණය වූ ආකාරය පිළිබඳවත් එදා හෙළදිවෙන් තොරතුරු හඳුනා ගත හැකිය. ලංකාවේ කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ජීවනෝපාය වූ වී ගොවිතැන පිළිබඳවත්, ධාන්‍ය වර්ග පිළිබඳවත් අපට මේ කෘතියෙන් අවබෝධයක් ලබාගත හැකිය. හාතියල්, හොඩරවාල, හීනටි, ඇල් වැනි වී වර්ග පිළිබඳවද එදා හෙළදිවේ තොරතුරු ඇත. මේ වී වර්ගයන්ට අමතරව ලංකාවේ පලතුරු වර්ග පිළිබඳවද මෙතුළින් අවබෝධයක් ලැබේ. නොක්ස් වාර්තා කරන ආකාරයට මෙරට බෞද්ධයන්ගේ ශුද්ධ වෘක්ෂය හෙවත් දේව වෘක්ෂකය වන්නේ බෝගසය. කන්ද උඩරට රාජධානිය තුළ ක්‍රියාත්මක වූ දඬුවම් ක්‍රම, උඩරට රාජධානිය තුළ දක්නට ලැබුණ විවාහ ක්‍රම, රජවාසල විත්ති, තානාපතීන් පිළිගන්නා ක්‍රම, රජුගේ බලතල හා කාර්යභාරයන් මෙරට ජනයාගෙන් අය කරන ලද බදු මෙන්ම රාජකීය ධාන්‍යාගාරය පිළිබඳවද මෙම කෘතියෙන් තොරතුරු ලබා ගත හැකිය. පරිච්ඡේද 34 ක් යටතේ කරුණු දක්වා ඇති නොක්ස්ගේ කෘතියෙන් ඔහු අනුරාධපුරය හරහා මන්නාරමට ගොස් එතනින් කොළඹට ආ හැටිත් කොළඹින් බතාවිය බලා ගොස් එතැනින් එංගලන්තය කරා ගමන් කළ අයුරුත් අපට හඳුනාගත හැකිය.

## ආර්. එල්. බ්‍රෝහියර්

ක්‍රි.ව. 1910 වර්ෂයේ සිට 1949 දක්වා ලංකාවේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කළ ආර්. එල්. බ්‍රෝහියර් හඳුනාගත් ලංකාව නම් කෘතිය තුළින්ද ශ්‍රී ලංකාව පිළිබඳ ඉතා වැදගත් තොරතුරු ප්‍රමාණයක් අපට හඳුනා ගත හැකිය. මේ කෘතිය තුළින් ඉදිරිපත් වන බොහෝ තොරතුරු බ්‍රෝහියර් සියැසින් දැක වාර්තා කරන ලද ඒවාය. ඔහු, වෙනත් පුද්ගලයන් සාමාන්‍යයෙන් නොයන ලංකාවේ ප්‍රත්‍යන්ත ප්‍රදේශයන් කරා ගමන් කර ඒවායේ දක්නට ලැබුණ දේ සියැසින් දැක ඒ පිළිබඳ තම කෘතියේ වාර්තා කර ඇත්තෙකි.

බ්‍රෝහියර් තම කෘතිය තුළ වාර්තා කිරීමට උත්සාහ දරා ඇත්තේ මෙරට ඉපැරණි ශිෂ්ටාචාරයේ කතාන්තරයයි. එහිදී ඔහු මෙරට වසර දහස් ගණනක් තිස්සේ පැවත ආ ජනකතා, සම්ප්‍රදායන් ඉදිරිපත් කිරීමට ක්‍රියා කර ඇත. ලංකාවට විජය රජු ඇතුළු පිරිස ගොඩ බැසි ස්ථානය පිළිබඳව බ්‍රෝහියර්තමා ලද අත්දැකීම් සමඟ විස්තරයක් ඉදිරිපත් කරයි. විජය ඇතුළු පිරිස ගොඩ බැසි ස්ථානය පිළිබඳ අන් ඉතිහාසකරුවන් දක්වන අදහස් දක්වා දැනට පිළිගන්නා මතය සනාථ කිරීමට මොහු කරුණු ඉදිරිපත් කරයි. බ්‍රෝහියර්ට අනුව විජය ඇතුළු පිරිස ගොඩබැස ඇත්තේ වයඹ දිග වෙරළේ පුත්තලම අසල පිහිටි මඟුල් තොටමුණ නම් ස්ථානයටය. මඟුල් තොටමුණ නම් නම එම ස්ථානයට ලැබීමට ප්‍රධාන හේතුව ලෙස බ්‍රෝහියර් දක්වන්නේ විජය හා කුවේණිය එම ස්ථානයේදී විවාහ වූ නිසා බව පවසයි.

කොළඹ පුත්තලම මාර්ගයේ හමුවන උඩප්පු නම් ධීවර ගම්මානයේ සෑම වසරකම පවත්වන උත්සවයක් පිළිබඳවද බ්‍රෝහියර් විස්තර කරයි. මෙය හින්දු ආගමේ ශිව භක්තිකයන් විසින් පවත්වන්නා වූ උත්සවයකි. ලංකාවේ ජීවත් වූ කාපිරි ජනතාව පිළිබඳ තම කෘතිය තුළ විස්තර කිරීමට අමතක නොකිරීමටද බ්‍රෝහියර් මහතා ක්‍රියාකර ඇත. කපිරිඤ්ඤා ගීත පිළිබඳවද අපට මේ කෘතියෙන් හඳුනාගත හැකිය. බ්‍රෝහියර් මහතා තම කෘතිය තුළ පුත්තලම ලුණු ලේවාය පිළිබඳ විස්තර කිරීමටද අමතක කර නැත. කල්පිටිය නගරය පිළිබඳවත් එය පෘතුගීසි හා ලන්දේසි බලපෑම්වලට නතුව තිබූ ආකාරය පිළිබඳවත් බ්‍රෝහියර් දක්වන විස්තරය ඉතා වටින්නේය.

මෙරට සාමාන්‍ය ජනයාගේ ජීවිතය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කර ගැනීමටද අපට බ්‍රෝහියර් මහතා විසින් රචනා කරන ලද 'බ්‍රෝහියර් හඳුනා ගත් ලංකාව' තුළින් හැකියාවක් ලැබේ. ඔවුන්ගේ ජන ජීවිතයේ ප්‍රධාන ජීවනෝපාය වූ වී ගොවිතැන ප්‍රමුඛ කෘෂිකර්මාන්තය, ගැමියන්ගේ සමාජ පදනම වූ ගම, ගම් තුළ ජීවත් වන දරුවන් සිදුකරන ක්‍රීඩා ආදිය පිළිබඳවද බ්‍රෝහියර් මහතා තොරතුරු වාර්තා කරයි. මෙරට සාමාන්‍ය ජනයාගේ පෙර නිමිති හා ඇදහිලි පිළිබඳවද අපට මෙතුළින් අධ්‍යයනය කළ හැකිය. අදටත් මෙරට ජනයා තුළ පවතින හූනු ශාස්ත්‍රය පිළිබඳවද බ්‍රෝහියර් මහතා තොරතුරු වාර්තා කර තිබේ. කන්ද උඩරට රාජධානිය පිළිබඳවද බ්‍රෝහියර් මහතා තොරතුරු වාර්තා කරයි. මහනුවර මෙන්ම ගම්පොල නගරයන් පිළිබඳවද ඔහු විස්තර වාර්තා කරයි.

## ජෝන් ඩොයිලි

ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කළ බ්‍රිතාන්‍ය ජාතිකයෙක් ලෙස ජෝන් ඩොයිලි හඳුන්වා දිය හැක. ක්‍රි.ව. 1774 දී මහා බ්‍රිතාන්‍යයේ උපත ලැබූ ඩොයිලි ක්‍රි.ව. 1801 දී මාතර ප්‍රදේශයේදී අයකැමි තනතුරට පත්ව ක්‍රි.ව. 1805 දී ලංකා බ්‍රිතාන්‍ය රජයේ ප්‍රධාන භාෂා පරිවර්තක ලෙස පත්වීම් ලැබීය. තෝමස් මෛට්ලන්ඩ් ආණ්ඩුකාරයා උඩරට වක්‍රාකාරව යටත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර ගැනීමට යොදා ගත්තේ මේ තරුණ බ්‍රිතාන්‍ය ජාතිකයාය. එතැන් පටන් ඩොයිලි කන්ද උඩරට රජු සමඟත් මල්වතු අස්ගිරි මහ නාහිමිවරු සමඟත්, උඩරට රදලයන් සමඟත් විවිධ ස්වරූපයේ සබඳතා පැවැත්වූහ. ඒවායේ අවසන් ප්‍රතිඵලය වූයේ ක්‍රි.ව. 1815 දී කන්ද උඩරට බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතට පත්වීමයි.

ජෝන් ඩොයිලි මෙරට ජීවිතය ගත කරන සමයේ ඔහු ලැබූ අත්දැකීම් සටහන් කර තබන්නට අමතක කර නැත. ඒවා ආශ්‍රය කරගෙන පසු කාලීන වැදගත් කෘති දෙකක් සම්පාදනය විය. ඉන් එකක් සිංහලේ ආණ්ඩුක්‍රමයයි. අනෙක ඩොයිලිගේ දිනපොතයි. මේ කෘති දෙකෙන් වඩාත් වැදගත් වන්නේ සිංහලේ ආණ්ඩුක්‍රමයයි. මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද මහතා විසින් සංස්කරණය කරන ලද ඇල්ලේපොල එච්. එම්. සෝමරත්න මහතා විසින් පරිවර්තනය කරන ලද සිංහලේ ආණ්ඩුක්‍රමය දැනට අප අතර ඇති වඩාත් දුර්ලභ ග්‍රන්ථයක් වේ.

මේ මාහැඟි කෘතිය අරඹන්නේම මෙරට දේශපාලනයේ ප්‍රධානම සංස්ථාව නාමයෙනි.

'මහ රජුගේ බලය අතිශ්‍රේෂ්ඨය, අසීමිතය' යනුවෙන් කෘතිය ආරම්භ කරයි. මේ කෘතිය තුළින් කන්ද උඩරට ක්‍රියාත්මක වූ රාජාණ්ඩු ක්‍රම, රජු පිළිබඳ මෙන්ම ඔහුගේ නිලධාරි යාන්ත්‍රණය පිළිබඳවද තොරතුරු හඳුනා ගත හැකිය. උඩරට රාජ්‍ය තුළ ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය බෙදීම් පිළිබඳව ඩොයිලි වාර්තා කර ඇත. උඩරට රාජ්‍යය තුළ ජීවත් වූ විවිධ ජන කොටස් පිළිබඳවද අපට මේ කෘතිය තුළින් කරුණු හඳුනාගත හැක්කේය. මහනුවර යුගයේ ක්‍රියාත්මක වූ බද්ද සංවිධානය පිළිබඳවද ඩොයිලි සඳහන් කරයි. කොට්ටල් බද්ද, බඩහැල බද්ද, රදා බද්ද, හද බද්ද, කුරුවේ බද්ද, මෙන්ම මඩිගේ බද්ද පිළිබඳවද සිංහලේ ආණ්ඩුක්‍රමයේ සඳහන් වේ.

උඩරට රාජධානිය තුළ ක්‍රියාත්මක වූ අධිකරණ පද්ධතිය හෙවත් මහනඩුව පිළිබඳවද මේ කෘතියේ තොරතුරු ඇතුළත්ය. මහනුවර රාජධානිය තුළ ක්‍රියාත්මක වූ අදිකාරම්, දිසාවේ ලේකම්ලා, රටේ මහත්තයා වැනි නිලධාරීන්ට හිමිව තිබූ අධිකරණ බලතල පිළිබඳවද අපට මෙතුළින් අධ්‍යයනය කළ හැකිය. මහනුවර යුගය තුළ ක්‍රියාත්මක වූ සිරිත් විරිත් අපරාධ හා ඒවාට දුන් දඬුවම්, ඉඩම් භුක්ති ක්‍රමය, ණය හා ගිවිසුම්, ඔප්පු තිරප්පු ආදිය පිළිබඳවද අපට මේ කෘතියෙන් හඳුනාගත හැකිය. මහනුවර යුගය තුළ දක්නට ලැබුණ විවාහ ක්‍රමය, වහල් මෙහෙය මෙන්ම මෙම රාජධානිය තුළ දක්නට ලැබුණ කුල ක්‍රමය පිළිබඳවද මේ කෘතියේ තොරතුරු ඇතුළත්ය.

මේ පුද්ගලයන්ට අමතරව ජෝන් ෆයිබස්, තෝමස් ස්කිනර්, විලියම් ෆෝබර්ස්, එමර්සන් ටෙනන්ට්, ලෙනාඩ් වුල්ෆ් වැනි බ්‍රිතාන්‍ය ජාතිකයන්ද අප රට පිළිබඳ තොරතුරු වාර්තා කර ඇත්තේය. මොවුන් අතරින් වසර 50 ක් පමණ මෙරට මහා මාර්ග ඉදි කිරීමේ කටයුතුවල නිරතව සිටි තෝමස් ස්කිනර්ගේ ලංකාවේ පනස් වසරක් කෘතියද ඉතා වැදගත් නිර්මාණයක් ලෙස පෙන්වාදිය හැකිය.





## සංකලන

### නර්තන ප්‍රසංගයේ විශේෂ අවස්ථා

'රූසර නර්තන පාසලේ' ශිල්පි ශිල්පිනියන්ගේ කුසලතාවලින් ඔප් නැංවුණු 'සංකලන නර්තන ප්‍රසංගය' පසුගියදා ටොරොන්ටෝ දොන් බොස්කෝ රඟහලේදී වේදිකාගත විණි. එහිදී නර්තන ආචාර්ය නිලන්ත කරුණාරත්නයන් සහ ඔහුගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ඉදිරිපත් කරනු ලැබූ නර්තන අංගයන් කැමරා ඇසට දිස් වූයේ මෙසේය.








ඔබගේ සියලුම සංචාරක කටයුතු සඳහා

VMS TRAVELS AND TOURS හි

රාජ් අමතන්න

416 567 5104



# VMS TRAVELS & TOURS INC.

3351, Markham Road, Unit 137A, Toronto Ont, M1X 0A6

416 293 5800 | 1 888 655 5575 www.flytrips.ca

48 A , Dr. Lester James Peries Mawatha (Dickmans Road) Colombo 5

94 11 250 21 98

info@vmstravels.ca | www.flytrips.ca





# සත්සර රාවය
## SATHSARA RAWAYA

**කැනඩා සිංහල සංගමය විසින් පවත්වන එළිමහන් සංගීත ප්‍රසංගය සහ සල්පිල**

2017 ජූලි 29 වන දා
පස්වරු 5 සිට රාත්‍රී 11 දක්වා
ස්කාබරෝ සිවික් සෙන්ටර් හිදී

**DATE**
July 29th 2017

**TIME**
5pm to 11pm

**VENUE**
Scarborough Civic Centre
150 Borough Dr, Scarborough,

**Vendors Please contact numbers below for more details.**
416-822-2789 / 416-522-5325

# BEYOND YOUR EXPECTATIONS !

**Residential & Commercial**

## Real Estate

proud sponsor of Children's Miracle Network

#1 RE/MAX

### BUY or SELL your HOME with me

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

My commission for your listing will be 0% when **you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



### 5% down payment? No problem!

**I will guide you through obtaining your DREAM HOME through my proven system!**

# Gamini Abeysinghe. ABR, CNE

## Real Estate Sales Representative

100% Club Award 2014, 2013, 2011, 2010

Platinum Club Award 2015, 2012

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

RE/MAX Diamond Realty Inc., Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

RE/MAX HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

## Call me Today !

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

www.gaminiabeysinghe.com

• Some conditions apply. Please feel free to contact me for further details ** • Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements